# ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය

## උතුරු - නැගෙනහිර සහ පුත්තලම් දිස්ත්‍රික්කය ඇසුරින්



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයක්.

# ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය

## උතුරු නැගෙනහිර සහ පුත්තලම් දිස්ත්‍රික්කය ඇසුරින්

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

(එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසමේ අනුග්‍රහයෙනි.)

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය

ISBN

කවරයේ ඡායාරූපය : **වෛද්‍ය එම්. එස්. වීරකෝන්**

පරිගණක අක්ෂර /පිටු සැලසුම : **ලිත්මා ග්‍රැෆික්ස්** ✆ **0114-216740**

මුද්‍රණය :

ප්‍රකාශනය : **විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු මහජන ප්‍රතිපත්ති පිළිබඳ විවාදයට සිවිල් සමාජයේ දායකත්වය අත්‍යවශ්‍ය මෙන් ම ශක්තිමත් කිරීම අවශ්‍යය යන දැඩි විශ්වාසයෙන් පිහිටුවාගත් ආයතනයකි. එය පර්යේෂණ හා උපදේශක වැඩසටහන් ඔස්සේ රාජ්‍ය පාලනයට හා ගැටුම් සමථයකට අදාළ ප්‍රශ්නවලට සිය අවධානය යොමු කර යි.

වැඩිදුර විස්තර සඳහා මෙහි පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය,
24/2, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුරකථනය : 94-11-2565304/06 ෆැක්ස් : 94-11-4714460
ඊ-මේල්: cpa@sri.lanka.net

# පටුන


- ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය පිළිබඳ කෙටි විස්තරයක් 11

1. නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය පිළිබඳ කෙටි විස්තරයක් 17
2. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණ 25
3. කලාපීය සහ සමාජ විෂමතා 31
4. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාකාරිත්වයේ සාර්ථකත්වය 35

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය පිළිබඳ උපකල්පනයක් යළි අවධානයට ලක්කිරීම 43

- දිස්ත්‍රික්ක පිළිබඳ තොරතුරු
- යාපන දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක් 49
- මන්නාරම් දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක් 62
- පුත්තලම් දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක් 77
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක් 90
- මඩකලපුව දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක් 104
- අම්පාර දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක් 115
- වව්නියාව දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක් 131
- එල්ටීටීඊ පාලනයට නතුව තිබෙන වන්නිය පිළිබඳ කෙටි විස්තරයක් 135
- 1 වෙනි ඇමුණුම - තවදුරටත් පර්යේෂණ පැවැත්වීමේ යෝජනා 138
- 2 වෙනි ඇමුණුම - පරිශීලනය සඳහා නිර්දේශිත ග්‍රන්ථ 143
- 3 වෙනි ඇමුණුම - සම්මුඛ පරීක්ෂණයට ලක් වූ ආයතන ලැයිස්තුව 149

## ස්තූතිය

මිරාක් රහීම් සහ වනේසා ගොසලින් ප්‍රධාන පර්යේෂණ නිලධාරී දෙපල විසින් මෙම අධ්‍යයනය පවත්වන ලදී.

පී. විජය ශාන්තන්, ශාන්ති තම්බයියා, ස්වර්නම් ප්‍රනාන්දු සහ උමා නන්දනී යන ක්ෂේත්‍ර පර්යේෂණ නිලධාරී පිරිස් ඔවුනට සහය වූ හ.

මේ කෘතිය සම්පාදනයේ දී රතිනි සෙල්වනායගම්, බෝධි ප්‍රනාන්දු, මීරා ප්‍රදන්, කෙලී බ්‍රයන්, තනූජා විජය ශාන්තන්, සරලා ඒම්මානුවෙල් සහ දේවනන්ද් රාමයියා ඇතුළු පිරිස ගෙන් ලද මහඟු උපකාරය සහ දායකත්වය අගේ කොට සලකන අතර ඒ සඳහා ඔවුන් වෙත ස්තුතිය පිරිනැමේ.

එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම සහ විශේෂයෙන් මෙම අධ්‍යයනය උදෙසා අරමුදල් සැපයීමෙන් සහ උපකාරී වීමෙන් සලසන ලද සේවය වෙනුවෙන් “සහජීවනයට ආරම්භයක්” යන වැඩසටහනට සම්බන්ධ සියලු දෙනාට ද ස්තුතිය පිරිනැමේ.

## පෙරවදන

2002 පෙබරවාරි 22 දින ශ්‍රී ලංකා රජයත්, එල්ටීටීඊ සංවිධානයත් අතර සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු, දීර්ඝකාලීන සාමයක් අපේක්ෂාවෙන් අවතැන් වූ පිරිස් ආපසු සිය නිජ භූමිය කරා පැමිණෙන්නට වූ හ. ඔවුන් ගේ සංඛ්‍යාව එන්ට එන්ටම වැඩිවන්නට විය. 800,000 ක් වූ මුළු අවතැන් වූ ජනතාව ගෙන් දැනටමත් 300,000 ක් දෙනා ආපසු සිය ගම්බිම් වෙත පැමිණ ඇතැ යි ගණන් බලා තිබේ. තවත් සමහරු ආපසු ඒම සඳහා කල්පනා කරමින් සිටිති. වසර විස්සක් පුරා වූ යුද්ධයෙන් බිලිගත් මිනිස් ජීවිත සංඛ්‍යාව 65,000 කි. මෙ ලෙස උතුරු හා නැගෙනහිර පළාත්වල සිදු වූ ව්‍යසනයෙන් සිදු වූ විනාශය අති විශාල ය. කයෝර ජීවන තත්ත්වයත්, නිවාස හා යටිතල පහසුකම් විනාශයට පත්වීම, ආර්ථික අවස්ථා සහ ස්වකීය ඉඩම්වල පදිංචිය අහිමිවීම සහ ඉඩම් හිඟය යන මේ දුෂ්කරතාත් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන්, ආපසු තම ගම් බිම් බලා පැමිණෙන වැසියන් සහ අනෙකුත් විවිධ ජන කොටස්වලට අයත් සාමාජිකයින් සියලු දෙනා තුළ අවිනිශ්චිත භාවයක් ඇති කිරීමට සමත් විය.

දීර්ඝ කාලීන යුද්ධයට හේතු කාරක වූත්, එසේ ම එහි පලවිපාකයන් වශයෙන් ද සැලකිය හැකි ජනවාර්ගික ගැටුම් රට තුළ අභ්‍යන්තර වශයෙන් මතුවන අර්බුදයට ප්‍රධාන වශයෙන් වගකිව යුතුව ඇත. ආපසු පැමිණෙන අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පිරිස් සහ සරණාගතයින් එම ප්‍රදේශවල ජනවාර්ගික හා ආගමික සුළුතරයක් බවට පත්වීම නිසා ජනවාර්ගික කැලඹීම් සහ එදිරිවාදිකම් උග්‍රවනු ඇත. දැනටමත් අවතැන් වූ සමහර පවුල් කලින් පදිංචිව සිටි පෙදෙස්වලට ආපසු පැමිණ ඇති අතර, තවත් බොහෝ දෙනෙක් එසේ පැමිණීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත. මෙසේ අලුතින් ගම් නියම් ගම් බලා පැමිණෙන පිරිස් හා එහි දැනට පදිංචිව සිටින පවුල් අතර මතභේද ඇතිවීමට බෙහෙවින් අවකාශ ඇත. මෙබඳු මතභේද නිරාකරණය කිරීම, බෙදී වෙන් වී ගිය ජන කොටස් අතර තිරසාර සාමය හා යහපත් සබඳතා පවත්වා ගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය ය. වැඩි වෙමින් පවත්නා ආරවුල් විසඳීම සඳහා මැදිහත්වීමට පොලීසියට සහ අධිකරණයට අවශ්‍යයෙන් ම තිබිය යුතු නීත්‍යානුකූල භාවය සහ හැකියාව හීන වෙමින් පවතී. අධිකරණය මඟින් ආරවුල් විසඳා ගැනීමේ

දුෂ්කරතා, අධික වියහියදම් සහ අනවශ්‍ය ලෙස කාලය මිඩංගු කිරීමට සිදුවීම යනා දී කරුණු නිසා ඒ කෙරෙහි ජනතාව උනන්දුවක් නො දක්වයි. මේ හා සසඳන විට ආරවුල් නිරාකරණය කිරීමේ අවිධිමත් මාර්ග හරහා වඩා ඵලදායී ප්‍රතිඵල ලබාගැනීම පහසු වී තිබේ. සම්මත අධිකරණ ක්‍රියාවලියන්ට වඩා අවිධිමත් ක්‍රමෝපායන් නම්‍යශීලී බවක් පෙන්වයි; එසේ ම වඩාත් ඉක්මණින් සාධනීය ප්‍රතිඵල ලබා දීමට ද සමත් වේ. ඒ මගින් ආරවුල් වලට කොටු වී සිටින පුද්ගලයින් සහ ජන කොටස් අතර සුහදතාව තහවුරු කිරීමට ද හැකියාව ලැබේ.

මෙම පසුබිම තුළ ය, සරණාගතයන් සඳහා වන එක්සත් ජාතීන් ගේ කොමිසම යටතේ "සාමකාමී සහජීවනය සඳහා ආරම්භයක්" යන තේමාව මුල් කරගෙන මෙම අධ්‍යයනයට මුල පුරන ලද්දේ. විවිධ ජන කොටස් අතර අවබෝධය හා එකමුතුව තහවුරු කිරීම උදෙසා දැනට පවත්නා ආරවුල් බේරුම් කිරීමේ සහ ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාමාර්ග හඳුනා ගැනීම එහි අරමුණ වේ. මෙම අධ්‍යයනයට පහත සඳහන් කරුණු විශේෂයෙන් ඉලක්ක වී තිබේ.

- ★ උතුරු හා නැගෙනහිර සියලු දිස්ත්‍රික්කයන් සහ පුත්තලම ද ආවරණය වන පරිදි විෂයානුබද්ධ අධ්‍යයන මගින් තහවුරු වන අයුරින් දැනට පවත්නා ප්‍රජා කේන්ද්‍ර කොටගත් අර්බුද නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රමෝපායන් පිළිබඳ කෙටි විස්තරයක් සහ විශ්ලේෂණයක් සැපයීම.
- ★ නිදර්ශනයක් වශයෙන් අනුගමනය කළ හැකි, ගම් මට්ටමින් ගැටුම් නිරාකරණය කිරීමේ "හොඳම ක්‍රමෝපායයන්" නිර්දේශ කිරීම.

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රමෝපායන් විග්‍රහ කිරීම

මෙම අධ්‍යයනය සම්බන්ධයෙන් ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමෝපායන් පහත සඳහන් පරිදි විග්‍රහ කරනු ලැබේ.

- ★ විශේෂයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ අධිකරණය ඇතුළු රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයන්ට පරිබාහිරවීම 'අවිධිමත්' යන්නෙන් ගම්‍ය වේ.
- ★ පුළුල් වශයෙන් ගත් කල ආරවුල්, ගෘහස්ථ ආරවුල්වල සිට අන්තර් - ජනවාර්ගික හිංසනය දක්වා වර්ධනය වේ.
- ★ මැදිහත්වීම හා බේරුම් කිරීම හා ඒ හා ආශ්‍රිත විවිධ දෑ අර්බුද නිරාකරණ ක්‍රියාවලියට අයත් වේ.

## මැදිහත් වීම

තෙවන පාර්ශ්වයක් (එකකු හෝ වැඩි ගණනක්) පුද්ගලයන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අතර හටගන්නා මතභේද නිරාකරණය කිරීම සඳහා ඉදිරිපත්වීම "මැදිහත්" වීමේ ක්‍රමෝපාය වශයෙන් සැලකේ. මෙහි දී මතභේදයට සම්බන්ධ වී සිටින පාර්ශ්වයෝ ඍජුව ම එකිනෙකා හා සාකච්ඡා පවත්වති. අදහස් හුවමාරු කරගනිති. පහසුකම් සපයන්නා ගේ කාර්යයභාරය වී ඇත්තේ අදාල පාර්ශ්වයන් අතර සන්නිවේදනය පහසු කිරීම, අර්බුදයට මුල් වී ඇති ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම හා එය නිරාකරණය කිරීම සඳහා විකල්පයන් නිර්මාණය කිරීම ය.

## බේරුම් කිරීම

දෙපාර්ශ්වයේ ම අනුමැතිය පිට තෝරාගත් තීරකයකු විසින් ආරවුලට කන් දී එය නිරවුල් කිරීම බේරුම් කිරීම වශයෙන් හඳුන්වනු ලැබේ. තුන්වෙනි පාර්ශ්වයක ආධාරය නො මැතිව පුද්ගලයින් දෙදෙනකු මුහුණට මුහුණ ලා සාකච්ඡා කිරීම විකල්ප ක්‍රමයකි.

★ පිටස්තර සංවිධානයක් විසින් ගම තුළ පිහිටුවනු ලබන ආයතන (රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කර ඇති සාම කමිටු යනාදිය) ගමට ආවේනික වූ ආයතන (ග්‍රාම සංවර්ධන සමිති, මුස්ලිම් පල්ලි යනාදිය) තත් කාර්යය සඳහා හෝ, ආයතනික ස්වරූපයෙන් හෝ පුනරාගත අයුරින් (ග්‍රාමසේවක, පූජක තැන යනාදී වශයෙන්) පුද්ගලයින් විසින් කටයුතු කිරීම 'යාන්ත්‍රණ' ගණයට වැටේ. මෙම අධ්‍යයනය විසින් හුදෙක් අවිධිමත් අයුරින් ගැටුම් නිරාකරණය කිරීමේ කලාව පමණක් අවධාරණය නො කරන අතර අනෙකුත් විධිමත් හෝ අර්ධ විධිමත් යාන්ත්‍රණයන් ද සැලකිල්ලට ගනු ලැබේ.

මිනිසුන් ස්වකීය අර්බුද හෝ ආරවුල් නිරාකරණය කරනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳ වඩාත් පෘථුල අවබෝධයක් ලබාදෙනු වස් විධිමත් මෙන් ම අර්ධ විධිමත් යාන්ත්‍රණයක් ද මෙම අධ්‍යයනයට ඇතුළත් කර තිබේ.

## ක්‍රමවේදය

වෙනස් මූලාශ්‍රයන් සතරකින් ලබාගත් තොරතුරු මෙම වාර්තාවට ඇතුළත් වේ.

1. කොළඹ සහ ක්ෂේත්‍රයේ නිවැසි සිවිල් සමාජ නියෝජිතයින් සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡා

2. යාපනය, එල්ටීටීඊ පාලනය යටතේ පවතින වන්නිය, මන්නාරම, වව්නියාව, පුත්තලම, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර යන පෙදෙස්වල ක්ෂේත්‍ර කටයුතු

3. අවිධිමත් ගැටුම් නිරාකරණය හා සම්බන්ධ තොරතුරු සමීක්ෂණය හා

4. මූලික වශයෙන් රැස් කරගත් තොරතුරු පිළිබඳ ප්‍රතිපෝෂණයක් ලබාගැනීම සඳහා වැඩමුළුවක්

පර්යේෂකයින් දෙදෙනකු ගෙන් යුත් කණ්ඩායමක් දල වශයෙන් දින 5 - 7 සංඛ්‍යාවක් සෑම දිස්ත්‍රික්කයක ම ගත කළ හ. ක්ෂේත්‍රයේ දී පර්යේෂකයින් ගේ ප්‍රවේශය වූයේ, ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය සහ සවිස්තරාත්මක විෂයානුබද්ධ අධ්‍යයනයන් හඳුනා ගැනීමේ අරමුණින් අදාල පුද්ගලයින් මුණගැසී සාකච්ඡා කිරීම ය. මේ අරමුණ වෙනුවෙන්, සිවිල් සමාජ නියෝජිතයින්, ජාත්‍යන්තර රාජ්‍ය නො වන සංවිධාන, ජාතික රාජ්‍ය නො වන සංවිධාන, සහවාස ප්‍රාදේශීය රාජ්‍ය නො වන සංවිධාන, රාජ්‍ය නො වන සංවිධානවල ක්ෂේත්‍ර නිලධාරීන්, ආගමික නායකයින්, සිවිල් බලධාරීන්, එල්ටීටීඊ යේ දේශපාලන නිලධාරීන්, ප්‍රජා මූලික සංවිධාන සහ ඔවුන් ගේ බල ප්‍රදේශ සමග සාකච්ඡා කරන ලදී. ගුණාත්මක වශයෙන් වැදගත් දත්ත ලබාගැනීමේ අදහසින් ප්‍රශ්න මාලාවක් උපයෝගී කරගනිමින් සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. ප්‍රබල විෂයානු බද්ධ අධ්‍යයනයක් හඳුනාගැනීමෙන් පසු, පර්යේෂකයින් කම්ටු සාමාජිකයින්, ගැටුමට සම්බන්ධ පුද්ගලයින් සහ අනෙකුත් අදාල පක්ෂ සියල්ල ම පාහේ පර්යේෂකයින් විසින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරන ලදී.

## සීමා බාධක

අධ්‍යයනය මාස 2 1/2ක් වැනි කාලයක් තුළ දී නිමාවට පත් කිරීම අපේක්ෂා කළ මුත් ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය පර්යේෂණ නිලධාරීන් ගේ සංඛ්‍යාව සීමිත විය. ගැටුම් නිරාකරණය කිරීමේ කාර්යක්ෂම යාන්ත්‍රණයක් සොයා ගැනීමේ අපහසුතාව නියදි අධ්‍යයන මඟින් හෙළි කිරීම නිසා තත්ත්වය තවදුරටත් ව්‍යාකූල විය. ප්‍රධාන ගැටලුව වූයේ විෂය පිළිබඳ ව විද්වතුන් ගෙන් මෙන් ම සිවිල් සමාජ නිලධාරීන් ගෙන් නිශ්චිත තොරතුරු ලබාගැනීමේ අපහසුතාවයි. ක්ෂේත්‍ර මට්ටමින්, ප්‍රාදේශීය රාජ්‍ය නො වන සංවිධානයන් විසින් පර්යේෂකයින් වෙත වැරදි තොරතුරු ලබාදීම තවත් ප්‍රධාන ගැටලුවකි. කාලය සීමා වීම ද

තවත් ගැටලුවකි. අවසාන වශයෙන් එල්ටීටීඊ සංවිධානයේ පාලනයට නතු වී තිබෙන පෙදෙස්වල පදිංචි මහජනතාව ගෙන් තොරතුරු ලබාගැනීමට නො හැකි වීම අධ්‍යයනයේ සාර්ථකත්වයට විශාල බාධාවක් විය. එ බැවින් මෙම අධ්‍යයනය මඟින් අනාවරණය කළ හැකිවූයේ රජයේ පාලනය යටතේ පවතින පෙදෙස් පමණි. එහි ප්‍රතිපලයක් වශයෙන් මෙම අධ්‍යයනය ආරවුල් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයක් සම්පාදනය කර ඇතැ යි කීම උගහට ය. එමෙන් ම ඉතා කාර්යක්ෂම යාන්ත්‍රණයක් පිළිබඳ ගැඹුරු විෂයානුබද්ධ අත්හදා බැලීමක් මෙම අධ්‍යයනය මඟින් සපයා නැත. එහෙත් මෙම පර්යේෂණය විසින් ක්ෂේත්‍ර කටයුතුවල දී හඳුනා ගත් යාන්ත්‍රණයන් ප්‍රක්ෂේපනය කරන අතර මෙම කලාප තුළ අදාල විෂයානුබද්ධ අධ්‍යයනවලින් පැහැදිලි කර ඇති ගැටුම් සමථයකට පත්කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයෙන් ලත් අත්දැකීම් පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක් ද සපයයි.

ක්ෂේත්‍ර කටයුතු පවත්වා ගෙන යනු ලබන දිස්ත්‍රික්කවල රාජ්‍ය නො වන සංවිධානයන් අගැයුමට ලක්කිරීම හෝ ඒ පිළිබඳ විස්තර කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ නො වේ. අංග සම්පූර්ණ අයුරින් පිළිතුරු සෙවීම වෙනුවට ගැටුම් නිරාකරණය කිරීම සම්බන්ධයෙන් වැදගත් ප්‍රශ්න මතුකිරීම සහ යම් මූලික නිගමනයන් ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. එබැවින්, මෙහි ප්‍රථම අදියරෙන් මතුකර පෙන් වූ ප්‍රශ්න සහ ක්‍රියාවලීන් ගැඹුරින් විමර්ශණයට භාජනය කරමින් තවදුරටත් පර්යේෂණ පැවැත්වීම මඟින් සාධනීය ප්‍රතිඵල අපේක්ෂා කළ හැකි ය. (දෙ වැනි ඇමුණුම බලන්න.)

## වාර්තාවේ ව්‍යුහය

දිස්ත්‍රික් වශයෙන් රැස් කරගත් තොරුතුරුවල සාරාංශයක් සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය පිළිබඳ සාමාන්‍ය විශ්ලේෂණයක් අඩංගු කෙටි විස්තරයක් සහ දෙවනුව සෑම දිස්ත්‍රික්කයක් පිළිබඳ ලඝු සටහනක් සහ විශ්ලේෂණයක් වශයෙන් මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

දිස්ත්‍රික්ක ආවරණය කර ඇති ආකාරය තෙයාකර ය. එ නම් ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයන්, දිස්ත්‍රික්කයේ හඳුනා ගත් ගැටුම් අගැයුම් කිරීම සහ එම යාන්ත්‍රණයන් ඒවාට ප්‍රතිචාරය දක්වනු ලබන්නේ කෙසේ ද කියා ආදී වශයෙනි.

සෑම කොටසක් ම වෙන් වශයෙන් කියවිය හැකි අතර එහි ප්‍රතිඵලයක් ලෙස එකම දේ අන්‍ය ස්ථානයන්හි යළි යළිත් සඳහන් වීම වැලැක්විය නො හැකි දෙයකි.

## තවදුරටත් විග්‍රහයන්

**ප්‍රජාව :-** මෙයින් අර්ථවත් වන්නේ හුදෙක් එක ම ආගමික හෝ වාර්ගික කණ්ඩායමක් නො වේ. එයට කිසියම් ප්‍රදේශයක ජීවත් වන සියලු පදිංචි කරුවන් ඇතුළත් වේ.

**ප්‍රජාමූලික සංවිධාන :-** මේවා එක ප්‍රජාවක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පදනම් කරගත් හා ඒවා සමඟ එක්ව කටයුතු කරනු ලබන ඔවුන් විසින් ම ආරම්භ කර ඇති සංවිධාන වේ. බොහෝ විට ප්‍රදේශීය අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වීමක් වශයෙන්, එම ප්‍රදේශ මුල් කරගනිමින් පිහිටුවන ලද ඒවා ලෙස මෙම සංවිධාන හැඳින්විය හැකියි. මෙම සංවිධාන අදාල ප්‍රදේශවල නිවැසියන් ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන් විසින් ම නිර්මාණය කරන ලද ඒවා ද වෙති.

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් දේශීය යාන්ත්‍රණ

මේවා රාජ්‍ය නො වන සංවිධාන හෝ යුද හමුදාව විසින් පිහිටුවන ලද ඒවා නො වේ. යම් හෙයකින් එ වැනි ආයතන විසින් පිහිටුවන ලද්දේ වුව ද ඒවා ස්වාධීනව කටයුතු කරන අතර ග්‍රාම සංවර්ධන සමිති, මුස්ලිම් දේවස්ථාන කමිටු වැනි ප්‍රාදේශීය සංවිධානවලට අන්තර්ග්‍රහණය වී තිබේ.

# ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය පිළිබඳ කෙටි විස්තරයක්

පර්යේෂණ ක්‍රියාවලියේ දී විවිධ ව්‍යූහයන් ගෙන් නිර්මාණය වූ ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණ ගණනාවක් පිළිබඳ අත්දැකීම් ලබාගැනීමට හැකිවිය. රාජ්‍ය නොවන සංවිධාන විසින් පිහිටුවන ලද සාම කමිටු විවිධ සාමක්‍රියාවලියන් තුළ නිරතව සිටිති. ඉන් එකක් ගැටුම් නිරාකණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයයි.

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඇති කරන ලද රාජ්‍ය නොවන සංවිධානවලට අයත් සාම කමිටු බොහෝ අවස්ථාවල මධ්‍යගත ගම්සභා හරහා ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණ ක්‍රියාත්මක කරමින් සිටිති. රජයේ (එනම් ග්‍රාම සංවර්ධන සමිති, ධීවර සංගම් හෝ ප්‍රජා මධ්‍යස්ථාන) පාලනයෙන් නිදහස්ව කටයුතු නොවන දේශීය ප්‍රජාමූලික සංවිධාන බොහෝ විට තමන් විසින් ම, අඩුපාඩු සහිතව වුවද ගැටුම් සහ ආරවුල් නිරවුල් කරගනිති.

ආගමික කමිටු සහ නායකයෝ (එනම් මුස්ලිම් දේවස්ථාන කමිටු, දේවස්ථාන, දේවස්ථානවලට අනුයුක්ත සභා සහ ඔවුන් යටතේ ක්‍රියාත්මක වන ආයතන) ස්වකීය ප්‍රජාවට සම්බන්ධ ගැටලු සහ ආරවුල් ඔවුනොවුන් ම සාකච්ඡා කර විසඳා ගනිති.

එහෙත්, බෞද්ධ සහ හින්දු පූජනීය ස්ථාන සතු භාරකාර කමිටු ගැටුම් විසඳීමේ අවිධිමත් ක්‍රියාවලියක් අනුගමනය කරනු ලබන්නේ මඳ වශයෙනි. වගකිවයුතු ප්‍රජා නියෝජිතයින්, ග්‍රාම සේවකයින්, රාජ්‍ය නිලධාරීන්, පොලිස් නිලධාරීන් සහ එල්ටීටීඊ සාමාජික පිරිස් ද ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයේ නිරත වෙති. රජයේ පාලනය යටතේ පවතින ප්‍රදේශවල එල්ටීටීඊ ය ස්වකීය දේශපාලන කාර්යාල විවෘත කර ඇති බැවින් ජනතාව ස්වකීය

ගැටලු නිරාකරණය කරගැනීම සඳහා ඔවුන්ගේ පිහිට පතති. ප්‍රජාව කේන්ද්‍ර කොටගත් හෝ අන්තර් වාර්ගික හිංසනයට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් හෝ ජන කොටස් සහ ප්‍රාදේශිය බලධාරීන් අතර මැදිහත්කරුවකු වශයෙන් කටයුතු කිරීම පිනිස ප්‍රදේශයේ සමහර වගකිවයුතු පුද්ගලයෝ ඉදිරිපත් වෙති.

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය

මේ යටතේ විවිධාකාරයේ ආරවුල් නිරාකරණය කරනු ලැබේ. පවුල් අතර අරමුදල් (ගෘහස්ථ හිංසනය, මදිරාබාධය, දේපල උරුමය යනාදිය) ගම් ඇතුළත ආරවුල්, එනම් පුද්ගලයින් අතර හෝ ගමපුරා (මායිම් මතභේද, මුදල් ගනුදෙනු, කුලය හෝ වාර්ගික තත්ත්වය මුල් කරගත් සණ්ඩු සරුවල් යනාදිය) හෝ ගම් අතර ආරවුල් (සම්පත් වලට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීම, වාර්ගික මතභේද, අභ්‍යන්තර අවතැන්වූවන් පදිංචි කිරීමේදී ගම්වැසියන් අතර හටගන්නා ආරවුල්) මින් සමහරකි. දේශපාලන සහ කණ්ඩායම් අනන්‍යතාව නිසා සුළු සුළු සිද්ධීන් කලහකාරී හිංසනය දක්වා ව්‍යාප්ත වේ. දේශපාලනඥයින්, ව්‍යාපාරිකයින් සහ සටන්කාමී පිරිස් පුද්ගල සිද්ධීන් ගෙන් අවස්ථාවාදී අයුතු ප්‍රයෝජන ගන්නවුන් අතර ප්‍රමුඛස්ථානය දරති. විශේෂයෙන්, නැගෙනහිර පළාතේ සුළු සිද්ධීන් කලහකාරී හිංසනය දක්වා ව්‍යාපත්වීමේ ප්‍රවනතාවක් පවතී. ජන කොටස් අතර කාලයක් මුළුල්ලේ පවත්නා අවිශ්වාසය මෙයට හේතු වී තිබේ. ජනවාර්ගික කණ්ඩායම් දෙකක් අතර ඇති වන සුළු සිද්ධියක් ජාතිවාදී ආරවුලක මුහුණුවරක් ගන්නා අතර එවැනි සිද්ධීන්වලට ප්‍රතිචාරය දක්වන්නේ ද ජාතිවාදී ස්වරූපයෙනි. ගැටුම් නිරාකණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය එකිනෙකට සමාන ක්‍රියාදාමයන් අනුගමනය කරන බව ආරවුල් නිරවුල් කිරීමේ විවිධ අවස්ථාවලින් පෙන්නුම් කෙරේ. ආරවුල්වලට මැදිහත් වූ පාර්ශ්ව තම ආරවුල් සම්බන්ධයෙන් පත්කර ඇති මණ්ඩලවලට හෝ නායකයින්ට වාචිකව හෝ ලිඛිතව වාර්තා කරති. පිටිසරබද කුඩා ගම්වල ප්‍රජා ගැටුම් සහ ආරවුල් බෙහෙවින් බහුලය. සමහර ගැටලු අවස්ථාවලට විවිධ යාන්ත්‍රණ මඟින් පිහිට සැලසෙයි.

සාමාන්‍යයෙන් ගැටලු නිරාකරණය සඳහා මැදිහත්වීම හා බේරුම් කිරීම සුපුරුදු ප්‍රවේශයන් වී තිබේ. කවුරුත් දන්නා පරිදි ප්‍රථමයෙන් පැමිණිල්ල විභාගයට ගනිමින් අදාල පාර්ශ්වයන් තනිව හෝ වෙන් වශයෙන් කැඳවනු ලැබේ. ඉන්පසු ආරවුලට සම්බන්ධ වූවන් විසින් හෝ, ඔවුන් වෙනුවෙන් හෝ විසඳුමකට එළඹෙනු ලැබේ.

## ගැටුම් විසඳීමේ විවිධ අවිධිමත් යාන්ත්‍රණ මඟින් නොයෙක් ආරවුල් විසඳනු ලැබේ.

මායිම් ආරවුල් සාමාන්‍යයෙන් ග්‍රාම සේවක විසඳයි. එහෙත් හිරිහැර කිරීම් වැනි සිද්ධීන් ආගමික සංවිධාන, කාන්තා වැඩසටහන් භාරව කටයුතු කරන ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන, හෝ එල්ටීටීඊ සංවිධානයේ අවධානයට යොමු කරනු ලැබේ. ගැටලු නිරන්තරයෙන් ම පුද්ගලයින් දෙදෙනකුගේ සහභාගීත්වයෙන් නිරාකරණය කෙරේ. මිනිසුන් ආරවුල් නිරාකරණය සඳහා යොදාගන්නා යාන්ත්‍රණ කලාපීය වශයෙන් වෙනස් ස්වරූපයක් දරති. තමන්ගේ වාසිය තකා ආරවුලකට කොටු වූ පිරිස් විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරති. විධිමත් හෝ අවධිමත් වශයෙන් ඔවුහු වෙනසක් නොදක්වති.

ආරවුලකට සම්බන්ධ වූ පිරිස් එය විසඳා ගැනීම සඳහා විවිධ පුද්ගලයින්ගේ හෝ ආයතනවල සහනය අපේක්ෂා කිරීමේ දී වාර්ගිකත්වය, ආගම, ගම්සභා සතු හැකියාව, කුලය, ආරවුලේ ස්වභාවය, එල්ටීටීඊයේ බලය, පොලීසිය හා අධිකරණයේ සහනය පැතීම සහ ගමේ සමිති සමාගම් කෙරෙහි වාර්ගික අර්බුදය බලපා ඇති අයුරු යනාදී කරුණු බෙහෙවින් බලපානු ඇත. ජනතාව ආරවුල් විසඳා ගැනීමේ යාන්ත්‍රණයක් තෝරාගැනීමේදී ඒ කෙරෙහි තැබිය හැකි හුදු විශ්වාසය පදනම් කරගෙනය තීරණයක් ගනු ලබන්නේ. ආරවුල් විසඳීමේ අවිධිමත් ක්‍රියාවලිය කෙරෙහි මනාපය දක්වන්නේ ද, විධිමත් යාන්ත්‍රණයන් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන බවට ඔවුන් තුළ ඇති විශ්වාසය නිසාම ය.

ගැටලු සහ ආරවුල් වෙනස් මුහුණුවරක් ඇරීම, එල්ටීටීඊය හිස එසවීම සහ අර්බුදය හේතුවෙන් බලතුලනය වෙනස්වීම යනාදී කරුණු නිසා ස්වකීය ආරවුල් විසඳා ගැනීම සඳහා කවර යාන්ත්‍රණයක් සුදුසු ද යන්න තෝරා ගැනීමේ දී සටන් විරාම ගිවිසුමෙන් ජනතාවට විවිධ බලපෑම් සිදු වී ඇත.

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයේ සාර්ථකත්වය තක්සේරු කිරීම.

යම් ප්‍රදේශයක හටගත් කිසියම් සුවිශේෂ ගැටලුවක් විසඳූ පමණින් ම, ඒ සඳහා යොදා ගන්නා ලද යාන්ත්‍රණය පොදුවේ ගැටුම් නිරාකරණය කරගැනීමට සමත් ක්‍රමයක් ලෙස සැලකිය නො හැකි ය.

සමහර අවස්ථාවල ගැටලුව සාර්ථක අයුරින් විසඳුවා විය හැකියි. එහෙත් විසඳීමේ දී අනුගගමනය කළ ක්‍රියාමාර්ගය සහ එහි අවසාන ප්‍රතිඵලය, යුක්තිය

හා සාධාරණත්වය පිළිබඳ මූලධර්ම, අපක්ෂපාතීත්වය, සුජාත භාවය, මනාපය පළකිරීමේ නිදහස හා නියෝජිතත්වය යනාදී අවශ්‍යතා උල්ලංඝනය කිරීමට සමත්වූවා විය හැකියි.

නායකත්වය ඉතා වැදගත් අංගයකි.

ගමේ නායකයින් සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යනාදී තනතුරු දරණ හෙයින් ගැටුම් නිරීක්ෂණය කිරීමේ අවිධිමත් ක්‍රමෝපායන් වශයෙන් සැලකෙන රාජ්‍ය නොවන සංවිධාන විසින් ආරම්භ කර ඇති කමිටු හෝ ගම්සභා වෙත ගම්වැසියෝ සිය කැමැත්ත දක්වති. ඒ ගැටුම් නිරාකරණය කිරීමේ බලතල ඒවා වෙත පැවරී තිබීම නිසා විය හැකියි. ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රියාවලියේ දී මැදිහත්වීම සහ බේරුම් කිරීම යන ක්‍රමෝපායන් යොදා ගැනීම නිසා ඔවුන්ට විවිධ ගැටලු හෝ සංකූලතාවලට මුහුණ දීමට සිදුවේ.

ප්‍රශ්නය වී ඇත්තේ ගැටුම් නිරවුල් කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය ජනතාව වඩාත් ප්‍රිය කරනු ලබනුයේ ඒවායේ නිලතල තමන් හොඳින් දන්නා අඳුනන ගමේ ප්‍රභූන් පිරිසක් විසින් දරණ නිසාද යන්නයි. එහෙත් ආධාර සපයන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවලට එක්තරා ගැටලුවකට මුහුණ පෑමට සිදු වී ඇත. එනම් ගමේ නායකයින් වෙනුවට, ඔවුන් කෙරෙහි ජනතාව දක්වන සැලකිල්ල හා ගෞරවය එයාකාරයෙන්ම ලබාගත නොහැකි වුව ද “නියෝජිත සභා” වැනි විකල්ප ආයතන පිහිටුවිය යුතුද යන්නයි.

යුද්ධය නිසා අවතැන් වූ ජනකොටස් අතර මෙබඳු ප්‍රශ්න පැනනැඟීමට එතරම් ඉඩකඩක් නැත.

ආරවුල් නිරාකරණය කිරීමේ ආයතන ගමේ නායකයින්ගේ අභිමතයට යටත් විය හැකි ය යන පසුබිම තුළ, ඔවුන් එම තනතුරුවලට පත් කිරීමේ දී වගකිව යුත්තන් වඩාත් කල්පනාකාරී වීම වැදගති.

එල්ටීටීඊයේ ආධිපත්‍යය හමුවේ, විශේෂයෙන් විවාදයට ලක්වී ඇති ගැටලු නිරාකරණය කිරීමේ දී සුපුරුදු ක්‍රමෝපායන් බල රහිත තත්ත්වයකට පත්ව ඇත.

ගමේ ආරවුල් විසඳීමේ අවිධිමත් යාන්ත්‍රණය දේශපාලන බලපුළුවන්කාරකම් නිසා දුබල වී ඇත. සමිති සමාගම්, ගමේ ප්‍රභූන් සහ රාජ්‍ය නොවන සංවිධාන පවා විශේෂයෙන් වාර්ගික ගැටලු ඇතුළු වෙනත් ආරවුල් විසඳීම සඳහා ඉදිරිපත්වීමට මැලිකමක් දක්වති. ඒ පසුව මුහුණ දීමට සිදුවන දුර්විපාක නිසායි.

ගමේ ආරවුල් නිරාකරණය සඳහා පිටතින් හඳුන්වා දී ඇති යාන්ත්‍රණ මහත් ගැටලුවලට මුහුණපා සිටියි. එහි තිරසාර පැවැත්ම හා අසාර්ථකත්වය වැදගත්

ප්‍රශ්න වී තිබේ. රාජ්‍ය නොවන සංවිධාන විසින් විහිදුවන ලද ඇතැම් කමිටු ගැටුම් නිරාකරණයේ දී අසමත් වී ඇතත්, ප්‍රජා අවශ්‍යතා සපුරාලීමට සමත් වී ඇති බව පර්යේෂණ මගින් හඳුනාගෙන තිබේ. දිස්ත්‍රික්කය අනුව මෙම තත්ත්වය වෙනස් වේ. සමහර රාජ්‍ය නොවන සංවිධාන දැනට ගම තුළ ක්‍රියාත්මක වෙමින් පවතින ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා සමිති යනාදියේ නිලධාරීන් යොදාගනිමින් නව කමිටු පිහිටුවති. අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන පොදු ප්‍රශ්න සහ අන්තර් ප්‍රජා සම්බන්ධතා සාකච්ඡා කිරීම සඳහා දැනට ගමේ ක්‍රියාත්මක වෙමින් පවතින සංවිධාන හෝ ඒවායේ නියෝජිතයින් යොදාගනිති.

රාජ්‍ය නොවන සංවිධාන විසින් හඳුන්වා දී ඇති කමිටු හුදෙක් සුළු සුළු ගැටලු නිරාකරණය කිරීමට සම්බන්ධ වුවද, දේශපාලන හා වාර්ගික මතභේද හමුවෙහි පසුබෑමකට ලක්ව ඇත. විශේෂයෙන් ආධාර සපයන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ස්ථාපනය කර ඇති කමිටු ඇතුළු පිටතින් හඳුන්වා දී ඇති වෙනත් ආයතනවල පසුබෑමට ප්‍රධාන වශයෙන් සාමය ස්ථාපනය කිරීමේ දී ඇති වන සුපුරුදු දුෂ්කරතා, ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින රාජ්‍ය නොවන සංවිධානවල දුර්වල ක්‍රියාකලාපය සහ ආධාර සපයන ආයතන වෙතින් ඇති වන බලපෑම් සහ අපේක්ෂා යන කරුණු තුන හේතු වී ඇති බව සොයා ගෙන තිබේ.

බොහෝ ගැටලු ජාතිවාදී ප්‍රශ්නවලට සම්බන්ධ වී ඇති නිසාත්, ඒවා දීර්ඝකාලීන අරගලවලට පාදක වී ඇති නිසාත්, කවර ආකාරයේ හෝ ගැටලු නිරාකරණය කිරීමේ යාන්ත්‍රණ මගින් සාර්ථක ප්‍රතිපල ලබාගැනීම බෙහෙවින් අපහසු වී තිබේ. රාජ්‍ය නොවන සංවිධාන තුළ පවත්නා ගැටලු සහ එම ආයතන ක්‍රියා කරන ආකාරය, පිටතින් හඳුන්වා දී ඇති ආයතන කෙරෙහි මහත් බලපෑමක් ඇති කරයි. එසේ ම රාජ්‍ය නොවන සංවිධාන සතු තමන්ගේ ම දේශපාලන හා සමාජීය න්‍යායපත්‍රය සහ අගතීන් හෝ පූර්ව විනිශ්චයක් ("සංවර්ධන" ක්‍රියාකාරකම් සඳහා ඔවුන් අනුගමනය කරන ප්‍රතිපත්තිවලින් මෙය මනාව තහවුරු වේ.) නිසා තත්ත්වය තවත් උග්‍ර වී තිබේ.

වඩාත් තාත්වික හා ලිඛිත ව්‍යාපෘති හෝ කඩිනම් අවශ්‍යතා වෙනුවට හුදෙක් ආධාර ලැබීමට සුදුසු ය විශ්වාස කරන වැඩසටහන් හෝ ව්‍යාපෘති පමණක් තෝරාගැනීමට රාජ්‍ය නොවන සංවිධාන පෙලඹී සිටිති. එයට හේතු වී ඇත්තේ රාජ්‍ය නොවන සංවිධානවලට පිටතින් ලැබෙන ආධාර මත රැඳී සිටීමට සිදුවීම ය.

මෙරට රාජ්‍ය නොවන සංවිධාන ප්‍රසිද්ධියේ පවසන දේත්, ප්‍රායෝගිකව ඔවුන් වෙතින් සිදුවන දේත් අතර වෙනසක් දක්නට ඇත. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන තුළ ඍජු භාවය සහ සමාජ වගකීම දක්නට නැත. නිදර්ශනයක් වශයෙන් රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පත් කරන ලද කමිටුවකින්

ත්‍රිකුණාමල ප්‍රදේශයේ එක්තරා සිද්ධියක් සාර්ථකව නිරවුල් කළ බවට කළ ප්‍රකාශය පුස්සක් වී ඇති බව සොයා ගෙන ඇත. බොහෝ සිද්ධීන්වල දී රාජ්‍ය නොවන සංවිධාන කියන කරන දේ අතර විශාල වෙනසක් දක්නට ඇති අතර ඔවුහු හුදෙක් තම ක්‍රියාකාරකම් අතිශයෝක්තියෙන් හඬනගා කීමට පුරුදු වී සිටිති. ගැටුම් නිරාකරණයේ දී පිටතින් හඳුන්වා දී ඇති යාන්ත්‍රණ අසමත්වී තිබේ. සාමය උදා කරලීමේ කාර්යයේ දී අපේක්ෂාවෙන් සහ ප්‍රමිතීන් අනවශ්‍ය ලෙස පරමාදර්ශී මට්ටමින් උපකල්පනය කිරීම මෙයට ප්‍රධාන හේතුව වී ඇත. ආධාර සපයන ආයතන මෙරට රාජ්‍ය සංවිධානවල කටයුතු වඩාත් පරීක්ෂාවට ලක් කරන්නේ නම් එමඟින් සාධනීය ප්‍රතිඵල ලබාගැනීමට හැකිවනු ඇත.

ගැටුම් නිරාකරණය සඳහා පිටතින් හඳුන්වා දී ඇති ආයතන සතු අඩුපාඩු තිබුණ ද, ඒවායෙන් සැලසෙන සේවය සුළු කොට තැකිය නො හැකි ය.

# 1. නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය පිළිබඳ කෙටි විස්තරයක්

ප්‍රායෝගික වශයෙන් මෙම යාන්ත්‍රණය වෙතින් ඒකාකාරී ස්වරූපයක් පිළිබිඹු කෙරේ. ඇතැම් අවස්ථාවලදී විවිධ වෙනස්කම් නිරීක්ෂණය වේ.

## 1.1 කුමන මාදිලියේ ගැටුම් ද?

ගැටුම් පවුලට සීමා වූ, ගමට සීමා වූ සහ ගම් අතර වශයෙන් ත්‍රිවිධාකාර ය. ගෘහස්ත හිංසනය, අඹු-සැමි ආරවුල්, පාරදාර සේවනය, මත්පැන් ආශ්‍රිත දූෂණ, දරුවන්ගේ සහ පවුලේ නඩත්තු ගෙවීම්, ලිංගික දූෂණය, ව්‍යාභිචාරය සහ දේපල උරුම පිළිබඳ මතභේද පවුලේ ආරවුල් වශයෙන් ගැනේ.

ගම තුළ හටගන්නා ආරවුල්වලට පුද්ගලයින්, පවුල් හෝ ගමේ සියලු වැසියන් හෝ ඉඩම් මායිම් පිළිබඳ මතභේද, ඉඩම් ගැටලු, ණයට ගත් මුදල් ආපසු නොගෙවීම, ණය තුරුස් පිලිබඳ ගැටලු, උගස් කරන ලද බඩු භාණ්ඩ නිදහස් කරගැනීම ආපහසු වීම තරුණ හිංසනය කලහාකාරී ක්‍රියා, කාන්තාවන්ට හිරිහැර කිරිම, හොර මත්පැන් නිෂ්පාදනය සහ පාවිච්චිය, කුල ගැටුම් සහ වාර්ගික ගැටලු හා විවිධ ගණයේ විෂමතාවන් ද ඇතුළත් වේ.

ගම් ඇතුළත හෝ සමස්ත ගම්මානයන්හී ක්‍රියාත්මක වන කුඩා කණ්ඩායම්, හිංසාවාදී සිද්ධීන්, ඉඩම් ආරවුල්, සම්පත් භුක්ති විඳීමට එරෙහිවීම්, වෙළඳ පළ, ප්‍රසිද්ධ මාවත්, ව්‍යාපාරික ප්‍රදේශ සහ වෙනත් භූමි ප්‍රදේශ, කෘෂි ඉඩම් හා ධීවර ප්‍රදේශවල බලෙන් පදිංචි වීම, කුල සහ වාර්ගික ගැටුම් සහ පිටතින් පැමිණ ගම්වල පදිංචි වීමේ දී ගම්වාසීන් දක්වන ප්‍රතික්‍රියා නිසා ඇතිවන මතභේද ගම් අතර හටගන්නා ආරවුල් වශයෙන් සැලකිය හැකි ය.

ගෙදර දොරේ සිදුවන සාපරාධී නොවන හිංසන ක්‍රියා (කාන්තාවන් හා ළමුන් සම්බන්ධ වන) අවිධිමත් යාන්ත්‍රණ හරහා නිරවුල් කරනු ලැබේ.

ගම් ප්‍රදේශවල ජනතාවට මුහුණ පෑමට සිදු වී ඇත්තේ හුදෙක් ආරවුල්ම පමණක් නො වේ. මූලික අවශ්‍යතා සපුරාලීම, හව්හරණක් නොමැති වීම, ආදායම් ඉපයීමේ මාර්ග, ආරක්ෂාව සැලසීමේ මාර්ග, පාසල්, නිවාස, සෞඛ්‍ය පහසුකම්, නැවත පදිංචි කිරීම සඳහා ආධාර දීම සහ පෞද්ගලික ඉඩකඩම්වල හමුදාව හෝ වෙනත් පුද්ගලයින් පදිංචි වී සිටීම යනාදී ප්‍රශ්න ප්‍රමුඛස්ථානය ගනියි. සම්පත් ප්‍රයෝජනයට යොදාගැනීම සඳහා තරග වැදීම කලහාකාරී තත්ත්වයන්ට මග පාදන්නකි.

ඉඩම් අහිමි හෝ වෙනත් අයගේ ඉඩම්වල පදිංචි වී සිටින පුද්ගලයින්ට විකල්ප ඉඩම් සැපයිය යුතු වේ.

සාම වැඩසටහන් සාර්ථක වීමට නම් සහන සැලසීම, පුනරුත්ථාපනය සහ සම්පත් සංවර්ධනය කිරීම අවශ්‍යම ය.

### *සිද්ධීන් උග්‍ර අතට පත්වන්නේ කෙසේ ද?*

සාමාන්‍ය සිද්ධීන් කලහකාරී හිංසනය දක්වා වර්ධනය වීමේ දී දේශපාලනය සහ කණ්ඩායම් අනන්‍යතාව බොහෝ දුරට වගකිව යුතු වේ. කේවල සිද්ධීන් දඩමීමා කරගනිමින් දේශපාලනඥයින්, ව්‍යාපාරිකයින් සහ සටන්කාමීන් ක්‍රියා කළ අයුරු පුත්තලම, මූතූර්, යාපනය සහ වාලච්චේනේ දී කරන ලද සම්මුඛ පරීක්ෂණ වලද හෙළිදරව් විය. පුත්තලමේ කණ්ඩායම් දෙකක් අතර වූ සුළු සිද්ධියක දී පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ඔවුන් ගේ අනුගාමිකයෝ ඊට සම්බන්ධ වූ හ. ගමේ ව්‍යාපාරිකයින් සිය ගම් පෙදෙස්වල ආර්ථික වශයෙන් තම ආධිපත්‍යය පිහටුවීමට තැත්කිරීම නිසා සුලු සිද්ධීන් පවා උග්‍ර තත්ත්වයට පත් වේ. වාර්ගික ජන කොටස් අතර පවත්නා අනවබෝධය සහ අවිශ්වාසය නිසා නැගෙනහිර පළාත විවිධ ගැටුම්වලට තෝතැන්නක් වී ඇත. සුළු සිද්ධීන් පවා ජනවාර්ගික ගැටුමක ස්වරූපය ගනියි. යම් සිද්ධියක් වූ විට ඉන් විපතට පත් ජන කොටස් එයට විවිධාකාරයෙන් පුළුල් ප්‍රචාරයක් ලබා දෙයි. එය හමාර වන්නේ ප්‍රදේශය පුරා පැතිරෙන හර්තාලයක් මගිනි. එවැනි හර්තාල් ව්‍යාපාරයක බලපෑම අන්‍ය දිස්ත්‍රික්ක කරාද පැතිරේ. එල්ටීටීඊය සම්බන්ධ සිද්ධීන් ද මෙබඳු ස්වරූපයක් ගනී.

ජන කොටස් අතර සැඟවී පවත්නා එදිරිවාදී කම් නිසා පුත්තලම වැනි ප්‍රදේශයක ඇතිවන කේවල සිද්ධියක් හුදෙක් සිංහල - මුස්ලිම් හෝ පිටතින්

පැමිණි පදිංචි වී සිටින පවුල් සහ ගමේම පවුල් අතර ඇති ව ආරවුලක් වශයෙන් අර්තකථනය කළ හැකි ය. එබඳු ආරවුල් එම ස්වරූපයෙන් ම අනෙක් ප්‍රදේශ කරාද පැතිරීමට ඉඩකඩ ඇත.

## 1.2 ගැටුම් නිරවුල් කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයේ අවධානයට ගැටලු ලක්වන්නේ කෙසේ ද?

### පොදු දැනුම :

ගම්වල ගැටලු සහ ආරවුල් සාමාන්‍ය සිද්ධීන් වේ. එහෙත් හුදෙක් කටකතා නිසා ඒවා දසත ව්‍යාප්ත වේ. ගමේ ආගමික ස්ථාන, කඩසාප්පු, ප්‍රජා මධ්‍යස්ථාන සහ මුහුදු වෙරල ප්‍රජා තොරතුරු හුවමාරු මධ්‍යස්ථාන මෙන් ම ගැටලු නිරාකරණය කිරීමේ මධ්‍යස්ථාන ද වේ. ගෙදරක සිදු වන අපචාර ක්‍රියාවක්, ගම් වැසියන්ගේ අවධානයට ලක්වීම සුලබ සිද්ධියකි.

### වාචික හා ලිඛිත පැමිණිලි

ගැමියෝ තම ගැටලු වාචික හෝ ලිඛිත අයුරින් ඉඩකඩ සලසා ඇති පරිදි ආරවුල් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය වෙත යොමු කරති. මුස්ලිම් දේවස්ථානවල ක්‍රියාත්මක වන කමිටු වාචික පැමිණිලි බාර ගෙන ඒවා ඉදිරිපත් කිරීමට කටයුතු සලසති. සමහර ආගමික ආයතන පැමිණිලි ලිඛිතව ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙති.

### ආරවුල් යොමුකිරීම

විධිමත් හෝ අවිධිමත් ආයතන හරහා ගැටලු නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය වෙත ආරවුල් යොමු කළ හැකි ය. නිදසුනක් වශයෙන් සාපරාධී නොවන ක්‍රියා පොලිසිය විසින් ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ගම් සභාව වෙත යොමු කරනු ලැබේ. ක්ෂේත්‍ර නිලධාරීහු ද මෙම ක්‍රියාදාමය අනුගමනය කරති.

## 1.3 ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය මගින් ආරවුල සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ කෙසේ ද?

### විමර්ශණය සහ පරීක්ෂණය

පැමිණිල්ලක් ලද විට ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයට සම්බන්ධ සාමාජිකයෝ ඒ ගැන පරීක්ෂා කර බලති. අදාල පාර්ශ්වයන්ට

කැඳවීමක් කරන අතර, අවශ්‍ය තන්හිදී ඔවුන් හමුවීමට යනු ඇත. ගෘහස්ථ ආරවුල් විසඳීමට කමිටු සාමාජිකයින් කීප දෙනෙක් පමණක් සහභාගී වෙති. ඒ රහස්‍යතාව ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙනි.

### පාර්ශ්වයන් කැඳවීම

පරීක්ෂණයක් සඳහා හෝ දෙපාර්ශ්වය එකිනෙකා මුණගස්වා අර්බුදය නිරාකරණු වස්, අදාල පාර්ශ්වයන් කැඳවනු ලැබේ.

### මැදහත්වීම හෝ බේරුම් කිරීම

දෙපක්ෂය මුණගස්වා ඔවුන් අතර සාකච්ඡා පැවැත්වීමට පහසුකම් සැලසීම මඟින් එකඟත්වයක් කරා ගෙන ඒම හෝ ගැටුම් නිරවුල් කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය විසින් ම විසඳුමක් නිර්මාණය කොට පාර්ශ්වයන් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

### තීරණයක් ගැනීමෙන් පසු මතු වන විකල්පයන්

තීරණයකට එළඹීමේ දී පාර්ශ්වයන් එකඟත්වයකට පත් නොවන්නේ නම් ඔවුන් වෙනත් විනිශ්චය මණ්ඩලයක් වෙත යොමු කෙරෙනු ඇත. එසේ නොමැති නම් ඔවුහු තම මනාපය පරිදි වෙනත් මාවතකට යොමු වනු ඇත. නඩුවක දී ගමේ විනිශ්චය මණ්ඩලය දුන් තීරණයට එරෙහිව යම් පාර්ශ්වයක් පොලීසියේ උපකාරය පතනු ඇත.

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාවලියට සම්බන්ධ වී සිටින සාමාජිකයින්ට මැදිහත්වීම හා බේරුම් කිරීම වැනි විෂයන් පිළිබඳ නිපුණතා නොමැති අතර පොදු දැනුම හා සමාජ යුක්තිය පිළිබඳ මූලධර්මයන් පමණක් අනුගමනය කිරීමට පුරුදුව සිටිති.

## 1.4 සහනය සලසන යාන්ත්‍රණ

### කුමන ගැටලු තම අවධානයට ලක් කරනු ලබන්නේ ද?

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය යටතේ ආරවුලකට සම්බන්ධ වූ දෙදෙනකු හෝ දෙපාර්ශ්වයක් විසින් ගැටලුව සමහන් කරගනු ලබන අතර, තුන් වැනි පාර්ශ්වයක මැදහත් වීමක් සිදු නො වේ. අර්බුදයට

සම්බන්ධ වූ පාර්ශ්වයන් ස්වෝත්සහයෙන් ගැටලුව ලිහාගැනීමට පෙළඹෙති.

නිදර්ශණයක් වශයෙන්, ඉඩම්වල පදිංචිය පිළිබඳ ප්‍රශ්නවල දී බොහෝ විට, ඉඩම් අයිතිකරු සහ පදිංචිකරු විසින් යම් යම් කොන්දේසි මත තීරණයකට එළඹෙති.

**<u>ක්ෂේත්‍ර කටයුතු වලදී අත්දුටු ආරවුල් සහ ඒවා නිරාකරණය කරගැනීම සඳහා පාර්ශ්වකරුවන් විසින් යොදා ගනු ලැබූ යාන්ත්‍රණ</u>**

| ආරවුලේ ස්වභාවය | සහනය අපේක්ෂා කරන ලද මූලික යාන්ත්‍රණ |
|---|---|
| ලිංගික දූෂණය, ව්‍යාභිචාරය | ක්ෂේත්‍ර නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන, එල්ටීටීඊය සහ පොලීසිය |
| දේපොල උරුමය | ග්‍රාමසේවක, පවුලේ වෘධයන්, ගමේ/ආගමික කමිටු, සාම මණ්ඩල |
| විවාහයට සම්බන්ධ | ගමේ/ආගමික කමිටු, කාන්තා කණ්ඩායම්, රාජ්‍ය නොවන සංවිධාන, පවුලේ වෘධයින් |
| ඉඩම්වල පදිංචිය | ග්‍රාමසේවක, එල්ටීටීඊය, මුස්ලිම් කමිටු, පොලීසිය, අධිකරණය |
| වැටවල් පිළිබඳ ආරවුල් | ග්‍රාමසේවක, ගමේ/ආගමික කමිටු |
| කසිප්පු | සියලුම දෙනා |
| නඩත්තු | ආගමික කමිටු, ග්‍රාමසේවක, අධිකරණය |
| හිරිහැර කිරීම | ආගමික කමිටු, එල්ටීටීඊය |
| තරුණ හිංසනය | ආගමික කමිටු, එල්ටීටීඊය, පොලීසිය |
| මුදල් ගනුදෙනු | ගමේ/ආගමික කමිටු, ග්‍රාමසේවක |
| වාර්ගික කණ්ඩායම් අතර හිංසනය | සාම කමිටු,ආගමික කමිටු සහ නායකයින්, එල්ටීටීඊය, පොලීසිය, හමුදාව, දේශපලනඥයින්, මානව හිමිකම් කමිටු, ශ්‍රී ලංකා සටන් විරාම කමිටු |

| ආරවුලේ ස්වභාවය | සහනය අපේක්ෂා කරන ලද මූලික යාන්ත්‍රණ |
|---|---|
| එල්ටීටීඊය සම්බන්ධ ආරවුල් | එල්ටීටීඊ, සාම කමිටු, ආගමික කමිටු සහ නායකයින්, පොලීසිය, හමුදාව, දේශපාලනඥයින්, මානව හිමිකම් කමිටුව, ශ්‍රී ලංකා සටන් විරාම කමිටුව |
| වාරිමාර්ග | ග්‍රාමසේවක, ජල ඒජන්ත, එල්ටීටීඊය |
| සන්නද්ධ හමුදා අඩංගු ආරවුල් | හමුදාව, සාම කමිටු, ආගමි කමිටු සහ නායකයින්, රාජ්‍ය නොවන සංවිධාන, දේශපාලනඥයින්, මානව හිමිකම් කමිටුව, ශ්‍රී ලංකා සටන් විරාම කමිටුව |
| කෘෂිකර්ම | ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රජා මධ්‍යස්ථාන, රාජ්‍ය නොවන සංවිධාන විසින් පිහිටුවා ඇති ප්‍රජා මූලික සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ ග්‍රාමසේවක |
| ධීවර ගැටලු | ධීවර සමිති, ධීවර සමූපකාර සමිති, ග්‍රාමසේවක, ආගමික කමිටු සහ ප්‍රජා මධ්‍යස්ථාන |

තම අභිලාෂයන් ඉටු කර ගැනීම සඳහා ආරවුල්වලට මැදි වූ පිරිස් විවිධ ක්‍රමෝපායන් වෙත නැඹුරුවීම සුලබ දර්ශනයකි.

## 1.5 කවුරුන් වෙත යා යුතු දැයි ජනතාව තීන්දු කරන්නේ කෙසේද?

අතෘප්තියට පත් පාර්ශ්වයන් සරණ පතා කුමන යාන්ත්‍රණ වෙත ප්‍රවිශ්ට වන්නේ ද යන්න තීරණය කරනු ලබන සාධක නම් : ආරවුලේ ස්වභාවය, අධිකාරී බලය සහ ගමේ කමිටු සතු ශක්තිය, පාර්ශ්ව කරුවන්ගේ වාර්ගිකත්වය සහ ආගම, එල්ටීටීඊයේ බලපෑම, පොලිස් සහ අධිකරණ ක්‍රියාවලියට පිවිසීම, සහ ප්‍රාදේශිය සමාජ දේශපාලන පසුබිම කෙරෙහි ගැටුම මඟින් සිදු කරන බලපෑම් යනාදියයි.

මේ කරුණු වෙන් වෙන් වශයෙන් පහත විස්තර කර තිබේ.

### පොලීසිය සහ අධිකරණ ක්‍රියාවලිය වෙත පිවිසීම

මෙම ආයතන විශාල වශයෙන් නාගරික පසුබිමකට මැදි වී සිටින හෙයින් ගැමි ජනතාව සරණ සොයා ඒ වෙත යාමට මැලිකමක් දක්වයි. ගමනාගමන අවහිරතා, නඩුකීම සඳහා වැය වන අධික මුදල් ප්‍රමාණයන්, දූෂණය, නඩු

ගොඩගැසී තිබීම හා කල් ගතවන අධිකරණ ක්‍රියාවලිය ගැමි ජනතාව නඩු මගට නොයැමට තුඩු දෙන සාධකයෝ ය.

## ආරවුලේ ස්වරූපය

පවුලේ ආරවුල් ප්‍රජාව තුළ දී ම ආගමික කමිටුවල අධීක්ෂණයට ලක්වේ. ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් අදාල පාර්ශ්ව ග්‍රාමසේවක හෝ වෙනත් නිසි බලධාරීන් වෙත යොමුවෙති.

## ගම්සභා සතු ශක්තිය

පිටතින් පවුල් පැමිණ පදිංචිවීම නිසා මුල් ස්වරූපය වෙනස් වූ ගම්වල ගම් සභා වෙත ආරවුල්වලට සම්බන්ධ පාර්ශ්වයන්ගේ පැමිණීම දුලබ ය. ප්‍රදේශයේ නායකයින් විසින් පවත්වා ගෙන යනු ලබන කමිටු මෙන් නො ව බාහිර වශයෙන් ස්ථාපනය කරන ලද කමිටුවල සුජාත භාවය සහ අධිකාරී බලය (වඩාත් පුළුල් අයුරින් නියෝජනය වී තිබුණ ද) ඌණ බැවින් වඩා වැදගත් කරුණු වල දී ඒවාට කොන් වී සිටීමට සිදු වී තිබේ. (4 වැනි කොටස බලන්න)

## වාර්ගිකත්වය සහ ආගම

ගැටුමක පාර්ශ්ව කරුවන් මනාපය පළ කරන යාන්ත්‍රණය සැලකිය යුතු ප්‍රමාණයකට වාර්ගිකත්වය හා ආගම යන කරුණු වෙතින් තීරණය වේ. දෙමළ ජනතාව පොලීසිය වෙත යනවා වෙනුවට එල්ටීටීඊය වෙත යැමත්, මුස්ලිම් ජනතාව තම දේවස්ථාන කමිටුව වෙත සරණ සොයා යැමත් නිදර්ශන වශයෙන් දැක්විය හැකි ය. සිංහල ජනතාවට පොලීසිය සහ හමුදාව හුරු පුරුදු තැන් ය. පවුලේ ප්‍රශ්නවල දී අදාල පුද්ගලයින් තව නියෝජිතයින්ගේ පිහිට පතනු ඇත.

## එල්ටීටීඊ නියෝජනයේ ප්‍රබලත්වය

රජයේ පාලනය පවතින පෙදෙස්වල ආරවුලට මැදිවූ දෙමළ ජනයා එල්ටීටීඊයේ දේශපාලන කාර්යාල වෙත සරණ පතා යති. මෙයට හේතු වශයෙන් ඔවුන් පෙන්වා දෙන්නේ පොලීසියේ සාර්ථකත්වය සහ ඍජු භාවය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි බව සහ භාෂාව පිළිබඳ ගැටලුවයි. අනෙකුත් පිරිස් එල්ටීටීඊය වෙත ප්‍රවේශ වනුයේ එල්ටීටීඊය ආරවුලේ පාර්ශ්වකරුවකු වීම හෝ ගැටලුව විසඳීමට එල්ටීටීඊයට හැකියාව ඇති ය යන විශ්වාසය නිසා ය. එල්ටීටීඊය විසින් පලවා හරින ලද මුස්ලිම් ජනතාව ආපසු පැමිණ සිය දේපල, ඉඩකඩම් ලබාගැනීමේ දී මතුවන දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා එල්ටීටීඊය වෙත යැමට සිදුවීම නිදර්ශනයක් වශයෙන් පෙන්වා දිය හැකි ය.

## ප්‍රදේශයේ සමාජ - දේශපාලන පසුබිම කෙරෙහි අර්බුදයෙන් අති වන බලපෑම

ජනතාව තවත් අර්බුදයකට මුහුණ දුන් ආකාරයෙන් ම, ඉන්පසු පැනනඟින සිද්ධීන් කෙරෙහි විවිධාකාරයෙන් ප්‍රතිචාරය දක්වයි. සහනය අපෙක්ෂා කරයි. නිදර්ශනයක් වශයෙන්, 1995ට පෙර යාපන ජනතාව තම ආරවුල් සම්බන්ධයෙන් එල්ටීටීඊයේ මැදිහත්වීම අපේක්ෂා කළ හ. එහෙත් යාපනය හමුදාවට යටත් වීමෙන් පසු ඔවුහු හමුදාව දෙසට නැඹුරු වූ හ. එසේත් නැත්නම් අවිධිමත් යාන්ත්‍රණ කෙරෙහි විශ්වාසය තැබූ හ.

සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වීමත් සමගම යාපන වැසියෝ විශාල ලෙස එල්ටීටීඊය වෙත සහනය පතා පැමිණිය හ. සමාජය අවුලට පත්ව, බිඳීයෑම නිසා, ජනතාව සාම්ප්‍රදායික සමාජ සන්ධාන වෙත නැඹුරු වූ අතර, කලින් මෙන් නොව ගමේ ප්‍රධානීන් සහ ග්‍රාම සංවර්ධන සමිති වැනි ප්‍රජා සංවිධාන වෙත උපකාර පතා යෑම අඩුවන්නට විය.

### *ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය වෙතින් සහනය ලබාගැනීමට පෙළඹීම*

ජනතාව සමන්ට විශ්වාසය තැබිය හැකි යාන්ත්‍රණයක් වෙත තම ගැටලුව නිරාකරණය කරගැනීම සඳහා යති. යාපනයේ අවතැන් වූ පිරිස් හා ආපසු ගම්බිම් කරා පැමිණි පිරිස් අතර ඉඩකඩම්වල පදිංචි වීම සම්බන්ධයෙන් අර්බුද පැනනැගුණ විට, නීත්‍යානුකූල අයිතිකරු නීතියේ පිහිට පතන අතර, නීත්‍යානුකූල හිමිකමක් නොමැති පදිංචිකරුවා එල්ටීටීඊයේ උපකාරය පතයි. එබැවින් තම කාර්යය සපුරාගැනීමට හැකිවෙතැ යි යන අපේක්ෂාවෙන් ආරවුලකට සම්බන්ධවූවෝ අවිධිමත් යාන්ත්‍රණයේ පිහිට පතති. එය හුදෙක් ම ක්‍රමෝපායන් සතු අවිධිමත් භාවය නිසා ම නොව, අතෘප්තියට පත් පුද්ගලයාට ඉන් මනා ප්‍රතිචාරයක් ලැබෙන හෙයිනි.

ගැටුම් නිරාකරණයේ අවිධිමත් යාන්ත්‍රණය තෝරාගනුයේ හුදෙක් වඩාත් විධිමත් ක්‍රමෝපායන් වලින් ප්‍රතිචාර ලබාගැනීම අපහසු වීම නිසා ය. දිවයින පුරා ආපසු පැමිණි පවුල් සහ ඔවුන්ගේ ඉඩම් අයිතිකරගෙන සිටින පුද්ගලයින් අතර තලෙයිමන්නාරමේ දී ඇති වූ අර්බුදයක දී, රජයේ බලධාරීන් යුක්තිය පසිඳලීමට අපොහොසත් වීම නිසා ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන්ට රාජ්‍ය නොවන සංවිධානයක සරණ පතා යෑමට සිදු වීම කදිම නිදසුනකි. අතෘප්තියට පත් පාර්ශ්වයන් තම කාර්යය ඉටු කරවා ගැනීම පිණිස විවිධ ආයතන හා පුද්ගලයින් වෙත යෑම අසාමාන්‍ය කරුණක් නො වේ.

# 2. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණ

## 2.1 රාජ්‍ය නොවන සංවිධාන විසින් පිහිටුවන ලද සාමකමිටු

රාජ්‍ය නොවන සංවිධාන රැසක් සාමය ඇති කිරීමේ කටයුතුවල නිරතව සිටිති. මොවුන් ගෙන් බහුතරයක් ආධාර සපයන සංවිධානවල අනුග්‍රහයෙන් පිහිටුවන ලද ඒවා වේ. සාම කටයුතුවල නිරත රාජ්‍ය නොවන සංවිධාන විසින් පිහිටුවන ලද සාම කමිටු වැඩිහරියක් ම ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාවලියේ ම නිරතව නොසිටින අතර සාමය පිළිබඳව දැනුවත් කිරීම, සාම අධ්‍යාපනය, අන්තර් ප්‍රජා සමාජ සහ සංස්කෘතික ක්‍රියාකාරකම් වෙත යොමු වෙමින් සිටිති. ජනතාවට තමන්ගේ ගැටලුවලට විසඳුම් ලබා ගැනීම සඳහා මෙම සාම කමිටුවල සේවය උපයෝගී කර ගත හැකි ය.

රාජ්‍ය නොවන සංවිධාන ඒකවාර්ගික හෝ බහුවාර්ගික ගම්වල එකක් හෝ ඊට වැඩියෙන් 'ගම්සභා' පිහිටුවනු ඇත. සාම කමිටු නියෝජිතයින් ප්‍රජාව විසින් තෝරා පත් කරනු ලැබේ. ඔවුහු විධායක හා පරිපාලනමය කටයුතුවල නිරතව සිටිති. රාජ්‍ය නොවන සංවිධානයක ක්ෂේත්‍ර නිලධාරියා තම සංවිධානයත් ගමේ සාම කමිටුවත් අතර සම්බන්ධතාව පවත්වයි. ඔහු ක්ෂේත්‍රයේ ගැටලු හඳුනා ගෙන ඒවා විසඳාලීමට තම සංවිධානයට උපකාරී වේ.

## 2.2 රාජ්‍ය නොවන සංවිධාන විසින් පිහිටුවන ලද සංවර්ධන සහ වෙනත් කමිටු

සංවර්ධන සහ අනෙකුත් වැටසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන විසින් ගම්සභා පිහිටුවා ඇත. මේවා කාන්තා කණ්ඩායම්, තරුණ

කණ්ඩායම් සහ ඉතිරි කිරීමේ කණ්ඩායම් යනාදියෙන් සමන්විත ය. නිතර ම පාහේ රාජ්‍ය නොවන සංවිධාන විසින් ඔවුන් කලින් පිහිටුවන ලද කමිටු සහ ගම් ප්‍රදේශයේ අනිකුත් කමිටු ඒකාබද්ධ කරමින් මධ්‍යම කමිටුවක් පිහිටුවනු ලබයි. ඒවා ප්‍රජා ගැටලු විසඳීමට උපකාරී වෙයි. තම කාර්ය පථයට පිටින්, හමුදාව සමඟ සම්බන්ධ වෙන කටයුතු ද ඒම කමිටු විසින් කරනු ලබති.

රාජ්‍ය නොවන සංවිධානවල ක්ෂේත්‍ර නිලධාරීහු ක්ෂේත්‍රයේ ගැටලු තම සංවිධාන වෙත යොමු කරති. රාත්‍රි කාලයේ තම බෝට්ටු තහනම් පෙදෙසකට යාත්‍රා කිරීමෙන් පසු ධීවර කාර්මිකයින් රැසක් ප්‍රදේශයේ රාජ්‍ය නොවන සංවිධානයේ මැදිහත්වීම මත ශ්‍රී ලංකා නාවික හමුදා බලධාරීන් වෙතින් එම බෝට්ටු මුදා ගැනීමට සමත් වූ හ.

## 2.3 දේශීය කමිටු

පර්යේෂකයින් සංචාරය කළ බොහෝ ගම් පෙදෙස්වල ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා ග්‍රාම සංවර්ධන සමිති, වී වගාකිරීමේ සමිති, කාන්තා කමිටු, වෙළඳ සංගම්, ධීවර සංගම්, තරුණ කණ්ඩායම්, ක්‍රීඩා සමාජ, ප්‍රජා මධ්‍යස්ථාන, කෘෂි කමිටු යනාදී වශයෙන් බහු විධ ප්‍රජාමූලික සංවිධාන ක්‍රියාත්මක වෙමින් තිබේ. මේවා අතුරින් සමහරක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවා ඇති අතර ඒවා ස්වාධීනව හා රජයේ බලපෑමකින් තොරව මනා අයුරින් තම කාර්යභාරය ඉටුකරයි.

දේශීය ප්‍රජා මූලික සංවිධාන තම පෙදෙස්වල ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාවලියෙහි නිරතව සිටියි. ධීවර කමිටු ධීවරයින්ගේ අර්බුද වලට විසඳුම් ලබාදෙති. යාපනය සහ වන්නිය හැරුණු විට උතුරේ අනාථ වූ දේශවල ග්‍රාම සංවර්ධන සමිති ආරවුල් කිරාතරණයේ කේන්ද්‍රස්ථාන වී ඇත. නාගරික හා අර්ධ නාගරික පෙදෙස්වල ග්‍රාම සංවර්ධන සමිති ක්‍රියාත්මක වන්නේ නැත. මුස්ලිම් පළාත්වල මුස්ලිම් පල්ලි තුළ ක්‍රියාත්මක වන කමිටු විශාල මෙහෙවරක් ඉටු කරති. ප්‍රජා සුබ සාධනය සඳහා ගුරුවරුන්, විදුහල්පතිවරුන්, වෘත්තිකයින්, ආගමික නායකයින් සහ ව්‍යාපාරිකයින් විසින් ආරම්භ කරන ලද දේශීය කමිටු සාමය ඇති කිරීම සහ සමාජ සහ ප්‍රජා සංවර්ධනය කෙරෙහි යොමු වී සිටින අතර, වැදගත් නාගරික පෙදෙස්වල නිරතව සිට තම කටයුතු සාර්ථකව කරගෙන යති. දිස්ත්‍රික්කයේ ගැටලු ඔවුන්ගේ අවධානයට ලක් වේ.

පුත්තලමේ ජනතා කේන්ද්‍රය, යාපනයේ සාම සභා, මන්නාරමේ පුරවැසි කමිටුව, මුතුර්හි සමයාන්තර සාම කමිටුව සහ අම්පාරේ කල්මුණ සාම පදනම මින් සමහරකි.

මේ කමිටු දෙයාකාරයකින් ආරවුල් නිරවුල් කිරීමේ විධිමත් යාන්ත්‍රණය ක්‍රියාත්මක කරමින් සිටී. එනම්, ගම් පෙදෙස්වල ඇති වන හිංසනයට හෝ අන්තර් වාර්ගික හිංසනයට ප්‍රතිචාරයක් වශයෙන් සහ පළාත් රජය, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා සහය, හමුදා කණ්ඩායම්, එල්ටීටීඊ ය ආදී සංවිධාන අතර, අතර මැදියකු වශයෙනි. සටන් විරාම ගිවිසුමෙන් පසු මේ සාම කමිටුවලින් සමහරක් අක්‍රිය වී ඇත.

## 2.4 ආගමික කමිටු සහ නායකයින්

මුස්ලිම් සහ කතෝලික ජනතාව පදිංචි පෙදෙස්වල ආගමික බලධාරීන් ඔවුන්ගේ ජන කොටස් තුළ හටගන්නා ආරවුල් සමථයකට පත් කරනවා පමණක් නොව ආගම් අතර හටගන්නා ආරවුල් සමහන් කිරීමේ ලා සුවිශේෂ කාර්යයභාරයක් ඉටු කරන බව ප්‍රකට කරුණකි.

### මුස්ලිම් දේවස්ථානවල ක්‍රියාත්මක වන කමිටු

ඉස්ලාමීය නීතියට අනුකූලව සාපරාධී නොවන වැරදි ක්‍රියා සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන ආයතනය, මුස්ලිම් දේවස්ථාන කමිටුව හෙවත් ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථානයේ භාරකාර මණ්ඩලයයි. මෙම කමිටු මුස්ලිම් කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙති. එහි සාමාජිකයින් මුස්ලිම් ප්‍රජාව විසින් තෝරා පත් කරනු ලබන අතර ඔවුහු ස්වාධිනව තම කාර්යයභාරය ඉටු කරති. සමාජිකයින් 6 සිට 22 දක්වා පත්වී සිටින අතර නිල කාලය වසර 1 සිට 3 අතර වේ. මෙහි කටයුතුවලට මුස්ලිම් කාන්තාවන් සම්බන්ධ නැති අතර ඔවුන්ට සිය පැමිණිලි කමිටු වෙත ඉදිරිපත් කළ හැකි ය. ක්‍රිස්තියානි පූජකවරුන් මෙන් නොව, යාඥා කටයුතු භාරව සිටින මෞලවී තැන මෙම කමිටුවලට සහභාගි නොවන අතර නායකත්වය ගෙන කටයුතු කරන්නේ ද නැත.

කමිටු සාමාජිකයින් ආරවුල් විභාග කර තීන්දුවක් දෙන අතර ඉන් අතෘප්තියට පත්වන පාර්ශ්වයන්ට රාජ්‍ය බලධාරීන් වෙත හෝ මුස්ලිම් පවුල් නීතිය යටතට වැටෙන කරුණ සම්බන්ධයෙන් කටයුතු කරන කාතිඋසාවි වෙත තම දුග්ගැනවිල්ල ඉදිරිපත් කළ හැකි ය. ඉන් ඔබ්බට මුස්ලිම් දේවස්ථාන ඒකාබද්ධ සංගමය සහ දිස්ත්‍රික් ඒකාබද්ධ සංගමය දක්වා අදාල පාර්ශ්වයන්ට තම ආරවුල යොමු කළ හැකි ය. පොලීසිය ඇතැම් සිද්ධින් මුස්ලිම් දේවස්ථාන කමිටුවට යොමු කරනු ඇත.

## කතෝලික පල්ලිය

ජනතා ආරවුල් නිරවුල් කිරීමේලා කතෝලික පල්ලිය විශිෂ්ට සේවාවක් ඉටු කරයි. පල්ලිය සතු පුළුල් සමාජ පදනමක් ද ඇත. ආගමික කටයුතු හැරුණු විට, ගමේ පල්ලියේ පූජක තුමා තම ප්‍රදේශයේ බැතිමතුන්ගේ ජන ජීවිතයට ඉතා සමීපව කටයුතු කරන්නකු වශයෙන් ගෞරවාදරයට පත්ව සිටියි. විශේෂයෙන්, යාපන අර්ධද්වීපයේ පුද්ගලයින් අතුරුදහන්වීමේ හා අත් අඩංගුවට පත්වීමේ සිද්ධීන් ගෙන් පසු එහි බිෂොප්වරු ජනතා දුක්ගැනවිලි පිළිබඳ ව සෘජුව ම සම්බන්ධ වී ක්‍රියා කළ හ. ප්‍රජා ගැටලු සහ ආරවුල් නිරාකරණය කිරීම සඳහා විශේෂයෙන්, මන්නාරමේ කතෝලික පල්ලිය ඉතා ප්‍රබල අයුරින් ක්‍රියා කරයි. දේවස්ථානයේ නඩත්තුව හා ජනතා ගැටලුවලට ප්‍රතිචාරය දැක්වීමේ කාර්ය භාරය පූජක තුමා ප්‍රධාන කමිටුවේ වගකීම වී ඇත. එයට සහයවීම සඳහා සාම කමිටු හෝ පවුල් කමිටු පිහිටුවා තිබේ. ප්‍රදේශයේ විවිධ සංවිධාන දේවස්ථාන සහා සමඟ සමීපව කටයුතු කරති. තහනම් මාළු දැල් පාවිච්චිය පිළිබඳ ප්‍රශ්නය වගිකිව යුතු උසස් නිලධාරීන් සමග සාකච්ඡා කර නිරවුල් කිරීම සඳහා පූජකතුමා ප්‍රධාන දේවස්ථාන කමිටුවට පවරා ඇත.

## බෞද්ධ ආගමික ආයතන

ප්‍රජා ගැටලු නිරාකරණය කිරීමේ දී ගමේ පන්සල වැදගත් කාර්යයභාරයක් ඉටු කරයි. තම ප්‍රජාව වෙනුවෙන් රාජ්‍ය බලධාරීන් සහ පොලීසිය හමුවේ පෙනී සිටින්නේ ද විහාරාධිපතීන් වහන්සේ ය. බෞද්ධ ගම් දෙකක් අතර ඇති වන ආරවුල් නායක විහාරාධිපතීන් වහන්සේට තීන්දුවක් සඳහා යොමු කරනු ලැබේ. ගමේ නායක කාරකාදීන්ගේ සහය ද උන්වහන්සේට නොපිරිහෙලා ලැබේ.

## හින්දු ආගමික ආයතන

හින්දු කෝවිල් භාරකාර මණ්ඩල ප්‍රජා කටයුතුවල වැඩි වශයෙන් නිරත වන්නේ නැත. ප්‍රධාන පූජකවරයා පවා එම කටයුතු වලින් ඈත්ව සිටියි. කෙළින් ම කෝවිලට සම්බන්ධ පූජා කටයුතු හැරුණු විට යාපන දිස්ත්‍රික්කයේ කෝවිල් භාරකාර මණ්ඩල ප්‍රජා ආරවුල් නිරාකරණ කටයුතුවලට සම්බන්ධ වන්නේ නැත. එහෙත් අම්පාර සහ මඩකලපු පළාත්වල කෝවිල් භාරකාර මණ්ඩල ජනතා ආරවුල් විසඳා ඒවාට පිලියම් ලබාදීමට කටයුතු කරති.

## 2.5 ආරවුල් නිරවුල් කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයෙහි නිරතව සිටින පුද්ගලයින් සහ නිලධාරීන්

ඇතැම් පුද්ගලයින්, විශේෂයෙන් ජනතා ගෞරවයට ලක්ව සිටින ගමේ ප්‍රධානීන් රාජ්‍ය නිලධාරීන් සහ එල්ටීටීඊ සාමාජික පිරිස් ආරවුල් නිරවුල් කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය හසුරුවමින් සිටිති.

සමහර ගැමියන් ප්‍රදේශයේ ආගමික නායකයින්, විදුහල්පති වරුන්, දේශපාලන පක්ෂ සංවිධායකයින්, ව්‍යාපාරිකයින් සහ හාම්පුතුන් මැදිහත් වී ආරවුල් විසඳන අවස්ථා ද නැත්තේ නො වේ.

### ග්‍රාමසේවක

යම් ප්‍රජාවක් තුළ සාපරාධී නොවන ගැටලු සහ ආරවුල් යොමු කෙරෙන මුල්ම බලධාරියා ග්‍රාමසේවක වේ. අසල් වැසියන් සම්බන්ධ ආරවුල්, මායිම් සහ ඉඩම් ආරවුල් සහ පවුලේ ප්‍රශ්න ඔහු වෙත යොමු කෙරේ. ගම් කීපයක රාජකාරී ආවරණය කරන ග්‍රාමසේවකයින් ජනතාවට සමීප නොවීම නිසා, ඔවුන් වෙත ආරවුල් නිරවුල් කිරීමේ සිද්ධීන් යොමුවන්නේ ඉතා මඳ වශයෙනි.

### අනෙකුත් රාජ්‍ය නිලධාරීන්

පොලිස් නිලධාරීන්, ජල ඒජන්තවරුන්, සමෘද්ධි නිලධාරීන් සහ සමාදාන විනිශ්චය කරුවන් වෙත ඔවුන් යටතට වැටෙන කරුණු සම්බන්ධයෙන් තීන්දු ලබාගැනීම සඳහා යෑම සාමාන්‍ය සිරිත වී ඇත. සමහර අවස්ථාවල මෙම නිලධාරීහු ද අවිධිමත් ක්‍රමෝපායන් හරහා ගැටලු වලට විසඳුම් ලබා දෙති. ඉඩම් ආරවුල් පොලීසියේ මැදිහත් වීමෙන් නිරවුල් වන අවස්ථා ද ඇත. එල්ටීටීඊ ඇතුළු ගමේ වෙනත් සංවිධාන වෙත පැමිණිලි යොමු කෙරෙන සිද්ධීන් ද නැත්තේ නො වේ.

### එල්ටීටීඊය

සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු හා එල්ටීටීඊය රජයේ පාලනය පවතින ප්‍රදේශවල දේශපාලන කාර්යාල විවෘත කිරීමත් සමඟ ම ජනතාව තම ආරවුල් විසඳා ගැනීම සඳහා ඔවුන් වෙත ඇදී යති. ගෘහස්ථ හිංසනය පිළිබඳ ආරවුල් සම්බන්ධයෙන් එල්ටීටීඊය ස්වකීය අවධානය යොමු කරන බවක් පෙනේ. අනෙකුත් ආරවුල් එල්ටීටීඊය විසින් පොලීසිය, උසාවි, ග්‍රාමසේවක වැනි රාජ්‍ය බලධාරීන් වෙත යොමු කරයි.

**ශ්‍රී ලංකා සටන් විරාම ගිවිසුම**

ශ්‍රී ලංකා සටන් විරාම කමිටුවේ නිලධාරීහු ආරවුල් නිරවුල් කිරීමේ විධිමත් ක්‍රියාදාමයන් හි නිරත වෙති. මෙම කමිටුවේ ප්‍රධාන කාර්යයභාරය වනුයේ සටන් විරාම අධීක්ෂණය කිරීමත්, එහි කොන්දේසි උල්ලංඝනය කෙරෙන අවස්ථා පරීක්ෂා කර වාර්තා කිරීමත් ය. ආරවුල් වලට වැදගත් වන මෙම කමිටුව රජය, එල්ටීටීඊය සහ ප්‍රජා නායකයින් අතර පැවැත්වෙන සාකච්ඡාවලට පහසුකම් සලස්වන්නකු වශයෙන් කටයුතු කරයි.

## 2.6 එල්ටීටීඊය විසින් ආරම්භ කර ඇති අවිධිමත් කමිටු දැනුවත් කිරීමේ එල්ටීටීඊ කණ්ඩායම්

එල්ටීටීඊය මෙබඳු කණ්ඩායම් යාපනයේ පිහිටුවා ඇත. ගම් මට්ටමින් සමාජ සහ සංස්කෘතික කටයුතු වල දී විධාන නිකුත් කරන බවට වාර්තා වුණා මිස, මෙම කමිටු ආරවුල් නිරවුල් කිරීමේ ලා ක්‍රියාකරන බවක් මෙය ලියන අවස්ථාවේ දී නිරීක්ෂණය නො වී ය. නොබෝදා හොරකම් රාශියක් සහ කසිප්පු පෙරීම සම්බන්ධයෙන් චාවාකච්චේරියේ දී "දැනුවත් කිරීමේ" රැස්වීමක් එල්ටීටීඊය සංවිධානය කළේ ය. එල්ටීටීඊ පාලය යටතේ පවතින වන්නි ප්‍රදේශයේ දැනුවත් කිරීමේ කණ්ඩායම් සිටින බවට වාර්තා වූ නමුත් පර්යේෂණ කටයුතු සඳහා කාලය සීමිත වූ බැවින් ඔවුන්ගේ කටයුතු අධ්‍යයනය කිරීමට අවකාශ නො ලැබුණි. දැනට පැරණි ගම් සභා දැන් අක්‍රීය වී ඇති අතර ආරවුල් කෙළින් ම එල්ටීටීඊ පොලීසිය වෙත යොමු කරනු ලැබේ.

# 3. කලාපීය සහ සමාජ විෂමතා

ආරවුල් නිරවුල් කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය සතු වටාපිටාව එහි ක්‍රියාකාරීත්වය කෙරෙහි බෙහෙවින් බලපායි. එම යාන්ත්‍රණයේ පැවැත්ම, අනන්‍යතාව, ක්‍රියාවලිය සහ සාර්ථකත්වය විවිධ කලාපීය සහ සමාජ සාධකයන් මත රඳා පවතී. පහත සඳහන් පරිදි දිස්ත්‍රික් පරිච්ඡේද මඟින් විස්තර කර ඇත.

## 3.1 අර්බුද කෙරෙහි කලාපීය බලපෑම

ඇතැම් ක්ෂේත්‍රයන් කෙරෙහි අර්බුදය තුළින් ඇති වන බලපෑම, ආරවුල්වල ස්වභාවය සහ එම ආරවුල් විසඳීමට ගන්නා ක්‍රියාමාර්ගය සැලකිය යුතු ආකාරයෙන් වෙනසකට ලක්කිරීමට සමත් වී ඇත.

- ⋆ වව්නියාව, සහ යාපනය වැනි මහ පරිමාණයේ අවතැන්වීම් සිදු වූ පෙදෙස්වල ජීවත්වන ප්‍රජාව, තම ප්‍රදේශයන් හි පදිංචියට පැමිණ සිටින පිටතින් පැමිණි පිරිස් කෙරෙහි වඩාත් සහනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව පෙනේ. එහෙත් පුත්තලම ප්‍රදේශයේ එම තත්ත්වය ඉඳුරාම වෙනස් වී ඇත. එනම්, ජන කොටස් අතර විවිධ මතභේද හට ගෙන තිබේ.
- ⋆ ප්‍රධාන වාර්ගික ජන කොටස් තුනක් ජීවත් වන නැගෙනහිර පළාතේ ජාතිවාදී ආරවුල් නිරන්තරයෙන් හට ගෙන ඇත.
- ⋆ විශාල වශයෙන් අවතැන් වීම් සිදු වී ඇති ගම්වල, සමතුලිතතාව වෙනස් වීම නිසා ගමේ සාම්ප්‍රදායික නායකත්වය සහ එහි වැඩිහිටියන් කෙරෙහි

දැක්වූ ගෞරවය පිරිහී ඇත. එබැවින් අනෙකුත් රජයේ පාලනය යටතේ පවත්නා පෙදෙස්වලට සාපේක්ෂව යාපන ජනතාව ස්වකීය ගැටලු නිරාකරණය සඳහා එල්ටීටීඊය කරා ළංවෙති. පොලීසිය කෙරෙහි විශ්වාසය නොමැති වීමත්, 1995 ට පෙර එල්ටීටීඊය "කාර්යක්ෂම" අයුරින් නීතිය ක්‍රියාත්මක කිරීමත් නිසා ජනතාව ඔවුන් පිළිබඳ ව විශ්වාසය තබා තිබුණි. ගමේ නායකයන් ගේ බලය සහ ගම් සභා අක්‍රිය වී ඇති අතර සමාජ බැමි පවා කැඩී බිඳී ගොස් ඇත.

★ මන්නාරමේ කතෝලික පල්ලිය අන්‍ය සියලු ආයතන සහ සංවිධාන සියල්ල අභිබවා ආරවුල් නිරාකරණයෙහි ප්‍රමුඛස්ථානය දරා සිටියි.

★ ත්‍රිකුණාමල පෙදෙසේ අවතැන්වීම් අඩු මට්ටමින් සිදු වී ඇති අතර ග්‍රාමසංවර්ධන සමිති සහ මුස්ලිම් දේවස්ථාන කමිටු ආරවුල් නිරාකරණය විෂයයෙහිලා ස්වකීය කාර්යයභාරය මැනවින් ඉටුකරමින් සිටිති.

★ වව්නියාවේ සුභසාධක මධ්‍යස්ථානවල වෙසෙන ජනතාවට කමිටු පිහිටුවාලීමට ඉඩ දී නොමැති අතර, කඳවුර භාර නිලධාරියාගේ අභිමතය පරිදි කටයුතු සිදුවෙමින් පවතී.

★ එල්ටීටීඊය පාලන පෙදෙස්වල ඔවුන්ගේ "පොලීසිය සහ අධිකරණය" ආරවුල් නිරාකරණය කිරීමේ යෙදී සිටිති. රජයේ පාලන පෙදෙස්වල එය දේශපාලන නිලධාරීන් වෙතින් සිදු වේ.

## 3.2 වාර්ගිකත්වය සහ ආගම

ආරවුල් නිරාකරණය කිරීමේ ලා කවර යාන්ත්‍රණයන් උපයෝගී කරගනු ලබන්නේ ද කියා වාර්ගිකත්ව සහ ආගම විසින් නිර්ණය කරනු ලබයි.

සිංහල ජනතාව රාජ්‍ය බලධාරීන් වෙත අවතීර්ණ වන අතර මුස්ලිම් වරු සුපුරුදු පරිදි සිය දේවස්ථාන කමිටුවල ආධාරය පතති. කතෝලික ජනතාව තම පූජකවරයා කෙරෙහි අසීමිත විශ්වාසය රඳවා ඇත. හින්දු පූජකවරුන් ආගමික කටයුතුවල නිරතවන නිසාත්, කෝවිල් භාරකාර මණ්ඩලය එහි පාලනය හා පැවැත්ම කෙරෙහි යොමු වී සිටින නිසාත්, දෙමළ ජනතාව එල්ටීටීඊය ඇතුළු විවිධ සංවිධානවල උපකාරය අපේක්ෂා කරති.

බහු වාර්ගික හා ආගමික කොටස් ජීවත් වන පෙදෙස්වල ජනතාව ඔවුනොවුන්ගේ සංවිධානවල පිහිට පතති.

## 3.3 ආරවුල් වල ස්වභාවය සහ එය නිරාකරණය කිරීම

මේ කෙරෙහි ප්‍රදේශයේ ජනතාව මෙන් ම දේශපාලනය වෙතින් ද බෙහෙවින් බලපෑම් සිදු වේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් හෝ එල්ටීටීඊය වෙත ජනතාව තම ප්‍රශ්න විසඳාලීම සඳහා නිරන්තරයෙන් නැඹුරු වෙයි. ඒ අනුව අවතැන් වූ පුද්ගලයින් තම ගැටලු විසඳාගැනීම සඳහා, තම ප්‍රදේශයේ මන්ත්‍රී වරයා වෙත යෑම පුත්තලම දිස්ත්‍රික්කය තුළ සුලබ සිද්ධියක් වී තිබේ. ගම්වල ජීවත් වන සුළු ජන කොටස්, එහි බහුතරය විසින් ආරම්භ කර ඇති අවිධිමත් යාන්ත්‍රණය මගින් තම ආරවුල් විසඳා ගැනීමට පෙළඹෙති.

(3.6 බලන්න.)

සැලකිල්ලට ගත යුතු අනෙකුත් සමාජ විසමතා ද ඇත.

- ⋆ යාපන ප්‍රදේශයේ ඇති වන ආරවුල් වලට හා ගැටුම්වලට කුල භේදය ප්‍රධාන හේතුව වී ඇත. විශේෂයෙන් යාපන සහ මඩකලපු දිස්ත්‍රික්ක දෙක කෝවිල් ආරවුල් ඉතාමත් ම වැඩියෙන් සිදුවන පෙදෙස් වශයෙන් සැලකේ.
- ⋆ අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන්ට අයත් කාන්තාවන් මුස්ලිම් තරුණයින් ගේ තාඩන පීඩනවලට ලක්වීමේ ගැටලුව මන්නාරම් සහ පුත්තලම් දිස්ත්‍රික්කවල මුස්ලිම් දේවස්ථාන කමිටු විසින් වරින් වර අවධාරණය කරනු ලබන්නකි.
- ⋆ මත් පැනට ගොදුරු වීම සහ වෙනත් සමාජ ගැටලු අවතැන් වූවන් සහ සුභ සාධන මධ්‍යස්ථානවලින් පිට වූ පිරිස් අතර බහුලව දක්නට ලැබේ.

ගැටලු නිරාකරණය සඳහා නාගරික වැසියන් පොලීසිය සහ අධිකරණය වෙත නැඹුරු වීම සුලබ සිද්ධියකි. මුදල් අහේනිය සහ යෑම්ඊම් අපහසුව නිසා ගම්බද ජනතාව ගැටලු නිරාකරණය කිරීමේ සාම්ප්‍රදායික ආයතන කෙරෙහි දැඩි විශ්වාසය තබා ඇත.

### ජනතා රුචිය දැක්වෙන ගැටලු නිරාකරණය සම්බන්ධ යාන්ත්‍රණ වෙත සටන් විරාම ගිවිසුමෙන් සිදු වී ඇති බලපෑම්.

ප්‍රධාන කරුණු තුනක් හේතු කොට ගෙන, ජනතාව රුචිය දක්වන ගැටලු නිරාකරණය කිරීමේ ක්‍රම සහ විධි කෙරෙහි සටන් විරාම කමිටුවෙන් පුළුල් බලපෑම් සිදු වී තිබේ. එම ප්‍රධාන කරුණු තුන මෙසේ ය; ගැටලු සහ ආරවුල්වල ස්වභාවය වෙනස්වීම, එල්ටීටීඊය හිස එසවීම සහ අනෙකුත් පාර්ශ්වයන්ගේ බලය හීනවීම ය.

අත්අඩංගුවට ගැනීම් ඇතුළු අනාය කරුණු වලදී ඒවාට සම්බන්ධ වූ වැසියන් පිළිබඳ ව යුද හමුදාව සමග කටයුතු කිරීමේ යෙදී සිටි කණ්ඩායම් අද අක්‍රීය වී සිටිති. ඔවුන් ගෙන් සමහරක ගේ අවධානය එල්ටීටීඊය විසින් තරුණයින් බලෙන් තම හමුදාවට බඳවා ගැනීම කෙරෙහි යොමු වෙමින් තිබෙන අතර, අනෙක්වා මුළු ගැන්වී සිටි.

රජයේ පාලන පෙදෙස්වල එල්ටීටීඊ බලය වැඩියෙන් පැතිරීම නිසා ජනතාව තම ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ඔවුන් වෙත යාමට පෙලඹී සිටී. ඒ නිසා හමුදා සහයක පිරිස්, පොලීසිය සහ හමුදාව මෙතෙක් ක්‍රියාත්මක කළ ගැටලු විසඳීමේ ක්‍රියාවලිය පිරිහීමට ලක්ව තිබේ.

# 4. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාවලියේ සාර්ථකත්වය

ගැටුම් නිරාකරණය කිරීමේ සාර්ථක අවස්ථා තක්සේරු කිරීමේ දී ඉතා වැදගත් ගැටලු කීපයක් මෙම අධ්‍යයනයේ දී හඳුනා ගැනීමට හැකි විය. කෙටි කාලීන අධ්‍යයනයක් තුළ අඩංගු ක්‍රමවේදය හා සම්බන්ධිත ගැටලු, සමස්තයක් වශයෙන් ප්‍රජාවට සාපේක්ෂව ගත් කල, සංකීර්ණ ස්වරූපයක් දරයි. ඒ හැරුණ විට අවිධිමත් යාන්ත්‍රණය මඟින් ආරවුල් විසඳාලීමේ සාර්ථක අවස්ථා හඳුනා ගත හැකි වුව ද, ඒවා ගැටලු නිරාකරණය කිරීමේ පොදු ප්‍රමිතීන් වශයෙන් අවශ්‍යයෙන් ම සැලකිය නො හැකි ය.

අවිධිමත් යාන්ත්‍රණය විෂයයෙහි ලා වැදගත්වන, ගමේ නායකත්වය සතු කාර්යයභාරය, සහ දේශපාලනය, දේශපාලනය තුළින් ඇති වන බලතල සහ බලය යන සාධක අප සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ. මෙහි දී ගමේ ප්‍රභූන් මුල් තැනක් ගෙන කටයුතු කිරීම. (විශේෂයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලිය) වැදගත් ලක්ෂණයක් සේ ගැනෙන බැවින් ඉන් හටගන්නා වාසි මෙන් ම, ආරවුල් ද මෙහි දී විමසා බලනු ලැබේ. ගම් මට්ටමින් දේශපාලනය සහ බලය වෙතින් සිදුවන මැදිහත්වීම් සහ ඇඟිලි ගැසීම් නිසා ආරවුල් විසඳීමේ අවිධිමත් යාන්ත්‍රණයට බාධා සිදු වී ඇත. මෙ රට සහ විදේශීය රාජ්‍ය නොවන සංවිධාන විසින් හඳුන්වා දී ඇති අවිධිමත් යාන්ත්‍රණ මෙහි දී විමසීමට භාජනය වනු ඇත. ඒවා අසාර්ථක මෙන් ම වැඩිකල් ඵලදායී අයුරින් පවත්වා ගෙන යෑමට නො හැකි ක්‍රමෝපායන් බව ක්ෂේත්‍ර අත්දැකීම් වලින් තහවුරු වී ඇත. සාමය ස්ථාපනය කිරීමේ දී නිසගයෙන් ම මතුවන ගැටලු, මෙ රට රාජ්‍ය නොවන සංවිධාන සතු දුර්වලතා සහ ආධාර සපයන ආයතන වලින් කෙරෙන බලපෑම් සහ අපේක්ෂාවන් ද හඳුනා ගැනීමට හැකිවිය.

## 4.1 ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය සඳහා ප්‍රමිතීන්

ගැටුමක්, "සාර්ථක අයුරින් නිරාකරණය කර තිබේ ද" යන්න නිගමනය කරනු ලබන්නේ කෙසේ ද? මෙය ගැටුම් නිරාකරණය කිරීම අධ්‍යයනය කිරීමේ මූලික අවශ්‍යතාවකි. ගැටුමට කොටු වී සිටින පුද්ගලයින් සෑහීමට පත්වන අයුරින් ගැටලු නිරාකරණය කරන ලද අවස්ථාවන් ගණනාවක් ම සොයා ගැනීමට ක්ෂේත්‍ර කටයුතු වල දී හැකි විය. ආරවුල් සම්බන්ධයෙන් සාර්ථක අයුරින් ක්‍රියා කර ඇතත්, ඒවා ඉදිරි ප්‍රමිතීන් ලෙස අනුගමනය කළ හැකි බවක් නො පෙනේ.

ක්ෂේත්‍ර පර්යේෂණයන් හි දී හමු වූ සිද්ධීන්වල පරිනාමය සහ ඒවා තුළින් ඇති වන බලපෑම, වේලාව මදිකම වැනි ස්වාභාවික අවහිරතා නිසා අගැයීමට ලක්කිරීමට නො හැකි විය. හුදෙක් තෝරාගත් කීප දෙනෙකු ගේ අදහස් විමසීමෙන් පමණක්, ගැටලු නිරාකරණය කිරීමේ ක්‍රියාවලිය සහ ක්‍රමෝපායන් කෙරෙහි සමස්ථ ප්‍රජාව විසින් දක්වනු ලබන ප්‍රතිචාරය හරිහැටි අවබෝධ කරගැනීම අපහසු ය. ප්‍රජාව දක්වන ආකල්පයන් කෙරෙහි අවධානය යොමු වීමෙන් ගැටලු නිරාකරණය කිරීමේ ක්‍රියාපිළිවෙළේ සුජාත භාවය අවබෝධ කර ගත හැකි ය. යම් සුවිශේෂ ගැටලුවක් සාර්ථක අයුරින් නිරාකරණය කළ පමණින් ම එය අනෙකුත් ගැටලු විසඳීමේලා ප්‍රමිතියක් වශයෙන් යොදාගත නො හැකි ය. ගැටලුවක් "සාර්ථක අන්දමින් නිරාකරණය කර තිබේ ද යන්න නිගමනය කිරීමේ දී මූලික සංකල්ප රැසක් මතු වේ. කාලය පිළිබඳ සාධකය හා වටිනාකම් ඒ අතරට ගැනේ. විසඳූ බවට ප්‍රකාශ කෙරෙන ගැටලුවක් සමහර විට කාලයක් පුරා හමස් පෙට්ටියේ දමා තිබුණා විය හැකි ය. එසේ ම යම් අර්බුදයක මතුපිටින් පෙනෙන ලක්ෂණ කෙරෙහි අවධානය යොමුවන්නට ඇති මුත්, එයට හේතු සාධක වූ කරුණු පරීක්ෂාවට ලක්නොවන්නට ඇත. ගැටලුවේ අක්මුල් සොයා ප්‍රතිකාර නො කළ හොත් එය තිබුණාටත් වඩා උග්‍ර තත්ත්වයට පත්වන්නට ඉඩ තිබේ.

පිළිගත් මූලධර්මයන් මත යුක්තිය පසිඳලීම අවශ්‍යයෙන් ම කළ යුතු හෙයින් ගැටුම් නිරාකරණයේ දී සාධාරණ ප්‍රමිතීන් ඉතා වැදගත් වේ. සාධාරණත්වය, අපක්ෂපාතී භාවය, සුජාත භාවය, සියලු පාර්ශ්වයන්ට කන්දීම යනාදිය ගැටලු නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය සතු මූලිකාංගයන් වේ. අංගසම්පූර්ණ අයුරින් නොවූවත්, යම් තරමකට හෝ මෙම සුවිශේෂ අංගයන් ගැටලු නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය විසින් උපයෝගී කරගනු ලබන ආකාරය පහත දැක් වේ.

### ⋆ සාධාරණත්වය

යම් ප්‍රදේශයක ප්‍රජාව විසින් දෙනු ලබන තීරණයකින් සිද්ධියේ දී අතෘප්තියට පත් පුද්ගලයාට හෝ පාර්ශ්වයට සාධාරණත්වය සිදු නුවූවා විය හැකි යි. වච්නියා

ප්‍රදේශයේ එක් පුද්ගලයකු ගේ බීමත්කම නිසා ඇති වූ හබයක දී එම ප්‍රදේශයේ ගම් සභා බලධාරීන් එම පුද්ගලයාට ගමෙන් පලවා හරින බවට තර්ජනය කිරීමේ සිද්ධිය මෙයට නිදර්ශනයක් වශයෙන් දැක්විය හැකි ය. සාධාරණත්වය පිළිබඳ ප්‍රමිතිය නිරන්තරයෙන් ප්‍රශ්නකාරී වී තිබේ.

## ★ පක්ෂග්‍රාහී නොවීම

තීරණ ගැනීමේ කාර්යය පැවරී ඇති පුද්ගලයින් සහ ඔවුන් විසින් ගනු ලබන තීරණ ස්වාධීන නො වන අතර, පක්ෂග්‍රාහී හා එක් පාර්ශ්වයකට බර වූ ස්වභාවයක් පෙන්නුම් කරනු ඇත. යාපනයේ කුල හීන දෙමළ වැසියන් මුහුණ දී ඇති සමාජ ප්‍රශ්න වලට ගමේ නායකත්වය මැදිහත් නො වනු ඇත. එම දෙමළ වැසියන් කෙරෙහි ඇති වී තිබෙන අගතිගාමී ආකල්ප නිසා සාධාරණය ඉටුවීම අපේක්ෂා කළ නො හැකි ය.

## ★ සුජාත භාවය

ගැටලු නිරාකරණයේ දී තමනට රුචි යාන්ත්‍රණය තෝරා ගැනීම සහ දෙනු ලබන තීරණ පිළිගත යුතු ද නැත් ද යන්න නිගමනය කිරීම සඳහා ආරවුලක පාර්ශ්ව කරුවන්ට නිදහස තිබේ යයි සිතීම අපහසු ය. ප්‍රදේශයේ බලගතු නායකයින්, දේශපාලනඥයින් සහ එල්ටීටීඊ බලධාරීන් ගේ සරණ සොයා යෑමේ දී මෙවන් ඉරණමකට මුහුණ දීමට සිදු වේ. බහුතරයේ අණසකට යටත් වීමට සිදුවීම තවත් එබඳු ම අවස්ථාවකි.

සුළුජන කොටස්වලට අයත් පුද්ගලයින් තම ගම්බිම් බලා ආපසු පැමිණීමේ දී පදිංචිය සඳහා ඉඩකඩම්, ගේ දොර අවශ්‍යතා පිළිබඳ ව ගමේ නායකත්වය දෙන තීරණවලට අවනත වීමට සිදු වේ.

## ආරවුලක පාර්ශ්වකරුවන්ට තමන් කැමති යාන්ත්‍රණය තෝරා ගැනීමේ නිදහස

ආරවුල විසඳීමට වැදගත් වන පුද්ගලයා කෙරෙහි හබයට සම්බන්ධ වී සිටින එක් පාර්ශ්වයක් කැමැත්ත පළ කරන අතර, අනෙක් පාර්ශ්වය ඔහු හෝ ඔහු ගේ තීරණය පිළිගන්නවා නො විය හැකි ය. ඉඩම් ආරවුලක දී එක් පාර්ශ්වයක් එල්ටීටීඊය නීත්‍යානුකූල බේරුම්කරුවකු වශයෙන් පිළිනොගෙන අධිකරණයේ තීරණයක් අපේක්ෂා කිරීමට පුළුවන. කිසියම් නායකයකු ගේ යාන්ත්‍රණයක් තෝරා ගැනීම සහ එහි තීරණය පිළිගැනීම යනු අවශ්‍යයෙන් ම ඒවා සාධාරණ හෝ නීත්‍යානුකූල බවට පිළිගැනීමක් නො වේ.

එය හබයක පාර්ශ්වකරුවන්ට තම අභිමතය පරිදි ක්‍රියාකිරීමේ නිදහස නො මැති වීම හෝ විසඳුම් ලබාදීමේ ක්‍රියාවලිය සහ එහි ප්‍රතිඵලයට එරෙහිව යෑමට අතෘප්තියට පත් පුද්ගලයාට ඉඩ ප්‍රස්ථාව නො මැති වීම ය.

**⋆ පාර්ශ්වයන් නිසි පරිදි නියෝජනය නොවීම.**

ආරවුල් නිරවුල් කිරීමේ යාන්ත්‍රණයට ඇතැම් පාර්ශ්වයන් හෝ පුද්ගලයන් සහභාගි කරවා නො ගැනීම නිසා ඉන් ලැබෙන අවසාන තීරණය සර්ව සම්පූර්ණ නො වනු ඇත. කාන්තාවන්ට මුස්ලිම් දේවස්ථාන කමිටුවට සහභාගි වීමට නො හැකි වීම හා නියෝජිතයින් තේරීමේ කාර්යයට දායක වීමට නො ලැබීම නිසා ඔවුන් ගේ ආරවුල් සැලකිල්ලට භාජනය වී ද හා ඒවා නිසි අයුරින් විසඳනු ලැබුවේ ද යන්න පිළිබඳ ව ඔවුන් තුළ සැක පහළ වේ. වාර්ගික සුළුතරය හෝ කාන්තාවන් හෝ අඩු කුලයක සාමාජිකයින් හෝ වේවා, ඔවුන් නිසි අයුරින් නියෝජනය නො වීම නිසා ඔවුන්ට සාධාරණය ඉටු නො වන්නට පුළුවන.

## 4.2 නායකත්වය

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාවලියේ දී ගම්වල නායකයෝ පුද්ගලයින් වශයෙන් හෝ ප්‍රජා මූලික සංවිධානවල සාමාජිකයින් වශයෙන් අනගි සේවාවක් සලසති. උගතුන්, සිවිල් නිලධාරීන්, උසස් කුල වලට අයත් පුද්ගලයින්, ඉඩම් හිමියන් සහ ව්‍යාපාරික ප්‍රජාව ද මොවුන් අතර වෙති. ධනය සහ උසස් සමාජ මට්ටම නිසා ඇතැම් පවුල්වලට සාම්ප්‍රදායික නායකත්වය හිමි වී තිබේ. සමාදාන විනිසුරු, ග්‍රාමසේවක සහ දේශපාලන පක්ෂ සාමාජිකයෝ ද මේවාට සම්බන්ධ වී සිටිති.

වර්තමාන වාර්ගික ගැටුම නිසා යාපනය සහ වව්නියා යන දිස්ත්‍රික්කයන් හි ගම්වල සාම්ප්‍රදායික නායකත්වය අහෝසි වී ඇති අතර සටන්කාමීත්වය සහ තරුණ පිරිස් බලවත් වීම මෙම වෙනසට යම් ප්‍රමාණයකට හෝ හේතු වී ඇත. බොහෝ විට ගමේ සංවිධානවල නිලතල හෙබවනුයේ ගම් නායකයින් විසිනි. සමහර විට, එක් අයකු සංවිධාන කීපයක තනතුරු රැසක් හොබවන අවස්ථා ද නැත්තේ නො වේ. ධනය, බලය, උසස් සමාජ මට්ටම සහ අනෙකුත් විවිධ දේශපාලන සම්බන්ධතා නිසා ගමේ ප්‍රභූ පිරිස්වලට නායකත්වය දිගින් දිගට ම පවත්වා ගෙන යෑමට හැකි වී තිබේ. අර්බුද නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය ගම් නායකයින් ගේ ආධිපත්‍යයට නතුවීම නිසා සාධාරණත්වය, අපක්ෂපාතීත්වය යනා දී මූලධර්මයන්ට හානියක් නො වූව ද, ඒ කෙරෙහි සැලකිලිමත්වීම සහ කැපවීම හුදෙක් එම නායකයින් කීප දෙනෙකු ගේ අභිමතය පරිදි සිදුවන්නක් බව නම් සත්‍යයකි.

කලින් සඳහන් කළ පරිදි යාපනයේ ඇතැම් පෙදෙස්වල සාම්ප්‍රදායික නායකත්වයට ඒ තරම් පිළිගැනීමක් නැති අතර, ප්‍රජා ගැටලු සහ ආරවුල් විසඳාලීම සඳහා දැන් විකල්ප සංවිධාන පිහිටුවා ගෙන ඇත. පුද්ගලයින් නායකත්වය හොබවන මුත් ඔවුන් සමස්ත ප්‍රජාව ගේ පිළිගැනීමට ලක්වී නො සිටිති. එ බැවින් ගැටලු නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය නිසි පරිදි නියෝජනය වීමෙන් යහපත් ප්‍රතිපල අත් කර ගැනීමට හැකි වේ.

අර්බුද නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයට ගමේ නායකයින් පත් කිරීමේ දී වගකිවයුත්තන් ඒ ගැන වඩාත් පරීක්ෂාකාරී වීම නුවණට හුරු ය. ආධාර සපයන සංවිධාන සහ රාජ්‍ය නො වන සංවිධාන ස්වකීය අනුග්‍රහය ලබන ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයන්හි යහපත් පැවැත්ම අපේක්ෂා කරන්නේ නම්, නිරන්තරයෙන් ඒවායේ ක්‍රියාකාරීත්වය කෙරෙහි උනන්දුව දැක්වීම හා විමසිල්ලෙන් සිටීම අවශ්‍ය වේ. ගම්වල ඇතැම් පිරිස් නො වැදගත් සේ සලකා කොන් කිරීම වැලැක්වීම සඳහා නායකයින් තෝරා ගැනීමේ දී පොදු හා සාධාරණ ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතු වේ. නියෝජිතයින් නිරන්තරයෙන් ම සාම්ප්‍රදායික නායකයින් නො විය යුතු යි.

## 4.3 දේශපාලන ක්‍රියාදාමය සහ බලය

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ එල්ටීටීඊය වැනි විශේෂයෙන්, සන්නද්ධ දේශපාලන සංවිධානයක් ක්‍රියාත්මකව තිබෙන පසුබිමක විශාල ලෙස පසුබෑමට ලක්ව සිටී. එ බැවින් ගැටුම් නිරාකකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ ඇගැයීමට ලක් කිරීමේ දී දේශපාලන ක්‍රියාදාමය සහ බලය පිළිබඳ සාධකය ගැන සැලකිලිමත් වීම වටී. සන්නද්ධ දේශපාලන සංවිධාන බලය නතුකරමින් සිටින පසුබිමක ගම් මට්ටමින් ගැටුම් නිරාකරණය කිරීමේ දී, පුද්ගලයින් බැහැර වී, ඒ වෙනුවට ප්‍රජාව ඍජුව ම මැදිහත් වේ. තම ගම් බිම් කරා ආපසු පැමිණි මුස්ලිම් ජාතිකයින් සහ ඔවුන් ගේ ඉඩකඩම් අයිතිව සිටින දෙමළ ජාතිකයින් අතර ඇති වී තිබෙන ඉඩම් ආරවුල් ඔවුනොවුන්ට විසඳා ගැනීම අපහසු බැවින් එල්ටීටීඊයේ දිස්ත්‍රික් අණදෙන නිලධාරියා හමුවීමට සිදු වේ. සමහර අවස්ථාවල, ගමේ මුස්ලිම් නායකත්වය කිලිනොච්චියේ එල්ටීටීඊ නායකත්වය මුණගැසී ගැටලුව නිරාකරණය කරගැනීමට සිදු වේ.

සන්නද්ධ කණ්ඩායම් වලින් ඇතිවිය හැකි ප්‍රතික්‍රියා කෙරෙහි ඇති බිය නිසා ම ගම්වල වෘද්ධ පිරිස් ගැටුම් නිරාකරණයට සම්බන්ධ නො වී මුළුගැන්වී සිටිති. මෙම තත්ත්වය සමස්ත දිස්ත්‍රික්කයට ම බලපාන අතර, ඒ හේතුවෙන් අන්තර් ජනවාර්ගික ප්‍රශ්න සම්බන්ධයෙන් මැදිහත් වීමට රාජ්‍ය නොවන

සංවිධාන මැලිකමක් දක්වති. එල්ටීටීඊය සහ එහි අනුගාමිකයින් අතර පැන නගින අර්බුද හුදෙක් ඔවුනොවුන් විසින් ම විසඳා ගත යුතුව ඇත.

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමත් සමඟ ම අඩපණ විය. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාව ඇතුළු, ඊපීඩීපී, ටෙලෝ සහ ප්ලොට් වැනි ආයතන යම් තරමකට හෝ ගැටුම් නිරාකරණය කිරීමේ කටයුතුවල නිරතව සිටි මුත්, එය දැන් පරිහානියට පත්ව ඇත. හමුදාව සහ එල්ටීටීඊය අතර මැදහත් වීමේ ක්‍රියාදාමයක නිරතව සිටි පුරවැසි කමිටු දැන් අක්‍රිය වී ඇත.

එදිරිවාදුකම් අත්හිටුවීම නිසා සමහර අවස්ථාවල මෙබඳු තත්ත්වයක් මතු වී ඇත. මුතූර් ප්‍රදේශයේ සමයාන්තර සාම කමිටුව කඩාවැටීමට ප්‍රධාන හේතුව වූයේ එල්ටීටීඊයේ බලපෑමයි. ගම්මට්ටමේ ආරවුල්වලට දේශපාලනඥයින් මැදිහත්වීම හා එම අවස්ථාවන් වලින් අයුතු ප්‍රයෝජන ලබාගැනීම හා හිංසාවාදී ක්‍රියාවන්ට අනුබලදීම සම්බන්ධයෙන් විවිධ චෝදනා එල්ල වුව ද, ඒවා තහවුරු කිරීමට තරම් සාක්ෂි සොයා ගැනීමට පර්යේෂකයින්ට අපහසු විය. එහෙත් හිංසාවාදී ක්‍රියාවන් මතුවීමෙන් පසු දේශපාලනයින් මැදිහත් වී පොලීසිය සහ හමුදාව ලවා ඒවා සමහන් කිරීමට ප්‍රයත්න දැරීමේ අවස්ථා බහුල වී තිබේ. කෙසේ වුව ද දේශපාලනඥයින් අර්බුදවලට සෘජුව ම වැදගත් වීම නිසා අර්බුද නිරාකාරණයෙහි යෙදී සිටින ගම් නායකයින් ගේ බලය හීන වී තිබේ.

## 4.4 බාහිර සංවිධාන විසින් ස්ථාපනය කරන ලද ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණ

බාහිර සංවිධාන විසින් ස්ථාපනය කර ඇති ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණ සහ ඒවා පදනම් වී ඇති සාධක සම්බන්ධයෙන් වැදගත් ප්‍රශ්න මතු වී ඇති බව ක්ෂේත්‍ර පර්යේෂණවලින් හෙළිදරව් වී ඇත. ඒවායේ කෙටිකාලීන පැවැත්ම සහ අසාර්ථකත්වය ප්‍රධාන වශයෙන් එයට හේතු වී තිබේ.

පොදුවේ ගත් කල සාමය ස්ථාපනය කිරීමේ දී නිසගයෙන් ම ඇතිවන ගැටලු, දේශීය රාජ්‍ය නොවන සංවිධාන සතු දුර්වලතා සහ ආධාර සපයන ආයතනවල බලපෑම සහ අපේක්ෂා මෙම පසුගාමී තත්ත්වයට මූලාශ්‍රය වී තිබේ. බාහිර වශයෙන් පිහිටුවා ඇති ආයතන (උදා :- යුධ හමුදාව, පොලීසිය, අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යාංශය සහ උනන්දුවක් දක්වන වෙනත් පුරවැසියන් විසින් පිහිටුවා ඇති ආයතන) මෙන් නොව ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා කමිටු සහ මුස්ලිම් දේවස්ථාන කමිටු වැනි රජයේ අමාත්‍යාංශවල අනුග්‍රහය යටතේ ආරම්භ කර ඇති සංවිධාන දේශීය කමිටුවලට වඩාත් සමීප බවක් පෙන්වයි. අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇති නව

සාම කමිටු රජයේ නියෝජිත ආයතනයක් ලෙස සැලකේ. පිටතින් ආධාර ලබන යාන්ත්‍රණයන්ට තිරසාර පැවැත්මක් නො මැත. සංවේදීතාවක් හෝ උනන්දුවක් නො තිබීම මෙයට හේතුව වශයෙන් බොහෝ දෙනා පෙන්වා දී ඇත. දේශපාලන පසුබිමින් ඇතිවන පීඩනය, අභ්‍යන්තර දේශපාලන විෂමතා, රාජ්‍ය නො වන සංවිධානවලින් සහ ආධාර සපයන ආයතනවලින් දීර්ඝකාලීන වශයෙන් ආධාර නො ලැබීම සහ පහත සඳහන් කරුණු ද වෙනත් හේතු වශයෙන් දැකිත හැකි ය.

ප්‍රජාව පදනම් කරගත් සංවිධාන මෙන්, පිටතින් ආධාර ලබන සංවිධානවල සාමාජිකයින් ද ගම් මට්ටමින් තෝරා ගනු ලබන්නේ නම්, ඒවායේ තිරසාර පැවැත්මට එය හේතු වනු ඇත. රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවන ලද යාන්ත්‍රණ ප්‍රතික්ෂේප කළ බවක් හෝ පිළිගත් බවක් ක්ෂේත්‍ර පර්යේෂණ මඟින් තහවුරු වී නැත.

දැනට පවත්නා ගම් මට්ටමේ සංවිධාන උපයෝගී කරගැනීමෙන් හෝ එම සංවිධානවල සාමාජිකයින් යොදා ගෙන රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති ගැටුම් නිරාකරණය කිරීමේ ආයතන මෙන් නො ව යම් ප්‍රජාවක් වෙනුවෙන් පිහිටුවන ලද ගම් සභා ජනතා අවශ්‍යතා සපුරා ලීමටත්, ජනතා සහයෝගයෙන් ප්‍රගතිය කරා යෑමටත් සමත් වී සිටින බව පෙනේ.

ගැටුම් නිරාකරණය කිරීමේ කාර්යයේ දී මන්නාරම සහ ත්‍රිකුණාමලයේ දී ලත් අත්දැකීම් පරිදි පිටතින් ආධාර ලබන සංවිධාන යහපත් ප්‍රතිඵල පෙන්වීමට අසමත් වී සිටී. එහෙත් ප්‍රජා අවශ්‍යතා හඳුනා ගැනීම වැනි කරුණුවල දී යම් සාධනීය කාර්යයභාරයක් ඉටු කිරීමට එම සංවිධාන සමත්ව සිටී. කසිප්පු ජාවාරම් පිළිබඳ සිද්ධීන් මෙන් ම ගමේ පවුලේ අඬදබර හා අර්බුද විසඳීමට මෙම සංවිධානවලට හැකියාව ලැබී ඇත. දේශපාලන සහ වාර්ගික අර්බුදවල දී බාහිර කමිටු වෙතින් සිදුවන සේවය අල්ප ය. ජාතිවාදී ආරවුල්, ඉඩම් මතභේද පහසුවෙන් නිරාකරණය කළ නො හැකි ය. ඒවා දීර්ඝකාලීන ආරවුල් දක්වා වර්ධනය වේ. දේශපාලනීකරණයට තදින් ම අසු වූ ගැටලු හෝ අර්බුද සාම්ප්‍රදායික ගම් නායකයින්ට විසඳිය නො හැකි ය. ඒවා ජාතීන් අතරට කොටු වූ ගැටලු වශයෙන් හඳුනා ගත හැකි ය. රාජ්‍ය නො වන සංවිධාන කටයුතු කරන ආකාරය මෙන් ම ඒවාට ආවේනික වූ ගැටලු ඔවුන් විසින් හඳුන්වා දී ඇති යාන්ත්‍රණ කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි.

මෙම සංවිධානවලට පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා සාර්ථක අයුරින් තම යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමට නො හැකි වීම සහ අනෙකුත් විවිධ ක්ෂේත්‍ර කටයුතුවල නිරත වීම මින් පළමු වැන්නයි. දෙවනුව, රාජ්‍ය නො වන මෙම සංවිධානවලට තමන් සතු දේශපාලන හා සාමාජීය න්‍යාය පත්‍රයක් සහ පක්ෂපාතීකම් ඇත. එසේ ම ඔවුන් ආධාර මත යැපෙන බැවින් සමහර

අවස්ථාවල අවශ්‍යයෙන් ම ඉටු කළ යුතු දේ පැහැර හරිමින්, ආධාර ලබා ගැනීමට හැකි වන අයුරින් ස්වකීය ව්‍යාපාර සකස් කිරීමට මෙම රාජ්‍ය නො වන සංවිධාන පොළඹති.

බොහෝ රාජ්‍ය නො වන සංවිධාන තමන්ට ආධාර සපයන ආයතනවල න්‍යාය පත්‍රය ප්‍රකාර කටයුතු කරන බැව් පෙනේ.

'අර්ථලාභීන්', 'බහුවාර්ගික සාම ව්‍යායාමය', 'බලාත්මක කිරීම', 'මනෝ - සමාජ උපදේශනය' සහ 'සහභාගිත්ව ප්‍රවේශය' යනා දී ආධාර සපයන්නන් ගේ මුවින් පිටවන වචන සම්මුඛ සාකච්ඡා වලදී පාවිච්චි කිරීමට තරම් රාජ්‍ය නො වන සංවිධාන හුරුපුරුදු වී සිටිති!

බොහෝ අවස්ථාවල රාජ්‍ය නො වන සංවිධාන ක්‍රියාකාරකම් අතිශයෝක්තියෙන් ප්‍රකාශ කර සිටිති. ඔවුන් ගෙන් සමහරකට ඍජු භාවය සහ සමාජ වගකීම යනා දී ගුණාංග නො මැත. රාජ්‍ය නො වන සංවිධානයක් විසින් හඳුන්වා දී ඇති සාම වැඩසටහනක් යම් ගමක ජනතාව විසින් පිළිගැනීම මඟින් අදහස් කෙරෙනුයේ ඉන් ඔවුන් ගේ අභිලාෂයන් පිළිබිඹු වීමක් නො වේ. එබැවින් එ වැනි වැඩ සටහනක තිරසාර පැවැත්ම තහවුරු කළ නො හැකි ය. එබැවින් ආධාර සපයන ආයතන රාජ්‍ය නො වන සංවිධානයන් ගේ කාර්යයභාරය වඩ වඩාත් පරීක්ෂාවට ලක්කිරීමෙන් දැනට වඩා යහපත් ප්‍රතිඵල නෙලා ගැනීමට හැකි වේ. වර්තමාන ප්‍රගති සමාලෝචනය වෙතින් දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා, විශේෂයෙන් විශ්වාසය ගොඩනැඟීම වැනි ව්‍යාපෘතිවල යථා තත්ත්වය හරි හැටි පිළිබිඹු නො වේ.

අවසාන වශයෙන් ගැටුම් නිරාකරණය කිරීම ඇතුළු, සාමය ගොඩනැඟීමේ වැඩ සටහන්වල ප්‍රගතිය උදෙසා ආධාර සපයන ආයතන, රාජ්‍ය නො වන සංවිධාන සහ ඔවුන් ගේ සේවය සැලසෙන විවිධ ජන කොටස් අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීමේ වැදගත්කම අවධාරණය කළ යුතුව ඇත.

# ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය පිළිබඳ උපකල්පනයක් යළි අවධානයට ලක්කිරීම

විශේෂයෙන්, සරණාගතයින් සහ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් ආපසු ගම් බිම් කරා පැමිණීම සැලකිල්ලට ගනිමින් සහ ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය සැලසුම් කිරීම අරමුණු කරගනිමින් මෙම අධ්‍යයනයට මුලපුරන ලදී.

සාමය ගොඩනැගීමේ කාර්යයෙහි නිරත වූවන්ට එම යාන්ත්‍රණ ශක්තිමත් කිරීම සඳහා අවකාශ ඇත්තේ ය යන අවබෝධය මතය මෙම අධ්‍යයනය මෙහෙයවන ලද්දේ. පර්යේෂකයින් ගේ සැලකිල්ලට ලක් වූ උපකල්පනයන් මෙහි පහත දැක් වේ.

අධිකරණයට මෙන් ම රජයට ද පරිපාලනමය වශයෙන් රටේ තොටේ සිදුවන සියලු ආරවුල් නිරාකරණය කිරීමේ හැකියාවක් නැත. අවතැන් වූවන් සහ සරණාගතයින් ආපසු තම ගම් බිම් කරා පැමිණීම නිසා ඉඩම් හා අනෙකුත් සම්පත් හා දේපොල පිළිබඳ ආරවුල් වැඩිවීමේ ප්‍රවනතාව මෙයට හේතු වී ඇත. දැනට ක්‍රියාත්මක වන ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය නිසා රජයේ කර මත පැටවෙන්නට තිබූ බර සැහැල්ලු වී තිබේ. නො එසේ නම්, පොලීසිය, අධිකරණය සහ රජයේ විවිධ පරිපාලන ආයතන වලට මෙම වගකීම දරන්නට සිදු වනවා නො අනුමාන ය. එහෙත් එම ක්‍රමය සර්ව සම්පූර්ණ යයි කිව නො හැකි ය. ඒ, ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රමය තුළින් යුක්තිය පසිදලීමේ මූලධර්ම උල්ලංඝනය වනවා පමණක් නො ව, බොහෝ විට ගැටුමකට තුඩු දුන් මූලික හේතු නො සොයා හුදෙක් මතුපිටින් පමණක් දකිත හැකි ලක්ෂණ සැලකිල්ලට ගැනීම නිසයි.

ඉඩම් පිළිබඳ ආරවුල් හෝ අන්තර් වාර්ගික ගැටලු සම්බන්ධයෙන් දැන් රාජ්‍ය ආයතන වඩාත් දැනුවත් වී සිටී. පොලීසිය, අධිකරණය සහ වෙනත් අදාල රාජ්‍ය ආයතනයන් ගේ පරිපාලනමය වගකීම් හෝ එල්ටීටීඊයේ කාර්යයභාරය ඌණ පූරණය කිරීම මිස ඒවා සතු වගකීම් ඉටු කිරීමේ ලා අවිධිමත් යාන්ත්‍රණය අපොහොසත් වී සිටී. ගැටුමට තුඩු දී ඇති හේතු සම්පත් හා දේපල වලට සම්බන්ධ එකක් නො වූව ද, අවිධිමත් යාන්ත්‍රණය විසින් ඉටු කළ යුතු සුවිශේෂ කාර්යයභාරයක් ඇත. එය රජයට ලෙහෙසියෙන් සපුරාලිය නො හැකි ය.

- ★ අවිධිමත් යාන්ත්‍රණය වනාහි ප්‍රජාව පදනම් කොට ගත් එකකි. ප්‍රජා ගැටලු, ප්‍රජාව විසින් ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන් නිරාකරණය කිරීම අවිධිමත් යාන්ත්‍රණයේ මූලික කාර්යයයි. ගමේ ප්‍රධානීන් ගේ මැදිහත්වීම නිසා ඔවුන් විසින් ගනු ලබන තීරණ බොහෝ විට ගම් වාසීන් ගේ පිළිගැනීමට මෙන් ම ගෞරවයට ද පාත්‍ර වේ.

අවිධිමත් යාන්ත්‍රණය මඟින් පුද්ගලයා සහ ගම එකිනෙකට සමීප කරනු ලබයි. ගමේ ප්‍රධානීන් රැසක් මුල් තැන ගෙන ක්‍රියාකිරීම නිසා ඇතැම් විට සාධාරණත්වය සහ අපක්ෂපාතීත්වය පිළිබඳ ප්‍රශ්න මතු නො වෙනවා ද නො වේ.

ආගමික නායකයින් සහ ඉඩම් හිමියන් තම බලපුළුවන්කාරකම් පෙන්විය හැකි තත්ත්වයක සිටින අතර, ගම්වල වෙසෙන පුද්ගලයින් සතු උසස් සමාජ තත්ත්වය නායකත්වය දැරීමේ ලා බෙහෙවින් උපකාරී වේ. වාර්ගික අර්බුදය පවතින පෙදෙස්වල ගමේ සාම්ප්‍රදායික නායකත්වය අඩපණ වී ඒ වෙනුවට තරුණ පිරිස් පෙරමුණ ගෙන සිටිති. ගැටුම් නිරාකරණය කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමවල දී කාන්තා සහභාගීත්වය ඉතාමත් අල්ප ය.

මේ සියල්ල සලකා බලන විට ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයට පිටතින් ලැබෙන සහයෝගය ප්‍රජා සම්බන්ධතා යළි ගොඩනැඟීමට හා ආරක්ෂා කරගැනීමට උපකාරී වන මුත්, විවිධ විෂමතා හා පුද්ගල බලපුළුවන්කාරකම් වැලැක්වීමේලා සමත් නො වේ.

- ★ බේරුම් කිරීම හා මැදිහත් වීම අවිධිමත් යාන්ත්‍රණයේ ප්‍රධාන අංග යෝ ය. එය සාමාන්‍යයෙන් පිළිගත් අධිකරණ ක්‍රියාවලියට වඩා බෙහෙවින් වෙනස් ස්වරූපයක් ගනී. ආරවුලකට සම්බන්ධ වූ පුද්ගලයන් අතර සම්බන්ධතා ගොඩනැඟීම හා ගැටුමට හේතු වූ කරුණු අධ්‍යයනය කිරීම මඟින් බෙදී වෙන් වූ ජන කොටස් අතර අන්‍යොන්‍ය අවබෝධය හෝ පොදු එකඟත්වය ඇති කිරීමේ ලා අවිධිමත් යාන්ත්‍රණය විශාල සේවාවක් සලසයි. අර්බුද හටගැනීම හා ඒවා ව්‍යාප්ත වීම වලක්වා ලීමට අවිධිමත්

යාන්ත්‍රණය බෙහෙවින් සමත් වේ. බොහෝ විට කලහයකට තුඩු නො දෙන ආරවුල් සාර්ථක අන්දමින් විසඳනු ලබන මුත් දේශපාලනික හා වාර්ගික ගැටුම් නිරාකරණය කිරීමේ ලා අවිධිමත් යාන්ත්‍රණය අසමත් වී සිටී.

★ මෙහි ප්‍රතිපලයක් වශයෙන් අවිධිමත් යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සහ අලුත් යාන්ත්‍රණ බිහි කිරීම සඳහා ආධාර සපයන ආයතන සහ සාමය ගොඩනැගීමේ කාර්යයේ නිරතව සිටින සංවිධාන විසින් ක්‍රියාකිරීම අවශ්‍ය වී තිබේ. රාජ්‍ය නො වන සංවිධාන විසින් ස්ථාපනය කරන ලද සාම කමිටු හා සංවර්ධන කමිටු ආසාර්ථක වීමට මගපෑදුණේ ව්‍යාපෘති සැලසුම් කිරීමේ මුල් අවධියේ දී ම ය. ඒ බව ක්ෂේත්‍රයේ කරන ලද පර්යේෂණ වල දී තහවුරු වී තිබේ. ජනතා අවශ්‍යතා අවබෝධ කර ගැනීමට නො හැකි වීම සහ සාමය ගොඩනැගීමේ ප්‍රායෝගික නො වන අපේක්ෂා ඇති කරගැනීම මෙයට තවත් හේතුවකි.

සාම කමිටු හා සංවර්ධන කමිටු නගා සිටුවීම සඳහා ආධාර සපයන ආයතන ඉදිරිපත් නො වීම සහ එම කමිටුවල නියුතු සේවකයින්ට ප්‍රමාණවත් පුහුණුවක් ලබා නො දීම ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයේ පැවැත්මට විශාල වශයෙන් බලපා ඇත. ජනතාවට බෙහෙවින් සමීප වී සිටින කතෝලික පල්ලිය සහ මුස්ලිම් දේවස්ථාන කමිටු වැනි ගැටුම් නිරාකරණය කිරීමේ ආයතනවලට මූල්‍ය ආධාර සැපයීම අවශ්‍ය නො වේ. ප්‍රදේශයේ දේශපාලන ක්‍රියාකාරීන් සිටීම හෝ නො සිටීම මෙන් ම ප්‍රාදේශීය නායකත්වයේ ස්වරූපය මත මෙම ආයතනවල සාර්ථකත්වය මූලික වශයෙන් රඳා පවතී. දෙවනුව මෙම ආයතන පවුල් ආරවුල්, මායිම් ගැටුම් හා මුදල් ගනුදෙනු පිළිබඳ ප්‍රශ්න විසඳීමේ ලා සමත් වී සිටින මුත් ඉඩම්, අන්තර්වාර්ගික හෝ දේශපාලන ගැටුම් හමුවේ පසුබෑමට ලක්ව සිටිති.

## නිර්දේශ

සාමය ගොඩනැගීම සහ ගැටුම් නිරාකරණය කිරීම ඉලක්ක කරගත් ව්‍යාපෘති වැඩි දියුණු කිරීම සඳහා ගත යුතු පියවර මෙම පර්යේෂණය විසින් පෙන්වා දී තිබේ.

## ප්‍රායෝගික අපේක්ෂා

විශේෂයෙන් සාම වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කිරීමේ අවධියේ දී සැලකිල්ලට භාජනය වූ උපකල්පනයන් යළි සලකා බැලීමෙන් පසුව පමණක් ආධාර සපයන ආයතන ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය

නගාසිටුවීම සඳහා කටයුතු කරනු ඇතැ යි සිතිය හැකි ය. පැතිර පවත්නා තත්ත්වයන් සැලකිල්ලට නො ගෙන හුදෙක් උසස් අරමුණු ඉලක්ක කරගැනීමත් යථාර්තයට පිටුපා ඇතැම් සාම කමිටු පිටින් ගෙනවිත් “අතහැරීම” නිසාත් සාම කමිටු ව්‍යාපාරයට නො නැසී සිටීමට නො හැකි විය. ඒ නිසා එය ශක්තිමත් පදනමක් මත ස්ථාපනය කිරීම අවශ්‍ය වේ.

ව්‍යාපෘතියක සාර්ථකත්වය රඳාපවතිනුයේ එය ඉලක්ක කරගත් අරමුණු සාක්ෂාත් කරගැනීමේ හැකියාව මත ය.

## ප්‍රදේශයේ අවශ්‍යතා තක්සේරු කිරීම

බාහිර වැඩසටහන් කෙරෙහි ප්‍රජාව උනන්දුව දක්වන්නේ හුදෙක් සංවර්ධන ආධාර ලබාගැනීමේ අපේක්ෂාවෙනි. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ කෙරෙහි ජනතා ප්‍රසාදය පළවන්නේ අල්ප වශයෙනි. ඔවුන් ගේ අවධානය මූලික වශයෙන් යොමු වී ඇත්තේ සහනය, සංවර්ධනය සහ පුනරුත්ථාපනය සම්බන්ධයෙන් මතුවන අවශ්‍යතා සපුරාලීමට ය. ජනතා දෘෂ්ටි කෝණයෙන් බලන විට සාමය ගොඩනැගීම සහ සංවර්ධනය පදනම් වූ ප්‍රවේශයක් වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතීන් සැලසුම් කිරීමේ දී සාමය ගොඩනැගීමේ හෝ වෙනත් ව්‍යාපෘතිවල නිරත පුද්ගල පිරිස්, ආර්ථික - සමාජීය තත්ත්වයන් සහ ආරවුල්වල ස්වභාවය වැනි කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ.

යම් ප්‍රදේශයක් දේශපාලනික හා වාර්ගික වශයෙන් වෙනසකට ලක් වී ඇත්නම් ආධාර සපයන ආයතන ඒ ගැන වඩා සැලකිලිමත් වීම වටී. එසේ ම, එම ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙමින් පවත්නා පූජා මූලික සාම ව්‍යාපෘති ජනතා හිතවාදී අරමුණු සාක්ෂාත් කරගැනීමට උපකාර වන අයුරින් හැඩගැස්විය යුතුය.

පිටස්තර සංවිධාන ක්ෂේත්‍ර කටයුතුවලට වැදගත් වීමේ දී තම දීර්ඝකාලීන අරමුණු සම්බන්ධයෙන් කල්පනාකාරීවීම වැදගත් ය. අතෘප්තියට පත් ප්‍රදේශයේ නායක කාරකාදීන් සමඟ අඛණ්ඩ සංවාදයක් පරවත්වාගෙන යා හැක්කේ කෙසේ ද සහ නායක සමූහයා හා රාජ්‍ය නො වන සංවිධානවල ක්ෂේත්‍ර නිලධාරීන්ට, කවර ආකාරයේ පුහුණුවක් ලබා දිය යුතු ද යනා දී කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා වීම යෝග්‍ය ය.

## ආධාර සපයන ආයතන, දේශීය රාජ්‍ය නො වන ආයතන සහ ප්‍රජාවන් අතර සන්නිවේදනය

ගමේ, පළාතේ පවත්නා යථා තත්ත්වය මැනවින් හඳුනා ගැනීමේ ශක්තිය රාජ්‍ය නො වන සංවිධාන සහ ප්‍රජාව සතුව ඇත. අවිධිමත් යාන්ත්‍රණය හරහා ගැටුම් නිරාකරණය කිරීම ඇතුළු සාමය ගොඩනැගීමේ ව්‍යාපෘති වඩාත් සාර්ථක කරගැනීමේ ලා ආධාර සපයන ආයතන සහ ජාත්‍යන්තර රාජ්‍ය නො වන ආයතන අතර මෙන් ම දේශීය රාජ්‍ය නො වන සංවිධාන සහ ප්‍රජාවන් අතර දියුණු සන්නිවේදන පද්ධතියක අවශ්‍යතාව අවධාරණය කළ යුතුව ඇත. එය ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී ජනතා අවශ්‍යතා සපුරා ලීමට ද ආධාර වේ. මෙ රට රාජ්‍ය නො වන සංවිධාන අතර සන්නිවේදනය දියුණු කිරීමෙන් ආධාර සපයන ආයතනවලට පශ්චාත් අර්බුද අවධියේ දී නව මුහුණුවරකින් මතුවන ආරවුල් සහ හිංසනයට එරෙහිව වගකිව යුතු කාර්යයභාරයක් ඉටු කළ හැකි ය.

## දේශීය හැකියාවන් ශක්තිමත් කිරීම

දේශීය වශයෙන් උචිත ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර සපයන ආයතන හා මෙ රට රාජ්‍ය නො වන සංවිධානවලට ඉතා පුළුල් සන්නිවේදනයක් අවශ්‍ය වන්නා සේ ම මැදහත්වීම, අපක්ෂපාතීත්වය සහ නායකත්වය පිළිබඳ ව ක්‍රියාකාරී පිරිස්වලට ප්‍රජා සහ රාජ්‍ය නො වන මට්ටමින් දීර්ඝකාලීන පුහුණුව ලබාදීම අවශ්‍ය වේ. දේශිය රාජ්‍ය ආයතනයන්ට බාහිර සම්පත් සඳහා ප්‍රවේශ වීමට ඉඩකඩ සැලසිය යුතු යි. එවිට ඒවාට විදේශිය ආධාර කෙරෙහි බලාපොරොත්තු නො තබා තම ක්‍රියාකාරකම් දිගින් දිගට පවත්වා ගෙන යාමට හැකි වේ.

## සාමය ගොඩනැගීමේ සැලසුම් වැඩිදියුණු කිරීම

ජන කොටස් අතර ධනාත්මක අයුරින් සම්බන්ධතා පවත්වා ගෙන යෑමේ සහ අර්බුද හටගැනීමේ ප්‍රවනතාව අඩු කිරීමේ ක්‍රමෝපායන් හඳුන්වාදීම පිළිබඳ ව ආධාර සැපයීමේ ප්‍රජාව තුළ සංකල්පමය වශයෙන් වෙනසක් සිදුවිය යුතු යි. ප්‍රගතිය විමසීමේ හා අගැයීමේ යාන්ත්‍රණ සම්බන්ධයෙන් යළිත් වරක් සිතා බැලීම කාලෝචිත ය.

සාමය ඇති කිරීමේ සැලසුම් සඳහා ප්‍රාදේශීය මට්ටමින් දේශපාලන සහභාගීත්වය ලබා ගැනීම සහ ආර්ථික වශයෙන් බලාත්මක කිරීම ඉලක්ක කොට ගැනීම අවශ්‍ය වේ.

## උතුරු නැගෙනහිර පළාත්වල නව දේශපාලන පද්ධතියක් සඳහා සහයදීම

දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ආයතනවල අකාර්යක්ෂමතාව සහ අසමත්කම නිසා පැනනැගී ඇති තත්ත්වයට මුහුණ දීම සඳහා නව ඉසව් කරා අවතීර්ණ විය යුතුව තිබේ. ශ්‍රී ලංකා රජය සහ එල්ටීටීඊය සතු දේශපාලන හා පරිපාලන ආයතන අතර සන්නිවේදන පද්ධතියක් කලාපීය වශයෙන් පිහිටුවීම මූලික අවශ්‍යතාවකි. ඒ මඟින් දෙපාර්ශ්වය අතර හටගන්නා ආරවුල් හෝ ගැටුම් සාකච්ඡාවට බඳුන් කළ හැකි ය. ඒ මඟින් ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය විධිමත් කළ හැකි වේ.

# යාපනය දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක්

යාපනයේ ජනතාව යාපන අර්ධද්වීපය තුළ මෙන් ම ඉන් පිටත ද විශාල වශයෙන් අවතැන් වූ හ. සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමත් සමග ම හමුදාවේ, පොලීසියේ සහ ඊපීඩීපී සංවිධානයේ බලය පිරිහෙන්නට පටන් ගත් අතර එල්ටීටීඊය විශේෂයෙන් කසිප්පු සහ කාන්තා ප්‍රශ්න ඇතුළු ආරවුල් සහ ගැටලු සම්බන්ධයෙන් ස්වකීය අවධානය යොමු කරන්නට විය. ගම් මට්ටමින් සම්ප්‍රදායික ප්‍රභූ පිරිස් සතු බලය හීන වී ගිය අතර පහත් යයි සම්මත කුල වලට අයත් විවිධ තරුණ කොටස් පෙරමුණ ගෙන ක්‍රියා කරන්නට වූ හ. අධි ආරක්ෂක කලාප හෙවත් යාපන භූමියෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ආරක්ෂක හමුදාවන් ගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නිසා දේශීය වශයෙන් අවතැන් වූ පවුල්වලට තම ඉඩකඩම් කරා ආපසු ඒම අපහසු වූ අතර, එම පවුල් යළි ස්වකීය ගම් බිම් බලා ආපසු පැමිණෙන වැසියන්ට අයත් ඉඩකඩම් හා ගේ දොර තම පදිංචිය සඳහා යොදා ගත් හ. ඉඩම් ආරවුල් හැරුණ විට, විවිධ කුල ගැටුම් යාපන ප්‍රදේශයේ සුලභ සිද්ධීන් බවට පත් වී ඇත.

## 1. ක්‍රියාත්මක වෙමින් තිබූ ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණ

- ⋆ පුද්ගලයින් විසින් අවිධිමත් යාන්ත්‍රණ හරහා ගැටුම් නිරාකරණය කිරීම - එල්ටීටීඊය, ග්‍රාමසේවක යනාදී
- ⋆ කතෝලික පල්ලිය
- ⋆ පුද්ගල වශයෙන් හෝ කමිටු හරහා පොදු ජන හැඟීමෙන් යුතුව ක්‍රියා කරන පුරවැසි කණ්ඩායම්

- ★ ගම්සභා : ග්‍රාම සංවර්ධන සමිති / ප්‍රජා මධ්‍යස්ථාන යනාදිය
- ★ රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවන ලද සංවර්ධන කමිටු

පුද්ගලයින් විසින් අවිධිමත් යාන්ත්‍රණ හරහා ගැටුම් නිරාකරණය කිරීම

යාපන දිස්ත්‍රික්කයේ සිදුවන ගැටුම් පිළිබඳ පැමිණිලි බොහොමයක් ප්‍රථමයෙන් ඉදිරිපත් කරනු ලබනුයේ ග්‍රාමසේවක, එල්ටීටීඊය සහ නීතිය ක්‍රියාත්මක කරනු ලබන බලධාරීන් වෙතට ය. ජනතාව ස්වකීය පැමිණිලි දැන් වැඩි වැඩියෙන් ගෙනෙනු ලබන්නේ එල්ටීටීඊ බලධාරීන් වෙත වන අතර, ග්‍රාමසේවක විසින් විසඳීමට අපොහොසත් වන පැමිණිලි ඊළඟට ඉදිරිපත් කරනු ලබන්නේ ද එල්ටීටීඊයේ විනිශ්චය සඳහා ය. ඇතැම් ආරවුල් කෙළින් ම පොලීසිය වෙත යොමු කරන අතර, එල්ටීටීඊය විසින් පොලීසිය වෙත ආරවුල් යොමු කිරීමේ අවස්ථා නැත්තේ ද නො වේ. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ ගම් නායකයින් විසින් අනුගමනය කරනු ලබන අවස්ථා ද එමට ය. සමාදාන විනිසුරුවන් හෝ ගුරුවරුන්, චෙට්ටි හෙවත් බෝට්ටු අයිතිකරුවන් හෝ කම්කරුවන් ගේ හාම්පුතුන් ද ගැටුම් නිරාකරණය කරනු ලබන අවස්ථා ඇත.

## කතෝලික පල්ලිය

ප්‍රජා ගැටලු නිරාකරණය කිරීමේ දී කතෝලික පූජක පක්ෂය වැදගත් කාර්යයභාරයක් ඉටු කරයි. වැසියන් ගේ ආරවුල් විසඳීමට ඉදිරිපත් වන පූජකවරයා ඔවුන්ගේ දුක්ගැනවිලිවලට ද සවන් දෙයි. ආරවුල්වලට සම්බන්ධ වී සිටින පාර්ශ්වයන් කැඳවා, ඔවුන් ගේ ප්‍රශ්නවලට මැදිහත් වී ඒ සඳහා පිළියම් යෝජනා කරනු ලබන්නේ ද පූජකවරයා විසිනි. ඔහු ගේ මැදිහත්වීම සාර්ථක නො වන අවස්ථාවල පූජක තුමාට ඉහළින් සිටින වෙනත් වගකිවයුතු අයට හෝ සෘජුව ම බිෂොප් තුමා වෙත පැමිණිල්ල යොමු කෙරේ.

පූජක තුමා ගේ ඉල්ලීම පිට බිෂොප් තුමා ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන් කැඳවා ගැටලුව නිරවුල් කිරීමට වැදගත් වේ. එහෙත් නෛතික හෝ ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් කතෝලික පල්ලියේ මැදිහත් වීමක් නැත.




## පොදු ජන හැඟීමෙන් යුතුව පුද්ගල වශයෙන් හෝ කමිටු හරහා ක්‍රියා කිරීමේ කණ්ඩායම්

1995 වසරේ දී ආරක්ෂක හමුදාව විසින් යාපනය අත්පත් කර ගැනීමෙන් පසුව වැඩි වශයෙන් බලධාරීන් හමු වී සාකච්ඡා කිරීම පිණිස විවිධ කමිටු ආරම්භ විය. එහෙත් නියෝජිතයින් ගේ හිඟකම නිසා ආරම්භ කිරීමට හැකිවූයේ හුදෙක් කමිටු දෙකක් පමණි. එනම් කතෝලික පල්ලිය විසින් පිහිටුවන ලද යුක්තිය හා සාමය සඳහා වූ කමිටුව සහ යාපන අර්ධද්වීපයේ ප්‍රධාන ආගමික නියෝජිතයින් ගෙන් සමන්විත සාමය සහ හොඳහිත සඳහා වූ පුරවැසි සභාවයි. මේවා දැන් බොහෝ දුරට අක්‍රීය වී ඇත. දැනට එම කමිටු සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක කිරීම, අධි ආරක්ෂක කලාප, සන්නද්ධ හමුදා විසින් ඉඩම් හා අනෙකුත් දේපල පදිංචිව සිටීම සහ සිසුන් විසින් හර්තාල් ව්‍යාපාර සංවිධාන කිරීමේ දී උදාවන තත්ත්වයන්ට හමුදාවෙන් සිදු විය හැකි ප්‍රතික්‍රියා වැළැක්වීම පිණිස අදාල බලධාරීන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම වැනි කටයුතුවලට මැදහත් වී සිටිති.

## ගම්සභා, ග්‍රාමසංවර්ධන සමිති, ප්‍රජා මධ්‍යස්ථාන යනාදිය

ග්‍රාම සංවර්ධන සමිති, ධීවර සමූපකාර සමිති, කෘෂිකාර්මික කමිටු, කාන්තා කමිටු, තරුණ කණ්ඩායම් සහ ප්‍රජා මධ්‍යස්ථාන වැනි දේශීය සංවිධාන ආරවුල් නිරවුල් කිරීමේ ලා විවිධාකාරයෙන් සම්බන්ධ වී සිටිති. ස්වකීය කාර්යය පථයට වැටෙන කරුණු හැරුණ විට, ප්‍රජාවට විශාල වශයෙන් බලපාන ප්‍රශ්න වලට සම්බන්ධ වීමට ඔවුහු මැලිකමක් දක්වති. ප්‍රජා මධ්‍යස්ථාන, අනෙක් සංවිධාන මෙන් නොව වඩාත් සක්‍රීය අයුරින් ක්‍රියා කරති. පෙර පාසල් ආරම්භ කිරීම, සංස්කෘතික සංදර්ශන, යටිතල පහසුකම් සැලසීම වැනි අවශ්‍යතා සංවිධානය කිරීම ඇතුළු ප්‍රජා ගැටලු නිරාකරණය කිරීමේ කටයුතුවල මෙම සංවිධාන සක්‍රීය ලෙස නිරතව සිටිති. එක ගමක් තුළ මෙ වැනි ප්‍රජා මධ්‍යස්ථාන 4ක් හෝ 5ක් ක්‍රියාත්මක වන අතර ඒවායේ සාමාජිකයින් අතර කාන්තාවන් සහ විවිධ කුලවලට අයත් පිරිස් ද සිටිති.

## රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති සංවර්ධන කමිටු

සමහර ආරවුල් සහ ගැටලු දේශීය රාජ්‍ය නො වන සංවිධාන හෝ ඔවුන් විසින් ස්ථාපනය කර ඇති කමිටු වෙත යොමු කෙරේ. මෙය හුදෙක් ඉඳහිට සිදුවන්නකි. නිදර්ශනයක් වශයෙන්, කාන්තා සහ සංවර්ධන මධ්‍යස්ථානය පවසන ආකාරයට ඇතැම් පවුලේ හෝ ගෘහස්ත ගැටලු ප්‍රථමයෙන් ගම් සභාවටත්, ක්ෂේත්‍ර නිලධාරීන්ටත්, පසුව ඔවුන් ගේ මාර්ගයෙන් රාජ්‍ය නො වන සංවිධිනයටත් යොමු කරන බව පෙන්වා දිය හැකි ය. කාන්තාවක් සිය සැමියාට නොදන්වා රාජ්‍ය නො වන සංවිධානයක මාසික රැස්වීම්වලට සහභාගීවීම නිසා ඇති වූ ආරවුලක් සම්බන්ධයෙන් සාමය ගොඩනැඟීමේ කාර්යයෙහි නිරත වෙනත් රාජ්‍ය නො වන සංවිධානයක් මැදිහත් වූ අවස්ථාවක් ගැන ද වාර්තා වේ.

## 2. සාම්ප්‍රදායික නායකත්වයේ වෙනස්වීම්

ගම් පළාත්වල සාම්ප්‍රදායික නායකත්වයේ සැලකිය යුතු වෙනස්වීම් සිදුවීම නිසා ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය හැසිරවීමේලා ගමේ නායකයින් මෙතෙක් දැරූ වගකිවයුතු තත්ත්වය ද යම් වෙනසකට භාජන වී ඇත. ඔවුන් නායකත්වය ගෙන ක්‍රියාකළ ග්‍රාම සංවර්ධන සමිති වැනි සමාජ සංවිධාන ජනතාව අතර පිරිහීමට ලක් වූ අතර තරුණ කොටස් හා කොන්වී සිටි පිරිස් හෝ අඩු කුලවල සාමාජිකයින් පෙරමුණ ගත් අලුත් සංවිධාන බිහි වෙන්නට පටන් ගත්තේය. මෙලෙස ගමේ සාම්ප්‍රදායික නායකත්වයේ පිරිහීම ආරම්භ වුව ද යම් යම් අවස්ථාවල ගැටලු නිරාකරණය සම්බන්ධයෙන් ගමේ නායකයෝ වැදගත් වූ හ. වාර්ගික අර්බුදය නිසා සාරධර්ම ගිලිහීයෑම, අධ්‍යාපනයක් නොමැති වීම සහ ඒ හේතුවෙන් ඇති වූ නොසන්සුන්කම, සහ තරුණ පිරිස්වල දරදඬු හැසිරීම මේ තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව බොහෝ වැඩිහිටියන් ගේ අදහස ය. ප්‍රජා කටයුතුවල දී කරුණ කොටස් අධිවේගයෙන් ක්‍රියාකළ ද, ඔවුන් අවශ්‍ය තන්හි ක්‍රිස්තියානි සහ කතෝලික පූජකවරුන් ගේ මගපෙන්වීම අපේක්ෂා කළ බව ජනතාව ගේ අදහස විය. මේ අතර, උසස් කුලවලට අයත් ප්‍රභූන් ගේ මෙන් ම ගමේ උසස් යයි සම්මත පවුල් සතු බලපුළුවන්කාරකම් ද බිඳ වැටෙන්නට විය.

ග්‍රාම සංවර්ධන සමිති අභිබවා, ප්‍රජා මධ්‍යස්ථාන කරලියට ඒම සඳහා සමාජ හා පන්ති අර්බුද මුල්විය. ග්‍රාම සංවර්ධන සමිති අකාර්යක්ෂම, දූෂිත හා අනවශ්‍ය සංවිධාන වශයෙන් ජනතාව අතර ප්‍රකට විය. ඒ නිසා ගමේ සාම්ප්‍රදායික නායකත්වය දැන් “චුත වී” ඇතැ යි යන මතය ජනතාව අතර පැතිරෙන්නට විය. තරුණ පිරිස් මුල් තැනක් ගෙන පිහිටුවන ලද ප්‍රජා මධ්‍යස්ථානවල සාර්ථකත්වයට එක් හේතුවක් වූයේ, ග්‍රාම සංවර්ධන සමිති මෙන් නො ව

ඔවුන් පහත් යයි සම්මත කුලවලට අයත් පුද්ගලයින් පවා තම සංවිධානයට සම්බන්ධ කර ගැනීමයි.

අනෙක් දිස්ත්‍රික්කවල මෙන් නො ව, ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ හරහා යාපන ප්‍රදේශයේ ප්‍රජා මධ්‍යස්ථාවල මූලිකත්වයෙන් වගකිවයුතු කාර්යය භාරයක් ඉටු කෙරේ. එහෙත් සාම්ප්‍රදායික නායකත්වය තවමත් සක්‍රීයව පවතින ගම්බද පෙදෙස්වල ගම් සභා ක්‍රියාත්මකව පවතී. ග්‍රාමසේවක ඇතුළු ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයින් තිදෙනකු විසින් වගකීම් එකොළහක් හොබවන තෙන්නමාරච්චි ප්‍රදේශයේ ගම්සභා මෙයට කදිම උදාහරණයකි. එහෙත් ඒවා එතරම් ක්‍රියාශීලී නොවන බව පෙනුණි. ආරවුල් වලට සම්බන්ධ පිරිස් සහනය පතා වැඩි වශයෙන් ම ග්‍රාමසේවක, පොලීසිය සහ එල්ටීටීඊ යේ පිහිට පැතු හ.

අවතැන්වීම හා වාර්ගික අර්බුදය හේතු කොට ගෙන සමාජයේ වැදගත් අංශයන් වෙත තියුණු බලපෑම් ඇති විය. නිදර්ශනයක් වශයෙන් ගම් 435 කින් ග්‍රාමසේවක නිලධාරියකු පත් කර ඇත්තේ 373 කට පමණි. ප්‍රශ්නයක් පැන නැගුණු අවස්ථාවන්හි දී ගම් වැසියෝ එකට රැස්වී සාකච්ඡා කර ඔවුනොවුන් ම විසඳුමක් කරා පිවිසෙති. චාවාකච්චේරි ප්‍රදේශයේ හින්දු කෝවිල් කීපයක දිගින් දිගට සොරකම් ඇති වූ අවස්ථාවේ, තරුණ පිරිස් සංවිධානය වී ඒවා ආරක්ෂා කළ හ.

## 3. අර්බුදයට සම්බන්ධ පාර්ශ්වකරුවන් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ආරම්භ වූ විවිධ සංවිධාන

යාපන වැසියන්ට විවිධ හමුදා සහ සහය හමුදාවල ආධිපත්‍යය යටතේ ජීවත් වීමට සිදු වීම, සාම්ප්‍රදායික ගමේ නායකත්වය අභාවයට යැමට එක් හේතුවක් විය. 1990 - සිට 95 දක්වා යාපනය එල්ටීටීඊ පාලනය යටතේ තිබූ අවධියේ සියලු ජනතා ප්‍රශ්නවලට විසඳුම් ලබාගැනීමට සිදු වූයේ එල්ටීටීඊ බලධරයන් ගෙනි. එල්ටීටීඊ ය සතු පොලිස් ස්ථාන හා අධිකරණ ආයතන ද විය. ජනසතු ප්‍රශ්න විසඳීමේ ලා මුල දී එල්ටීටීඊ ය පත් කළ ගම්සභා දැන් අක්‍රිය වී තිබේ.

1995 දී ශ්‍රී ලංකා යුධ හමුදාව යාපනය යටත් කර ගැනීමෙන් පසු, හමුදාව, පොලීසිය සහ අධිකරණය වෙත තම ප්‍රශ්නවලට විසඳුම් පතා ජනතාව සමීප වූ හ. හමුදාවේ අනුග්‍රහය යටතේ ප්‍රදේශීය ලේකම් ගේ අධීක්ෂණයට යටත් පුරවැසි කමිටු පිහිටුවන ලද අතර, අත්අඩංගුවට පත් පුද්ගලයින් සම්බන්ධයෙන් සොයා බැලීම ඒවායේ වගකීම විය.

සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වීමෙන් පසු යුක්තිය හා සාමය සඳහා වූ කොමිසම සහ සාමය හා හොඳහිත සඳහා වූ පුරවැසි සභාව අක්‍රිය තත්ත්වයට පත්වුව ද සිසු විරෝධතා මැඩීමට හමුදාව සහ පොලීසිය ක්‍රියා කරන අවස්ථාවන් හි දී, එම ආයතන ක්‍රියාත්මක විය. සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වීම නිසා විශේෂයෙන් ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය සම්බන්ධයෙන් යාපන අර්ධද්වීපයේ සන්නද්ධ සංවිධාන අතේ පැවති බල තුලනය දැඩි වෙනසකට භාජනය විය. කයිට්ස් දූපතේ ස්ථාපිතව තිබූ ඊපීඩීපී ආධිපත්‍යය අභාවයට ගොස් එල්ටීටීඊ බලය ආදේශ විය. ජනතාව සිය ගැටලු නිරාකරණය කරගැනීම සඳහා නිසගයෙන් ම එල්ටීටීඊ ය දෙසට නැඹුරු විය.

## 4. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ තුළ එල්ටීටීඊ යේ අපැහැදිලි කාර්යයභාරය.

යාපන වැසියන් අතර හටගන්නා ආරවුල් නිරාකරණය කිරීමේ ලා එල්ටීටීඊ ප්‍රමුඛස්ථානය ගෙන කටයුතු කරයි. නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය සහ කාන්තාවන්ට අදාල ප්‍රශ්න එල්ටීටීඊය සාර්ථක අයුරින් විසඳා ඇත. තීරණ ක්‍රියාත්මක කිරීමට නො හැකි වීමත්, මහජනතාව විසඳුම් පතා යොමු කරන ප්‍රශ්න සංඛ්‍යාව දෙස බලන විට එල්ටීටීඊ යේ ගැටුම් නිරාකරණය කිරීමේ කාර්යක්ෂමතාව ඒ තරම් සාර්ථක නො වන බව පෙනුණි.

### 4.1 අවිධිමත් යාන්ත්‍රණය හරහා ගැටුම් නිරාකරණය කිරීමේ දී එල්ටීටීඊ ය දක්වන කාර්යක්ෂම භාවය ජනතා ඇසින්

එල්ටීටීඊ ය වෙත යෙමු කෙරෙන ආරවුල් සංඛ්‍යාව වැඩි වෙමින් පවතී. සාම්ප්‍රදායික ක්‍රමෝපායන්වල දුර්වලකම සහ විකල්ප ක්‍රම නො මැති වීම මෙන් ම පොලීසිය කෙරෙහි අප්‍රසාදය පළවීම එයට එක් හේතුවකි.

1995ට පෙර යාපනය එල්ටීටීඊ පාලනයට නතුව තිබූ අවධියේ නීතිය ක්‍රියාවේ යෙදීමේ දී ඔවුන් දැක් වූ “කාර්යක්ෂමතාව” දෙවන හේතුවයි. බහුතරයක් වන සිංහල පොලිස් නිලධාරීන් දෙමළ භාෂාව නො දැන සිටීමත්, ආරවුල් වලට සම්බන්ධ පාර්ශ්ව කරුවන්ට ආගන්තුක වීමත්, නිසා පොලීසියෙන් සාධාරණය බලාපොරොත්තු විය නො හැකි බව උතුරේ ජනතාව අදහස් කරයි. පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම හා අල්ලස් ගැනීම පිළිබඳ ව පොලීසියට චෝදනා එල්ල වී ඇත. අනෙක් අතට පොලීසිය වෙත කෙරෙන මහජන පැමිණිලි අධිකරණය වෙත යොමු කිරීම නිසා අධික වියදමක් දරා කාලයක් පුරා උසාවි යෑමට සිදුවීම මහජනතාවට ඉසිලිය නො හැකි බරක් වී තිබේ. ආරවුල් වලට මැදහත් වීමට පොලීසිය ප්‍රවේශම් වන අවස්ථා ද නැත්තේ නො වේ. කලින්

වාර්තාගත අයුරින් කටයුතු කිරීම සහ ඕනෑ ම වේලාවක හමු වී පහසුවෙන් අවුල බේරා ගැනීමට හැකිවීම වැනි කරුණු නිසා, මහජනතාව එල්ටීටීඊ ය වඩාත් ප්‍රිය කරයි.

නීතිය ක්‍රියාත්මක කිරීමේ දී එල්ටීටීඊ ය ලබා ඇති ජනප්‍රියතාවය, එල්ටීටීඊ සටන් කාමියකු මෙසේ විස්තර කරයි. " මිනිසුන්ට අපි විශ්වාසයි; ඔවුන් අප කෙරේ විශ්වාසය තබා තිබෙනවා. අපි කතා කරන කොට ඔවුන් නිශ්ශබ්දව සිටිනවා."

පොලීසිය සහ ග්‍රාමසේවා නිලධාරීන් විසින් පැමිණිලි කරුවන්ට එල්ටීටීඊ ය වෙත යැමට උපදෙස් දෙන අවස්ථා ද නැත්තේ නො වේ.

## 4.2 අවිධිමත් යාන්ත්‍රණය හරහා ගැටුම් නිරාකරණය කිරීමේ එල්ටීටීඊ ය සතු කාර්යක්ෂමතාව පිළිබඳ යථාර්තය

ස්වකීය තීරණ ක්‍රියාත්මක කිරීම නො හැකි වීමත් ජනතාව තබා ඇති අධික බලාපොරොත්තු ඉටු කිරීමට නො හැකි වීමත් නිසා එල්ටීටීඊ යේ කාර්යක්ෂමතාව ඉතා අඩු මට්ටමක පවතින බව නිතැතින් ම පැහැදිලි විය. සටන් විරාම ගිවිසුමෙන් සීමාවන් පැනවී තිබීම සහ ශ්‍රී ලංකා රජයේ බලය යළි ස්ථාපිත වී තිබීම හේතු කොට ගෙන, එල්ටීටීඊ ය වෙත ලැබෙන විශාල පැමිණිලි සංඛ්‍යාව සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අපහසු වී ඇතැ යි එහි දේශපාලන අංශ නියෝජිතයකු පැවසී ය. විශේෂයෙන් සාපරාධී ස්වභාවයේ නඩු, එ නම් සොරකම් මෙන් ම ඉඩම් සහ මුදල් පිළිබඳ ආරවුල් විසඳීමේ ලා එල්ටීටීඊ ය අපොහොසත් වී ඇති නිසා, බොහෝ පිරිස් ඔවුන් කෙරෙහි කලකිරීමට පත්ව ඇති බව පෙනේ.

ආරවුල් විසඳීම සඳහා තමන් මැදිහත් වීමට අකමැති නිසාත්, යම් පරිශ්‍රමයක් දැරී නම් එය ද පසුබෑමට ලක්ව ඇති නිසාත් ආරවුල් වලට සම්බන්ධ පිරිස්වලට පොලීසිය හෝ කෘෂිකාර්මික කමිටු, ග්‍රාමසේවක, හෝ මානව හිමිකම් කොමිසම වෙත යන ලෙස එල්ටීටීඊ ය උපදෙස් දෙයි. පොලීසියට නිරාකරණය කළ නො හැකි ආරවුල් එල්ටීටීඊය ස්වකීය දිස්ත්‍රික් මූලස්ථානය වෙත ඉදිරිපත් කරයි. ආරවුල් විසඳීමේ ලා මැදිහත්වීම හෝ උපදෙස් ලබාදීම යන ක්‍රමෝපායන් තමන් නිරන්තරයෙන් යොදාගන්නා බව එල්ටීටීඊ ය පවසයි. කාන්තා අපචාරය සහ විවිධ සමාජ ප්‍රශ්න ඇතුළු කාන්තාවන් ගොදුරුවන ගෘහස්ත හිංසනය සහ අනෙකුත් අනේකවිධ හිංසා, පීඩා සහ හිරිහැර සම්බන්ධයෙන් එල්ටීටීඊ ය ඇඩි උනන්දුවකින් ක්‍රියා කරයි.

පෙම්වතා අතහැර දැමූ හා විවාහ නොවූ එහෙත් ගැබ්ගත් තරුණ ගැහැණු ළමුන් සම්බන්ධයෙන් ඔවුන් ගේ පවුලේ මුදල් තත්ත්වය පරීක්ෂාකර, පෙම්වතුන්

යුවල තමන් වෙත කැඳවා කරුණු විභාග කිරීම එල්ටීටීඊ ය අනුගමනය කරන එක් ක්‍රියාමාර්ගයකි.

ප්‍රසිද්ධියේ කාන්තාවන්ට හිරිහැර කිරීම සම්බන්ධයෙන් සැකකරුවන් "අත්අඩංගුව" ගෙන රඳවා තබා උපදෙස් දීමෙන් පසු නිදහස් කිරීම එල්ටීටීඊ යේ යුක්තිය පසිඳලීමේ තවත් අවස්ථාවක් සේ සැලකේ.

එල්ටීටීඊ යේ පරිපාලනය යටතේ නිදහසේ සැරිසැරීමට කාන්තාවන්ට ඉඩ සැලසී ඇති අතර ඔවුන් ගේ ආරක්ෂාව ද තහවුරු වී තිබේ.

සමාජය පිළිබඳ දැනුවත් කිරීමේ මුවාවෙන් එල්ටීටීඊ ය කසිප්පු ජාවාරම්, ගණිකා වෘත්තිය හෝ සොරකම් කිරීමේ සිද්ධීන් සම්බන්ධයෙන් මැදිහත් වී ක්‍රියාකරයි.

මත්පැන් පාවිච්චිය, අසභ්‍ය චිත්‍රපට සහ ගණිකා වෘත්තිය හේතු කොට ගෙන සමාජ ශික්ෂණය පිරිහී ඇති බවට එල්ටීටීඊ ය වෙත කරුණු සැල වී ඇත. එ වැනි අවස්ථාවල දී ගම පුරා රැස්වීම් පැවැත්වීම, විධාන නිකුත් කිරීම, ගම්සභා පිහිටුවීම හෝ "කරදරකාරයින්" කැඳවීම් හරහා එල්ටීටීඊ ය ක්‍රියාත්මක වේ. කසිප්පු තහනම් කිරීම, සොරුන්ට ප්‍රසිද්ධියේ අවවාද කිරීම සහ ඍජු නියෝග නිකුත් කිරීම එල්ටීටීඊ ය අනුගමනය කරන තවත් ක්‍රියාමාර්ගයකි. එල්ටීටීඊ ය විසින් පිහිටුවන ලද "දැනුවත් කිරීමේ කණ්ඩායම්" එ තරම් ක්‍රියාශීලී ඒවා නො වී ය. ඒවා එක්තරා ප්‍රදේශයන්ට පමණක් සීමා විය. බටහිර වල්ලිගාමම් ප්‍රදේශයේ දැනුවත් කිරීමේ කණ්ඩායමක් විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාවට වීථිචර්යා පද්ධතියක් ද අඩංගුව තිබුණි.

එය මෙසේ ය :-

**බීමත්ව වීථිවල නො හැසිරිය යුතු යි.**

**සන්ධ්‍යා කාලයේ ළමුන් වීථි සංචාරය කිරීමෙන් වැලකී සිටිය යුතු යි.**

**වීථි වල ගමන් කිරීමේ දී කාන්තාවන් හිසේ ලකුණක් ඉවත් කිරීමේ පුරුද්ද අත්හැරිය යුතු යි.**

එල්ටීටීඊ යේ තීන්දු කෙතෙක් දුරට අදාල පාර්ශ්වයන් විසින් ගරු කරනු ලබන්නේ ද යන්න පැහැදිලි නැත. එල්ටීටීඊ යට සවන් දෙන්නේ එසේ කළ යුතු නිසාම බව සමහරු පවසති. "භය" වැදගත් සාධකයක් වී තිබේ.

එල්ටීටීඊ යට තම තීන්දු ක්‍රියාත්මක කිරීමට බලයක් නැති බවත්, ඔවුන් ගේ තීන්දු නොපිළිගන්නා පාර්ශ්වයන්ට අධිකරණය වෙත යා හැකි බවත් සමහරු

පැවසූ හ. ශ්‍රී ලංකා රජයේ සහ එල්ටීටීඊ යේ ද්විත්ව පරිපාලනය යටතේ එක හා සමාන අවසාන තීන්දු නො ලැබේ. එකම ගැටලුව පොලීසිය සහ එල්ටීටීඊ ය වෙත යොමු කළ විට, පොලීසිය ඒ පිළිබඳ ව කටයුතු නො කරන බව බහුතරයේ විශ්වාසය වී ඇත. ධනවතුන් සහ උගතුන් ආරවුල් බේරුම් කරගැනීම සඳහා අධිකරණයේ පිහිට පතන අතර දුප්පතුන් එල්ටීටීඊ ය කරා පැමිණෙ තැයි එල්ටීටීඊ ය පවසයි. එල්ටීටීඊ ය සමාජ සාධාරණය ඉටුකිරීම සඳහා මැදිහත් වීම තහවුරු කෙරෙන කදිම සාක්ෂියකි, ගම්වල ධනවත් පුද්ගලයින් අය කරනු ලබන අධික පොලී ප්‍රමාණයට එරෙහිව තදින් ක්‍රියාකිරීම.

## 5. ගැටුම්වල ස්වභාවය සහ ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය

පවුල් ප්‍රශ්න, මත්පැන්, මුදල් ගනුදෙනු සහ ඉඩම් ආරවුල් ගම් මට්ටමේ ගැටුම් වශයෙන් සැලකේ. ආරවුලේ ස්වභාවය අනුව ය, විසඳුම් කරා පාර්ශ්වයන් යොමුවන්නේ. ධීවරයකු ගේ බිරියක් ගෙදර ඇති වූ අගහිගකමක දී පවා ස්වාමියාට රැකියාව කරගැනීම සඳහා බෝට්ටුව සපයා දුන් “චෙට්ටි” මුදලාලි වෙත යෑම වැනි මුදල් හදල් අතමිටේ තිබෙන පුද්ගලයින් වෙත සරණ පතා යෑම යාපනයේ මෙන් අනෙකුත් දිස්ත්‍රික්කවල ද සුලබව සිදු වේ.

ස්ත්‍රී දූෂණය හා ගෘහස්ත අපචාර සිද්ධීන් සම්බන්ධයෙන් කෙළින් ම එල්ටීටීඊ ය මැදිහත් වේ. ණයට ගත් මුදල් ආපසු නො ගෙවීම හෝ උකස් කරන ලද රන් රිදී භාණ්ඩ හෝ වේතන නො ගෙවීම හා සම්බන්ධ ප්‍රශ්න ප්‍රජා මධ්‍යස්ථාන, ග්‍රාමසේවා නිලධාරී හෝ එල්ටීටීඊ ය වෙත යොමු කෙරේ. ධීවර කටයුතු වලට එරෙහිව පනවා ඇති සීමා හෝ හමුදාව විසින් ප්‍රයෝජනයට ගෙන ඇති ඉඩකඩම් හෝ අවතැන්වූවන්ට අධි ආරක්ෂක කලාපය තුළ ඉඩම්වල පදිංචිවීම වැනි ප්‍රශ්න හමුදා බලධාරීන් වෙත ඉදිරිපත් කළ හැකි ග්‍රාමසේවා නිලධාරීන් ඇතුළු වෙනත් ආයතන වෙත යොමු කරනු ඇත. ඉඩම්වල පදිංචිවීම වැනි කරුණු රජයේ අවධානයට ලක්වීම අවශ්‍ය ය. වැට හෝ මායිම් පිළිබඳ ගැටුම් හෝ කෝවිල් පිළිබඳ ප්‍රශ්න යාපනයේ ජනතාවට මහත් හිසරදයක් වී ඇතැ යි වරක් එල්ටීටීඊ නියෝජිතයෙක් පැවසී ය. කෝවිල් භාර හෝ පිරිස් සහ පූජකවරයා හෝ ප්‍රභූ පවුල් අතර ඇති වන කෝවිල් ආරවුල් ද ඉතා බහුල ය. වසර 30 ක් පුරා කෝපායි ප්‍රදේශයේ ධනවත් පවුලක පූසාරි වරයා ගේ මාර්ගයෙන් කෝවිලේ පූජා පැවැත් වූ මුත් 1999 වසරේ සිට එය කෝවිල් භාරකාර මණ්ඩලය හරහා කළ යුතු බවට ගත් තීරණයකට එරෙහිව අවසාන වශයෙන් තීන්දුවක් දිය හැකි වූ අධිකරණයට පමණි.

එක ම කාරණය සඳහා පැමිණිලි පක්ෂය අධිකරණයේ පිහිට සොයද් දී, වග උත්තරකාර පාර්ශ්වය එල්ටීටීඊ යෙන් තීරණයක් බලාපොරොත්තු වන

අවස්ථා ද නැත්තේ නො වේ. අධිකරණ තීන්දුවලට එරෙහිව ඇතැම් පුද්ගලයෝ එල්ටීටීඊ යේ සරණ පතා යති.

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන්, වෙනත් දිස්ත්‍රික්කවල සිට ආපසු පැමිණි පුද්ගලයින් සහ කෙදිනක හෝ අවතැන් නො වූ පිරිස් අතර සිදුවන ගැටුම් සුලබ සිද්ධියක් වී තිබේ. යාපන වැසියන් සහ වන්නි ප්‍රදේශයේ සිට ආපසු එන පිරිස් අතර විවිධ ආරවුල් හටගැනේ. කුල ප්‍රශ්නය ද මේවාට මුල් වී තිබේ. අවතැන් වී ආපසු පැමිණෙන උසස් කුලවලට අයත් පුද්ගලයෝ තම අනන්‍යතාව සුරැකීම සඳහා තදින් අඩිටන් කරගෙන සිටිති. වන්නි ප්‍රදේශයේ සිට යාපනය බලා ආපසු එන පිරිස් "තක්කඩින්" වශයෙන් සලකනු ලැබේ. (1 වැනි ස්ද්ධි අධ්‍යයනය බලන්න.)

මුළු යාපන අර්ධද්වීපයේ ම ආරවුල් වලට මුල් වී ඇත්තේ කුල භේදයයි. සමාජය හමුවේ පුද්ගලයින් කුලය මත කොන්කිරීම, කුල අතර විවාහ අනුමත නො කිරීම, පහත් කුල වල ජනතාවට කෝවිලට යෑමට ඉඩ නො දීම, උසස් කුලවලට අයත් පුද්ගලයින් තම ඉඩම් හරහා අඩු කුල ජනයාට ළිඳකට හෝ ඉඩමකට යෑමට ඉඩ නො දීම, අඩු කුල ජනයාට අධ්‍යාපනය ලබා ගැනීමේ දී හෝ මුදල් ඉපයීමේ දී ඇති වන බාධක හා අවහිරතා, උසස් කුලවලට අයත් පුද්ගලයින් වෙසෙන පළාත්වල අඩු කුල පිරිස් ඉඩම් මිල දී ගැනීම නිසා ගැටුම් ඇතිවීම, කුල භේදය හේතුවෙන් මතුවන අවස්ථා වෙති.

සම්පත් සහ පහසුකම් භුක්ති විඳීමේ දී අඩු කුලවල ජනතාවට සිදුවන හානි වලකාලීම සඳහා එල්ටීටීඊ ය ක්‍රියා කළ ද, එය සියයට සියයක් ම සාර්ථක වී නැත. එල්ටීටීඊ ය මෙම සමාජ විෂමතා කුල භේදය නිසා ඇති වන ප්‍රශ්න වශයෙන් පිළිගැනීම ප්‍රතික්ෂේප කර ඇති අතර, ඒවා හුදු සමාජ ප්‍රශ්න වශයෙන් හඳුන්වා දීමට පුරුදු වී සිටී. "පහත් කුල ගැටුම්" ඒ තරම් බරපතළ නො වන අතර ආරවුල් ඇති කරගන්නා සේ ම යළි ඒවා අමතක කර එකතුවීම, ඒවාට සම්බන්ධ පුද්ගලයින් ගේ සිරිත වී තිබේ. හිංසාකාරී තත්වයක් උදාවුව හොත් පමණක් පොලිසිය හෝ එල්ටීටීඊ ය මැදහත් වේ. ජාත්‍යන්තර රාජ්‍ය නො වන සංවිධාන සහ එක්සත් ජාතීන් ගේ ආයතන ආධාර බෙදාදීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ දී මතුවන විෂමතාවන් ආරවුල් හෝ ගැටුම්වලට තවත් හේතුවක් බව බොහෝ පිරිස් පැවසූ හ.

## ***සිද්ධි අධ්‍යයනය 01***

### ***ශාන්ත මේරි ක්‍රීඩා සමාජය සහ ශාන්ත නිකලස් ක්‍රීඩා සමාජය අතර පාපන්දු තරගයේ දී ඇති වූ හිංසාකාරී සිද්ධීන්.***

2003 ජනවාරියේ සිට යාපනයට නුදුරු නාවන්තුරෙයි කතෝලික ග්‍රාමයේ වැසියන් අතර ශාරීරික හා දේපල හානි සිදු කරමින් හිංසාවාදී ක්‍රියා හටගැනුණි. මෙම ධීවර ගම්මානයේ වැසියෝ මුකුවා සහ කිම්ලාරු වශයෙන් කරයාර් ධීවර කුලය යටතේ උප කුලවලට බෙදී සිටිති.

ශාන්ත මේරි සහ ශාන්ත නිකලස් දේවස්ථාන දෙක මුකුවා සහ කිම්ලාරු උප කුල දෙකට අයත් වැසියන් ආගමික කටයුතු සඳහා වෙන් වශයෙන් බෙදා වෙන් කරගෙන තිබේ. ඉරිදා දේව මෙහෙය සහ නත්තල් උත්සව ද වෙන් වෙන් කුල වශයෙන් පැවැත් වේ. කුල භේදය ආගමික උත්සව වලට වලංගු නො වේ. කුල වශයෙන් බෙදුණ පාර්ශ්වයන් දෙක සඳහා වෙන ම පාපන්දු ක්‍රීඩා සමාජ දෙකක් ඇති අතර 2001 වසරේ පැවැති පාපන්දු තරගයකින් පසුව දෙ පිරිස අතර හිංසාවාදී ක්‍රියා ඇති විය. ආරවුල සමතයකට පත්කිරීම සඳහා එල්ටීටීඊ ය යාපන පාපන්දු ක්‍රීඩා සමාජය හා සාකච්ඡා කිරීමට එකඟත්වය පළ කළේ ය. අන්තිමට සිදු වූ කලහාකාරී ක්‍රියාවල දී ශාන්ත නිකලස් පාපන්දු ක්‍රීඩා සමාජයට අයත් පාපන්දු කුසලානය විනාශ කරන ලදී. 1990 ගණන්වල සාමය පැතිරී තිබුණ ද, ශාන්ත මේරි ප්‍රදේශයේ වැසියන් සය වසරකට පසු ආපසු සිය නිවෙස් බලා පැමිණීමේ දී යළි හිංසාවාදී ක්‍රියා ආරම්භ විය. වන්නි ප්‍රදේශයේ සිට ආ නිසාම ඔවුන්, විරුද්ධ වාදීන් ගේ අවඥාවට ලක්ව සිටිති. ශාන්ත මේරි පාර්ශ්වය නඟන චෝදනා වලින් සමහරක් මෙ සේ ය: අනාථයන් වශයෙන් පොදු ස්ථානවල විසීමට සිදුවීම, නාවුක හමුදාවේ අනුදැනුම පිට ශාන්ත නිකලස් පාර්ශ්වය තමන් ගේ බෝට්ටු සොරා ගැනීම, අවතැන් වීමට පෙර ශාන්ත නිකලස් වැසියන් බොහොමයක් කුලී කාරයින් වශයෙන් දිවි රැකගත්ත ද දැන් ඔවුන් ධීවරයන් වී සිටීම සහ නාවුක හමුදාව මුහුදු තීරයේ කොටසක් සිය පදිංචිය සඳහා යොදා ගැනීම නිසා, ශාන්ත මේරි සහ ශාන්ත නිකලස් වැසියන් දෙ ගොල්ලන් එක ම මුහුදු තීරයක් ප්‍රයෝජනයට යොදාගැනීමට සිදු වීම යනාදිය වේ. මත්පැනට අබ්බැහිවීම සහ අධ්‍යාපනයක් නො මැතිවීම මෙම ආරවුල් වලට බොහෝ දුරට හේතු වී තිබේ. සුලු සිද්ධීන්, බලවත් හිංසාකාරී ක්‍රියාවන් බවට පත්වීමට එක් හේතුවක් වී ඇත්තේ තරුණ කොටස් ඒවාට සම්බන්ධ වීමයි. කාන්තාවෝ ද මෙම හිංසාකාරී ආරවුල්වල කොටස් කරුවන් වී සිටිති.

පූජකවරයන් ගේ මැදහත් වීමෙන් පවා යහපත් ප්‍රතිඵල ලබාගැනීම අපහසු විය. ජනවාරියේ දී ගැටුම් උග්‍ර වීමෙන් පසු බිෂොප් තුමා, පොලීසිය සහ එල්ටීටීඊය මැදිහත් වී ආරම්භ කළ සාම වැයම ද අසාර්ථක විය. සාමය තහවුරු කිරීම සඳහා පිහිටුවන ලද සාම කමිටුවල නියෝජිතයින් පවා ගැටුම්වලට සම්බන්ධ වීම නිසාත්, තරුණ පිරිස් පැත්තකට වී සිටීම නිසාත් ගැටලුව සමථයකට පත්කිරීම අපහසු විය. අප්‍රියෙල් 29 දින ශාන්ත නිකලස් වැසියන් පැවැත් වූ මංගල්‍යය සහ සංගීත සන්දර්ශනයට, ශාන්ත මේරි පාර්ශ්වයට ආරාධනා නො කිරීම නිසා යළි කලහාකාරී ක්‍රියා හටගැනුණි. අවසානයේ දී එල්ටීටීඊ යේ මැදහත්වීම මත ගැටුම් අවසන් විය. පොලීසියේ සහභාගීත්වය නො මැතිව, එල්ටීටීඊ යේ සහ බිෂොප්වරයා ගේ මැදිහත් වීමෙන් සාම කමිටුවක් දැන් පිහිටුවා ඇත.

ගැටුම් වැලැකීමට හැකි වී ඇත්තේ එල්ටීටීඊ යට පමණි. කලහකාරීන් අත්අඩංගුවට ගෙන රඳවා තැබීමේ එල්ටීටීඊ ක්‍රියාදාමය 1999 පටන් සිදුවන්නකි. මෙ වර ද කලහාකාරීන් අත් අඩංගුවට ගන්නා බවට එල්ටීටීඊ ය තර්ජනය කොට තිබේ. නවන්තුරේ ප්‍රදේශයේ පොලිස් ස්ථානයක් පිහිටුවා නැත. පොලීසිය ප්‍රශ්න ඇති කරන බවත්, පොලීසියක් ආරම්භ කළ හොත් ගණිකා වෘත්තිය පැතිරීමට ඉඩ ඇති බවත් ප්‍රදේශයේ වැසියෙක් පැවසී ය.

## *සිද්ධි අධ්‍යයනය 02*

## *ආපසු ගම් බිම් කරා පැමිණෙන පවුල් සතු ගැටලු සහ ආරවුල් - මූවර් පාර, යාපනය.*

1990 දී එල්ටීටීඊ ය මුස්ලිම් ජාතිකයින් පලවාහරින තුරු යාපනයේ මුවර් වීදියේ මුස්ලිම් බහුතරයක් පදිංචිව සිටිය හ. දැනට පවුල් 50 ක් ආපසු පැමිණ යාපන වීථියේ පදිංචිව සිටිති. මූවර් වීදියේ තිබූ බොහෝ දේපළවලට විනාශය සිදුවූයේ යුද්ධයෙන් නො ව කොල්ල කරුවන් ගෙනි. දැනට නිවාස 100 ක් අවතැන් වූ දෙමළ ජාතිකයින් සහ නිවෙස් අටක පමණක් මුල් මුස්ලිම් පවුල් පදිංචි වී සිටිති. ආපසු පැමිණි මුස්ලිම් ජාතිකයින් ගෙන් බහුතරය පිරිමි වන අතර තම නිවෙස් තනන තුරු ඔවුහු මුස්ලිම් දේවස්ථානවල පදිංචි වී සිටිති. එල්ටීටීඊ යේ 10% බද්ද නිසා තම ව්‍යාපාර යළි ආරම්භ කිරීම අපහසු වී ඇති බව මුස්ලිම් ජාතිකයෝ පවසති. තමන් පලවා හරින ලද්දේ එල්ටීටීඊ ය නිසා ඔවුන් ගේ 10% බද්දෙන් තමන් නිදහස් කළ යුතු යයි ද මුස්ලිම් ජාතිකයෝ කියා සිටිති.

ආපසු පැමිණි මුස්ලිම් ජාතිකයින්ට කලින් තමන් සතුව තිබූ දේපළ යළි ලබාගැනීම ගැටලුවක් වී තිබේ. ඇතැම් පදිංචිකරුවන් මාස තුනක් ඇතුළත දී දේපළ ආපසු භාරදීමට එකඟ වූ අතර, එබඳු එකඟත්වයකට පැමිණීම අපහසු වූ සිද්ධීන් ග්‍රාමසේවක, මුස්ලිම් මන්ත්‍රීන් සහ එල්ටීටීඊ යේ අවධානයට යොමු කර තිබේ. එල්ටීටීඊ ය මෙම ප්‍රශ්නවලට මැදිහත් වීමට අකමැති බව පෙනී ගොස් තිබේ. එහෙත් මෙම ප්‍රශ්නය තමන් මාසික රැස්වීම්වල දී මූවර් වීථියේ මුස්ලිම් ජාතිකයින් සමග සාකච්ඡා කරන බව එල්ටීටීඊ ය පවසයි. තම නිවෙස් ආපසු තමන් වෙත ලබා දෙන ලෙස ඉල්ලා සිටිය ද එහි වර්තමාන පදිංචි කරුවන් ගේ දේපොළ අධි ආරක්ෂක කලාපවලට යට වී තිබෙන නිසා හෝ ඒවා කැඩී බිඳී විනාශ වී ගොස් ඇති බැවින් එසේ කිරීම අපහසු වී ඇති බව මුස්ලිම් වරුන්ට අවබෝධ වී ඇත.

2003 අප්‍රියෙල් වල දී ඇති වූ සිද්ධීන් නිසා දෙමල සහ මුස්ලිම් ජන කොටස් දෙක අතර සම්බන්ධතා යහපත් තත්ත්වයක නො පවතී. අවතැන් වූ ඇතැම් දෙමළ ජාතිකයින් කසිප්පු පෙරීම ආරම්භ කර තිබේ. ඒ පිළිබඳ ව මුස්ලිම් පදිංචිකරුවන් එල්ටීටීඊ යට පැමිණිලි ගිරීමෙන් පසු, කසිප්පු පෙරීමට එරෙහිව එල්ටීටීඊ ය විසින් පුවත්පත් මගින් අනතුරු ඇඟවීමක් කර තිබුණි. මෙම ප්‍රශ්නය නිරාකරණය කරගැනීම සඳහා යාපන මුස්ලිම් පල්ලිය මුල් වී ආරම්භ කළ සාකච්ඡාවක් කලහයකින් හමාර විය. මෞලවි තැන ඇතුළු මුස්ලිම් ජාතිකයින් ති දෙනෙක් තුවාල ලැබූ හ. මෙම ආරවුල ජාතිවාදී එකක් නො වන බව මුස්ලිම් වරු පිළිගත් හ. එහෙත් ගැටුම් පැවැති අවස්ථාවේ “1990 දී සිදු වූ දේ අමතක කරන්න එපා” යි දෙමල ජාතිකයින් කීප දෙනෙකු ගේ මුවින් පිට වූ වචන මුස්ලිම් ජාතිකයින් ගේ මතකයෙන් තවමත් බැහැර වී නැත.

# මන්නාරම් දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක්

මන්නාරම් දූපත ඇතුළු මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම - වව්නියාව මහ මාර්ගයට උතුරින් පිහිටා ඇති ප්‍රදේශය එල්ටීටීඊ යේ පාලනයට නතු වී තිබේ. ප්‍රධාන වශයෙන් දෙමළ ජනතාව ජීවත්වන මෙම දිස්ත්‍රික්කයේ විශාල කතෝලික ප්‍රජාවක් ද සිටියි. කතෝලික පල්ලිය ඉතාමත් ම ක්‍රියාකාරීව ප්‍රජා කටයුතුවල නිරත වේ. ජනතාව සම්බන්ධ වී සිටින ධීවර අයිතිවාසිකම් හෝ අන්තර් - වාර්ගික හිංසාව පිළිබඳ සිද්ධීන් හෝ වෙවා පල්ලිය ඒවාට මැදිහත් වී කටයුතු කරයි. සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු අවතැන් වූ පිරිස් එල්ටීටීඊ යේ පාලනයට යටත් ප්‍රදේශ සහ ඉදිරිපෙළ ආරක්ෂක වළලු වලට සමීපව පදිංචියට පැමිණෙමින් සිටිති. එල්ටීටීඊ ය විසින් පලවා හැරීමට පෙර මන්නාරමේ සැලකිය යුතු මුස්ලිම් ජනගහනයක් ද විය. ඔවුන් දැනට සිය ගම් බිම් බලා ආපසු පැමිණෙමින් සිටි අතර කලින් ඔවුන් සතුව තිබූ දේපල අන්‍ය පිරිස් අයිතිකරගෙන එහි පදිංචිව සිටිති.

ආපසු පැමිණෙන පිරිස් මුහුණ පා ඇති ප්‍රධාන ගැටලුව සම්පත් ඌණතාව සහ සහය සේවා නො මැති වීම බව ක්ෂේත්‍ර කටයුතුවල දී නිරීක්ෂණය වුව ද වෙප්පන්කුලම් ග්‍රාමයේ හටගත් හිංසාවාදී ක්‍රියා තුළින් යටපත් වී ඇති වාර්ගික ගිනිදළු කොයිවේලේ හෝ මතුවීමේ සැබෑ අනතුර පෙන්නුම් කෙරිණි.

## 1. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයට සම්බන්ධ ආයතන

- ★ ගම පදනම් කරගත් සංවිධාන
- ★ දේවස්ථාන කමිටු (ක්‍රිස්තියානි)

* මුස්ලිම් දේවස්ථාන කමිටු
* රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති සාම කමිටු
* රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති සංවර්ධනය මූලික කමිටු හෝ වෙනත් කමිටු
* පුරවැසි කමිටු
* ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයට සම්බන්ධ වී සිටින පුද්ගලයින්, දිසාපති, එල්ටීටීඊ

## ගම පදනම් කරගත් සංවිධාන

ධීවර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති ඇතුළු ගමේ සංවිධාන සතු ගැටුම් නිරාකරණය කිරීමේ ධාරිතාව සීමිත ය. රජය විසින් මෙම සංවිධාන පිහිටුවා ඇති මුත් ඒවා දැන් ගමේ සමාජ ව්‍යුහයේ කොටසක් බවට පත්ව තිබේ. නිතර ම පාහේ මෙම ගමේ සංවිධාන දේවස්ථානය හෝ රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කර ඇති මධ්‍යගත ගම් සභා යටතේ කටයුතු කරති.

## දේවස්ථාන කමිටු

කතෝලික පල්ලිය මන්නාරම් දිස්ත්‍රික්කය තුළ සුවිශේෂ කාර්යයභාරයක් ඉටු කරයි. ආගමික කටයුතු හැරුණ විට ගම් වැසියන් ගේ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ ද කතෝලික පල්ලියේ පූජක තුමායි. පූජක තුමා හැරුණ විට පල්ලිය ද වාර්ගික යුද්ධය පැවති සමයේ ජනතාව වෙනුවෙන් රජයේ සන්නද්ධ හමුදා හෝ එල්ටීටීඊ ය සමඟ විවිධ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා ඇරඹූ හ. මන්නාරමේ බිෂොප් තුමා ද පල්ලිය වෙනුවෙන් ආරවුල් සංසිඳීමට ඉදිරිපත් වේ. මේ අතර ගම් සභාවක ස්වරූපයෙන් කටයුතු කරන දේවස්ථාන සභාවක් ද ඇත. වසරක් පාසා සාමාජිකයින් තෝරා පත්වෙන මෙම සභාවේ සාමාජික සංඛ්‍යාව හයකි. මෙම දේවස්ථාන සභාව යටතේ ක්‍රියා කරන උප කමිටු සාමය, මූල්‍ය සහ පවුල් සභා වලින් සමන්විත වේ. සාම සභාවල කාර්යයභාරය වනුයේ මායිම් ආරවුල් විසඳීම වන අතර පවුල් සභා අඹු සැමි ගැටලු සහ මත්පැන් පාවිච්චිය පිළිබඳ ව කටයුතු කරති. ආරවුල් පූජා ප්‍රසාදී තුමන් ගේ හෝ දේවස්ථාන සභාවේ අවධානයට ලක්කෙරේ. ආරවුලේ ස්භාවය අනුව තෝරා ගත් කමිටු සාමාජිකයින් විසින් පරීක්ෂණයක් පවත්වනු ඇත. කමිටුව මැදිහත් කරුවකු වශයෙන් කටයුතු කරයි.

## මුස්ලිම් දේවස්ථාන කමිටු

මුස්ලිම් ජාතිකයින් ගේ ආරවුල් නිරාකරණය කරනු ලබන මූලික ආයතනය මුස්ලිම් දේවස්ථාන කමිටුවයි. එහි වගකීම දෙයාකාර ය. පල්ලිය භාරකාර මණ්ඩලය වශයෙන් කටයුතු කිරීම හා ගොඩනැගිල්ලේ නඩත්තුව සහ මවුලවි තුමා බලා කියා ගැනීම ඉන් පළමු වැන්නයි. දේවස්ථාන කමිටුව තම ප්‍රජාව සඳහා උපදේශක මණ්ඩලයක් වශයෙන් ද කටයුතු කරයි. අවතැන් වූවන් ආපසු නො පැමිණි ප්‍රදේශවල සියලු ම වැඩිමහලු පිරිමින් ගෙන් මෙම කමිටුව සමන්විත වන අතර නැවත පදිංචි වූ ගම්වල තේරී පත් වූ සාමාජිකයෝ මෙම කමිටුවේ සාමාජිකයින් වශයෙන් පත් වෙති.

## රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කර ඇති සාම කමිටු

සාම කමිටුවල ප්‍රධාන කාර්යය සාමය ගොඩනැගීමයි. අවිධිමත් යාන්ත්‍රණය හරහා ගැටුම් නිරාකරණය කිරීම විශේෂ කාර්යයභාරය වී ඇත. දැනට ක්‍රියාත්මකව පවතින ගමේ සංවිධානවල සහ ආගමික කමිටුවලට තේරී පත්වී සිටින සාමාජිකයෝ මෙම කමිටු නියෝජනය කරති. වෙනත් දිස්ත්‍රික්කවල පදිංචිව සිටින මුල් ම පදිංචිකරුවන් ගේ නියෝජිතයින් ද මෙම සාම කමිටුවල සාමාජිකයෝ වෙති. අවිධිමත් යාන්ත්‍රණය හරහා ගැටලු විසඳීමට මෙම සාම කමිටුවලට හැකියාව තිබේ යයි අදහස් කරන අතර, එම කමිටු දරන පරිශ්‍රමය විශ්වාසය ගොඩනැගීමේ ලා වැදගත් වන බව ද විශ්වාස කෙරේ. මෙම සාම කමිටු සාමාජිකයින්ට රාජ්‍ය නො වන සංවිධාන විසින් පුහුණුව ලබා දෙනු ඇත.

## රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති සංවර්ධන කමිටු හා වෙනත් කමිටු

සියලු කමිටු හා එක්ව කටයුතු කරන අනෙක් රාජ්‍ය නො වන සංවිධාන ස්වකීය නීත්‍යානුකූල රාජකාරියේ කොටසක් වශයෙන් පමණක් ගැටලු නිරාකරණය කිරීම සිදු කරයි. ක්ෂේත්‍ර නිලධාරීන් සහ රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති සංවර්ධන හෝ සමාජ කමිටු ද ගැටුම් නිරාකරණය කිරීමේ වැඩපිළිවෙළේ නිරත වෙති.

## පුරවැසි කමිටු

මන්නාරමේ පුරවැසි කමිටුව වසර හතකට පෙර යුද්ධයට ප්‍රතිචාරයක් වශයෙන් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ගැන පරීක්ෂා කිරීමේ අරමුණින් පිහිටුවන ලදී. අතුරුදහන්වූවන් සොයා ගැනීමට උපකාරී වීම, රජයේ හමුදා

සහ එල්ටීටීඊ ය සමග මැදහත් වී කටයුතු කිරීම සහ අත්අඩංගුවේ සිටින පුද්ගලයින්ට නීති ආධාර සැපයීම පුරවැසි කමිටුවේ ප්‍රධාන අරමුණු ය. ළමයින් බලෙන් යුද්ධයට බඳවා ගැනීම වැනි මහ ජනතාවට බලපාන කරුණු ගැන එය අවධියෙන් සිටී. කමිටුව වෙත පැමිණිලි ලත් විට ඒවා සටන් විරාම කමිටුව, පොලීසිය සහ එල්ටීටීඊ ය වෙත දැනුම් දෙනු ලැබේ.

### පුද්ගලයින්

රාජ්‍ය සහ පෞද්ගලික දේපල තම පදිංචිය සඳහා යොදා ගැනීම පිළිබඳ ව ශ්‍රී ලංකා යුද හමුදාව සමග දිසාපතිවරයා කටයුතු කරමින් සිටී. ගම් මට්ටමින් ගැටුම් නිරාකරණය කිරීමේ දී ග්‍රාමසේවා නිලධාරී වැදගත් කාර්යයභාරයක් ඉටු කරයි. එල්ටීටීඊ කාර්යාල විවෘත කිරීමත් සමග ජනතාව වැඩි වැඩියෙන් තම පැමිණිලි එල්ටීටීඊ ය වෙත යොමු කරයි. වැට මායිම් ප්‍රශ්න, ඉඩමේ පදිංචියේ සිට ළමුන් බලෙන් යුද්ධයට බඳවා ගැනීම දක්වා සියලු ආරවුල් එල්ටීටීඊ යේ අවධානයට යොමු කෙරේ.

## 2. සාම්ප්‍රදායික සහ ආගමික සංවිධාන කෙරෙහි වාර්ගික අර්බුදයේ බලපෑම

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයක් වශයෙන් ගම් මට්ටමින් පමණක් නො ව ඉන් ඔබ්බට පවා ගොස් කතෝලික පල්ලිය ක්‍රියා කරන අවස්ථා ඇත. මුස්ලිම් දේවස්ථාන කමිටු ගම් මට්ටමින් ස්වකීය වර්ගයා මුහුණ පා ඇති ගැටලු නිරාකරණය කරයි; තම ප්‍රජාව වෙනුවෙන් මැදහත් වන අවස්ථා ද නැත්තේ නො වේ. කෙසේ වුව ද, ගම් නායකයින් ගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික ක්‍රමෝපායන් ක්ෂයවීම වාර්ගික අර්බුදයේ ඍජු ප්‍රතිඵලයකි. තරුණ කොටස් සන්නද්ධ වීම සහ ප්‍රජාවන් අවතැන් වීම ද ගමේ වෘද්ධයින් ගේ බලය හීන වීමට හේතුවිය. වැඩිහිටියන් සතු බලය පිරිහීමත් සමග යුද්ධය නිසා උග්‍ර අතට පත් ගම් ප්‍රදේශවල ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම රජයට අපහසු කරුණක් විය. එසේ ම පළාත් පාලන ආයතන වලට සහ අධිකරණයට ද සීමාව ඉක්ම වූ බරක් පැටවී තිබුණි. එබැවින් ගැටලු විසඳීම බෙහෙවින් අපහසු එකක් විය. මෙම පසුබිම යටතේ ය, එල්ටීටීඊ ය ගම් ප්‍රදේශවල ආරවුල් වලට කන්දීමට යුහුසුළු වූවා මිස අවශ්‍යයෙන් ම ඒවා විසඳීමට ඉදිරිපත් නො වූයේ.

### 2:1 කතෝලික පල්ලිය

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය උපරිම මට්ටමින් ජනතා සේවය සඳහා උපයෝගී කර ගන්නා, ආයතනයකි, මන්නාරමේ කතෝලික

පල්ලිය. පල්ලියේ පූජක තුමා, මීසම් සභාව සහ කතෝලික පල්ලිය යන ආයතන තුන විවිධ මට්ටමින් ගැටුම් නිරාකරණය කිරීමේ කාර්යයෙහි නිරතව සිටිති. බොහෝ ප්‍රදේශවල පල්ලිය හා ප්‍රජාව අතර ඇත්තේ ප්‍රබල සම්බන්ධතාවකි. එහෙත් විශාල ප්‍රජාවක් තුළ හෝ ජනතාව අවතැන් වූ ගම් පෙදෙස්වල මෙම සම්බන්ධතාව හීන වී ඇත.

## 2:1:1 පූජක තුමා

පූජක වරයා ගේ සාම්ප්‍රදායික නායකත්වය මෙන් ම ඔහු කෙරෙහි පිදෙන ගෞරවය යුද පසුබිම තුළ වුව ද නොවෙනස්ව පවතී. අනෙක් සමාජ හා රාජ්‍ය ආයතන පිරිහී තිබුණ ද, නැතහොත් යුද්ධයට ඇදී ගිය ද, කතෝලික පූජක තුමා වෙතින් ජනතාවට සැලසෙන සේවය අඛණ්ඩව සිදුවිණි. රජයේ හෝ එල්ටීටීඊ යේ පාලනයට නො වැටෙන මායිම් ප්‍රදේශවල මෙය ඉතා විශිෂ්ට අන්දමින් සිදු විය. ජනයා අවතැන් වූ අවස්ථාවන් හි දී පූජක වරයා ඔවුන් සමඟ විය.

ග්‍රාමීය සහ ධිවර ප්‍රදේශවල පූජක තුමා විසින් සුවිශාල කාර්යයභාරයක් ඉටු කරයි. ආගමික කටයුතුවල යෙදීම පමණක් නො ව අඹු - සැමි ආරවුල් ඇතුළු අනෙකුත් විවිධ ජනතා ප්‍රශ්න වලට විසඳුම් ලබාදීම ද පූජක තුමා අතින් සිදු විය. යුද සමයේ දී වුව ද පල්ලිය තම ශක්තිය නොවෙනස්ව පවත්වා ගෙන යැමට සමත්විය. පල්ලියේ පූජක තුමා මෙන් ම, රයප්පු ජෝෂප් මන්නාරමේ බිෂොප් තුමා ද කෙළින් ම ජනතා ගැටලුවලට මැදිහත් වී ඒවා සංසිඳීමේ ලා එක සේ ක්‍රියාශීලී විය. ධීවර කාර්මිකයින් අතර නිතර හට ගන්නා ආරවුල් වලට පූජක තුමා නිසගයෙන් ම වැදිවෙයි. පාර්ශ්ව කරුවෝ එතුමන් ගේ තීරණය අපේක්ෂාවෙන් ඔහු වෙත රොක් වෙති. මේ හැර දේවස්ථාන භූමිය ආරවුල් විසඳීමේ මධ්‍යස්ථානය බවට පත්ව ඇත.

## 2:1:2 දේවස්ථාන සභාව

ගම් වාසීන් ගේ ගෞරවය දිනා සිටින සමාදාන විනිශ්චයකරු, ග්‍රාමසේවා නිලධාරී, තැපැල් ස්ථානාධිපති හෝ විදුහල්පති ඇතුළු ප්‍රභූන් ගෙන් දේවස්ථාන සභාව නියෝජනය වී ඇති බැවින් ප්‍රදේශයේ ගැටලු නිරාකරණය කිරීමේ ලා සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කිරීමට එයට හැකි වී තිබේ.

පල්ලිය සතු සදාචාරාත්මක මෙන් ම සමාජීය බලපෑම් නිසා එහි තීරණවලට එරෙහි වීම පහසු කරුණක් නො වේ. දේවස්ථාන සභාව උගත් හා ධනවත් පුද්ගලයින් ගේ බලයට නතු වී ඇති හෙයින්, එය නිසි පරිදි ජනතාව නියෝජනය කරන්නේ ද යන්න සැකයට භාජනය වී ඇත. එබැවින් පල්ලිය විසින් යුක්තිය පසිඳලීමේ දී එය සර්ව සාධාරණ අයුරින් ඉටුවේ යයි සිතීම අපහසු ය.

මීසම් සභාවේ සහ පූජක තුමා ගේ කාර්යයභාරය වඩාත් සැහැල්ලු කිරීමේ අරමුණින්, කතෝලික පල්ලිය විසින් හඳුන්වා දෙන ලද, “නව ජීවන වැඩසටහන” යටතේ සාම, මූල්‍ය සහ පවුල් කමිටු පිහිටුවන ලදී. ප්‍රදේශයේ ගැටලු විසඳීමේ ලා එම කමිටු වෙතින් මහගු සේවයක් ඉටු වේ. ජනතා නියෝජිකත්වයෙන් මෙම සභා වෙතින් කෙතරම් සේවයක් සැලසුණ ද, සමාජයේ උගත් මෙන් ම ධනවත් පුද්ගලයින් ගේ ආධිපත්‍යය එම සභා තුළ නොසෙල් වී පවතී.

## සිද්ධි අධ්‍යයනය 03

## අරිප්පු

මන්නාරමට දකුණින් පිහිටා ඇති අරිප්පු කතෝලික ගමකි. එහි වැසියන් ගේ ප්‍රධාන රැකියාව ධීවර කර්මාන්තයයි. මීසම් සභාව වැයික්කි 9 කට බෙදා ඇති අතර එම සැම වැයික්කියකට අයත් නියෝජිතයකු මීසම් සභාව නියෝජනය කරයි. උප කමිටු ගණනාවකින් ම දේවස්ථාන සභාවට සහයෝගය ලැබේ. පූජක තුමා ගේ දේවස්ථාන සභාව ප්‍රජා ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා රැස්විය යුතු අවස්ථාවල දී පල්ලියේ ආවතේවකරු ( සැන්ක්‍රිස්තියන්) සීනුව නාද කරමින් ඒ බව නිවේදනය කරයි. මෙම රැස්වීම් බොහෝ විට කාලගෝට්ටි වලින් ගහණය.

ප්‍රදේශයේ ධීවරයින් පිරිසක් විසින් “සුරුකුවල්ලයි” නමැති විශේෂ දැල් වර්ගයක් යොදා ගනිමින් මහ පරිමාණයෙන් මසුන් මැරීමට එරෙහිව, ප්‍රදේශයේ ධීවර සමූපකාර සමිතිය ගත් ක්‍රියාමාර්ගය පිළිබඳ අවසාන වරට පැවැත් වූ රැස්වීමේ දී සාකච්ඡා කෙරිණි. ධීවරයින් ගේ මෙම ක්‍රියාව සම්බන්ධයෙන් ලත් පැමිණිල්ලක් මත ධීවර අමාත්‍යාංශය “සුරුකුවල්ලයි” දැල් පාවිච්චිය තහනම් කරමින් නියෝගයක් පැනවී ය.

යුද්ධය පැවති සමයේ ප්‍රදේශ වැසියන් අත්අඩංගුවට ගත් විට හෝ අතුරුදහන් වූ විට ඒ සම්බන්ධයෙන් පූජක තුමෝ බියෙන් තොරව මැදහත් වී අවශ්‍ය කටයුතු කළ හ. රජයේ හමුදා මෙන් ම එල්ටීටීඊ ය ද දැක් වූ ගෞරවය නිසා තම කටයුතු පහසුවෙන් කරගෙන යෑමට ගැති වූ බව එතුමෝ පැවසූ හ. සිය වර්තමාන කාර්යයභාරය ගැන කතා කරන පූජක තුමා පවසන්නේ ප්‍රදේශ වාසීන් ගේ ගැටලු සම්බන්ධයෙන් තමන් තීන්දු නො දෙන බවත්, හුදෙක් ගැටුමට මැදි වී සිටින පාර්ශ්වයන් කැඳවා අර්බුදය නිරවුල් කරන බවත් ය. මුහුදු වෙරළ ප්‍රදේශයේ වැසියන් ගේ ‘ප්‍රවෘත්ති මධ්‍යස්ථානය’ වශයෙන් සැලකේ. ප්‍රදේශයේ ඇති වන සිද්ධීන් ඍජුව ම වාර්තා වන්නේ ද මුහුදු වෙරළට ය. ධීවර ගම් දෙකක වැසියන්

අතර ඇති වන ආරවුලක් පිළිබඳ ප්‍රවෘත්තිය ප්‍රථමයෙන් සාකච්ඡාවට බඳුන් වනුයේ මුහුදු වෙරළේ දී ය.

ධීවර ගම් දෙකක පිරිස අතර ධීවර දැල් පිළිබඳ ප්‍රශ්නයක් මුහුද මැද දී සිදු වූ පිහියා අනුමකින් කෙලවර විය. සිද්ධියට තුඩු දුන් ධීවර දැල් තොගය දේවස්ථානය රඳවා ගත් අතර, ගම් දෙකේ පූජක තුමන්ලා ඔවුනොවුන් හා සාකච්ඡා කිරීමෙන් පසු සොරාගත් ධීවර දැල් ආපසු අයිතිකරුවන්ට බාරදීමටත්, මාළු දැල්වලට සිදු වූ හානිය සහ පුද්ගලයින්ට සිදු වූ ශාරීරික පීඩාවලට වන්දි ගෙවීම සහ යළි මෙබඳු සිද්ධි ඇති නො වීමට ගිවිස ගැනීම යන මේ කරුණු පූජක තුමන්ලා දෙපල අතර ඇති වූ ලිපි හුවමාරුවේ දී තීන්දු විය. "ගැටුම් නිරාකරණයට සති කීපයක් ගත වෙන අතර, ඒ කාලය තුළ පාර්ශ්වකරුවන්ට ආවේගශීලී බවින් මිදීමට අවකාශ ලැබේ. ගැටුම්වලට සම්බන්ධ වූවන් එක ම ජනවාර්ගික සම්භවයක්, එක ම ආගමක්, එක ම භාෂාවක් හා එක ම කුලයකට අයත් බැවින් ගැටලු නිරාකරණය වඩාත් ලිහිල් වී ඇත්තේ යයි, මීසම් සභාවේ සාමාජිකයෙක් පැවසී ය.

## 2:2 මුස්ලිම් දේවස්ථාන කමිටු

යළි පදිංචිය සඳහා පැමිණෙන මුස්ලිම් ප්‍රජාව සම්බන්ධයෙන් මුස්ලිම් දේවස්ථාන කමිටුවෙන් විශාල සේවයක් සැලසේ. 1990 දී එල්ටීටීඊ ය මුස්ලිම් වරුන් පලවා හැරීමෙන් පසු, පසුකාලයේ දී ඔවුහු ටිකින් ටික ආපසු සිය ගම් බිම් කරා පැමිණෙන්නට වූ හ. ඔවුහු පල්ලිය වටේ ඒකරාශී වූ හ. පල්ලිය යළි ගොඩනැගීම හදිසි අවශ්‍යතාවක් බව ඔවුන් බොහෝ දෙනෙකු ගේ මතය විය. ප්‍රජාව තුළ හටගන්නා ගැටලු මෙන් ම, අන්තර් ප්‍රජා ගැටලු සම්බන්ධයෙන් ද මුස්ලිම් දේවස්ථාන කමිටුවට ක්‍රියා කළ හැකි ය. වාචිකව හෝ ලිඛිතව කමිටුව හෝ කමිටු සාමාජිකයින් වෙත පැමිණිලි ඉදිරිපත් කරනු ලැබේ. ආරවුල් නිරාකරණය කිරීමේ වේලාවන් දේවස්ථානයෙන් දේවස්ථානයට වෙනස් වේ. මුස්ලිම් ජාතිකයකු යම් ගැටලුවකට සම්බන්ධ වී සිටී නම්, අනෙක් ප්‍රජාවන්ට ද මුස්ලිම් දේවස්ථාන කමිටුව සමඟ කටයුතු කළ හැකි ය. (සිද්ධි අධ්‍යයනය 04 බලන්න.)

## 2:3 වැඩිහිටියන් ගේ බලය පිරිහීම

ගමේ වැඩිහිටියන් සතු බලය පිරිහී ඇති බව පෙනේ. යුද්ධයේ බලපෑම මෙයට බෙහෙවින් හේතු විය. ඒ හැරුණ විට තරුණ කොටස් සන්නද්ධ වීම සහ ඇත්ත නැත්ත කතා කිරීමට වැඩිහිටියන් බියවීම තවත් ප්‍රබල හේතුවකි. ආරවුල් වල දී, පැරණි මායිම් ගැන හොඳ මතකයක් ඇති වැඩිහිටි පිරිස්

සහයෝගය නො දක්වා පසකෙට වී සිටිය හ. මත්පැනට ඇබ්බැහි වූ තරුණ කොටස් ගමේ සාම්ප්‍රදායික නායකත්වයට අභියෝගයක් විය. සාම්ප්‍රදායික නායකත්වයේ බලය පිරිහීම යනු ගම් මට්ටමින් බලය හීන වීමක් නො වන අතර හුදෙක් බල තුලනයේ වෙනසක් සිදු වීම පමණි.

## 2:4 අවිධිමත් ක්‍රියා පිළිවෙළ හරහා ගැටුම් නිරාකරණය කිරීමේ දී එල්ටීටීඊ ය සතු පුළුල් කාර්යයභාරය

ගැටුම් නිරාකරණය කරගැනීමේ ප්‍රබල ආයතනයක් සේ සලකා ජනතාව එල්ටීටීඊ ය වෙත සරණ පතා යයි. එහෙත් සියලු ම ආරවුල් එල්ටීටීඊ ය විසින් විසඳනු ලබන බව හෝ ආරවුල්වලට සම්බන්ධ පාර්ශ්වයන් බොහෝ අවස්ථාවල ගැටලු විසඳාගැනීමේ එක ම ආයතනය වශයෙන් එල්ටීටීඊ ය වෙත යන බවක් පැහැදිලි නැත.

යම් ප්‍රදේශයක එල්ටීටීඊ ය සතු ශක්තිය සහ ඉදිරිපත්වීම මත ඔවුන් සතු ගැටලු විසඳීමේ කාර්යයභාරය රඳා පවතී.

රජයේ පාලන පෙදෙස්වල එල්ටීටීඊ ය වැඩි වශයෙන් ක්‍රියාත්මක වීම සහ ඔවුන් ගෙන් වඩා ඉක්මණින් ගැටලු විසඳා තීන්දුවක් ලබාගත හැකිය යන විශ්වාසය පිට ජනතාව ඔවුන් වෙතට නැඹුරු වේ. එහෙත් එල්ටීටීඊ යෙන් නො විසඳෙන ප්‍රශ්න පොලීසිය සහ අධිකරණය වෙත යොමු කෙරේ.

මන්නාරම් දූපත් වැසියෝ හුදෙක් එල්ටීටීඊ යේ ම සහය නො පතති. ඇතැම් අවස්ථාවල “අලුත් කල්ලියේ” ඇඟිලි ගැසීම් කෙරෙහි ඔවුහු සිය අප්‍රසන්න භාවය ප්‍රකාශ කිරීමට තරම් දිරිමත් වී සිටිති.

අන්තර් ප්‍රජා ගැටලු නිරන්තරයෙන් ම එල්ටීටීඊ ය වෙත යොමු කෙරේ. ඉඩම් ආරවුල් සහ මුස්ලිම් හා දෙමළ පිරිස් අතර හටගන්නා කලහකාරී සිද්ධීන් මුස්ලිම් භාරකාර මණ්ඩලය සහ අදාල ප්‍රජා නායකයින් විසින් එල්ටීටීඊ ය වෙත යොමු කරනු ලැබේ. එල්ටීටීඊ ය මුස්ලිම් ජාතිකයින් පලවා හැර ඔවුන් සතු ඉඩම් ආපසු ගැනීම නිසා ප්‍රදේශයේ ඉඩම්වල පදිංචිවීම පිළිබඳ ප්‍රශ්න එල්ටීටීඊ ය වෙත යොමු කරනු ලැබේ.

## 3. ගැටුම් හා ආරවුල්වලට ඉඩම් පිළිබඳ ප්‍රශ්න හේතු වී තිබේ.

පිහිටා ඇති ප්‍රදේශය අනුව ඉඩම් ආරවුල් වලට හේතුවන කරුණු වෙනස් වන මුත්, ඉඩම් පැවරීමේ දී සාමාන්‍යයෙන් කලහකාරී ක්‍රියා සිදු නො වේ. ඉඩම් ආරවුල්වලට සම්බන්ධ පාර්ශ්වයෝ ඉඩම්වල අයිතිය ලබා ගැනීම සඳහා

ගැටලු නිරාකරණය කිරීමේ විධිමත් හා අවිධිමත් ක්‍රම පොදුවේ භාවිත කරති. මන්නාරම් ප්‍රදේශයේ ඉඩම් රජයේ ආරක්ෂක හමුදා, ප්‍රදේශයේ ජනතාව සහ එල්ටීටීඊ සංවිධානය විසින් බදු දී ඇති පුද්ගලයින් ගේ පදිංචියට නතු වී තිබේ.

මන්නාරම් ප්‍රදේශයේ ඇතැම් කොටස්වල යළි පදිංචි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇත. එයට හේතු වී ඇත්තේ සන්නද්ධ හමුදාවල ආරක්ෂක ප්‍රතිපත්ති සහ එල්ටීටීඊ යයි. මෙම අපහසුතා දැන් බොහෝ දුරට පහව් ගොස් ඇති අතර, බිම් බෝම්බ ඉවත් කිරීමත් සමග බොහෝ ප්‍රදේශ සිවිල් ජනතාව ගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබේ. කෙසේ වුව ද, මන්නාරම් දූපතේ අධි ආරක්ෂක කලාප පිහිටීම නිසා මන්නාරම් නගර ප්‍රදේශයේ මෙන් ම තලෙයිමන්නාරමේ ද යළි මහජනයා පදිංචි කරවීම වැලකී ඇත. තලෙයිමන්නාරමේ පවුල් 60 කට සිය නිවෙස් අධි ආරක්ෂක කලාපය තුළ පිහිටා ඇති බැවින් ඒවායේ පදිංචියට යැමට නො හැකි වී තිබේ. අධි ආරක්ෂක කලාප නිසා ඉඩම් ආරවුල් සංකීර්ණ වී තිබේ. පොදුවේ සලකා බලන විට ඉඩම් අයිතිකරුවන් සහ එහි පදිංචිකරුවන් අතර ඇති වන ආරවුල් සහ මතභේද හිංසාවාදී ක්‍රියාවලින් තොර වී ඇත. ආරවුල්වල පාර්ශ්ව කරුවෝ තම ගැටලු නිරාකරණය කරගැනීමේ දී අවිධිමත් ක්‍රියාපිළිවෙළ අනුගමනය කරති. එ නම්, තුන් වෙනි පාර්ශ්වයක සහභාගීත්වයක් නො මැතිව ඔවුනොවුන් වාචික වශයෙන් ගිවිස ගැනීම ය. මෙම වැඩපිළිවෙළ යටතේ ගිවිස ගත් පරිදි යම් කාල සීමාවක් තුළ දී එක්කෝ පදිංචිකරු ඉඩමෙන් ඉවත් වේ. නැතහොත්, අන්‍යොන්‍ය වශයෙන් එකඟත්වයකට පැමිණීමෙන් පසු පදිංචිකරු හා අයිතිකරු තාවකාලික දේපොල භුක්ති විඳිනු ඇත.

## සිද්ධි අධ්‍යයනය 04

## හවුලේ නිවෙස් භුක්ති විඳීම : තරාපුරම්

1990 දී මුස්ලිම් ජනතාවට යාපනයෙන් පිට වී යන ලෙස එල්ටීටීඊ ය නියෝග කළ අවස්ථාවේ තරාපුරම් හි පදිංචිව සිටි මුල් පවුල් 750 ම පිට වී ගිය හ. 1992 සිට මුස්ලිම් ජනතාව ටිකෙන් ටික තම පැරණි ගම් බිම් හා නිවෙස් බලා ආපසු ඒමට පටන් ගත් හ. 1995 දී ශ්‍රී ලංකා හමුදා යාපනය සිය අණසකට නතුකර ගැනීමත් සමග ම වන්නියේ සහ යාපනයේ සිට දෙමළ පවුල් 65 ක් පමණ පදිංචිය සඳහා මන්නාරම් දූපතට පැන ආ හ.

අවතැන් වූ දෙමළ ජාතිකයින්ට හිස්ව පවතින නිවෙස්වල පදිංචි විය හැකි අතර, මුස්ලිම් පවුල් ආපසු පැමිණිය හොත් එම නිවෙස් ඔවුන්

වෙත ලබා දිය යුතු බවට අදාල පුද්ගලයෝ වාචිකව එකඟත්වයකට පැමිණිය හ. කලකට පසු මුස්ලිම් පවුල් කීපයක් ආපසු පැමිණි අවස්ථාවේ දෙමළ ජාතිකයින්ට විකල්ප නිවෙස් ලබා දීම හෝ මුස්ලිම් වරුන්ට අයත් නිවෙස් වලින් කොටසක් ඔවුන්ට කුලියට දීම සිදු විය.

මුස්ලිම් පවුල් 30 ක් පමණ යාපනයේ සහ කිලිනොච්චියේ පිහිටි ඔවුන් ගේ නිවෙස් කරා පදිංචියට ගොස් තිබේ.

තමන් සමග එක ගෙයි ජීවත් වූ දෙමළ ගැහැනු ළමයෙකු ප්‍රශ්න කිරීම සඳහා ගෙනයෑමට උත්සාහ කළ අවස්ථාවේ එයට හරස් වූ මුස්ලිම් ගැහැනු ළමයාත් එම දෙමළ ගැහැනු ළමයාත් යන දෙදෙනා ම මැරුම් කෑම, දෙමළ හා මුස්ලිම් ජන කොටස් අතර පවතින සුහදතාව තහවුරු කෙරෙන එක් අගනා අවස්ථාවකි. එහෙත් අවතැන් වූ දෙමළ ගැහැනු ළමයින් මුස්ලිම් තරුණයින් අතින් තාඩන පීඩන වලට ලක්වීමේ අවස්ථා නැත්තේ ද නො වේ. එ වැනි සිද්ධින් වල දී මුස්ලිම් දේවස්ථාන කමිටුව අවශ්‍ය කටයුතු කිරීමට ඉදිරිපත් වේ.

දැනට තරාපුරම් ප්‍රදේශයේ මුස්ලිම් පවුල් 100 ක් පමණ ජීවත් වේ. යුද්ධය නිසා මෙන් ම වෙනස් ජීවන රටාවකට හුරුපුරුදු වී සිටින නිසාත් අවතැන් වූවන් ගෙන් අඩක් පමණක් ආපසු ස්ථිර පදිංචිය සඳහා පැමිණෙනු ඇතැ යි විශ්වාස කෙරේ.

මුස්ලිම් දේවස්ථාන භාරකාර මණ්ඩලයේ සභාපති වරයා ගේ නිවසේ බිත්තියේ දක්නට ලැබෙන "පැලීම් හෝ ඉරිතැලීම්" මුස්ලිම් ප්‍රජාව සැකයෙන් ජීවත්වන බව නිරූපනය කෙරෙන සාක්ෂියක් යයි විශ්වාස කෙරේ. තත්ත්වය යහපත් අතට හැරුණ හොත්, බිත්තිය අලුත්වැඩියා කරන්නේ යයි සෑම වසරක දී ම ඔහු තමාට ම පවසා ගනී.

ඉදිරියේ දී පදිංචිය සඳහා අවශ්‍ය ඉඩම් නො මැතිකම ආරවුල්වලට බොහෝ සේ හේතුවිය හැකි යයි ප්‍රදේශවාසීහු විශ්වාස කරති. අවතැන් වූවන් දිගින් දිගට ම ආපසු පැමිණිය හොත් මේ තත්ත්වය උග්‍රවනු ඇත. විකල්ප ක්‍රියාමාර්ග හරහා මෙම තත්ත්වය සමහන් කරගත හැකි ය. ජනගහනය ස්වාභාවිකව වැඩිවීම ද ඉඩම් පිළිබඳ ප්‍රශ්නය උග්‍ර වීමට තවත් හේතුවකි. මූසාලි ග්‍රාමයෙහි පමණක් ජනගහනය 6000 සිට 10 000 දක්වා වැඩි වී තිබේ. ඉඩම් නො මැති ජනතාවට රජයේ ඉඩම් බෙදාදිය නො හැක්කේ ඇයිදැ යි ප්‍රශ්නයක් මතු වී තිබේ. ඉඩම්වල පදිංචිවීම සම්බන්ධයෙන් එල්ටීටීඊ ය කටයුතු කර ඇති ආකාරයත්, ප්‍රජාවන් අතර මතභේද නො මැති වීමත් සහ ආපසු පැමිණෙන අවතැන් වූ පවුල්වලට පල්ලිය සහ දිසාපති වරයා ගෙන් ලැබෙන සහයෝගය නිසාත්, ඉඩම් පිළිබඳ ආරවුල් විශාල ගැටලුවක් බවට පත් වී නැත.

ඉඩම්වල පදිංචිය සම්බන්ධයෙන් පැනනගින ආරවුල් විසඳීමේ ලා එල්ටීටීඊ යේ මැදිහත්වීම අවශ්‍ය කරුණක් වී තිබේ. ආපසු පැමිණෙන මුස්ලිම් පවුල්වලට ඉඩ දී ඉවත් වන ලෙස දෙමළ පවුල් බොහොමයකට එල්ටීටීඊ ය දැනුම් දී තිබුණි. එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා නානඳුව ප්‍රදේශයේ මුස්ලිම් ජාතිකයින්ට අයත්ව තිබූ ඉඩ කඩම්වල පදිංචිව සිටි අවතැන් වූ දෙමළ පවුල් 25 කට ඉන් ඉවත්වන ලෙස එල්ටීටීඊ ය දැනුම්දීම මෙයට කදිම නිදර්ශණයකි. දෙමළ පුනරුත්ථාපන සංවිධානයේ ආධාරය ද මුස්ලිම් පවුල්වලට ලැබී තිබේ. දෙමළ සහ මුස්ලිම් ජන කොටස් අතර පැවැති සුහදතාව නිසා 1990 දී එල්ටීටීඊ ය මුස්ලිම් ජනතාව පලවා හැරීමට ගත් තීරණයට ජනතා සහයක් නො ලැබුණි. මුස්ලිම් වරුන් ගේ ආපසු පැමිණීම ප්‍රජා නායකයෝ එක සිතින් අනුමත කළහ.

සාම සාකච්ඡා ඉදිරියට ගෙන ගොස් උතුරු හා නැගෙනහිර පළාත්වල යහපත් වාතාවරණයක් ඇතිවුව හොත් බොහෝ දුරට ආරවුල් තත්ත්වය ක්‍රමයෙන් පහ වී යනු ඇත. එසේ ම අවතැන් වූවන්ට තම ගම්බිම් කරා පහසුවෙන් පැමිණීමට ඉඩ ලැබෙනු ඇත. හමුදාව විසින් අධි ආරක්ෂක කලාප පිහිටුවා ඇති ප්‍රදේශ වලින් ඉක්මණින් ඉවත් නො වන හෙයින්, හා ඇතැම් පවුල් තමන් ගේ නිත්‍ය ඉඩකඩම් වල පදිංචියට ඒමට අකමැත්තක් දක්වන බැවින් තවදුරටත් ආරවුල් ඇතිවීමේ ප්‍රවනතාවක් පවතී.

ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් මුහුණට මුහුණ ලා කෙරෙන සාකච්ඡා අසාර්ථක වීමේ දී පාර්ශ්වකරුවෝ පොලීසිය, අධිකරණය සහ පළාත් පාලන බලධාරීන් ගේ සරණ සොයා යති. සාමාන්‍යයෙන් ආරවුලකට මැදි වූ පාර්ශ්වයන් අධික වියහියදම් හා කාලය විශාල වශයෙන් මිඩංගු කිරීමට සිදුවීම වැනි කරුණු නිසා පොලිස් හෝ අධිකරණ ක්‍රියාමාර්ගයන් කරා පිවිසීමට මැලි කමක් දක්වති.

නාගරික පෙදෙස්වල ඇති වන ඉඩම් ආරවුල්වල දී අදාල පාර්ශ්වයන් අධිකරණ පිළිවෙත් අනුගමනය කිරීම සුලභ දෙයක් වී තිබේ.

## 4. ආපසු පැමිණෙන පිරිස් සඳහා ප්‍රමුඛත්වයක්

ඉඩම් පිළිබඳ ගැටලු වලටත් වඩා සම්පත් නො මැතිවීම හා පුනරුත්ථාපනය සඳහා ලැබිය යුතු සහයෝගය නො ලැබීම වැනි කරුණු ආපසු ගම් බිම් කරා පැමිණෙන ජනතාවට ප්‍රශ්නයක් වී තිබේ. මූලික අවශ්‍යතා සැපයීම සඳහා රජයෙන් හෝ රාජ්‍ය නො වන සංවිධාන වලින් ආධාර කිසිවක් නො ලැබීම, ආරක්ෂාව සඳහා මෙන් ම ආපසු ගම රට බලා පැමිණීමේ අයිතිය සම්බන්ධයෙන් නිශ්චිත වශයෙන් රජයෙන් හෝ එල්ටීටීඊ යෙන් සහතිකයක් නො මැතිවීම සහ අනාගතය පිළිබඳ පවත්නා අවිනිශ්චිත තත්ත්වය මුස්ලිම් අනාථයින් නැවත පදිංචි කිරීමේ දී මතුවන ප්‍රධාන ගැටලු තුනයි. මෙය මන්නාරමේ පමණක්

නො ව, යාපනය සහ පුත්තලම දිස්ත්‍රික්කයන් හි මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් ද වලංගු වේ. පවුල් පිටින් මුස්ලිම් ජනතාව නො පැමිණෙන අතර, පවුලේ වැඩිහිටියන් පමණක් පැමිණ ගොවිතැන, වෙළඳාම සහ ස්වකීය ගෙවල් දොරවල් නැවත තැනීම වැනි කටයුතුවල යෙදීම කැපී පෙනෙන ලක්ෂණයකි. මුස්ලිම් වරුන් ගේ මෙම පැමිණීමේ රටාව රජයේ සහනාධාර සැපයීමේ ක්‍රමයන්ට මෙන් ම, රාජ්‍ය නො වන සංවිධානයන් හි මෙහෙයුම් කරටයුතු වලට ද මහත් ගැටලුවක් වී ඇත. තමතමන් ගේ ගේ දොර බලා කියා ගැනීම සඳහා අනාථ පිරිස් වැඩි වැඩියෙන් පැමිණෙන අතර එහි දී ඇතිවන සැක සංකා බිය සහ දුෂ්කරතා නිසා ඔවුහු අධෛර්යමත් වී සිටිති.

බොහෝ මුස්ලිම් ජාතිකයින් ගොවිතැන් කටයුතුවල යෙදෙන මුත් අස්වැන්න නෙලාගැනීමෙන් පසුව ඔවුහු සියලු දෙනා ම පාහෝ තම ගම්බිම් වල පදිංචි වී නො සිටිති. පුනරුත්ථාපනය සඳහා සහයෝගය නො ලැබීම මෙයට හේතු වී ඇත. රජයට ආධාර උපකාර කිරීමට නො හැකි වී ඇත්තේ මුස්ලිම් අනාථ පිරිස් ආපසු පැමිණීමේ අක්‍රමවත් රටාව නිසා ය. වෙප්පන්කුලමේ මුස්ලිම් පැල්පත් තුනක් ගිනි තබා විනාශ කිරීම නිසා මුස්ලිම් අනාථයින්ට ආපසු පැමිණීම සම්බන්ධයෙන් දෙවරක් සිතීමට සිදු වී ඇත.

මුස්ලිම් ජාතිකයින්ට ආපසු සිය ගම් බිම් බලා ඒමට හරස් වී ඇති බාධක හා දුෂ්කරතා එයාකාරයෙන් ම දෙමළ සරණාගතයින් සඳහා ද බලපානු ලැබේ. ජනතාව පොදුවේ ප්‍රතිසංස්කරණ කටයුතුවල යෙදී සිටින අතර මූලික යටිතල පහසුකම් වශයෙන් ගැනෙන මහාමාර්ග සහ පාසල් පුනරුත්ථාපනය කිරීම පසුගාමී තත්ත්වයක පසු වේ. එසේ ම යුද්ධය හේතු කොට ගෙන සිදු වූ හානිය කායික මෙන් ම මනෝ විද්‍යාත්මක වශයෙන් ද ජනතාවට බලපා තිබේ. මන්නාරමේ එල්ටීටීඊ පාලනයට නතු වී තිබෙන අඩම්පන් ප්‍රදේශයේ පාසලක් පවත්වා ගෙන යන පූජකවරයෙක් දරුවන් වෙනුවෙන් අධ්‍යාපන පමණක් නො ව උපදේශන සේවාවක් ද පවත්වා ගන යාමේ වැදගත්කම අවධාරණය කළේ ය. ප්‍රදේශ වාසීන්ට ආරවුල් නිරවුල් කරනවාට වඩා වැදගත් වී ඇත්තේ රාජ්‍ය හෝ රාජ්‍ය නො වන සංවිධාන හෝ වෙනයම් බාහිර ආයතනයක් විසින් ඔවුන් ගේ වර්තමාන තත්ත්වය හා මුහුණ දී ඇති ගැටලු සම්බන්ධයෙන් සොයා බැලීම ය.

මෙ ලෙස ප්‍රදේශ වාසීන් බාහිර වශයෙන් යම් ආයතනයකින් ආධාර පැතීම නිසා ඔවුන් සහ රාජ්‍ය නො වන සංවිධාන අතර හොඳ හිත පලුදු වීමට මගපෑදී තිබේ. ජනතාව ගේ උන්නතිය සඳහා නියෝජිත ආයතන පිහිටුවා ඇති බව රාජ්‍ය නො වන සංවිධාන කියා සිටිති. මෙයට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය නො වන සංවිධානවල වුවමනාවට යාන්ත්‍රණ පිහිටුවා ඇති අතර ඉන් එම ආයතනවල අවශ්‍යතා සපුරාලන බවත්, එසේ ම එම යාන්ත්‍රණ ඔවුන් ගේ

නියෝජිතයින් ගේ ආධිපත්‍යයට නතු වී ඇති බවත්, ප්‍රදේශ වාසීහු පෙරලා පවසති. පේසාලේ ගම් වැසියන් සහ සුභ සාධන මධ්‍යස්ථානය අතර මතභේද ඇතිවීමෙන් පසු (එ නම් සුභසාධන බලධාරීන් සමාජ විරෝධී හා හිංසාවාදී ක්‍රියාවල යෙදෙන බවට ගම් වැසියන් චෝදනා කරන නිසා) පිහියෙන් ඇනීමේ සිද්ධියක් ද වාර්තා විය.

ඉඩම්වල පදිංචිය පිළිබඳ ගැටලු අවිධිමත් යාන්ත්‍රණය මඟින් විසඳීමේ ක්‍රියාමාර්ගය දිගින් දිගට ම සිදුවන අතර, අතෘප්තියට පත්වන පුද්ගලයින් යුක්තිය ඉටු කර ගැනීම සඳහා අධිකරණයේ හෝ දේශපාලන අධිකාරියේ පිහිට අපේක්ෂාවෙන් සිටින බව ද නිරීක්ෂණය වේ.

## 5. ගැටුම් සහ ජාතිවාදී ප්‍රචණ්ඩත්වයේ අනතුරු

යුද්ධය ඇතිවීමට පෙර ජන කොටස් අතර හිංසාවාදී ක්‍රියාවන් සිදු නො වීම, ඉඩම් ආරවුල් සාමකාමීව බේරුම් කරගැනීම සහ ඔවුනොවුන් අතර පැවැති මිත්‍රශීලී සම්බන්ධතා නිසා ජාතිවාදී ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය මැන ගැනීම අසීරු විය. මෙය ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින රාජ්‍ය නො වන සංවිධාන වලට බෙහෙවින් වැදගත් වේ. අවිධිමත් යාන්ත්‍රණය හරහා ඉඩම් පිළිබඳ ගැටුම් නිරාකරණය කිරීම හෝ සාමය අවබෝධ කිරීමේ ක්‍රියාකාරකම්වල නිරතවීම වැඩසටහන් වල ඉලක්කය වී ඇතත්, දීර්ඝ කාලීන වශයෙන් අරමුණ වී ඇත්තේ ප්‍රජා සම්බන්ධතා යළි ගොඩනැගීම සහ ජාතිවාදී ප්‍රචණ්ඩත්වය වර්ධනයවීම වැලැක්වීම ය.

කෝඩේඩ් ගේ අවධානය යොමු වී ඇත්තේ බහුවාර්ගික සාමය ගොඩනැගීම සහ එයට උපකාරීවන ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය කෙරෙහි ය. ආගමික කමිටු සහ අනෙකුත් ආයතන නියෝජනය වන පරිදි, සංවිධාන පිහිටුවීම මඟින් අර්බුද බේරුම් කර ගැනීම සඳහා ප්‍රදේශයේ ජනතාව දිරිගැන්වීමට ඔහු පරිශ්‍රම දරයි. ප්‍රදේශයේ ජනතාවට ප්‍රශ්න සාකච්ඡා කර ඔවුනොවුන් අතර විශ්වාසය ගොඩනැගීම පිණිස අවස්ථාව සලසාදීම නව සංවිධානවල අරමුණ වී ඇත. ආරවුල් හරිහැටි හඳුනා ගෙන ඒවාට සුදුසු අයුරින් මුහුණදීමට ජනතාව නො දන්නා බැවින් එම අඩුපාඩුව සපුරාලීම අරමුණු කරගෙන ය, කෝඩේඩ් විසින් සාම කමිටු පිහිටුවීමට මුලපුරන ලද්දේ. සාම කමිටු සම්බන්ධීකරණය කිරීම සහ ආපසු ඒ මේ අපේක්ෂාවෙන් අවතැන් වී සිටින පිරිස් සාකච්ඡා වලට සහභාගී කරගැනීම හැරුණ විට, අර්බුදවලට මැදිහත්වීමේ ක්‍රමෝපායන් සම්බන්ධයෙන් ද කෝඩේඩ් අවශ්‍ය පුහුණුව ලබා දෙයි. සාම කමිටුවලට වඩා ජනතාව ගේ මූලික අවශ්‍යතා සහ ගැටලු වැදගත් කමක් දරයි. එ බැවින් සාම කමිටුවලට ලැබෙන්නේ අඩු ප්‍රමුඛත්වයකි. සාමය අවබෝධ කරවීමේ සහ ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද කෝඩේඩ් විසින් මෙහෙයවනු ලැබේ.

රාජ්‍ය නො වන සංවිධාන ගණනාවක් ම විවිධාකාරයේ සාම වැඩසටහන් දියත් කර ඇති මුත් ඔවුන් තුළ ජාතිවාදී පිපිරීම් පිළිබඳ ව ඇති බිය මෙම වැඩසටහන්වල ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපා තිබේ. ග්‍රාම සංවර්ධන අරමුදල ප්‍රජාව දැනුවත් කිරීමේ කටයුතු වල ද, “සෝ ආ” සංවිධානය ගම්මාන වෙනුවෙන් ශ්‍රමදාන හෝ සමාජ සේවා වැඩසටහන් වල ද නිරතව සිටිති. “සෝ ආ” සංවිධානය විසින් මදුරකුලි හින්දු ග්‍රාමය සහ රසුල්පුතුවේලි නම් වූ මුස්ලිම් ග්‍රාමය අතර ශ්‍රමදානයක් සංවිධානය කරන ලදී. එහි දී මුස්ලිම් ග්‍රාමයේ ක්ෂේත්‍ර කටයුතුවල නිරතව සිටි නිලධාරී පිරිසට එහි මුස්ලිම් ජනතාව ජාතිවාදී ආරවුල් හට නො ගන්නා බවට සහතික වූ හ.

ආරවුල් නිරාකරණය කිරීමේ දී ප්‍රදේශවාසී ජනතාව සතුව ද කිසියම් වගකීමක් ඇති බව ඔවුන්ට අවබෝධ කිරීමේ දී රාජ්‍ය නො වන සංවිධානයන්ට දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදු විය. වව්නියාවේ සිට පදිංචියට ආ පිරිස් සහ වතුකරයෙන් පැමිණි දෙමළ පවුල් පදිංචිව සිටින මදුරකුලි ග්‍රාමයේ ඇතිවුන සිද්ධීන් එයට සාක්ෂි දරයි. අනුබද්ධිත ආයතන සහිත මධ්‍යගත සංවිධානයක් පිහිටුවීමට ගත් පරිශ්‍රමය විවිධ අවහිරතා මධ්‍යයේ නිෂ්ඵල විය. සංවර්ධන කටයුතු වලට සහභාගි වීමට වතුකරයේ සිට පැමිණි දෙමළ පිරිස් අකමැති වීම මෙයට කදිම නිදර්ශණයකි. මේ නිසා නිවාස තැනීම සහ ජලය සපයා ගැනීම වැනි පොදු කටයුතුවලට දායක වීම වැනි අවස්ථාවන් ඔවුන් වෙතින් ගිලිහී ගියේ ය. 2003 අප්‍රියෙල්වල දී මුසාලි ප්‍රදේශයේ හටගත් සිද්ධිය අලුයම සැඟවී තිබෙන ජාතිවාදී වෛරයේ ගිනිදැල් යළි ඇවිලීමේ අනතුර අඟවන ඉඟියකි. එය හුදකලා සිද්ධියක් වුව ද රාජ්‍ය නො වන සංවිධාන විසින් නිරන්තරයෙන් පළ කර ඇති බිය එමඟින් තහවුරු වේ. විශේෂයෙන් ගැටලු නිරාකරණය සම්බන්ධයෙන් මැදහත්වීමේ අවශ්‍යතාව සහ සාමය ගොඩනැගීම සඳහා වැඩි වැඩියෙන් කැපවීමේ වැදගත්කම එම සිද්ධිය මඟින් තවදුරටත් තහවුරු කෙරේ.

## සිද්ධි අධ්‍යයන 05

## වෙප්පන් කුලම් සහ කොකුපාදයන්ත්

මෙම ගම් දෙක මූසලි ප්‍රදේශයේ එකිනෙකට සමීපව පිහිටා තිබේ. වෙප්පන් කුලම් මුස්ලිම් ග්‍රාමයක් වන අතර එහි පදිංචිකරුවන් 1990 දී ඉන් පැන ගොස් යළි ආපසු ඒමට පටන් ගත්තේ සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වීමත් සමඟ ය. 2003 දී බිහිසුණු සිද්ධියක් ඇති වූ අවස්ථාවේ පවුල් 20 කට අඩු සංඛ්‍යාවක් ආපසු පැමිණ තිබුණි. කොකුපාදයන්ත් දෙමළ ගමක් වන අතර එහි පදිංචිව සිටි පවුල් 120 ගම අතහැර ගිය හ. ඔවුන් ගෙන් බහුතරයක් මින් වසර තුනකට පෙර ආපසු පැමිණි ය හ.

මේ ගම්වල පදිංචි දෙමළ සහ මුස්ලිම් පුද්ගලයන් දෙදෙනෙක් කුලුපග මිත්‍රයෝ වූ හ. දෙමළ තරුණයා ට්‍රැක්ටරයක් පදවමින් සිටි අවස්ථාවේ ඔහු ගේ මිතුරා වූ මුස්ලිම් තරුණයා තුවක්කුවක් අතැතිව ට්‍රේලරයේ ගමන් කරමින් සිටිය දී හදිස්සියෙන් තුවක්කුව පත්තු වී ද්‍රවිඩ රියදුරා මරණයට පත්විය. මුස්ලිම් තරුණයා ඔහු ගේ හිතමිතුරු දෙමළ රියදුරා මැරූ බවට පැතිර ගිය කට කතාවෙන් පසු මුස්ලිම් ගම්මානයේ නිවෙස් තුනකට අසල් වැසි දෙමළ පිරිස් විසින් ගිනි තබා විනාශ කරන ලදී. ඉන්පසු මුස්ලිම් ජාතිකයෝ ගම අතහැර පැනයෑමට පටන් ගත් හ. ගිනි තබා විනාශ කළ මුස්ලිම් නිවෙස් තුනේ පදිංචි කරුවෝ පසුදා ම පුත්තලම බලා පිටත්ව ගිය හ. පැනනැගී තිබුණ තත්ත්වය පාලනය කිරීම සඳහා පොලීසිය, පල්ලිය (මීසම් භාර පූජක තුමා හා බිෂොප් තුමා ගේ නියෝජිතයින්) මන්නාරමේ පුරවැසි කමිටුව සහ ශ්‍රී ලංකා සටන් විරාම කමිටුවේ නිලධාරිහු ද මැදිහත් වූ හ. සිද්ධියට සම්බන්ධ පුද්ගලයින්ට සහ ප්‍රදේශයේ සියලු ජන කොටස්වලට ඔවුන් ගේ සෑම දුග්ගැනවිල්ලලක් ම ඉදිරිපත් කිරීම සඳහා රැස්වීමකට සහභාගි වන ලෙස මන්නාරමේ මන්ත්‍රී වරයා ආරාධනා කළේ ය. ඉන්පසු මුස්ලිම් පවුල් තවදුරටත් තම ගම්බිම් අතහැර යෑම නවතා ඇති බවත් පෙනෙන්නට තිබුණි.

# පුත්තලම් දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක්

උතුරු සහ නැගෙනහිර පළාත්වලට පමණක් සැබවින් ම වාර්ගික යුද්ධය සීමාවුව ද, අවතැන් වූ පිරිස් විශාල වශයෙන් යළි පදිංචි කරවීමේ කාර්යය සම්බන්ධයෙන් මතු වූ ගැටුම් සහ විවිධ ගැටලු දෙස බලන විට පුත්තලම් දිස්ත්‍රික්කය සුවිශේෂ වැදගත්කමක් දරයි.

1990 දී එල්ටීටීඊ ය විසින් උතුරෙන් පලවා හරින ලද මුස්ලිම් පදිංචි කරුවන් ගෙන් බහුතරය පුත්තලම් දිස්ත්‍රික්කයට පැමිණීම නිසා එහි පවත්නා සම්පත් හිඟය තවදුරටත් උග්‍ර විය. මේ නිසා අවතැන් වූ මුස්ලිම් ජනතාව හුදකලා වීම ඇතුළු විවිධ තාඩනපීඩන වලට ලක්වූ හ. එදිරිවාදිකම්, අරමුදල් සහ ඇතැම් අවස්ථාවල දී හිංසාවාදී ක්‍රියාවන්ට පවා ඔවුහු විටින් විට ගොදුරු වූ හ. ගැටුම් නිරාකරණය කිරීමේ සාම්ප්‍රදායික ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට එහි වෙසෙන විවිධ ජන කොටස් මැනවින් හුරුපුරුදු වී සිටිය හ. සාම කමිටු, සාකච්ඡා සඳහා පොදු වේදිකා සහ බහුවාර්ගික සංවර්ධන ව්‍යාපෘති ඇතිකිරීම මගින් ජන කොටස් අතර පවත්නා ආරවුල් සහ හිංසාවාදී ක්‍රියා මැඩපැවැත්වීමේ ලා රාජ්‍ය නො වන සංවිධාන සහ ප්‍රදේශ වාසීන් මුල් තැනක් ගෙන ක්‍රියා කළ මුත් හිංසනය වලක්වා එම කටයුතු ඉදිරියට ගෙන යෑම දුෂ්කර විය.

## 1. ගැටුම් නිරාකරණය කිරීමේලා යොදාගන්නා ලද අවිධිමත් යාන්ත්‍රණය

- සාම්ප්‍රදායික ආගම් කමිටු
- ගමේ වැඩිහිටි සහ අනෙකුත් නායකාකාරකාදීන්
- අවිධිමත් යාන්ත්‍රණය උපයෝගී කරනු ලබන වෙනත් පුද්ගලයින්

* රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති සාම කමිටු
* රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කරන ලද බහුවාර්ගික දැනුවත් කිරීමේ සහ සංවර්ධන ව්‍යාපෘතීන් භාර කණ්ඩායම්
* පුරවැසි කමිටු

## සාම්ප්‍රදායික ආගම් කමිටු

විශේෂයෙන් වාර්ගික යුද්ධය නිසා මතු වූ අර්බුදකාරී තත්ත්වයන් හමුවේ එයට ගොදුරු වූ විවිධ ජන කොටස්වල සුභසාධන සහ උන්නතිය උදෙසා මුස්ලිම් දේවස්ථාන කමිටුවෙන් අප්‍රමාණ සේවාවක් ඉටු විය. බොහෝ අවස්ථාවල මුස්ලිම් දේවස්ථානය ජනජීවිතයේ කේන්ද්‍රය බවට පත්විය. ප්‍රජා නියෝජිතයින් ගේ සක්‍රීය සහභාගීත්වය යටතේ ජනතාව මුහුණ පා ඇති විවිධ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් ඒවාට පිළියම් යෙදීමේ ලා ඉන් අසීමිත සේවාවක් සැලසුණි.

මෙම කමිටු පෙරමුණ ගනිමින් පරිපාලනමය ගැටලු වලට මැදිහත් වූ අතර ආරවුල් නිරවුල් කිරීමේ කටයුතුවල දී ද සක්‍රීයව ක්‍රියාකළ හ. කමිටු සාමාජිකයින් සීමිත කාලයක් සඳහා තෝරා පත්කරනු ලැබේ.

කමිටුව වෙත ලිඛිතව හෝ වාචිකව ලැබෙන පැමිණිලි ජුම්මා යාඥාවට පෙර සාකච්ඡාවට භාජනය කරනු ලැබේ. පැමිණිල්ලට සම්බන්ධ කරුවන් කැඳවනු ඇත. එසේ නො මැති නම් කමිටු සාමාජිකයෝ පාර්ශ්වකරුවන් ගේ නිවෙස් වලට පැමිණෙති. ආරවුලට මැදිහත්වීම හෝ බේරුම් කිරීම කමිටුව වෙතින් සිදු වේ. පොලීසිය සංකීර්ණ ස්වරූපයේ පැමිණිලි කමිටුවට යොමු කරයි. ගම් දෙකක් අතර සිදුවන ආරවුල් පවා මුස්ලිම් නො වන වැසියන් විසින් දේවස්ථාන කමිටුව වෙත යොමු කරනු ලැබේ.

## ගමේ වැඩිහිටි නායකකාරකාදීන්

බොහෝ ගම්වල ආරවුල් නිරවුල් කිරීමේ ලා පවුල් ඒකකය ප්‍රමුඛස්ථානයක් දරයි. විශේෂයෙන්, ආනමඩුව වැනි ප්‍රදේශවල පුළුල් පවුල් ව්‍යූහය ආරවුල් නිරාකරණය කිරීමේ ලා වැදගත් වේ. සාම්ප්‍රදායික වශයෙන් ගමේ ප්‍රභූ පවුල් වෙත ආරවුල් යොමු කෙරෙනු ඇත. අනෙකුත් ගැටලු එනම්, පොල් වගා කටයුතුවල දී ඇතිවන ආරවුල් 'කප්රුක' වැනි සංවිධානයන් වෙත යොමුකරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා ග්‍රාම සංවර්ධන සමිති, ධීවර සමිති සහ වී වගා කිරීමේ සමිති ස්වකීය ක්ෂේත්‍රයන්ට අදාල කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකරති.

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය උපයෝගී කරගත් පුද්ගලයින්

විශේෂයෙන් සංවිධානාත්මක ව්‍යුහයක් නො මැති නැවත ජනතාව පදිංචි කරන ලද සිංහල ගම්මාන වැනි පෙදෙස්වල ආගමේ හෝ රැකියාවේ අධිකාරී බලය සහිත පුද්ගලයෝ ගමේ ගැටලු නිරාකරණයේ දී වැදගත් සේවාවක් ඉටුකරති. ගමේ දේවස්ථානයේ පූජක තුමා සහ විද්‍යාලයාධිපති වරයාට නිසගයෙන් ම නායකත්වය හිමි වේ. සමාදාන විනිශ්චයකාරවරයා වෙත ද විවිධ ආරවුල් විසඳුම් පතා යොමු කරනු ඇත. මෙබඳු වගකීමක් දරන පුද්ගලයෝ හුදෙක් ආරවුල්වලට මැදිහත් වෙනවා පමණක් නො ව ඒවා ඍජුව බේරුම් කිරීම ද සිදුකරති. ගමේ පවුල් දෙකක් අතර මතුවන ගැටුමක දී හෝ සොරා ගමේ ම පුද්ගලයෙක් ලෙස හඳුනාගත් අවස්ථාවන්හි දී ඔවුහු ඍජුව ම ඒවාට මැදිහත් වී තීන්දුවක් දෙති.

## රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති සාම කමිටු

පුත්තලමේ රාජ්‍ය නො වන සංවිධාන විසින් සාම කමිටු පිහිටුවා ඇති අතර ඉන් සමහරකට ගැටුම් නිරාකරණය කිරීමේ හැකියාව ඇත. සාමය හා සමාජය පිළිබඳ ව දැනුවත් කිරීම සහ ඒකාබද්ධ සංස්කෘතික හා සමාජ ක්‍රියාකාරකම් මෙම කමිටු වෙත පැවරී ඇති ප්‍රධාන රාජකාරී වේ. මෙම කමිටු බොහෝ දුරට රාජ්‍ය නො වන සංවිධාන විසින් සහන පුනරුත්ථාපන හෝ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශවල ආරම්භ කර ඇත. ප්‍රජා භාරකාර අරමුදල විසින් මෙහෙයවනු ලබන සාම කමිටු බහුවාර්ගික ජනගහනයක් ජීවත්වන පොකුරු ගම්මානවල ක්‍රියාත්මක වන අතර ග්‍රාමීය සංවර්ධන අරමුදලේ සාම කමිටු ගම් දෙකක වෙනත් ජන වාර්ගික කණ්ඩායම් සම්බන්ධවන අරමුදල් සහ පොදු ප්‍රශ්න පිළිබඳ ව ක්‍රියාකරති. මේ හැම සාම කමිටුවකට ම රාජ්‍ය නො වන සංවිධානවලට අයත් ක්ෂේත්‍ර නිලධාරීන් සහ ව්‍යාපෘති සමායෝජන නිලධාරීන් ගෙන් උපදෙස් ලැබේ.

## රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කරන ලද බහුවාර්ගික දැනුවත් කිරීමේ සහ සංවර්ධන ව්‍යාපෘති භාර කණ්ඩායම්

සංවර්ධන අවශ්‍යතා කේන්ද්‍ර කොට ගනිමින් අනෙකුත් රාජ්‍ය නො වන සංවිධාන විසින් බහුවාර්ගික ආයතන පිහිටුවා ඇත. මෙම ආයතන ඍජුව ම ගැටුම් නිරාකරණය කිරීම සඳහා සම්බන්ධ නොවන මුත්, දැනුවත් කිරීම සහ තාක්ෂණික පුහුණුව, සම්බන්ධනා ගොඩනැගීම සහ පොදු ගැටලු සාකච්ඡාවට බඳුන් කිරීම සඳහා අවස්ථාව සලසාදීම වැනි රාජකාරිවල නිරත වෙති.

සංවර්ධන කටයුතුවල නිරත රාජ්‍ය නො වන සංවිධාන ගම් නියෝජනය වන පරිදි මධ්‍යම ගම් සභා පිහිටුවීම කෙරෙහි ද නැඹුරු වෙති.

“වෝඩෙප්ට්” යනු ‘ෆෝරුට්’ සහ ‘වර්ල්ඩ් විෂන්’ සංවිධාන අරමුදල් වලින් ආරම්භ කර ඇති කාන්තා සංවර්ධන කේන්ද්‍රයකි. කාන්තාවන් සඳහා ආදායම් ඉපයීමේ සහ ණයදීමේ ව්‍යාපෘති එමඟින් ක්‍රියාත්මක වේ. කාන්තාවන්ට රැකියා ලබාදීම සහ සාකච්ඡා සඳහා අවස්ථා සැලසීම ද ‘වෝඩෙප්ට්’ සංවිධානය වෙතින් ඉටු වේ. එහි දිස්ත්‍රික්ක මට්ටමින් පැවැත්වෙන බහුවාර්ගික රැස්වීම්වල දී පොදු ප්‍රශ්න සාකච්ඡාවට ගැනේ. ඒ හැරුණු විට මත්පැන් ලෝලිත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු, නායකත්ව නිපුණතා සහ වෙළඳ පොළ පුහුණුව ද එමඟින් සපයනු ලැබේ.

## පුරවැසි කමිටු

බලධාරීන් ගේ උදාසීන භාවය හා අලසකම හමුවේ, උනන්දුවක් දක්වන පුරවැසි පිරිස් ඉදිරිපත් වී මැදිහත් වීමේ හෙවත් ගැටලු නිරාකරණය කිරීමේ කාර්යයට සම්බන්ධ වූ හ. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් ගැන ක්‍රියාකරන පුරවැසි කමිටුව සහ වැඩි වශයෙන් මුස්ලිම් ජනතාව ජීවත් වන පුත්තලම නගර වාසීන් ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් පෙනී සිටින ජනතා කේන්ද්‍රය වශයෙන් පුත්තලම නගරය තුළ කමිටු දෙකක් ක්‍රියාත්මක වේ. පුරවැසි කමිටුව මානව හිමිකම් සුරැකීමේ කටයුතුවල නිරත වෙයි. ජනතා කේන්ද්‍ර හුදෙක් කයෝර පළාත් පාලන මැතිවරණයකින් පසුව ප්‍රදේශයේ දේශපාලන නැයින් අතර පැනනගින මතභේදවලට මැදිහත් වීම සඳහා නිර්මාණය කරන ලද්දකි. යම් හෙයකින් ජන කොටස් දෙකක් අතර ගැටුමක් ඇති වූ විට දී, ජනතා කේන්ද්‍රය ඉක්මණින් සාම කමිටුවක් පිහිටුවා සාමය ස්ථාපනය කර, නැවත එබඳු සිද්ධීන් ඇතිවීම වැලක්වීමේලා ක්‍රියාත්මක වේ.

## 2. වාර්ගික ජන කොටස් සහ සත්කාරක ප්‍රජා කණ්ඩායම් හෝ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පිරිස් අතර පැනනගින ගැටුම්කාරී තත්ත්වයන් සහ අර්බුද

### 2:1 ගැටලු

යුද්ධයට ඍජුව ම සම්බන්ධ වී නැති නමුදු පුත්තලමට එහි බලපෑම දැඩි ලෙස දැනී ඇත. ජනතාව අතර සිදුවන ගැටුම්වලට පවා එය තදින් බලපා ඇත. එල්ටීටීඊ ය මුස්ලිම් ජාතිකයින් උතුරෙන් පලවාහැරීම නිසා 1990 ඔක්තෝම්බර්වල දී පුත්තලමේ ජනගහනය 80,000 කින් වැඩිවිය. උතුරේ දිස්ත්‍රික්කවලින් පැන ආ සරණාගත පිරිස් තාවකාලිකව පුත්තලමේ පදිංචි වූ හ. මේ නිසා කාලයා ගේ ඇවෑමෙන් අනාථයින් ස්ථිර පදිංචිකරුවන් වීමත් සමඟ

ම ජනකොටස් අතර විවිධ ගැටුම්, එදිරිවාදීකම් හා මතභේද හටගන්නට විය. සම්පත් ඌණතාව සහ අනෙකුත් ආර්ථික ගැටලු ද උග්‍රවන්නට විය.

වැඩි වූ ජනගහනයට සරිලන පරිදි විශේෂයෙන් සෞඛ්‍ය සහ අධ්‍යාපන අවශ්‍යතා ඇතුළු මූලික පහසුකම් සැපයීමට බලධාරීන් අපොහොසත් වීම නිසා ජනතාව අතර නොසන්සුන් තාවයක් ඇතිවිය. රෝහල් වැඩිදියුණු නො කිරීම, දෙමළ භාෂාවේ ප්‍රවීනත්වය ලත් රාජ්‍ය සේවකයින් ප්‍රමාණවත් පරිදි පත් නො කිරීම, පාසල් ගොඩනැගිලි හිඟකම යනාදිය කැපී පෙනෙන අඩුපාඩු කීපයකි. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ ජනතාවට රජයේ සේවයට පිවිසීම පහසු දෙයක් නො වේ. ඒ වෙනුවට ත්‍රී රෝද රියදුරු තනතුරු, බේකරි පවත්වා ගෙන යෑම ඇතුළු කම්කරු ශ්‍රේණි පමණක් අවතැන් වූවන්ට විවෘත විය. අවතැන් වූ පිරිස් අඩු මුදලකට තම ශ්‍රමය අළෙවි කිරීම නිසා, ප්‍රදේශයේ සාම්ප්‍රදායික පදිංචිකරුවන්ට රැකියා අවස්ථා අහිමිවීමේ තර්ජනයක් පැනනැඟුණි.

දේශපාලනඥයින්, රාජ්‍ය නො වන සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නො වන සංවිධාන විසින් අවතැන්වූවන් සඳහා සහන සැපයීම ජන කොටස් අතර යම් ආකාරයේ "සීතල යුද්ධයක්" ඇතිවීමට හේතුවිය. ඉඩම් මිලට ගෙන අවශ්‍ය අංගෝපාංගයන් සහිත නිවෙස් තැනීම සහ යටිතල පහසුකම් සැපයීම සඳහා අවතැන්වූවන්ට රජයෙන් මූල්‍යාධාර සැපයිණි. ප්‍රදේශයේ මුල් පදිංචි කරුවන්ට නො මැති පහසුකම් අවතැන්වූවන්ට සහනාධාර යටතේ භුක්ති විඳීමට ඉඩලැබීම ද මතභේදයට තුඩු දීමට එක් හේතුවක් විය.

ප්‍රජා අවශ්‍යතා සපුරාලීමට බලධාරීන් අපොහොසත්වීම නිසා ඇති වූ හිඩැස පිරවීම සඳහා දේශීය රාජ්‍ය නො වන සංවිධාන ඉදිරිපත් වූ හ. එහෙත් ප්‍රමාණවත් පරිදි විදේශාධාර නො ලැබීම නිසා එම වෑයම ව්‍යර්ථ විය. ජනතා කේන්ද්‍රය සහ සමාජ ප්‍රවර්ධනය සඳහා වූ පර්යේෂණ සහ ක්‍රියාකාරී සංවිධානය වැනි අනෙකුත් ආයතන අරමුදලට මූලාශ්‍රය වූ පසුබිම් ගවේෂණය කිරීමේ නිතර වූ හ. මුලතිව් සහ යාපනයේ සිට පැමිණි අවතැන් වූවන් සඳහා අලුතින් පිහිටුවන ලද ගම "හිජ්රාතපුරම්" යන්වෙන් නම් කිරීම ගැන උරන වූ ප්‍රදේශවාසීහු එහි පැරණි නම වන "පෙරියකුලම්" නො වෙනස්ව තිබිය යුතු යයි විරුද්ධත්වය පළ කළ හ. මේ හේතුවෙන් ජන කොටස් අතර ගැටුම්කාරී තත්ත්වයක් උදාවිය.

පුත්තලම බෙහෙවින් ම දේශපාලනීකරණය වූ ප්‍රදේශයක් වන අතර සාමාන්‍ය මතභේද හා ආරවුල් මැතිවරණ සමයේ දී උග්‍රවීම සිරිතක් වී තිබේ. දේශපාලන අනුග්‍රහය ගැටුම්වලට මූලික හේතුවයි. මැතිවරණ කාලයේ දී ඡන්දය ලබාගැනීමේ අපේක්ෂාවෙන් අවතැන් වූවන් සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විවිධ සම්පත් ලබා දෙති.

අවතැන් වූවන් විශාල වශයෙන් පැමිණීම නිසා පුත්තලමේ මුස්ලිම් ජනගහනය සම්පූර්ණයෙන් ම දෙගුණ විය. දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 23% ක් ම ඔවුහු වෙති. මේ අයුරින් ජනගහන අනුපාතය වෙනස්වීම නිසා සිංහල සහ මුස්ලිම් වැසියන් අතර ගැටුම්වලට තුඩු දෙන පසුබිමක් නිර්මාණය වෙමින් තිබේ.

නාගරික ප්‍රදේශවලින් පැමිණෙන තරුණ පිරිස්වල හිංසාවාදී ක්‍රියාවන්ට ගම්බද ප්‍රදේශ ගොදුරුවීම තවත් වැදගත් කරුණකි. අවතැන් වූවන් පදිංචි මෙම ප්‍රදේශවල පිරිමින් යාපනය සහ මන්නාරම වැනි ඈත එපිට නගරවල රැකියාව කරන බැවින්, හුදකලාව ගෙදරට කොටු වී සිටින ඔවුන් ගේ බිරියන්ට සහ දරුවන්ට නාගරික ප්‍රදේශවලින් පැමිණෙන තරුණයින් ගේ තර්ජන ගර්ජන වලට බියෙන් කාලය ගත කිරීමට සිදු වී ඇත. එ බැවින් විශේෂයෙන් පාලවි සහ මදුරන්කුලි යන ප්‍රදේශවල සාමය තහවුරු කිරීම ඉක්මණින් කළ යුතු ව ඇති කාර්යයක් වී තිබේ.

## 2:2 සමාප්තිය සහ විශ්ලේෂණය

මිනී මැරුමක් හෝ පිටින් පැමිණ පදිංචි වූ පවුලකට අයත් පාසල් ගුරුවරියක් ශිෂ්‍යයෙකුට තරවටු කළ සිද්ධියක් සැලකිය යුතු ප්‍රශ්නයක් බවට පත් වී විවිධ කණ්ඩායම් වලින් ක්ෂණික ප්‍රතික්‍රියා දැක්වීම සිදුවෙයි. සමහර විට එය කලහකාරී කණ්ඩායම්වල හිංසාවාදී ක්‍රියාවන්ට මුල පුරන්නක් වියහැකියි. වාර්ගික ජනගහනයේ සිදු වූ ප්‍රබල වෙනස්වීම්, දිස්ත්‍රික්කය තුළ සම්පත් ඌණතාව, සීමිත සම්පත් වෙන්කරණු ලබන ආකාරය සහ දේශපාලනීකරණයට ගොදුරු වීම, ගැටුම්කාරී වාතාවරණයට එක් වැදගත් හේතුවකි. දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් නො වන, එහෙත් පිටින් පැමිණ පදිංචි වූ පිරිස් සහ ගම් වැසියන් අතර ඇතිවන ආරවුල් සහ තම ගම්බිම් කරා ආපසු පැමිණෙන පවුල් සහ ගමේ පැරණි පදිංචිකාරයින් අතර ඇතිවන ගැටුම් හා මතභේද වලට ගොදුරුව සිටින පුත්තලම් දිස්ත්‍රික්කය, අනෙකුත් දිස්ත්‍රික්කවලට පූර්ව නිදර්ශණයකි. සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වීමෙන් පසු මුස්ලිම් පවුල් 5000 ආපසු යාපනයේ තම පැරණි ගේ දොර සොයා ගෙස් ඇත

අවතැන්වූවන් ගෙන් විශාල සංඛ්‍යාවක් ආපසු යෑම සඳහා අධිෂ්ඨාන කරගෙන සිටින මුත්, දේශපාලන අවිනිශ්චිත භාවය, අනාරක්ෂිත භාවය පැරණි ගේ දොර ඉඩකඩම් පරිහානියට පත්වීම, සහ ස්වභාවික ජනගහන වර්ධනය යනාදී හේතු නිසා දැනට පදිංචි වී සිටින ස්ථානවල ස්ථිර වශයෙන් පදිංචි වීමට අධිෂ්ඨාන කරගෙන සිටිති. එබැවින් අවතැන් වූ පිරිස් සහ ආපසු පැමිණෙන පවුල් අතර ගැටලු පැනනැඟීම හා අර්බුදකාරී තත්ත්වයන් දිගින් දිගට ඇතිවීමට බෙහෙවින් ඉඩ තිබේ.

# 3. ගැටුම් සහ ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය

3:1 පවුලේ ගැටුම්, ප්‍රජාව තුළ ඇතිවන ගැටුම් සහ අන්තර් ප්‍රජා ගැටුම් වශයෙන් ගැටුම් ත්‍රිවිධාකාර ය. ගැටුම් තීරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයේ සාර්ථකත්වය, ගැටුමේ ස්වභාවය සහ ඒවා විසඳීමේලා ගනු ලබන ප්‍රවේශය මත රඳාපවතී.

## පවුලේ ගැටුම්

මත්පැනට ලොල්වීම, ගෘහස්ථ අපචාරය, පරදාර සේවනය සහ අනෙක් පෞද්ගලික ගැටලු සම්බන්ධයෙන් පිළිවෙළින් ගමේ සාම්ප්‍රදායික බලධාරීන් සහ පුළුල් පවුල් ව්‍යූහය විසින් ක්‍රියා කරනු ඇත. මුස්ලිම් ප්‍රජාව තුළ ඇතිවන මෙම ගැටලුවලට විසඳුම් සෙවීම දේවස්ථාන කමිටුවේ කාර්යයභාරය වේ. පොලීසිය හා අධිකරණය හා සසඳා බලන විට ගැටුම් නිරාකරණයේ දී ගමේ සාම්ප්‍රදායික නායකත්වය බෙහෙවින් ජනතාවට සමීප බැවින් වඩාත් ප්‍රායෝගික කාර්යයභාරයක් ඉටු කළ හැකි තත්ත්වයක සිටී. එහෙත් එය සමාජ සංස්කෘතිය මත රඳාපවතී.

## ප්‍රජාව තුළ ඇතිවන ගැටුම්

මෙම ගැටලු සම්බන්ධයෙන් මූලිකව ක්‍රියා කරනු ලබන්නේ ගමේ සාම්ප්‍රදායික නායකත්වයයි. ඉඩම් පිළිබඳ ආරවුල් සහ ණය ආපසු නො ගෙවීම වැනි ගැටලු සම්බන්ධයෙන් ගමේ සාම්ප්‍රදායික කමිටුව කටයුතු කරයි. අනෙකුත් ප්‍රශ්න, එ නම් ජලය අපතේ යැවීම වැනි කරුණු වී වගා කිරීමේ සමිතිය වෙත යොමු කරනු ලැබේ.

## අන්තර් ප්‍රජා ගැටුම්

ගැටලුවේ ස්වභාවය සහ එය විසඳීමට සුදුසු පුද්ගලයා කවුද යන කරුණු ගැන සැලකිලිමත් වෙමින්, ගැටලුවලට සම්බන්ධ පාර්ශ්වයන් විවිධ බලධාරීන් වෙත සමීප වෙති. මුස්ලිම් දේවස්ථාන කමිටුව, ප්‍රදේශයේ සාම කමිටුව සහ පුත්තලම මුස්ලිම් දේවස්ථාන සම්මේලනය ඔවුන් ගෙන් කීපයකි.

3:2 මහජනතාව වෙනස් යාන්ත්‍රණ උපයෝගී කරගැනීමේ දී ගැටුම් ඇති වීමේ දී ඒවා නිරාකරණය කිරීම සඳහා යා යුත්තේ කා වෙතට ද යන්න පිළිබඳ ව මිනිසුන්ට හොඳ අවබෝධයක් ඇත.

සාම්ප්‍රදායික බලධාරීන් සතු බලය හීන වී ඇති නාගරික හෝ අර්ධ නාගරික පෙදෙස්වල ජනතාව වෙතත් බලධාරීන් කරා යයි. පොලීසිය සහ දිසාපති වරයා හැරුණු විට දේශපාලකයින් ගේ මැදහත්වීම අපේක්ෂා කරන අවස්ථා ද එමට ය. සාම මණ්ඩල ද සුවිශේෂ කාර්යයභාරයක් ඉටු කරති. සමහරු යාබද ගමේ ප්‍රජා නායකයින් වෙත ද සහනය පතා යති. මුස්ලිම් දේවස්ථාන කමිටුව මෙන් ම, මුස්ලිම් නො වන යාබද ගම්වල වැසියන් විසින් මතුකළ ප්‍රශ්නයක් වූයේ ප්‍රදේශයේ කාන්තාවන් මුස්ලිම් තරුණයින්ගේ අඩන්තේට්ටම් වලට ගොදුරු වීමයි. එබඳු අවස්ථාවල දී මුස්ලිම් දේවස්ථාන කමිටුව සිද්ධිය ගැන පරීක්ෂණයක් පවත්වයි. එමෙන් ම මුස්ලිම් නො වන අන්‍ය ප්‍රජාවක ගෙන් මුස්ලිම් ජාතිකයෙකු සහනය පැතීමේ දී, විද්‍යාලයාධිපති වරයෙක් වැනි ගමේ ප්‍රභූ වරයෙකු ගේ පිහිට සොයා යාම පුරුද්දක් වී තිබේ.

## 3:3 ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය විශ්ලේෂණය කිරීම;

### ප්‍රජාව මුහුණ දෙන ඇතිවන ගැටලු විසඳීම

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය එම කාර්යය ඉටු කිරීමේ ලා ශක්තිමත් එකක් වුව ද එහි තීරණවලට එළඹීමේ ව්‍යුහය විධිමත් පරිදි නියෝජනය වී නැතුවා විය හැකි ය. එසේත් නැතිනම්, එහි තීරණය ප්‍රජාවට සාධාරණ එකක් වුව ද එයින් අදාල පාර්ශ්වයට හෝ පුද්ගලයාට සාධාරණත්වයක් ඉටු නො වූවා විය හැකි ය. ස්වාධිනව බලන කල මෙම "මැදිහත් වීම" එක්තරා විශිෂ්ට පවුල් හෝ පුද්ගලයින් කීප දෙනෙකුට පමණක් සීමා වූවක් සේ පෙනේ. කමිටුවේ නිලතල දරන්නන් වඩාත් ධනවත් හා උගතුන් පිරිසක් නිසා, තීරණ ගැනීමේ බලය ඔවුන් ගේ ඒකාධිකාරය වී තිබේ. පුද්ගලයින් ප්‍රජාවෙන් කොන් කර තිබීම හෝ ඉවත් කිරීම ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය සතු සුවිශේෂ බලතල අතුරින් කැපී පෙනෙන්නකි. මුස්ලිම් කාන්තාවන් මත්පැනට ඇබ්බැහි වී සිටින තම ස්වාමියා ගෙන් වන හිරිහැරය ගැන කරනු ලබන පැමිණිල්ලක් හේතුවෙන් දඬුවමක් වශයෙන් ඇය ගේ සැමියා මුස්ලිම් ප්‍රජාවෙන් ඉවත් කරනවා පමණක් නො ව ඔහු මිය ගිය පසු මුස්ලිම් මිනී පිටියේ ඔහු ගේ සිරුර වැලලීමට පවා ඉඩ දෙනු නො ලැබේ.

රාජ්‍ය නො වන සංවිධානවලට තම ක්ෂේත්‍ර කටයුතුවල දී කාන්තාවන්ට බෙහෙවින් උපකාර කළ හැකි ය. විශේෂයෙන් සුළු ණය මුදලක් යොදා කාන්තාවන් වෙනුවෙන් ආරම්භ කරනු ලබන ව්‍යාපෘතිවල දී රාජ්‍ය නො වන සංවිධාන වලට කාන්තාවන් සඳහා වඩාත් උපකාරී විය හැකි ය. කලාතුරකින් යෙදෙන අවස්ථාවල, රාජ්‍ය නො වන සංවිධානවලට ඔවුන් විසින් ආරම්භ කර ඇති ව්‍යාපෘතිවලින් සමාජ චාරිත්‍ර හෝ ආචාර ධර්ම වලට බලපෑමක් සිදු වී

නො මැති බවට මුස්ලිම් දේවස්ථාන කමිටුවට කරුණු පැහැදිලි කරදීමට සිදු වේ.

## 4. පිටස්තර සංවිධාන විසින් ස්ථාපනය කරන ලද සාම කමිටුවල කෙටිකාලීන පැවැත්ම

සාම කමිටු පිහිටුවීමේ දී වැදගත් වන ප්‍රධාන සාධක තුන වනුයේ ආධාර සපයන ආයතන, මෙ රට රාජ්‍ය නො වන සංවිධාන සහ ප්‍රජාවන් ය. මේවා එක්තරා ප්‍රමාණයකට සාම කමිටුවල කෙටිකාලීන පැවැත්මට වගකිව යුතුව ඇත.

විශේෂයෙන්, ආධාර සපයන ආයතන දක්වන කෙටිකාලීන උනන්දුව නිසා සාම කමිටුවල තිරසාර පැවැත්ම සහතික කිරීම අපහසු ය. මේ හැරුණ විට දේශීය රාජ්‍ය නො වන සංවිධානවලට ආධාර සපයන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නො වන සංවිධාන වලින් ලැබෙන ආධාර කෙරෙහි විශ්වාසය තැබීමට සිදුවීම සහ, ප්‍රදේශවාසීන් ගේ සහ අවතැන්වූවන් ගේ අලසකම සාම කමිටුවල පැවැත්මට වෙසෙසින් ම බලපා ඇත. නව සාම කමිටු අකාලයේ බිඳවැටීමට එක් හේතුවක් වී ඇත්තේ ඒවා පිහිටුවන ලද ආකාරයයි. ආධාර සපයන ආයතනවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සිදුවීම නිසා මෙන් ම ප්‍රජාවන් දෙකක් අතර මතු වූ අනපේක්ෂිත කරුණක් හේතු කොට ගෙන මෙ රට රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවන ලද සාම කමිටු ද එක හා සමාන ඉරණමකට මුහුණ දෙමින් අකාලයේ බිඳවැටේ. ආධාර සපයන ආයතන කෙටි කාලීනව ආධාර සැපයීම නිසා සාම කමිටුවලට දීර්ඝ කාලීනව කටයුතු කළ නො හැකි වීම මෙහි යථාර්තයයි.

සාම ක්‍රියාකාරකම් පවත්වා ගෙන යන මට්ටම පිළිබඳ රාජ්‍ය නො වන සංවිධානවල මූලස්ථානයත්, ක්ෂේත්‍රයත් අතර ප්‍රභේදයක් දක්නට ඇත.

සාම කමිටු රාජ්‍ය නො වන සංවිධානවලට අයත් ව්‍යාපෘතිවල මූලිකාංගයක් වුව ද, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂකයින්ට එ වැන්නක් නිරීක්ෂණය කළ නො හැකි විය. රාජ්‍ය නො වන සංවිධානවල මට්ටමින් මෙයට හේතුව වශයෙන් පෙන්වා දී ඇත්තේ අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් වලට ප්‍රමුඛත්වය ලැබී තිබුණ මුත්, සාම කමිටු පවත්වා ගෙන යෑම සඳහා ප්‍රමාණවත් ආධාර මුදල් සහ සේවක මණ්ඩල නො මැති වීමයි. සාම කමිටු ආරම්භ කළ කෙටිකාලය තුළ දී ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ හරහා සමහර ආරවුල් තීරණය කිරීමට සමත් විය. ගම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර හටගන්නා ගැටුම් නිරාකරණය කිරීමේ ලා සාම කමිටු වැදගත් මෙහෙවරක් ඉටු කර ඇති අතර, එම කාර්යයේ දී විවිධ ගම් ප්‍රදේශ අතර සහයෝගය සහ සම්බන්ධතා

වර්ධනය වීමට මගපෑදී ඇත. සහයෝගීතාව සක්‍රීයව පැවතියත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ඉන් පිටිවහලක් නො ලැබේ. (සිද්ධි අධ්‍යයන 06 බලන්න.) දේශීය රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කරන ලද සාම කමිටු වලින් මූලික අරමුණු දෙකක් ඉෂ්ට වේ. එනම් විවිධ ජන කොටස් අතර සම්බන්ධතා ගොඩනැගීම සහ ආරවුල් නිරාකරණය කිරීමේ හැකියාව නගා සිටුවීම සඳහා සාම කමිටුවල තනතුරු දරන ප්‍රභූ පිරිස්වල සුජාත භාවය තවදුරටත් ශක්තිමත් කිරීම ය. සාම කමිටුවල තිරසාර පැවැත්මට හරස් වී ඇති ප්‍රධානතම බාධකය නම් ඒ කෙරෙහි වගකිවයුත්තන් ගේ උනන්දු හීනවීම ය. සිරිමාපුර පිළිබඳ (සිද්ධි අධ්‍යයන 06) මඟින් පෙන්වා දෙන පරිදි ප්‍රදේශයේ ජනතාව එකිනෙකා මුණගැසී සම්බන්ධතා වර්ධනය කිරීම මත ය, සාම කමිටුවලට නො මැරී හිස ඔසවා සිටිය හැක්කේ. හදිසියෙන් පැනනඟින අර්බුද අඩු වීමත් සමඟ ම, වගකිවයුත්තන් ගේ උනන්දුව හීනවීම නිසා ගැටලු නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය අභාවිතයට පත් වෙමින් තිබෙන අයුරු පුලුතිවයෙල් - උල්ලුකාපලම් සිද්ධි අධ්‍යයනය අංක 07 මඟින් පෙන්නුම් කරන ලදී. සාම කමිටු කෙරෙහි ගම් වැසියන් තුළ උනන්දුවක් ඇති කිරීම බරපතළ දුෂ්කරතාවක් බව රාජ්‍ය නො වන සංවිධාන සහ ජනතා කේන්ද්‍රය වැනි කණ්ඩායම් පවසා ඇත. එබැවින් සාම කමිටු මෙන් ම, එම කමිටු සහ රාජ්‍ය නො වන සංවිධාන අතර පවත්නා සම්බන්ධතාව සැලසුම් කිරීමේ දී, සාම කමිටු දීර්ඝකාලීන පදනමක් මත පවත්වා ගෙන යා හැක්කේ කෙසේ ද යන්න තීරණය කිරීම වැදගත් වේ.

## *සිද්ධි අධ්‍යයන 06*

## *සිරිමාපුර*

මුස්ලිම් ජාතිකයින් පිරිසක් සිංහල ත්‍රීවිල් රියදුරකුට තම වාහනය ගාල් කිරීම සඳහා ඔවුන් ගේ රථ ගාල තුළ ඉඩදීම පිළිබඳ සිද්ධියක් මුල් කරගෙන පසුගියදා මදුරන්කුලි ප්‍රදේශයේ කලහයක් ඇතිවිය. සිද්ධිය වූ දින රාත්‍රියේ 25 - 40ක පිරිසක් අලුතින් පිහිටුවන ලද ගමකට, එහි වැසියන් මුස්ලිම් දේවස්ථානයේ යාඥා කරමින් සිටිය දී පහර දුන් හ.

කලහකාරී පිරිස නිවෙස 10 කට ගිනි තබා විදුලි භාණ්ඩ විනාශ කර දමා මහා කලබලයක් කරමින් සිටිය දී පොලීසිය පැමිණීමත් සමඟ පැන ගිය හ. එක් කාන්තාවකට තුවාල සිදු වූ අතර, පවුල් කීපයක් පදිංචිය අතහැර දමා පලා ගිය හ. ගින්නෙන් විනාශ වූ නිවෙස්වල අයිතිකරුවෝ කිලඩි සුභ සාධක කඳවුරට හෝ පුත්තලමේ පෞද්ගලික නිවෙස්වල පදිංචියට ගිය හ. තරුණ ගැහැනු ළමුන් 19 දෙනෙකු ආරක්ෂාව පතා ගමෙන් පිටමන් කරන ලදී. මෙහි කාන්තාවන්ට තම පුරුෂයින් ගෙදරින්

බැහැරව යාපනය, මන්නාරම වැනි ඈත එපිට ප්‍රදේශවල රැකියාව කරන බැවින් බියෙන් ඇලලී ජීවත් වීමට සිදු වී ඇත.

ප්‍රදේශ වාසීන් පවසන ආකාරයට කලහකාරී කණ්ඩායම් පැමිණ ඇත්තේ පාලවි ප්‍රදේශයේ සිට ය. ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කිරීමේ අභිලාෂයෙන් කන්නමූලෙයි මුස්ලිම් දේවස්ථාන කමිටුව විසින් යෝජනා කරන ලද ආරක්ෂක වැඩපිළිවෙළ ක්‍රියාත්මක නො වී ය.

තමන්ට පහර දෙන ලද්දේ හුදෙක් තම නිවාස අලුතින් තනාගෙන යහතින් ජීවත්වීම නිසා යයි අවතැන්වූවෝ මැසිවිලි නගති. ඔවුන් උතුරේ තම පැරණි ගම් බිම් වෙත යළි පදිංචියට යාමට ද මනාපයක් නැත. ඒ ආරක්ෂාවක් නො තිබීම නිසයි. ඔවුන් සිරිමාපුර පවා ජීවත් වන්නේ ඉමහත් බියෙනි. සිරිමාපුර පදිංචි අවතැන් වූ පවුල් සහ යාබද පුබුදු ගම පදිංචි සිංහල පවුල් 122 අතර සුහදතාව ඇති කරනු වස් ග්‍රාම සංවර්ධන අරමුදල විසින් පිහිටුවන ලද සාම කමිටුව වසර දෙකක් වැනි කෙටි කාලයක දී දෙපාර්ශ්වය ම සතු උනන්දුව හීනවීම නිසා අකර්මන්‍ය විය. කලහයට සාම කමිටුවේ සාමාජිකයෙක් ද සම්බන්ධ බවට රාවයක් පැතුරුණි. සාම කමිටුව ගමේ කාන්තා සමිතියේ කාන්තාවන් හත් දෙනෙකු නියෝජනය කළ හ. කමිටුව විසින් සංවිධානය කරන ලද සංස්කෘතික හා ආගමික ක්‍රියාකාරකම් වලට දෙපිලේ ම නියෝජිතයින් සහභාගී වූ අතර ඒ මඟින් ඔවුනොවුන් අතර සම්බන්ධතා ගොඩනැගීමට ද හැකි විය.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද මැලේරියාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් වලට අතිරේකව කෙයාර් සංවිධානයේ අනුග්‍රහයෙන් අවතැන් වූවන් සඳහා වැසිකිලි 7ක් ද,ගම්වැසියන් සඳහා 36ක් ද, අනාථ වූවන් සඳහා වතුර ටැංකි 5ක් ද, ගම්වාසීන්ට 4ක් ද ඇතුළුව දෙපාර්ශ්වයේ ම සහභාගීත්වයෙන් ඒකාබද්ධ ව්‍යාපෘති දියත් කිරීමට සාම කමිටුව සමත් විය. ආධාර ලාභීන් ගේ උනන්දුවක් නො මැතිවීම නිසා සාම කමිටුව අභාවිතයට පත් වී ඇති බවක් පෙනෙන්නට ඇත. එයට විශේෂ හේතුවක් ලෙස දැක්විය හැකිකේ අවතැන් වූවන් විසින් සාම කමිටුව හුදෙක් භෞතික සම්පත් සැපයීමේ ආයතනයක් වශයෙන් සලකනු ලැබීමයි.

දැනට ගම් දෙකේ වැසියන් අතර සම්බන්ධතා යහපත් අයුරින් පවතී. කඹ සෑදීම සහ ඉස්සන් කොටුවල සහ ලුණු ලේවායේ වැඩ කිරීම මඟින් ලැබෙන සුළු වේතනය ප්‍රමාණවත් නො වන බැවින් සුළු පරිමානයේ ව්‍යාපෘති ආරම්භ කිරීමට හැකිවනු පිණිස ණය දෙන ආයතනයක් පිහිටුවීම සඳහා පුබුදුගම වැසියන් යෝජනාවක් කර තිබේ. එහෙත් ගම් දෙකේ

වැසියන් තමන්ට පොදු වූ ප්‍රශ්න ගැන එකතු වී සහයෝගයෙන් වැඩ කිරීමට උනන්දුවන ගතියක් තවමත් පෙනෙන්නට නැත.

## *සිද්ධි අධ්‍යයන 07*

## *කරම්බෙයි ප්‍රදේශයේ ගම්මාන*

***කරම්බෙයි*** - සිංහල සහ මුස්ලිම් වැසියන්

***උලුකපල්ලම්*** - අවතැන් වූ මුස්ලිම් ජාතිකයින් සඳහා අලුතෙන් පිහිටවූ ගමක්

***පුත්තියවෙල්*** - ප්‍රදේශවාසී මුස්ලිම් වරුන්

***නයකතෙන්නයි*** - දෙමළ

කරම්බෙයි සහ උලුකපල්ලම් හි ප්‍රජා භාර අරමුදල විසින් ආරම්භ කරන ලද සාම කමිටු

පුතියවෙලි ගමේ මුස්ලිම් දේවස්ථාන කමිටුව ගමේ අභ්‍යන්තර ආරවුල් විසඳීමේ ලා ප්‍රධාන තැනක් ගෙන ක්‍රියා කරයි. සාමාජිකයින් 9 කින් සමන්විත කමිටුව තමන් වෙත යොමු කරනු ලබන ආරවුල් ගැන සොයා බලා, පරීක්ෂා කිරීමෙන් පසු එය විසඳාලීමේ මාර්ග යෝජනා කරයි. සුලු, සුලු වැරදි දේවස්ථාන කමිටුව විසින් විසඳනු ලබන අතර සොරකම් වැනි වැරදි ප්‍රථමයෙන් පොලීසියට යොමු කළ ද, ඉදිරි කටයුතුවල දී දේවස්ථාන කමිටුවේ උපදෙස් ලබාගනු ලැබේ. ගම් දෙකක් අතර ගැටුම් ඇතිවන අවස්ථාවල දී එය සමනය කිරීමට දේවස්ථාන කමිටුව ඉදිරිපත් වේ.

2001 දී උලුකපල්ලම් ගමේ මත්ද්‍රව්‍ය අලෙවි කරන්නෙකුට එයින් වලකින ලෙස ගම්වැසි මුස්ලිම් වරුන් අනතුරු ඇඟවීමක් කිරීම නිසා, හිංසාකාරී ක්‍රියාවන් හටගැනීමෙන් පසු පැල්පත් දෙකකට ගිනි තැබීම නිසා මසක් පුරාම පොලීසියට මුර සංචාරක කටයුතුවල නිරත වීමට සිදු විය.

මත්ද්‍රව්‍ය අලෙවි කරන්නකුට ඉන් වලකින ලෙසත් එසේ නො කළ හොත් මරා දමන බවටත් නිර්නාමික ලිපියක් ලැබීමෙන් දින දෙකකට පසු අලෙවිකරු ගේ පැල්පතට ගිණි තබන ලදී. දෙපාර්ශ්වය අතර උණුසුම් තත්ත්වයක් උදාවීමෙන් පසුව, ගැටුම නිරාකරණය කිරීම සඳහා මුස්ලිම්

දේවස්ථානයේ මැදිහත් වීම ඔවුහු අපේක්ෂා කළ හ. අවතැන් වූවන් ප්‍රදේශයේ මන්ත්‍රී වරයාට සිද්ධිය සැලකිරීමෙන් පසු ඔහු ගේ ඉල්ලීම පිට හලාවත පොලීසිය ප්‍රදේශයේ මුර සංචාරයක් ඇරඹී ය. පසුව පුලුකියවෙල් කමිටුවේ ඉල්ලීම පිට නිර්නාමික ලියුම එවූ බවට සැක කරන පුද්ගලයා ඉදිරිපත් වී, වරද පිළිගත් මුත්, පැල් පතට ගිණි තැබීම ගැන ස්වකීය නිර්දෝෂී භාවය ප්‍රකාශ කර සිටී. පසුව මත්ද්‍රව්‍ය අලෙවිකරු විසින් පැල්පත් ගිණි තැබූ බව උලුකපල්ලම් කමිටුවට දැනගන්නට ලැබිණි. ඉදිරියට ඇතිවිය හැකි ආරවුල්වල දී එකමුතු වී සාමය ඇති කිරීමට කමිටු දෙක එකඟ වූ හ. 2001 දෙසැම්බර් මැතිවරණය පැවති කාලයේ පිරිසක් "කාඩ් ක්‍රීඩාවේ" යෙදී සිටින මොහොතක, දෙමළ වැසියන් කීප දෙනෙකු අතින් මුස්ලිම් තරුණයකුට පහර කෑමට සිදු විය. ඉන්පසු ඇති වූ කලහයේ දී දෙපාර්ශ්වයේ ම වැඩිහිටි පිරිස් ද පහර කෑම්වලට ලක් වූ හ. එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ වශයෙන් ගම් දෙක දේශපාලන කඳවුරු දෙකකට බෙදී තිබුණි. උලුකපල්ලම් සහ කරම්බෙයි ගම් දෙක නියෝජනය කරන සාම කමිටුවේ මැදහත් වීම මත එම ගම් දෙකෙන් ඉදිරිපත් වූ පුද්ගලයින් දෙදෙනෙක් හමු වී සාකච්ඡා කිරීමෙන් පසු කලහකාරී සිද්ධියට තරුණ පිරිස් වගකිවයුතු බවට එකඟත්වයකට පැමිණිය හ. එසේ ම හුදෙක් මෙම සිද්ධිය නිසා දෙපාර්ශ්වය අතර හොඳ හිත පලුදු වීමට ඉඩ නො දිය යුතු බවට ද ඔවුහු එකඟත්වයකට පැමිණිය හ.

ඉන්පසු ගම් දෙක අතර තවදුරටත් හිංසාවාදී ක්‍රියා පැතිරීම වැලක්වුණ බව ඔවුහු පවසති.

# ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක්

සිංහල, දෙමළ සහ මුස්ලිම් ජන කොටස් බොහෝ දුරට සම සමව ජීවත්වන හා ආර්ථික ක්ෂේත්‍රයෙහි අන්‍යොන්‍ය වශයෙන් යැපෙන නගරයකි, ත්‍රිකුණාමලය.

එක් ජන කොටසක් යුද හමුදාව හා රජය සහ දේශපාලකයින් හා නැගෙනහිර පුනරුත්ථාපන හා මුස්ලිම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වැනි ආයතන වලින් අනුග්‍රහය ලබන බව තවත් ජන කොටස ගේ විශ්වාසය වී ඇත. සුළු සිද්ධියක් වාර්ගික ගැටුමක් කරා පුපුරායෑමේ ඉඩකඩ අති විශාල ය. ඉඩකඩම් හා ජලය විශේෂයෙන් විවාදයට ලක් වී ඇති ප්‍රශ්න වේ. රජය විසින් අරඹා ඇති සිංහල ජනපද ව්‍යාපාර මෙන් ම සිංහල ජනතාව විසින් තම ප්‍රදේශයේ ඉහළ ගංගාධාර ජල සම්පත් හරස් කිරීම පහළ ප්‍රදේශයේ ගොවිතැන්වල යෙදී සිටින දෙමළ ගොවි ජනතාවට විවිධ දුෂ්කරතා ගෙන දීමට සමත් වී ඇත.

එල්ටීටීඊ පාලනයට නතු වී තිබෙන හා අන්‍ය ප්‍රදේශවල පවත්නා ඉඩම්වල පදිංචිවීම හා ඒවාට ප්‍රවේශවීමේ දී ඇතිවන ගැටලු සම්බන්ධයෙන් මුස්ලිම්වරු පැමිණිලි කරති. සිංහල ජනතාවට එල්ටීටීඊ තර්ජන - ගර්ජන හා පහරදීම් වලට මුහුණ පෑමට සිදු වී ඇත. අත්‍යෑප්තියට පත් කණ්ඩායම් විසින් මෙහෙයවනු ලබන හර්තාල් ව්‍යාපාර මඟින් ගැටුම්කාරී තත්ත්වයන් ඇති කරවන අතර හිංසාවාදී ක්‍රියාවන්ට ද එමඟින් ඉඩකඩ සැලසේ. මෙම පර්යේෂණය මෙහෙයවන අවස්ථාවේ සිද්ධීන් දෙකක් මුල් කරගෙන හර්තාල් ව්‍යාපාර ආරම්භ කර තිබුණි. ත්‍රිකුණාමල නගරයේ දී සිංහල වැසියන් සහ මුතූර් නගරයෙන් මුස්ලිම් වැසියන් පැහැරගෙන යෑම සම්බන්ධයෙන් එල්ටීටීඊ යට එරෙහිව එම හර්තාල් ව්‍යාපාර දියත් කර තිබුණි.

## 1. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ මෙවලම්

- ★ රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවන ලද සාම කමිටු
- ★ රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කරන ලද සංවර්ධන කමිටු
- ★ ගම් සභා : ග්‍රාම සංවර්ධන සමිති / දැනුවත් කිරීමේ කණ්ඩායම
- ★ මුස්ලිම් දේවස්ථාන කමිටු
- ★ බලධාරීන් විසින් අත්පත්කරන ලද සාම කමිටු
- ★ එල්ටීටීඊ ය, පොලීසිය, ග්‍රාමසේවක, ජල ඒජන්ත යනා දී පුද්ගලයින් විසින් අවිධිමත් යාන්ත්‍රණය හරහා ගැටුම් නිරාකරණය කිරීම.

### රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවන ලද සාම කමිටු

රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවන ලද සාම කමිටු විසින් සමහර ගැටුම් නිරාකරණය කර තිබේ. ගම්සභා පිහිටුවීම හරහා ඒඑච්ඒඑම්, කින්නියා විෂන්, සර්වෝදය සහ ශක්ති වැනි ආයතන විසින් සාමය උදා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. (ඇමුණුම බලන්න.) මේවාට ඔක්ස්ෆර්ඩ් හෝ කෙයාර් වැනි ආයතන වලින් අරමුදල් සපයනු ලැබේ. රාජ්‍ය නො වන සංවිධාන සියලු වාර්ගික ජන කොටස් නියෝජනය වන අයුරු ගම්සභා පිහිටුවති. රාජ්‍ය නො වන සංවිධානවල ක්ෂේත්‍ර නිලධාරීහු ඒවාට උපදෙස් ලබාදෙති. මෙම ගම්සභා පසුව ප්‍රජා මූලික සංවිධාන වශයෙන් ලියාපදිංචි කරනු ලැබේ.

### රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කරන ලද සංවර්ධන කමිටු

දේශීය රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කරනු ලබන කණ්ඩායම් වලින් බහුතරය ඔවුන් ගේ සංවර්ධන හෝ සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වේ. එසේ ම ගැටලු පැනනගින අවස්ථාවල දී ඒවා ද නිරාකරණය කරනු ඇත. තරුණ කණ්ඩායම් හෝ කාන්තා කණ්ඩායම් හෝ ගොවි කණ්ඩායම් වශයෙන් එම සංවිධාන හැඳින්විය හැකි ය. ටීඩීඊ සංවිධාන විසින් පිහිටුවන ලද ගම් මට්ටමේ ඉතිරි කිරීමේ කණ්ඩායම් ඉඳහිට හමුදාව සමඟ ඇති වන ප්‍රාන්තවලට මැදිහත් වී විසඳුම් ලබාදෙති. සංවර්ධන අරමුණු සඳහා පිහිටුවන ලද කණ්ඩායම් වල නායකයින් ගෙන් සමන්විත සාම කමිටු රාජ්‍ය නො වන සංවිධාවල අනුග්‍රහයෙන් පිහිටුවන ලදී.

## ගම්සභා

ස්වකීය ගැටලු සහ ආරවුල් විසඳාලීම සඳහා ගම් වැසියෝ දැනටමත් පිහිටුවා ඇති ප්‍රජා මූලික සංවිධාන වෙත පිවිසෙති. විශේෂයෙන්, රජය විසින් ස්ථාපනය කර ඇති ග්‍රාම සංවර්ධන සමිති ගැටුම් නිරාකරණය කිරීමේ ලා සක්‍රීයව කටයුතු කරති. ඒවායේ සාමාජික පිරිස් බොහෝ විට දේශීය රාජ්‍ය නො වන සංවිධානවල හෝ වෙනත් කණ්ඩායම්වලට සම්බන්ධ වී සිටිති.

## මුස්ලිම් දේවස්ථාන කමිටු

ත්‍රිකුණාමල ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව මුහුණ පාන ගැටලු බහුල වශයෙන් ගම් ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථාන කමිටුව වෙත යොමු කෙරේ. වසර තුනකට වරක් ප්‍රදේශයේ ජනතාව විසින් මෙම කමිටුවලට නියෝජිතයින් තෝරා පත් කරනු ලැබේ. ඔවුන් ගේ එම පත්වීම මුස්ලිම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් විධිමත් කරනු ලැබේ. සාමාජිකයින් 15 කින් සමන්විත මෙම කමිටුවට ඉමාම් තුමා ද සහභාගි වේ. පැමිණිල්ලක් ලත්විට ඒ ගැන පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා කමිටුව කීප දෙනෙකු පත්කරයි. ඉන්පසු කමිටුව අදාල පාර්ශ්වයන් කැඳවා ඔවුන් සියලු දෙනා ම එකඟවන ආකාරයේ විසඳුමක් ඉදිරිපත් කරයි. ඇතැම් පැමිණිලි පොලීසිය විසින් ද කමිටුව වෙත යොමු කරනු ලැබේ. ගැටලු සහිත පැමිණිලි ත්‍රිකුණාමල ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථාන කමිටු සංවිධානය වෙත යොමු කරනු ඇත.

## බලධාරීන් විසින් පිහිටුවා ඇති සාම කමිටු

වාර්ගික ගැටුම් හටගැනීම වැලැක්වීමේලා විවිධ ජන වාර්ගික කණ්ඩායම් වලට අයත් නායකයින් අතර සම්බන්ධතාව ගොඩනැඟීමේ අරමුණින් බලධාරීන් විසින් සාම කමිටු පිහිටුවා ඇත. වාර්තා වන අයුරු පිළිවෙළින් පොලීසිය, සන්නද්ධ හමුදා සහ අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් සාම කමිටු තුනක් පිහිටුවා තිබේ. මේවාට නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් සහ ප්‍රදේශයේ නායක කාරකාදීන් පත්කර ඇත. අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් අලුතින් පිහිටුවා ඇති සාම කමිටු දිස්ත්‍රික්කය තුළ බහුල වශයෙන් ක්‍රියාත්මක වේ. මෙම කමිටු අලුතින් ආරම්භ කර ඇති බැවින්, ඒවායේ ක්‍රියාශීලී ස්වභාවය නිරීක්ෂණය නො විණි. සාම්ප්‍රදායිකව හෝ දරන තනතුර වෙතින් අධිකාරී බලය ලැබී ඇති පුද්ගලයින් කරා ගැටලු විසඳාගැනීමේ අරමුණින් ගම්වැසියෝ පැමිණෙති. ග්‍රාමසේවා නිලධාරීන්, ඇතැම් පොලිස් නිලධරීන්, එල්ටීටීඊ සංවිධානය, ජල ඒජන්තවරුන් සහ ආගමික යාන්ත්‍රණය යොදාගන්නවා විය හැකියි.

## ගැටුම් විසඳීම පිණිස කුමන යන්ත්‍රණයක් කරා යා යුතු දැයි ගම්වාසීන් තීරණය කරන්නේ ද? ඒ කෙසේ ද?

අර්බුදයක පාර්ශ්ව කරුවන් එම අර්බුදයේ ස්වභාවය සහ තම තමන් සතු ප්‍රදේශීය හා ජාතික දේශපාලන රුචි අරුචිකම් අනුවය, සහනය පතා විවිධ යාන්ත්‍රණ ඔස්සේ හඹායන්නේ.

එම යාන්ත්‍රණ පුළුල් වශයෙන් මෙසේ වර්ග කළ හැකියි.

i. අවිධිමත් යාන්ත්‍රණය හරහා පාර්ශ්වයන් අතර එකඟත්වය ඇති කිරීම සඳහා මැදහත් වීම හෝ ආරවුල් බේරුම් කිරීම.

ii. අනුග්‍රහය ලබාදීම සහ බලපෑම් ඇති කිරීම.

iii. නීතිය ක්‍රියාත්මක කිරීමේ හෝ අධිකරණ බලධාරීන්

හුදෙක් ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය කෙරෙහි ජනතාව වැඩි මනාපයක් දැක්වීමට හේතු වූ කරුණු අන්‍ය දිස්ත්‍රික්කවල මෙන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට ද එක සේ වලංගු වේ. ප්‍රථමයෙන් තම අභිලාෂයන් ඉටු කරවා ගත හැකි කවර හෝ යාන්ත්‍රණයක් කරා ඇදීයාම ස්වභාවික ය. ඉඩම් නඩු බොහෝ විට පොලීසිය හෝ අධිකරණය මඟින් තීන්දු වේ. අධිකරණයේ දී තම නඩුව ජයග්‍රහණය කළ හැකි යයි විශ්වාස කරන පුද්ගලයා අන් ක්‍රම කෙරෙහි විශ්වාසයක් නො තබයි. දෙවනුව, සාකච්ඡා මාර්ගයෙන් ඉකඟත්වයකට පැමිණීමට කැමති පාර්ශ්වයෝ අවිධිමත් යාන්ත්‍රණය කෙරෙහි විශ්වාසය තබයි.

ආරවුලේ පාර්ශ්ව කරුවන් මුස්ලිම් දේවස්ථාන කමිටුව කරා පැමිණෙනුයේ එය ගම් ප්‍රදේශයේ බලවත්ම ආයතනය වී ඇති නිසා ම නො ව, යම් හෙයකින් පොලීසිය වෙත ගියේ නම්, අනෙකුත් ගම් වැසියන් ගේ තාඩන පීඩනවලට වැඩියෙන් ගොදුරු වන්නට ඉඩ තිබුණ නිසා ය. (අංක 08 සිද්ධි අධ්‍යයනය බලන්න) දේවස්ථාන කමිටුව හරහා සාකච්ඡා මාර්ගයෙන් විසඳුමක් ලබාගැනීම ඔවුන්ට බෙහෙවින් අවශ්‍ය විය. ජලය භුක්ති විඳීමේ අයිතිවාසිකම් පිළිබඳ ආරවුල් ත්‍රිකුණාමල ප්‍රදේශයේ නිතොර පැනනගී. ජලය පරිභෝජනය නිරන්තරයෙන් අවිධිමත් ගිවිසුම් මඟින් පාලනය කෙරෙන බැවින් අතෘප්තියට පත් පුද්ගලයෝ ස්වභාවයෙන් ම අධිකරණය වෙත යනවා වෙනුවට ග්‍රාමසේවා නිලධාරී හෝ ජල ඒජන්තවරයා ගේ තීන්දුවක් බලාපොරොත්තු වෙති.

තුන් වෙනුව, ආරවුලක පාර්ශ්ව කරුවකු අවිධිමත් යාන්ත්‍රණය වෙත ප්‍රවිශ්ට වන්නේ එහි සාමාජිකයින් අතර ගමේ දේශපාලන, ආගමික හෝ වගකිව යුතු තනතුරක් හොබවන පුද්ගලයකු සිටින අවස්ථාවල දී ය. ඉඩම් හිමි වැව්ලි කරුවන්, උසස් යයි සම්මත කුලවලට අයත් පුද්ගලයින්, ගුරුවරුන් සහ සිවිල්

නිලධාරීන් දේශීය හෝ රාජ්‍ය නො වන සංවිධානවලට අයත් කමිටුවල උසස් තනතුරු වලට පත් වේ. සමහර ගම්වල කමිටු එකකට වැඩියෙන් ක්‍රියාත්මක වේ. (අංක 08 සිද්ධි අධ්‍යයනය බලන්න.) පෙරාරු ආරවුලේ දී විසඳුමක් සෙවීමේ කාර්යය භාරව ක්‍රියා කළ සාමාජිකයින් අතුරෙන් සභාපති සහ භාණ්ඩාගාරික පිළිවෙලින් නීතීඥයෙකු සහ ගුරුවරයෙකු වූ හ. ඔවුන් ගේ සහයට ගණකාධිකාරී වරයෙක් සහ සිවිල් නිලධාරියෙක් ද වූ හ. ඉතිරි සාමාජිකයින් සියලු දෙනා ම කම්කරුවෝ වූ හ. තීන්දු ගැනීම සම්බන්ධයෙන් ඔවුන් කිසිවකු හෝ සැලකිය යුතු කාර්යයභාරයක් ඉටුකළ බවට, අනෙකුත් සාමාජිකයින් විසින් සඳහන් නො කිරීම කැපී පෙනෙන ලක්ෂණයක් විය.

## සිද්ධි අධ්‍යයන 08

### කන්තලේ, පෙරාරු ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථාන කමිටුව

2003 මාර්තුවේ දී පෙරාරු මායිම් ගමේ නිවැසි දෙමළ සහ මුස්ලිම් වැසියන් කණ්ඩායමක් කුඹුරු වැඩ සඳහා පොළොන්නරුව බලා ගිය හ. ගමේ පදිංචි දෙමළ පවුල් 75 සහ මුස්ලිම් පවුල් 500 නියෝජනය වන පරිදි මෙම කම්කරු පිරිසට දෙමළ ජාතිකයින් හතරක් සහ මුස්ලිම් ජාතිකයින් පහළොවක් අයත් වූ හ. කුඹුරු හිමියා සමඟ සම්බන්ධීකරණ කටයුතු භාරව ක්‍රියා කළ ජයකොඩි නමැති දෙමළ ජාතිකයකු කණ්ඩායමේ නායකයා විය. අක්කර පහළොවක අස්වැන්න නෙළීමේ කටයුතු ඔවුන්ට භාර වූ අතර, අක්කර නවයක වැඩ හමාර වූ පසු බීමත්ව සිටි කණ්ඩායමේ නායකයා සහ මුස්ලිම් ජාතිකයකු අතර අවුලක් හටගැනිණි. මුස්ලිම් ජාතිකයා කණ්ඩායම් නායකයා ගෙන් පහර කෑමට ලක් වූ හෙයින් එයට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මුස්ලිම් කම්කරුවන් පස් දෙනෙක් ආපසු සිය නිවෙස් බලා පැමිණිය හ. අක්කර 13 ක අස්වැන්න නෙලා ගැනීමෙන් පසු අසනීප වූ කම්කරුවෙකු සිය නිවෙස් බලා ආපසු පැමිණියේ ය. රැකියා අතහැර ගිය කම්කරුවන් නිසා ඇති වූ පුරප්පාඩු පිරවීම සඳහා පොළොන්නරුවේ ඉඩම් අයිතිකරුට අලුතින් කම්කරුවන් හය දෙනෙකු යොදා ගැනීමට සිදු විය. අස්වැන්න නෙලාගැනීම හමාර වීමෙන් පසු ඉතිරි කම්කරුවන් නව දෙනාට පොරොන්දු වූ මුදල ගෙවීම ඉඩම් අයිතිකරු ප්‍රතික්ෂේප කළේ ය. එයට හේතුව වශයෙන් ගෙනහැර පෑවේ වැඩවල ගුණාත්මක භාවය අඩු වීමයි. ඉතිරි කම්කරුවන් නව දෙනා ආපසු ගම් බලා පැමිණි විට, කලින් පැමිණි කම්කරුවන් සය දෙනාට වේතන ගෙවීම ජයකොඩි ප්‍රතික්ෂෙප කළේ ය. කොන්ත්‍රාත්තුව උල්ලංඝනය කර ඇති බැවින් වේතන ගෙවීම ප්‍රතික්ෂේප කළ ඔහු, කලින් අත්තිකාරම් මුදලක් ද ගෙවා ඇති බවත් හා කෑම බීම සපයා ඇති බවත් දන්වා සිටියේ ය.

මුස්ලිම් කම්කරුවන් සය දෙනා ජයකොඩිය තර්ජනය කළ හ. ජයකොඩි ගැටලුව සඳහා මුස්ලිම් දේවස්ථාන භාරකාර මණ්ඩලයේ සහය පැතී ය. භාරකාර මණ්ඩලය සියලු පාර්ශ්වයන් පසු දින කැඳවා ඔවුන් ගේ අදහස් විමසී ය. කම්කරුවන්ට ගෙවිය යුතු වේතන වලින් කොටසක් ජයකොඩි විසින් පෞද්ගලික අවශ්‍යතාවන් සඳහා වැයකර ඇති හෙයින් කම්කරුවන් ගේ හිඟ වැටුප් ගෙවීමට නො හැකි වී ඇති බැව් අනාවරණය විය. ගණන් මිනුම් පරීක්ෂාකර බලා සාධාරණ අයුරින් පාර්ශ්වයන් අතර මුදල් බෙදාදීමේ වගකීම භාරකාර මණ්ඩලය එහි භාණ්ඩාගාරික වෙත පැවරී ය. ජයකොඩි භාරකාර මණ්ඩලයේ තීරණය පිළිගැනීමට එකඟ විය. අවශ්‍ය නම් අධිකරණ ක්‍රියාමාර්ගයට පිවිසිය හැකි යයි භාරකාර මණ්ඩලය ඔහුට දැන් වී ය.

අවසානයේ දී භාරකාර මණ්ඩලයේ තීරණයට එකකු හැර සියලු දෙනා ම එකඟ වූ හ. ආරවුල මෙයාකාරයෙන් විසඳනු නො ලැබුවේ නම් අතෘප්තියට පත් මුස්ලිම් කම්කරුවන් හා දෙමළ ජාතික ජයකොඩි අතර හටගත් ආරවුල කලහයකට පරිවර්තනය වීමට ඉඩ තිබුණි. එහෙත් මෙම සිද්ධිය අන්තර් වාර්ගික ගැටුමක් කරා වර්ධනය වීමේඉඩකඩ තිබුණේ දැයි පැහැදිලි නැත.

මෙතෙක් අවධානයට ලක් වූ සෑම අවස්ථාවක දී ම ප්‍රදේශයේ නායක කාරකාදීන් ගම්සභා තුළ විශාල බලයක් හිමි කරගෙන සිටින බව අනාවරණය විය. එහෙත් ආලන්කනි ග්‍රාම සංවර්ධන සමිතිය එයට කදිම ව්‍යතිරේකයකි. (සිද්ධි අධ්‍යයනය 9 බලන්න.) ඇත්තෙන් ම ප්‍රදේශවාසීන් ස්වකීය ගැටුම් නිරාකරණය කරගැනීම සඳහා දැඩි බලාපොරොත්තු තබා ඇත්තේ අවිධිමත් යාන්ත්‍රණය කෙරෙහි ද, නැතහොත් නායකත්වය කෙරෙහි ද යන්න ප්‍රශ්නයකි. බහුතරයක් සිද්ධිවලින් පෙනෙන ආකාරයට එය නායකත්වය නම් ප්‍රශ්න දෙකක් මතු වේ.

නායකත්වය නිසා ම ජනතාව ගැටුම්වලට විසඳුම් කරා පැමිණෙන්නේ නම් "නියෝජිත කමිටු" පිහිටුවීමේ අරමුණක් තිබේ ද? ප්‍රදේශයේ නායකකාරකාදීන් වෙත බලය රැඳී ඇති අවස්ථාවක පවත්නා යාන්ත්‍රණ ශක්තිමත් කළ යුතු ද? මෙය දේශිය රාජ්‍ය නො වන සංවිධානවලට මෙන් ම ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය හඳුන්වා දීමට දායක වී සිටින ආයතනවලට සහ ආධාර ලබාදෙන සංවිධාන වලට ද විශේෂයෙන් අදාල වේ. දෙවන කරුණ මෙහි පහත තවදුරටත් සාකච්ඡාවට බඳුන් වී තිබේ.

## සිද්ධි අධ්‍යයන 09

## ග්‍රාම සංවර්ධන සමිතිය, ආලංකනි, කින්නියා

මේ දෙමළ ග්‍රාමයේ, බහුතරයක් මුස්ලිම් ජනතාව වෙසෙන පෙදෙසක ගමේ ගැටලු සහ ආරවුල් බේරුම් කරගැනීම සඳහා ගම් වැසියන් පැමිණෙන ප්‍රධානතම ආයතනය ග්‍රාම සංවර්ධන සමිතියයි. ඒ හැරුණ විට මෙහි කාන්තා සංගමයක් ද තරුණ ක්‍රීඩා සමාජයක් ද ඇත.

1999 දී පිහිටුවන ලද මෙම ග්‍රාම සංවර්ධන සමිතියේ සාමාජික සංඛ්‍යාව 15 කි. ඉන් පස් දෙනකු පරිපාලන විධායක කාර්යය මණ්ඩලයට අයත් ය. ඉතිරි සාමාජිකයින් තරුණ පිරිස් සහ ශිෂ්‍යයෝ වූ හ. ගමේ නායකයින් මෙහි සක්‍රීය සාමාජිකයෝ නො වෙති. කාන්තාවෝ ද ඇතුළත් නො වෙති. හොර සූරා, පවුලේ ගැටලු සහ ඉඩම් උරුමය පිළිබඳ ප්‍රශ්න මෙහි දී නිරාකරණය කෙරේ. යාබද මුස්ලිම් ග්‍රාමයේ වැසියන් සම්බන්ධ ප්‍රශ්න කිසිවක් මෙම ග්‍රාම සංවර්ධන සමිතිය වෙත යොමු කර නැත.

ගමේ පවුල් සංඛ්‍යාව සුළු බැවින් පැමිණිල්ලක් ලද විට ඒ පිළිබඳ පරීක්ෂා කර බැලීම වෙනුවට, දෙපාර්ශ්වය කැඳවා සාකච්ඡා කරනු ලැබේ. ඉන්පසු විසඳීමකට එළඹෙනු ඇත. ගෘහස්ත ගැටලු සම්බන්ධයෙන් නිරන්තර පරීක්ෂාවෙන් සිටීමට සිදු වේ. සංගමයේ ලේකම් පවසන ආකාරයට මේ වන විට සියලු ම පැමිණිලි විසඳා ඇත. සමිතියේ සභාපති වරයා ගේ හුදු අවංක හා ඍජු භාවය මෙන් ම අපක්ෂපාතීත්වය නිසාම එහි කටයුතු සාර්ථක වී ඇති බව ලේකම් පවසයි.

## ගැටලුවල ස්වභාවය

ගැටලු විසඳීමේ යාන්ත්‍රණය තීරණය කිරීමේ ප්‍රධාන සාධකය ගැටලුවේ නිත්‍ය ස්වභාවයයි. ගෘහස්ත, පවුලේ හා පවුල් අතර ගැටලු විධිමත් යාන්ත්‍රණය හරහා විසඳා ගනු ලබන පොදු ගැටලු වේ. ඒ අතරට ගැනෙන උරුමය පිළිබඳ ගැටලු, ගෘහස්ත හිංසනය සහ මත්පැන් මුල් වී ඇති වැරදි ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට විශේෂ වූ ඒවා වෙති.

ගම් දෙකක් අතර සිදුවන ආරවුල් සහ මුදල් පිළිබඳ ප්‍රශ්න ගමේ කණ්ඩායම් සහ මුස්ලිම් දේවස්ථාන කමිටු විසින් විසඳනු ලැබේ.

රජය හෝ එල්ටීටීඊ ය සම්බන්ධ ආරවුලක දී ඒ පිළිබඳ ව කටයුතු කිරීම සඳහා ප්‍රදේශ වාසීහු රාජ්‍ය නො වන සංවිධානයක් කරා යති. සටන් විරාම

ගිවිසුම ක්‍රියාත්මක වීමට පෙර ධීවරයින් ගේ බෝට්ටු රාත්‍රී කාලයේ මුහුදේ ගසා ගොස් තිබෙන අවස්ථාවන් හි දී ප්‍රදේශවාසී හු ඒඑච්ඒඑම් සංවිධානයේ ආධාරය මත එම බෝට්ටු ආපසු නාවුක හමුදාවෙන් ලබා ගත් හ. අන්තර් ජනවාර්ගික ගැටලු විසඳීම සඳහා අවිධිමත් යාන්ත්‍රණය හරහා කටයුතු කෙරෙන බවක් නො පෙනේ. වාර්ගික ගැටුම් තිබෙන බවක් පිළිගැනීමට ප්‍රදේශ වාසීහු මැලිවූ හ. එහෙත් කුඩාවේලි මුස්ලිම් දේවස්ථාන කමිටුව එබඳු ආරවුල් ඉහළ මට්ටමකින් තිබෙන බව පිළිගත් මුත්, ඔවුන් ගේ කාර්යයභාරය වී ඇත්තේ මුස්ලිම් ප්‍රජාවට අදාල ගැටලු විසඳීම පමණි. මෙ රට රාජ්‍ය නො වන සංවිධාන පහත සඳහන් කර ඇති පරිදි අන්තර් ජනවාර්ගික ආරවුල් විසඳීමට මැදිහත් වන්නේ නැත. එයට ප්‍රබල හේතුවක් වශයෙන් පෙනී යන්නේ අධික දේශපාලන බලපෑම් ඇතිවීමයි. කුඩාවේලිවල පවා එල්ටීටීඊය බලවත් වී සිටින හෙයින් ඉඩම් පිළිබඳ ආරවුල් විසඳීමක් සිදුවන්නේ නැත. කුඩාවේලි නොබෝදා වැසියන් යළි පදිංචි කරන ලද ග්‍රාමයෙකි. එය වාර්ගික අර්බුදයෙන් විපතට පත් ප්‍රදේශයක් වූ අතර ජනගහනය ද විශාල වශයෙන් අවතැන් වීමට ලක්විය. කාන්තාවන් සහ මුස්ලිම් දේවස්ථාන කමිටුවේ සාමාජිකයින් පවා මත්පැනට තදින් අබ්බැහි වී සිටිති. බොහෝ ආරවුල් මුස්ලිම් දේවස්ථාන කමිටුව සහ පොලීසිය වෙත යොමු කෙරේ. පවුල් ප්‍රශ්න, ඉඩම් හා මුදල් පිළිබඳ ගැටලු සාමාන්‍යයෙන් දේවස්ථාන කමිටුව මඟින් විසඳේ. දෙමළ ප්‍රදේශවල පිහිටි ස්වකීය ඉඩම් වලට ප්‍රවේශ වීමේ දී මුස්ලිම් වරුන්ට වාර්ගික ගැටලුවලට මුහුණ පෑමට සිදු වේ. හිස් ඉඩම්වලට මුස්ලිම් වරුන් ප්‍රවේ වීමේ දී එල්ටීටීඊ යෙන් තර්ජන එල්ල වෙන අතර දෙමළ ජාතික ගොවීන් අනවසරයෙන් මුස්ලිම් වරුන්ට අයත් ඉඩම්වල පදිංචිවීම පිටුපස එල්ටීටීඊ ය ක්‍රියාත්මක වේ. සාම කමිටුව අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යාංශය විසින් පිහිටුවා ඇති බැවින් හා ඉඳහිට රැස්වෙන බැවින් දේවස්ථාන කමිටුව ඒ කෙරෙහි විශ්වාසයක් තබා නැත. ඉඩම් පිළිබඳ අර්බුද අඩුත්, වැඩිත් නැතිව එයාකාරයෙන් ම පවතී.

2000 වසරේ දී සියලු ම ජන කොටස් නියෝජනය වන අයුරින් ආගමික නායකයින් කීප පළක් විසින් ආරම්භ කරන ලද මූතූර් අන්තර් ආගමික සාම කමිටුවට ද එල්ටීටීඊ යේ බලපෑම සහ කමිටු සාමාජිකයින් ගේ උදාසීනත්වය නිසා වාර්ගික ගැටුම් නතර කිරීමට නො හැකි විය. වාර්ගික ගැටුම් උත්සන්න කිරීම තම අභිප්‍රාය වූයෙන් දේශපාලකයින් ගේ සහය ලබාගැනීම ද දුෂ්කර කාර්යයක් විය. එ බැවින් ප්‍රදේශයේ දේශපාලකයින් ගේ මැදිහත්වීම අපේක්ෂාවෙන් ඔවුහු කමිටුවක් පිහිටුවා ගත් හ.

අන්තර් ආගමික සාම කමිටුව, සටන් විරාම ගිවිසුමෙන් පසු අක්‍රීය විය. එයට එක් හේතුවක් වූයේ පුද්ගලයින් පැහැර ගැනීමේ හා කප්පම් ගැනීමේ එල්ටීටීඊ ක්‍රියා නතර කිරීමට කමිටුව අසමත් වීමයි. වරක් දේවස්ථාන කමිටු සභාපතිවරයා අතුරුදහන් වූ මුස්ලිම් ජාතිකයින් දෙදෙනකු මුදා ගැනීම සඳහා

කිලිනොච්චියට ගොස් තිබුණ බව වාර්තා විය. පොලීසිය, සන්නද්ධ සේවා සහ අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද අන්තර් ආගමික කමිටුව ක්‍රියාත්මක වන බවක් වාර්තා නො විණි.

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයේ බලය හීනවන අවස්ථා සිංහල ජනතාව පදිංචි පෙදෙස්වලින් ද වාර්තා වේ. අබේපුර සිංහල ග්‍රාමයේ පුද්ගලයෙකු තම ඉඩම දෙමළ ජාතිකයෙකුට විකිණීමට තැත් කිරීමේ දී සිංහල පදිංචිකරුවන් ගෙන් ප්‍රබල විරෝධතා එල්ල විණි. දේශපාලන බෙදිලි මත එජාප සහ ජේවීපී ය අතර පවත්නා මතභේද හේතු කොට ගෙන ගැටුම් හටගැනීම නිසා සර්වෝදය ශ්‍රමදාන කමිටුවට පවා කටයුතු කරගෙන යාම අපහසු විය.

දැනට පොලීසිය සියලු පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරයි. යුද්ධය පැවති යුගයේ මෙන් නො ව සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු අවිධිමත් යාන්ත්‍රණය අඩපණ වී ඇති බවක් පෙනුණි. 'පලතාදිචෙනායි' නමැති දැනුවත් කිරීමේ කණ්ඩායම ද මෙබඳු ඉරණමකට මුහුණ පා ඇති බව පෙනේ. එල්ටීටීඊ ය ප්‍රදේශය තුළ බලවත්ව සිටීම මෙයට හේතුව බව විශ්වාස කෙරේ. මහජන පැමිණිලි සංඛ්‍යාව අඩුවීමට හේතුව යුද හමුදාව සම්බන්ධයෙන් එල්ලවන පැමිණිලි අඩුවීමයි.

## සාධාරණත්වය, මැදිහත් භාවය සහ ආරවුල් සාර්ථක අයුරින් විසඳීම

මෙම අධ්‍යයනය සඳහා කාලය ඉතා සීමිත වූ බැවින් ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය ඇත්තෙන් ම සාර්ථක ප්‍රතිඵල ගෙනදීමට සමත් වී දැයි යන්න තක්සේරු කිරීම සඳහා පර්යේෂක පිරිසට සීමිත තොරතුරු රැසක් මත යැපෙන්නට සිදුවිය. ආරවුල් නිරවුල් කිරීමේ සාර්ථකත්වය මැනීමේ මිණුම් දණ්ඩ වශයෙන් වැදගත් භාවය, සාධාරණත්වය සහ තිරසර භාවය යොදා ගැනීමට හැකි වේ. අවිධිමත් යාන්ත්‍රණය මෙම අවශ්‍යතාවන් ගෙන් තොර වී ඇති බව පර්යේෂණය මඟින් පෙන්වා දී ඇත.

ප්‍රදේශයේ ආරවුල් විසඳීමේ ලා ගමේ නායක කාරකාදීන් ප්‍රධාන තැන ගෙන කටයුතු කිරීම නිසා සාධාරණත්වය සහ අපක්ෂපාතී භාවය සිදුවේ ද යන්නත්, ඒවාගේ ම ඔවුන් විසින් දෙනු ලබන තීන්දු සම්බන්ධයෙන් අතෘප්තියට පත් පාර්ශ්වයන්ට කරුණු කියාපෑමට ඉඩකඩ තිබේ ද යන්නත් ප්‍රශ්නයට භාජනය වී තිබේ. ගමේ නායකත්වය මැනවින් "නියෝජනය" වී ඇති මුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී කාන්තාවන්ට සහ අසරණ භාවයට පත්ව සිටින ගැමියන්ට හඬක් නැඟීමේ ඉඩක් නො මැති බව පෙනේ.

රාජ්‍ය නො වන සංවිධාන, විවිධ කණ්ඩායම්, ගම් ප්‍රධානීන් සහ ක්‍රියාකාරී කමිටු ඔවුන්ට ආවේනික වූ න්‍යාය පත්‍ර සහ විවිධ මතිමතාන්තර ඇති බවත්, ඒ සියල්ල වෙතින් සාධාරණත්වය සහ තිරසර භාවය කෙරෙහි බලපෑම් සිදුවන බවත් පර්යේෂණයේ දී පෙනී ගොස් ඇත. වැද්දන් ඉගෙනීමක් හා අවබෝධයක් නො මැති පිරිසක් බැවින් ඔවුන් සතු අයිතිවාසිකම් රජය විසින් පැහැර හැර ඇතැ යි පවසමින් මහමාර්ග හා විදුලිය වැනි මූලික යටිතල පහසුකම් සපයා දෙන ලෙස ඔවුන් ලවා අරගල කරවීමට රාජ්‍ය නො වන සංවිධාන වෙර දරා ඇත.

වැදි ජනතාවට ඇඳුම් ඇන්දවීම වනාහි ඔවුන්ට අහිමි වී තිබෙන අයිතිවාසිකමක් යළි ලබාදීමට ගන්නා උත්සහයෙක් දැයි ප්‍රශ්න කළ යුතුව තිබේ. ඒවාගේ ම රටේ ශිෂ්ට සම්පන්න භාවය සහ “ප්‍රජා සංවර්ධනය” සම්බන්ධයෙන් රාජ්‍ය නො වන සංවිධානවල අගතිගාමී ප්‍රවේශය නිරූපනය වීමක් ද යන්න ප්‍රශ්නයකි. අසල්වැසි සිංහල ජාතික බෝට්ටු හිමියන් යටතේ රැකියාව කිරීම ප්‍රතික්ෂේප කිරීමට තරම් ධීවර පිරිස් “බලාත්මක කරන ලද්දේ ද” මෙම රාජ්‍ය නො වන සංවිධානය විසිනි.

ඉහත නිදර්ශණය මගින් හුදෙක් ප්‍රජා ගැටලු විසඳීම පමණක් පෙන්නුම් කරනු ලබන අතර පවත්නා ආයතන ශක්තිමත් කිරීමේ දී මුහුණ දීමට සිදුවන ගැටලු නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය පිළිබඳ ඇගවීමක් ද කරයි. ඒ සම්බන්ධයෙන් කදිම නිදර්ශණයක් මෙහි පහත දැක්වේ.

මූතූර් ප්‍රදේශයේ පාලකාදිචෙනයි දෙමළ ග්‍රාමයේ ග්‍රාමසේවා නිලධාරී ගේ ඉල්ලීම පිට 1996 දී කසිප්පු මර්දනය සඳහා දැනුවත් කිරීමේ කණ්ඩායමක් පිහිටුවන ලදී. ගමේ පවුල් 215 න් 65 ක් ම සිය ජීවිකාව කරගෙන ගියේ කසිප්පු පෙරීමෙනි. මුල දී තර්ජනවලට බියෙන් ගම්වාසීහු යුද හමුදාවට හෝ එල්ටීටීඊ යට පැමිණිලි නො කළ හ. කෙසේ වුව ද, දැන් කසිප්පු පෙරීම අතහැර දමා ඇත. මේ සඳහා දැනුවත් කිරීමේ කණ්ඩායම යොදාගත් උපක්‍රමය වූයේ කසිප්පු බෝතල්, කසිප්පු අළෙවි ස්ථාන සහ කසිප්පු පෙරීමේ උපකරණ විනාශ කර දැමීම ය. කසිප්පු පෙරීමේ කටයුතුවල නිරතව සිටි පවුල්වලට විකල්ප ආදායම් මාර්ගයක් සලසා නො දීම නිසා ඔවුහු දැන් අසරණ තත්ත්වයට වැටී සිටිති.

## මෙ රට රාජ්‍ය නො වන සංවිධාන හා සම්බන්ධ ප්‍රධාන ගැටලු

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ රාජ්‍ය නො වන සංවිධාන සාමය ගොඩනැගීම හා සංවර්ධනය පිළිබඳ කාර්යයේ දී සපුරා ගත් බවට පවසා සිටින ජයග්‍රහණ සහ කරුණු පිරික්සා බැලීමේ දී දුටු යථාර්තය අතර විශාල වෙනසක් තිබේ. “රැවටිල්ලක්” තේමාව කරගත් සිද්ධි අධ්‍යයනය (අංක 10) මගින් විශාල වංචනික

සිද්ධියක් හෙළිකිරීමට පර්යේෂණ කණ්ඩායමට හැකි වී තිබේ. මෙය ත්‍රිකුණාමල ප්‍රදේශයේ නිරත සියලු රාජ්‍ය නො වන සංවිධාන වෙත පොදුවේ එල්ල කෙරෙන චෝදනාවක් නො වේ. ඒවාට සාධාරණය ඉටු කිරීමක් වශයෙන් රාජ්‍ය නො වන කිසිම සංවිධානයක් නමින් සඳහන් කරනු නො ලැබේ.

සම්මුඛ සාකච්ඡාවට සහභාගි වූ මෙ රට රාජ්‍ය නො වන සංවිධාන ගණනාවක් ම ස්වකීය ප්‍රජා මූලික වැඩසටහන්වල සාර්ථකත්වය හෝ අකර්මන්‍ය භාවය එක්කෝ දැන නොසිටි බව හෝ නැතිනම් එහි සාර්ථකත්වය සහ තම කාර්යයභාරය අතිශයෝක්තියෙන් පෙන්නුම් කරන බවක් පෙනුණි.

එක් රාජ්‍ය නො වන සංවිධානයක් නොබෝදා තමන් එක්තරා ප්‍රදේශයක ගම් සභාවක් පිහිට වූ බවත්, එමගින් ඉඩම් ආරවුල් නිරාකරණය කළ බව පැවසූ මුත් පර්යේෂක කණ්ඩායම එම ප්‍රදේශයට ගිය විට මෙම ගම සභාව පසුගිය මාස දෙකක් පුරා අකර්මන්‍යව තිබුණ අතර නිරවුල් කළෑ යි කී ඉඩම් ආරවුල අධිකරණය හමුවට පමුණුවා ඇති බව දැනගන්නට ලැබිණි. තවත් රාජ්‍ය නො වන සංවිධානයක් මුතූර් හි අන්තර් ආගමික සාම කමිටුවට උපදෙස් ලබාදෙමින් සිටින බව පැවසී ය. එහෙත් සටන් විරාම ගිවිසුම අත්සන් කොට මාස කීපයකට පසු හා පර්යේෂක කණ්ඩායම යාමට බොහෝ කලකට පෙර එම සාම කමිටුව බිඳවැටී තිබුණි. මෙ රට රාජ්‍ය නො වන සංවිධාන ස්වකීය ජයග්‍රහණ පමණක් නො ව ක්‍රියාකාරකම් ද අතිශයෝක්තියෙන් පවසති. අප පර්යේෂණ කණ්ඩායම පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවල දී සාමය ගොඩනැගීම සඳහා දැරූ මහත් පරිශ්‍රමයන් විස්තර කිරීමට මෙම සංවිධාන ඇඩි වෙහෙසක් දැරූ හ. ස්වකීය බහු වාර්ගික ප්‍රවේශය, කාන්තාවන් පිරිමින් හා සම තත්ත්වයේ ලා සැලකීම, බලාත්මක කිරීම, ආරවුල් නිරවුල් කිරීම සහ සහභාගිත්ව ප්‍රවේශය ගැන ද මෙම සංවිධානය ඉහළින් අවධාරණය කර සිටිය හ. එහෙත් සැබවින් ම මේවායේ යථා තත්ත්වය කුමක් දැයි පැහැදිලි නැත.

ඉතාමත් සංකීර්ණ සාම ක්‍රියාමාර්ගයක් දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙන බව මෙම සංවිධාන ප්‍රකාශ කර සිටිය ද, පසු අවධියක දී කියා සිටියේ එම සාම ක්‍රියාමාර්ගය හුදෙක් පටන් ගත් බවක් පමණි. සමහර රාජ්‍ය නො වන සංවිධාන ස්වකීය මෙහෙයුම් පටන් ගැනීමටත් පෙර ආරම්භ කර තිබූ කමිටු හුදෙක් තමන් ගේ ම නිර්මාණ බවට ප්‍රකාශ කළ අවස්ථා ද නැත්තේ නො වේ. අගැයුම සහ අධීක්ෂණය වැනි මූලධර්ම අනුගමනය කිරීමට අපොහොසත් වීම නිසා, අතිශයෝක්තිය සහ රැවටිල්ල සඳහා ඉඩ ප්‍රස්ථාව ලැබුණා විය හැකියි. අවසාන වශයෙන් කිසිම රාජ්‍ය නො වන සංවිධානයකට මෙතෙක් තමන් විසින් විසඳන ලද එක ම හෝ වාර්ගික ගැටුමක් පෙන්වා දීමට හැකි වී නැති බව මෙහි දී සඳහන් කිරීම වටී. රාජ්‍ය නො වන සංවිධාන නිසගයෙන් උරුම කරගත් පසුබිම සහ ආධාර ලබාගැනීම සඳහා වූ උග්‍ර අවශ්‍යතාව එයට හේතු

වන්නට පුළුවන. මෙ රට රාජ්‍ය නො වන සංවිධාන සහ ආධාර සපයන ප්‍රජාව අතර සම්බන්ධතා ඉතා අඩු මට්ටමකින් පවතින බව පර්යේෂණය මඟින් සොයා ගෙන තිබේ. මෙය ආධාර සැපයෙන ප්‍රජාවට කෙරෙන අනතුරු ඇඟවීමකි. ආධාර ලබාගැනීමේ අපේක්ෂාවෙන් මෙ රට රාජ්‍ය නො වන සංවිධාන, ආධාර සපයන ආයතනවල අපේක්ෂා සහ අගැයීමේ ප්‍රමිතීන්වලට අනුකූල වන පරිදි ස්වකීය ව්‍යාපෘති සැලසුම් කිරීම පමණක් නො ව සිත්ගන්නා කතාව ද ගලපා තිබේ. කෙසේ වුව ද, විශාල වශයෙන් බෙදී ගිය සහ දේශපාලනීකරණයට ලක් වූ ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රික්කයක සාමය ගොඩනැගීමේ සාර්ථකත්වය හුදු ආධාර ලාභීන් ගේ හෝ බහුවාර්ගික කමිටු සංඛ්‍යාවෙන් මැනගත නො හැකි ය. බෙදීගිය ජන කොටස් අතර සම්බන්ධතාවන් හි ගුණාත්මක වශයෙන් සිදු වී ඇති වෙනස මඟින් එය අගැයුමට ලක්කිරීම වඩාත් යෝග්‍ය ය. මේ සඳහා මෙ රට රාජ්‍ය නො වන සංවිධාන මැනවින් සකස් වී තිබේ.

කෙසේ වුව ද, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ රාජ්‍ය නො වන සංවිධාන පිහිටුවා ඇත්තේ බෙදීගිය හා දේශපාලනී කරණයට ලක් වූ පසුබිමක් තුළ ය. ඇතැම් රාජ්‍ය නො වන සංවිධාන සතු ඔවුන් ගේ ම න්‍යාය පත්‍රයන් ඇත; මේ හැරුණ විට ඇතැම් රාජ්‍ය නො වන සංවිධාන දුෂ්කර සහ අනතුරුදායක සාම ව්‍යාපාරවල යෙදීමට අකමැත්තක් දක්වති. බොහොමයක් රාජ්‍ය නො වන සංවිධාන වාර්ගික කණ්ඩායම් අනුව බෙදී හුදෙක් එක ජන කොටසක් සඳහා පමණක් සේවය කිරීමට කැපවී සිටිති.

ආධාර සපයන ආයතන විසින් මෙ රට තත්ත්වයන් ගැන නො සලකා සාමය ඇති කිරීමේ පරමාර්ථයෙන් "අමු අමුවේ" පිට සිට ආරෝපනය කරනු ලබන ප්‍රමිතීන් සහ ආකෘතීන් මෙ රට ක්‍රියාත්මක වන රාජ්‍ය නො වන සංවිධානවල පැවැත්මට බෙහෙවින් හානිදායක වී ඇත. තමන් කටයුතු කරන ප්‍රදේශයේ තත්ත්වයන් අනුව සාමය ළඟා කරගැනීම උදෙසා ගත යුතු ක්‍රියාමාර්ග ගැන තීන්දු කළ යුතු හොඳ ම පුද්ගලයා අදාල රාජ්‍ය නො වන සංවිධානයයි. ස්වකීය අවංකත්වය සහ ඍජු භාවය තහවුරු කරනු පිණිස ආධාර සැපයීමේ ආයතන රාජ්‍ය නො වන සංවිධාන සමඟ යහපත් සම්බන්ධතා ගොඩනැගිය යුතුවා පමණක් නො ව, පසුබැම් සහ නිර්මාණශීලී ස්වයං අගැයුම් සඳහා ද ඉඩකඩ සපැයිය යුතු වේ.

## සිද්ධි අධ්‍යයනය 10

## රැවටිල්ලක්

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ විවිධ ග්‍රාමයන් හි අන්තර් - වාර්ගික කමිටු පිහිටුවා ඇතැ යි පවසා සිටි රාජ්‍ය නො වන සංවිධානයක කාර්යාලය වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂණ නිලධාරීහු ගිය හ. ප්‍රදේශයේ ගැටුම් විසඳූ බවක් මෙම සංවිධානය පැවසී ය. එ බඳු අවස්ථාවක් පෙන්වා දෙන ලෙස දැන් වූ විට  දෙමළ සහ මුස්ලිම් තරුණ කණ්ඩායම් සහයෝගයෙන් කටයුතු කරමින් වාර්ගවාදී ගැටුම් සමථයකට පත් කරනු ලැබූ "එක්ස් සහ වයි" යන ගම් දෙකක් ක්ෂේත්‍ර පර්යේෂණ නිලධාරීන්ට පෙන්වා දෙනු ලැබූ හ.

පර්යේෂණ නිලධාරීන් වෙත සිද්ධිය පැහැදිලි කරන ලද්දේ මෙයාකාරයෙනි;

රාමසාන් දිනවල දී "එක්ස්" ගමේ පදිංචි ද්‍රවිඩ ජාතිකයෙකුට අයත් හරකකු නැති වූ අතර, අල්ලපු "වයි" ගමේ නිවැසි මුස්ලිම් ජාතිකයෙකු විසින් එය පැහැර ගන්නා ලද්දේ යයි ඔහු විශ්වාස කළේ ය. මෙම සිද්ධිය වාර්ගික ගැටුමක් කරා වර්ධනය වී තිබුණ අවස්ථාවේ, මෙම රාජ්‍ය නො වන සංවිධානය විසින් යාබද ගමේ පිහිටුවන ලද දෙමළ හා මුස්ලිම් කණ්ඩායම් මෙම සිද්ධිය විභාග කර බැලීමට තීරණය කළ හ. හරකා දෙමළ ජාතිකයකු විසින් සොරා ගෙන විකුනා ඇති බව ඔවුන්ට සොයා ගැනීමට හැකිවිය.

මේ සිද්ධිය සම්බන්ධයෙන් අදාල ගම්වලට ගොස් ඒ ඒ තරුණ කමිටු සහ අනෙකුත් සම්බන්ධිත පිරිස් හමුවීමට යන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායම රාජ්‍ය නො වන සංවිධානය වෙත දැනුම් දුන් හ. පසු දින පර්යේෂණ කණ්ඩායම මුස්ලිම් ගමට පැමිණි අවස්ථාවේ මෙම සිද්ධිය හෝ රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවන ලද මුස්ලිම් තරුණ කණ්ඩායමක් ගැන හෝ එහි කිසිවකු නො දැන සිටිය හ. එ විට රාජ්‍ය නො වන සංවිධානයේ ක්ෂේත්‍ර නිලධාරියා පර්යේෂණ නිලධාරී පිරිස, දෙමළ තරුණ කණ්ඩායම මුණගැසීම සඳහා කැඳවාගෙන යාමට පොරොන්දු විය. මෙම නිලධාරියා දෙමළ තරුණ කණ්ඩායමේ සාමාජිකයින් කීප දෙනෙකු රැස්කර, කලින් කී පරිදි ම සිද්ධිය පිළිබඳ විස්තරයක් කෙළේ ය. දෙමළ තරුණ කණ්ඩායමෙන් ප්‍රශ්න කිරීමේ දී හෙළිවූයේ අදාල සිද්ධිය ගැන ඔවුන් කිසිවක් හො නො දන්නා බවයි.

හරකා සොයා ගැනීමේ දී වඩාත් ක්‍රියාත්මක වූයේ රාජ්‍ය නො වන සංවිධානයේ ආධාරය මත ආරම්භ කළ මුස්ලිම් තරුණ කණ්ඩායම බව පවසමින් නිලධාරියා ඇඟබේරාගැනීමට උත්සාහ කළේ ය. මුස්ලිම් තරුණ කණ්ඩායමේ නායකයා මුණ ගස්වන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ, මෙම මුස්ලිම් තරුණ කණ්ඩායම තම සංවිධානය විසින් පිහිටුවන ලද්දක් නො ව, ඔවුන් හුදෙක් මිතුරන් කණ්ඩායම් පමණක් බව නිලධාරියා හෙළි කළේ ය. අවසානයේ දී මුළු සිද්ධිය ම රැවටිල්ලක් බව නිලධාරියාම පැහැදිලි කළේ ය.

මෙබඳු සිද්ධියක් සැතපුම් විස්සකටත් වඩා එපිට ප්‍රදේශයක සිදු වූ බව රාජ්‍ය නො වන සංවිධානයට දැනගන්නට ලැබී තිබුණි. පසුව එය තමන් ගේ ම දෙයක් වශයෙන් ඔවුහු යොදාගත් හ.

මෙම රාජ්‍ය නො වන සංවිධානය පහත සඳහන් පරිදි සත්‍ය වසන් කර ඇත.

- ★ ස්වකීය තරුණ කණ්ඩායම්වල යථා ස්වභාවය වසන් කරමින් එම කණ්ඩායම ගැටුම් නිරාකරණ කටයුතුවල නිරත වූ බව වංකව ප්‍රකාශ කිරීම.
- ★ මිතුරන් කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක වූ සංවිධානයක්, තමන් විසින් පිහිටු වූ තරුණ කණ්ඩායමක් බව අඟවා අසත්‍ය ප්‍රකාශයක් කිරීම.
- ★ වෙනත් ප්‍රදේශයක හටගත් සිද්ධියක් තමන් විසින් විසඳන ලද අන්තර් - වාර්ගික ගැටලුවක් වශයෙන් සාවද්‍ය ප්‍රකාශයක් කිරීම.

මෙබඳු සාවද්‍ය ප්‍රකාශ කිරීම මඟින් තම සංවිධානය කවර ආකාරයේ වාසි ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ දැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂණ නිලධාරීන් පිරිස ක්ෂේත්‍ර නිලධාරියා ගෙන් ප්‍රශ්න කළ හ. පිළිතුර වූයේ තම සංවිධානයේ වැඩකටයුතු සඳහා ප්‍රචාරය සහ අරමුදල් ලබාගැනීමට අපේක්ෂා කරන බවයි. ආධාර සපයන සංවිධානවල අපේක්ෂා සපුරාලීමේ අරමුණින් මෙ රට රාජ්‍ය නො වන සංවිධාන කොතෙක් දුරට රැවටිලිකාර උපක්‍රමවල යෙදෙන්නේ දැයි පෙන්වීමට මෙම සිද්ධිය කදිම නිදර්ශණයකි.

# මඩකලපුව දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක්

මඩකලපු දිස්ත්‍රික්කය දෙමළ හා මුස්ලිම් බහුතරයක් සහිත ජනාකීර්ණ ප්‍රදේශයකි. මුහුදු බඩ පෙදෙස්වල ජනගහනය වඩාත් සමාන මට්ටමින් පැතිරී ඇත. පැහැර ගැනීම් ඉඩම්වල පදිංචිවීම්, පෞද්ගලික කෝන්තර සහ වෙළඳ ප්‍රශ්න නිසා ගැටුම්කාරී තත්ත්වයන්, ආරවුල් සහ දෙමළ සහ මුස්ලිම් ජන කොටස් අතර අර්බුද හටගෙන තිබේ. මුස්ලිම් ජනතාව ගේ ප්‍රශ්න මුස්ලිම් දේවස්ථාන කමිටුව සහ අනුක්‍රමාධිපත්‍යය විසිනුත්, ගම් සභා සහ එල්ටීටීඊ ය දෙමළ ජනතාව ගේ ප්‍රශ්නත්, ප්‍රධාන වශයෙන් විසඳනු ලැබේ. ගම් ප්‍රදේශවල නායක කාරකාදී හු එල්ටීටීඊ සහභාගීත්වය ද සහිතව ගැටුම්කාරී පසුබිමට ප්‍රතිචාරය දක්වා තිබේ.

## 1. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ මෙවලම් :-

- ★ ගම්සභා
- ★ රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කරන ලද සංවර්ධන සහ සාම කමිටු.
- ★ ආගමික නායකයින්, විද්වතුන් සහ වෘත්තිකයින් විසින් ආරම්භ කර ඇති සාම කමිටු.
- ★ මුස්ලිම් දේවස්ථාන කමිටු, මුස්ලිම් දේවස්ථාන කමිටු සම්මේලනය සහ මුස්ලිම් දේවස්ථාන දිස්ත්‍රික් කමිටු සම්මේලනය

★ අවිධිමත් යාන්ත්‍රණය මඟින් ගැටුම් නිරාකරණය කරන ලද ආගමික ආයතන (පූජා ප්‍රසාදින් වහන්සේ සහ කෝවිල් භාරකාර අධිපතීන්)

★ අවිධිමත් යාන්ත්‍රණය මඟින් ගැටුම් නිරාකරණයේ යෙදුණ එල්ටීටීඊ ය, පොලීසිය, ග්‍රාමසේවා නිලධාරී සහ ජල ඒජන්ත.

## ගම්සභා

වාර්ගික අර්බුදය පැවති සමයේ දී මඩකලපු ජනතාව එල්ටීටීඊ ය, ශ්‍රී ලංකා යුද හමුදාව හෝ පොලීසියේ සහය පතනවා වෙනුවට තම ප්‍රශ්න විසඳා ගැනීම සඳහා නිරන්තරයෙන් ම ප්‍රදේශයේ විවිධ සංවිධාන කරා පිවිසිය හ. එයට හේතුව වූයේ ඉහත කී ආයතනවල උපකාරය ලබාගැනීමෙන් පසු ඇතිවිය හැකි අනිටු පලවිපාකවලට මුහුණදීමට ප්‍රදේශ වාසීන් බිය වීමයි. ගම්සභා ක්‍රියාත්මක නො වන ප්‍රදේශවල වැඩහිටි පිරිමි සහ කෝවිල් භාරකාර මණ්ඩලවල නිලධාරීහු යම් යම් සංවිධාන පිහිටුවති. ගැටුම් නිරාකරණය කිරීම සහ ආර්ථික සංවර්ධනය නියෝජනය කරමින් අවම කාන්තා පිරිසක් මෙම සංවිධානවල කටයුතු කරති.

## රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කරන ලද සංවර්ධන සහ සාම කමිටු

නිශ්චිත සංවර්ධන කටයුතු අරභයා මෙම සංවිධාන පිහිටුවා ඇත. ගම් මට්ටමේ නායක කාරකාදීන් ගෙන් සමන්විත මෙම සංවිධාන අවධිමත් ක්‍රමෝපායන් හරහා ගැටුම් නිරාකරණය කරති. මෙයට අතිරේකව රාජ්‍ය නො වන සංවිධාන ගණනාවක් ගැටුම් නිරාකරණය කිරීම් ඇතුළු සාමය ගොඩනැගීමේ ක්‍රියාකාරකම් රැසක් අරඹා ඇත. “කඩකම්” (ග්‍රාමීය ජනතා සංවිධතා) අල් ඉන්සානියා (සමාජ සංවර්ධන සංවිධානය) සහ සර්වෝදය ද ඉන් සමහරකි.

## ආගමික නායකයින්, විද්වතුන් සහ වෘත්තිකයින් විසින් ආරම්භ කර ඇති සාම කමිටු

මඩකලපුව සාම කමිටුව මෙබඳු සංවිධානයකි. සාමාජිකයින් 12 දෙනෙකු ගෙන් (හින්දු 5, ක්‍රිස්තියානි 4, මුස්ලිම් 2, සිංහල 1) සමන්විත මෙම සාම කමිටුව නාගරික ප්‍රදේශයේ වැඩියෙන් ම ක්‍රියාකාරී වන අතර, අත්අඩංගුවට ගැනීම් සහ අතුරුදහන් වීම් සම්බන්ධයෙන් පොලීසියට සහ සටන් විරාම කමිටුවට පැමිණිලි ඉදිරිපත් කිරීමේ නිරතව සිටී. 2002 ජුනි වල දී වාලච්චනේ ප්‍රදේශයේ ඇති වූ ගැටුම් වලින් පසු මෙම කමිටුව යළි පණ ගන්වා ඇතිමුත්, ප්‍රදේශයේ ගැටුම් නිරාකරණය කිරීමේ දී මුල් තැනක් ගෙන ක්‍රියා නො කරයි.

හමුදාව, එල්ටීටීඊ ය සහ සිවිල් සමාජ නායකයින් අතර සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා මෙම කමිටුව වරින්වර රැස්වීම් පවත්වයි.

## ආගමික ආයතන විසින් අවිධිමත් යාන්ත්‍රණය හරහා ගැටුම් නිරාකරණය කිරීම.

මඩකලපුවේ මුස්ලිම් ප්‍රදේශවල හටගන්නා ගැටුම් ප්‍රධාන වශයෙන් නිරාකරණය කරනු ලබන්නේ මුස්ලිම් දේවස්ථාන කමිටුව සහ මුස්ලිම් දේවස්ථාන කමිටු සම්මේලනය විසිනි. සෑම ගමකට ම මුස්ලිම් කමිටුවක් තිබෙන අතර, එම කමිටු වසර තුනකට වරක් මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් තේරී පත් වේ. යම් ප්‍රදේශයක මුස්ලිම් දේවස්ථාන කීපයක් නියෝජනය වන ආකාරයෙන් මුස්ලිම් දේවස්ථාන කමිටු සම්මේලනයක් ආරම්භ කරනු ලැබේ. සෑම මුස්ලිම් කමිටුවක් මෞලවි සහ තවත් දෙදෙනෙකු විසින් නියෝජනය කෙරේ. ඒ හැරුණ විට, ග්‍රාමසේවා නිලධාරීන්, ග්‍රාමීය සංවිධාන වල නියෝජිතයින්, විද්‍යාලයාධිපතිවරුන්, ගුරුවරුන් සහ වෘත්තීය සමිති නායකයෝ ද එම කමිටුවේ කටයුතු කරති. අන්තර් වාර්ගික ආරවුල් වල දී මුස්ලිම් දේවස්ථාන කමිටු සම්මේලනයේ ආධාරය ඇතිව, දිස්ත්‍රික් සම්මේලනය ක්‍රියා කරයි. ස්වකීය ප්‍රජාව තුළ හටගන්නා ආරවුල් සම්බන්ධයෙන් අනෙකුත් ආගමික කණ්ඩායම් සුදුසු පරිදි කටයුතු කරති. ගමේ දේවස්ථානයේ පූජා ප්‍රසාදී තුමන් මාර්ගයෙන් ක්‍රිස්තියානි ජනතාව තම තමන් ගේ ආරවුල් බේරුම් කරගනිති. හින්දු ජනතාව ආරවුල් වල දී කෝවිල් භාරකාර මණ්ඩලයේ උපදෙස් පතති.

## පුද්ගලයින් විසින් අවිධිමත් යාන්ත්‍රණය හරහා ගැටලු නිරාකරණය කිරීම

මෙය බහුලව සිදුවන ක්‍රියාදාමයකි. ග්‍රාමසේවා නිලධාරීන්, ගම් ප්‍රදේශවල වගකිවයුතු හා උසස් තනතුරු දරණ පුද්ගලයින්, ජල ඒජන්ත වරුන් යනා දී පුද්ගලයෝ මෙම කාර්යයෙහි නිරත වෙති. වී කුඹුරු අයිති කරුවන් විසින් තෝරා පත්කරගනු ලබන 'වට්ට විදානයාර් වරු' (ජල ඒජන්තවරුන්) ජලය බෙදාහැරීමේ කටයුතු සහ ඉන් පැන නගින ගැටලු සම්බන්ධයෙන් බලය ලත් නිලධාරීන් වශයෙන් කටයුතු කරති. 1995 න් පසු කෘෂිකර්ම අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ වී වගා කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා කෘෂි කණ්ඩායම් පිහිටුවන ලදී. මේවායේ සාමාජිකයින් වශයෙන් කටයුතු කරන ජල ඒජන්ත වරුන් ජලය බෙදාහැරීමේ දී පක්ෂග්‍රාහීව කටයුතු කිරීම සම්බන්ධයෙන් චෝදනා ද එල්ල විය. ආරවුල් විසඳාගැනීම සඳහා ජනතාව එල්ටීටීඊ යේ දේශපාලන අංශයේ සහය පැතු හ. නෛතික වශයෙන් කටයුතු කිරීම අවශ්‍යවන අවස්ථාවන් හි දී එල්ටීටීඊ ය අදාල සිද්ධීන් ශ්‍රී ලංකා පොලීසිය වෙත යොමු කරයි. එල්ටීටීඊ පාලනය පවතින පෙදෙස්වල මහජන පැමිණිලි එල්ටීටීඊ පොලීසිය විසින් ඔවුන් ගේ ම උසාවි වෙත යොමු කරනු ලැබේ.

1996 දී සියලු ම රජයේ සේවකයින්ට මඩකලපුව අතහැර යන ලෙස එල්ටීටීඊ ය නියෝග කළ අතර, ග්‍රාමසේවා නිලධාරීන් ගෙන් කොටසක් පමණක් එයට අවනත වූ හ. ඔවුන් මෙතෙක් ආපසු පැමිණ නැත. අර්බුද හේතුවෙන් ග්‍රාම සංවර්ධන සමිති වැනි සංවිධාන අකර්මන්‍ය වූයෙන්, ප්‍රදේශයේ ජනතාව ගම්සභා වැනි ආයතන ආරම්භ කළ හ. රාජ්‍ය නො වන සංවිධාන විසින් ගම්සභා ආරම්භ කිරීමේ දී, ග්‍රාම සංවර්ධන සමිති අක්‍රිය විය.

## 2. මඩකලපුවේ මුස්ලිම් ජනතාව හුරු පුරුදු වී සිටින ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමෝපායන්

පුද්ගලයින්, පවුල් සහ ගම් අතර ඇති වන ආරවුල් විසඳීමේ දී මඩකලපු මුස්ලිම් ප්‍රජාව බෙහෙවින් මුස්ලිම් දේවස්ථාන කමිටුව කෙරෙහි විශ්වාසය තබා තිබේ. පුද්ගලයින් හෝ පවුලේ සාමාජිකයින් අතර කලාතුරකින් ඇතිවන ආරවුල ග්‍රාම සේවා නිලධාරී හෝ විද්‍යාලයාධිපති වරයෙකු වෙත යොමු කරන මුත්, බොහෝ විට ඔවුන් එම ආරවුල් මුස්ලිම් දේවස්ථාන කමිටුවට දන්වනු ඇත.

සෑම ගමක ම පාහේ ක්‍රියාත්මක වන මෙම පිරිමින් ගෙන් පමණක් සමන්විත දේවස්ථාන කමිටුව, මෞලවි ගේ ප්‍රධානත්වයෙන් සිකුරාදා දිනවල රැස්වී පැමිණිලි භාරගනු ලැබේ. දේවස්ථාන කමිටුව විසින් පත්කරනු ලබන නිලධාරීන් දෙදෙනකු පැමිණිලි ගැන පරීක්ෂණයක් පවත්වා ඉදිරිපත් කරනු ලබන වාර්තාව පදනම් කරගෙන, දේවස්ථාන කමිටුව අවසාන තීරණයක් කරයි. ආරවුල නීතිය හා සම්බන්ධ එකක් නම් එය  පොලීසිය වෙත යොමු කරනු ඇත. මඩකලපු මුස්ලිම් ප්‍රජාව ගේ ආරවුල් දිස්ත්‍රික්කයේ දේවස්ථාන කමිටු සම්මේලන තුන මඟින් ද නිරාකරණය කරනු ලැබේ. ඇතැම් අවස්ථාවල මඩකලපු සාම කමිටුවේ, පොලීසියේ හා එල්ටීටීඊ යේ සහයෝගය ද මෙයට ලැබෙන ඇත. මඩකලපුවේ දේවස්ථාන කමිටු සම්මේලන තුන කාත්තන්කුඩි, එරාවුල් සහ වාලච්චනෙයි හි පිහිටා තිබේ.

අන්තර් - වාර්ගික ආරවුල්, විශේෂයෙන් එල්ටීටීඊ ය හෝ යුද හමුදාව සම්බන්ධ අත්අඩංගුවට ගැනීම, අතුරුදන් වීම, මිනීමැරුම් සහ ජාතිවාදී ගැටුම් විසඳීමේ ලා දිස්ත්‍රික් සම්මේලනය වගකීම දරයි. මුස්ලිම් ගමක් හා වෙනත් ජන කොටසකට අයත් ගමක් අතර ආරවුල් ඇති වූ විට එය දිස්ත්‍රික් සම්මේලනයට යොමුකිරීමට පෙර, අදාල දේවස්ථාන කමිටු සම්මේලනය සිද්ධියට සම්බන්ධ කණ්ඩායම් හඳුනා ගැනීම පිණිස මූලික පරීක්ෂණ පවත්වනු ලැබේ. එම කණ්ඩායම් තම බල ප්‍රදේශයට අයත් නම් දේවස්ථාන කමිටු සම්මේලනය විසින් අදාල සිද්ධිය සම්බන්ධ වගකීම තමන් වෙත පවරා ගනු ඇත. 2002 ජූනි වල දී හටගත් වාලච්චිනෙයි සිද්ධියෙන් පසු මුස්ලිම් දේවස්ථාන සම්මේලනය මඩකලපුව සාම කමිටුවේ දී මුස්ලිම් ජනතාව නියෝජනය කෙළේ ය.

මුස්ලිම් තරුණයෙකු පැහැරගෙන ගොස් මරා දැමීමේ සාපරාධී ක්‍රියාව සම්බන්ධයෙන් වාලච්චිනෙයි මුස්ලිම් දේවස්ථාන කමිටු සම්මේලනය පොලීසිය, එල්ටීටීඊ ය සහ ප්‍රදේශයේ රාජ්‍ය නො වන සංවිධානයක් හා එක්ව කටයුතු කරන බව මෙම පර්යේෂණය මෙහෙයවනු ලැබූ අවධියේ දී දැනගන්නට ලැබිණි. මුස්ලිම් දේවස්ථාන සම්මේලනයේ වැඩවලට ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය සහ ජාතික එක්සත් පෙරමුණ ඇඟිලි ගසන බවට චෝදනා කීපයක් එල්ලවිණි. එහෙත් මෙය තහවුරු කිරීමට ක්ෂේත්‍රයේ පර්යේෂණ නිලධාරී කණ්ඩායම අපොහොසත් විය.

මඩකලපුවේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය නො වන සංවිධාන ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රමෝපායන් ඍජුව අනුගමනය කරන අවස්ථා විරල ය. ස්වකීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මුස්ලිම් ප්‍රජාව සමඟ ඇති කරගන්නා සමීප සම්බන්ධතාව නිසා ඔවුන් ගේ ගැටලු පිළිබඳ හොඳ අවබෝධයක් ඇතත්, රාජ්‍ය නො වන සංවිධාන ජනතා ආරවුල් සුපුරුදු පරිදි දේවස්ථාන කමිටු වෙත යොමු කරනු ලැබේ. මෙම දේවස්ථාන කමිටු සහ කාති උසාවිවලට මුස්ලිම් ප්‍රජාව සම්බන්ධයෙන් සුවිශේෂ බලතල පැවරී ඇති නිසා, ගැටුම් නිරාකරණය කිරීම් සම්බන්ධයෙන් රාජ්‍ය නො වන සංවිධාන සම්බන්ධ වන්නේ නැත.

## සිද්ධි අධ්‍යයන 11

## අල්ඉන්සානියා සමාජ සංවර්ධන සංවිධානය

දුගී දුප්පත් මුස්ලිම් ජනතාව ගේ උන්නතිය වෙනුවෙන් මෙම සංවිධානය ඉතිරි කිරීමේ යෝජනා ක්‍රම, ස්වයං රැකියා ව්‍යාපෘති, සංවර්ධන සහ සාම යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරයි. සභාපති, උප සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ සහකාර ලේකම්වරයකුගෙන් සමන්විත මෙම සංවිධානය ගම් 15 ක සිය ව්‍යාපෘති දියත් කර තිබේ. එයට ආධාර සපයනුයේ "ක්‍රිස්ටියන් ඒඩ්" ආයතනයයි. කලින් මුස්ලිම් ගම්වල 'තඩකම්' සමඟ කටයුතු කළ මුත් 2000 දෙසැම්බරයේ සිට එය ස්වාධීනව කටයුතු කරයි. දෙමළ කාන්තා සහ මුස්ලිම් තරුණ කොටස් අතර මිත්‍රත්වය තහවුරු කිරීමේ අටියෙන් ඔවුන් සඳහා අල්-ඉන්සානියා සංවිධානය 'තඩකම්' සමඟ සම්බන්ධ වී දින දෙකක කඳවුරක් 2001 වසරේ දී ආරම්භ කළේ ය.

ඔවුන් ගේ වැඩසටහන් වලට ඉලක්ක වී ඇත්තේ දුප්පත් පවුල්වල කාන්තාවන් ය. ඔවුහු ගමේ රැස්වීම්වල දී ඉතිරි කිරීම් හා ස්වයං රැකියා

පිළිබඳ ප්‍රශ්න මතුකරති. එහි දී ඒවා සාකච්ඡාවට භාජනය වීමෙන් පසු සුදුසු විසඳුම් ලබා දෙනු ඇත. මෙම රැස්වීම් වල දී අඹු සැමි ප්‍රශ්න ඇතුළු අනෙක් පවුලේ ප්‍රශ්න ද අවධානයට ලක් වේ.

## 3. මඩකලපු දෙමළ ප්‍රජාව විසින් යොදා ගනු ලබන ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය

ග්‍රාමසේවා නිලධාරී, පොලීසිය, එල්ටීටීඊ දේශපාලන අංශ සභිකයින්, පල්ලිය, ගම්සභා, සමාදාන විනිශ්චයකාර වරුන්, කෝවිල් භාරකාර කමිටු, දේශපාලන පක්ෂ නිලධාරීන් සහ ජල ඒජන්ත වරුන් ආදී පිරිස් ගැටුම් නිරාකරණය කිරීමේ කාර්යයට සම්බන්ධ වී ක්‍රියා කරති. නාගරික ප්‍රදේශවල ජනතාව තම පැමිණිලි පොලීසිය වෙත ඉදිරිපත් කරයි. සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු, විවිධ ප්‍රදේශවල ස්වකීය දේශපාලන අංශයේ ශාඛා පිහිටුවීමත් සමඟ ම, ජනතාව අතර හටගන්නා සාමාන්‍ය ආරවුල්, ගෘහස්ථ ආරවුල්, පවුල් කීපයක් අතර හටගන්නා ප්‍රශ්න, මුදල් ගනුදෙනු සහ ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් විවිධාකාරයේ පැමිණිලි රාශියක් එල්ටීටීඊ ය වෙත ලැබුණි. මායිම් ප්‍රශ්න, කුඹුරු බද්දට දීමේ දී මතුවන ප්‍රශ්න, ඉඩම් පදිංචිය (විශේෂයෙන් දෙමළ සහ මුස්ලිම් ජන කොටස් අතර) ඉඩම් ආරවුල් ගණයට වැටේ. පහරදීම් හෝ අධිකරණයේ පිහිට පැතිය යුතු ආරවුල් පොලීසියට යොමු කරන ලෙස එල්ටීටීඊ ය උපදෙස් දෙයි. පොලීසිය කෙරේ විශ්වාසයක් නො මැතිවීම හා පොලීසිය වෙත යොමු කරනු ලබන ආරවුල් අවසානයේ දී අධිකරණයෙන් කෙලවර වන බැවින්, හුදු අකමැත්ත නිසා ම දෙමළ ජනතාව පොලීසියට තම පැමිණිලි යොමු කිරීමට දිරිමත් වන්නේ නැත. පළාතේ එල්ටීටීඊ දේශපාලන කාර්යාලයෙන් උපදෙස් ලබාගන්නා ලෙස පොලීසිය පැමිණිලි කරුවන්ට උපදෙස් දුන් අවස්ථා ද නැත්තේ නො වේ. එල්ටීටීඊ පාලන පෙදෙස්වලට සමීපව ජීවත්වන පවුල් වල හටගන්නා පහරදීම්, අඹු සැමි ප්‍රශ්න සහ පවුල් දෙකක් අතර හටගන්නා ඉඩම් ආරවුල් එල්ටීටීඊ ය වෙත යොමු කෙරේ.

එල්ටීටීඊ පාලන පෙදෙස්වල නිවැසි ජනතාව ස්වකීය ආරවුල් එල්ටීටීඊ උසාවි හමුවට ගෙන එන අතර, රජයේ පාලන පෙදෙස්වල ජීවත්වන පුද්ගලයින්ට එල්ටීටීඊ පොලීසිය හෝ උසාවිය විසින් නිකුත් කරනු ලබන සිතාසිවලට අනුව ක්‍රියා කරන්නට සිදු වේ.

යුද්ධය පැවති සමයේ මඩකලපු ප්‍රදේශයේ මායිම් ගම්වල පිහිටි මුස්ලිම් ජාතිකයින්ට අයත් අතහැර දමන ලද ඉඩකඩම්, එල්ටීටීඊ ය විසින් දෙමළ ජාතික ගොවීන්ට බද්දට දී තිබේ. සටන් විරාම ගිවිසුමෙන් පසු එහි පැමිණි මුස්ලිම් ජාතිකයින් තම ඉඩම් ආපසු ලබා දෙන ලෙස ඉල්ලා සිටීමේ දී, සණ්ඩු සරුවල් ඇති විය. පසුව මෙම මුස්ලිම් ජාතිකයෝ පොලීසියට මේ සම්බන්ධයෙන්

පැමිණිලි කළ හ. සාම සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් සමහර ඉඩම් මුස්ලිම් ජාතිකයින්ට ආපසු ලබාගැනීමට හැකි විය. එහෙත් ඉඩම් ආපසු ලබාගැනීමට නො හැකි වූ සැහෙන මුස්ලිම් ජාතිකයින් සංඛ්‍යාවක් තවමත් සිටිති.

ආරවුල් නිරාකරණය කිරීමේ දී ආරවුලට භාජනය වූ පාර්ශ්ව කරුවන් හා එල්ටීටීඊ ය අතර පවත්නා සම්බන්ධතාවන් නිසා විශාල බලපෑමක් සිදු වේ.

සටන් විරාම ගිවිසුමෙන් පසු බොහෝ එල්ටීටීඊ සාමාජිකියෝ රජයේ පාලන පෙදෙස්වල පිහිටා ඇති තම ගම්බිම්, ගේ දොර බලා ආපසු පැමිණිය හ. ඔවුහු නිතර ම පාහේ මුදල් ගනුදෙනු සහ අනවසරයෙන් ඉඩම්වල පදිංචි වී සිටීම වැනි තමන් ගේ පවුල් පාර්ශ්ව කරුවන් වී සිටින ආරවුල් වලට සම්බන්ධ වෙති. එවිට ඔවුන් ගේ ප්‍රතිවාදීහු ඔවුන්ට විරුද්ධව එල්ටීටීඊ යට පැමිණිලි කරති. පැමිණිලි එල්ටීටීඊ බලධාරීන් බාරගන්නා මුත් ඒවා විසඳන දිනයක් දැකිය නො හැකි බැවින් හා පොලීසිය වෙත යෑම තම ආරක්ෂාවට තර්ජනයක් බැවින් පැමිණිලි කරුවන් රාජ්‍ය නො වන සංවිධාන වෙත සරණ පතා යෑමට සිදු වී ඇත. අවසානයේ දී ඔවුනට ද කළ හැකි දෙයක් නො මැති නිසා පොලීසිය හෝ සටන් විරාම කමිටුව වෙත යෑම සඳහා රාජ්‍ය නො වන සංවිධාන ඔවුන්ට උපදෙස් දෙති. ක්‍රිස්තියානිහු තම ආරවුල් සඳහා ගමේ දේවස්ථානයේ පූජක තුමා ගේ උපදෙස් ලබාගනිති. ආරවුල සුහද ආකාරයෙන් විසඳීමට ඔහු අපොහොසත් වුවහොත්, පැමිණිල්ල පොලීසිය වෙත යොමු කරනු ඇත.

## 4. මඩකලපු ප්‍රදේශයේ රාජ්‍ය නොවන සංවිධාන

මෙම රාජ්‍ය නො වන සංවිධානවල වැඩ සටහන්වලට අයත් විශේෂ අංගයකි, ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය. ගැටුම් නිරාකරණය කිරීමේ දී බොහෝ රාජ්‍ය නො වන සංවිධාන මඩකලපු සාම කමිටුවේ සහය පතති. ගැටුම් නිරාකරණය කිරීමේ කටයුතුවලට ගම් මට්ටමේ කමිටු රාශියක් නිරතව සිටින බැවින් එම කමිටුවල ධාරිතාව තර කිරීම සඳහා රාජ්‍ය නො වන සංවිධාන කටයුතු කරමින් සිටිති. කාන්තා ප්‍රශ්න සම්බන්ධයෙන් ක්‍රියා කරන රාජ්‍ය නො වන සංවිධාන, දික්කසාද ඇතුළු ගෘහස්ථ කරුණු හා කලාතුරකින් ලිංගික අපචාර සිද්ධීන් පිළිබඳ ව සිය අවධානය යොමු කර ඇත.

සටන් විරාම ගිවිසුමෙන් පසු රාජ්‍ය නො වන සංවිධානවලට ස්වාධීන කාන්තා ප්‍රශ්න පිළිබඳ කටයුතු කිරීමේ අවස්ථාව ගිලිහී ගිය අතර තමන් හා එකට කටයුතු කරන ලෙස එල්ටීටීඊ යෙන් නියෝග නිකුත් විණි. එ බැවින් රාජ්‍ය නො වන සංවිධාන වලට එල්ටීටීඊ යේ පාලනයට විශාල වශයෙන් නතුවීමට සිදුවිණි. සමහර රාජ්‍ය නො වන සංවිධානවලට මෙය මහත් ගැටලුවක් වී ඇත. අනුන් ගේ පාලනය යටතේ කටයුතු කිරීම ස්වකීය වැටකටයුතුවල

දියුණුවට බාධාවක් බව ඔවුන්ට වැටහී ගොස් ඇත. දුරස්ථ ගම්මාන ප්‍රදේශයේ පරිපාලන යාන්ත්‍රයට සමීප නැත. ශක්තිමත් පරිපාලන සංවිධානයක් ද එම ගම්මානවල නො මැත.

ඉතිරි කිරීමේ හා ණය දීමේ යෝජනා ක්‍රම හරහා රාජ්‍ය නො වන සංවිධාන මඩකලපුවේ සමහර ගම්වල සාමය ගොඩනැගීමේ ක්‍රියාකාරකම්වල නිරතව සිටිති. මෙම  රාජ්‍ය නොවන සංවිධාන විසින් පිහිටුවා ඇති ගම් සභාව වෙත ගැටලු විසඳීම සඳහා ආධාර ඉල්ලා පැමිණිලි කීපයක් ලැබී ඇත. ග්‍රාමසේවා නිලධාරී ගේ හෝ සමාදාන විනිශ්චකරුවන් ගෙන් අවශ්‍ය සහය ලබා ගන්නා ලෙස කොමිටියේ ප්‍රධානියා පැමිණිලි කරුවන්ට උපදෙස් දී තිබුණි. මෙම රාජ්‍ය නො වන සංවිධාන සක්‍රියව සිය කටයුතු කරනු ලබන ගම්වල පොලීසියක් හේ ග්‍රාම සංවර්ධන සමිතියක් හෝ නැති බැවින්, සංවිධානය විසින් පිහිටුවා ඇති කමිටුවල සහය ලබා ගැනීමට ජනතාව උනන්දු වී සිටී. එය සපල නුවුවහොත් ආරවුලට සම්බන්ධ පුද්ගලයෝ එල්ටීටීඊ යේ සහය පැතීමට පෙළඹෙති. එල්ටීටීඊ ය තමන් වෙත යොමු කරන සෑම පැමිණිල්ලක් ම විභාග නො කරන අතර, ඇතැම් අවස්ථාවල ඒවා ශ්‍රී ලංකා පොලීසිය වෙත යොමු කරනු ලැබේ.

## සිද්ධි අධ්‍යයන 12

## තඩකම් - ග්‍රාමීය ජනතා සංවිධානය

1991 දී ආරම්භ කරන ලද 'තඩකම්' රාජ්‍ය නො වන සංවිධානය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහනකත් ගම් තිස් හයකත් උද්‍යෝගීව සිය කටයුතු කරයි. ඉතිරි කිරීම්, ස්වයං රැකියා ණය දීම, කෘෂිකර්මය සහ සාමය පිළිබඳ දැනුවත් කිරීමේ කාන්තා වැඩසටහන් පිළිබඳ ව්‍යාපෘති මෙම සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. 'ස්වකීය ක්‍රියාකාරකම් ගම තුළ ක්‍රියාත්මක කිරීමට පෙර "තඩකම්" හි ක්ෂේත්‍ර නිලධාරීහු තොරතුරු රැස්කර, මූලික ප්‍රජා අවශ්‍යතා තක්සේරු කරති.

ප්‍රජා සහභාගීත්වය දිරිගැන්වීම සඳහා 'තඩකම්' සංවිධානය ගමේ රැස්වීමක් ආරම්භ කර ව්‍යාපෘතියේ අරමුණු පැහැදිලි කරයි. ගම්වාසීන් මුහුණ දී ඇති ගැටලු හා අවශ්‍යතා සාකච්ඡා කර ඒවා සාක්ෂාත් කරගන්නා අයුරු අවධානයට ලක්කරයි. ඊළඟට ගම්වාසීන් කුඩා කණ්ඩායම් වලට බෙදනු ලැබේ. 'තඩකම්' උප කමිටු වශයෙන් හැඳින්වෙන ගම්සභා පිහිටුවීම පිණිස සාමාජිකයින් තිදෙනකු නම් කෙරේ. මෙම ගම්සභාවෙන් එක් සාමාජිකයකු ප්‍රධාන 'තඩකම්' කමිටුවේ සාමාජිකයකු වශයෙන් සේවය කිරීම සඳහා තෝරාගනු ලැබේ. මෙම සංවිධානය පොදුවේ ගැහැනු,

පිරිමි, වැඩිහිටි සහ තරුණ කොටස්වල සමාන දායකත්වය අපේක්ෂා කරයි. නොයෙකුත් කමිටුවලට ගම්වාසීන් පත්කිරීම මගින් කමිටුව වඩාත් පුළුල් අයුරින් නියෝජනය කිරීමට තඩකම් සංවිධානය උත්සාහ දරයි. ග්‍රාමසේවා නිලධාරීන්, සමෘධි නිලධාරීන්, කෝවිල් භාරකාර මණ්ඩල සාමාජිකයින්, විදුහල්පති වරුන් ආදීන් ගෙන් සමන්විත ගම් සංවර්ධනය කිරීමේ කණ්ඩායම් 'තඩකම්' ආයතනයේ උපදෙස් පිට පිහිටුවා තිබේ. ගමේ සංවර්ධනය සම්බන්ධයෙන් ඔවුහු උපදේශකයින් ලෙස ද කටයුතු කරති. කෝවිල් භාරකාර මණ්ඩල සාමාජිකයින් සහ ජල ඒජන්තවරුන් ගෙන් සමන්විත කෘෂිකර්ම කණ්ඩායමක් ද 'තඩකම්' සංවිධානය විසින් බිහි කර තිබේ. මෙම ආයතන ප්‍රජා ගැටලු වලට විසඳුම් සෙවීමටත් ගම් අතර පවත්නා ප්‍රජා ආරවුල් විසඳීමටත් උපකාරී වේ. නිදර්ශණයක් වශයෙන් මෙම පර්යේෂණය පැවැත්වෙමින් තිබිය දී පිරිම්පාදිතීවු සහ මුරගන්තීවු ගම් දෙක අතර පාසලක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් පැනනැඟි ආරවුලක් එම ගම් දෙකේ සංවර්ධන කණ්ඩායම්වල ඒකාබද්ධ මැදිහත් වීමෙන් විසදෙමින් තිබුණි. සටන් විරාම ගිවිසුමට පෙර 7 වෙනි පන්තිය දක්වා ඉගැන්වීම් කළ පාසල මුරුගන්තීවු වෙත ගෙනන ලදී. (විදුහල්පති වරයා සහ ආචාර්ය මණ්ඩලය විසින් කරන ලද පැමිණිලි නිසා විදුහල වෙනත් ස්ථානයකට ගෙනයෑමට සිදු වූ බව විශ්වාස කිරීමට තරම් හේතු පිපාදිතිවු වැසියන් සතුව තිබුණි.) පාසල වෙනත් තැනකට ගෙන ඒම සම්බන්ධයෙන් මුරුගන්තීවු සිසුහු ප්‍රසාදය පළ කළ මුත් පිරිම්පාදිතීවු ජනතාව ප්‍රකාශ කර සිටියේ සිසුන් බොහෝ දෙනෙක් ඔවුන් ගේ ගම් සහ ඉන් එපිට ගම්වල සිට පැමිණෙන බව ය. මෙම අර්බුදය විසඳීම සඳහා ගම් දෙකේ ම සංවර්ධන කණ්ඩායම් සාකච්ඡා කරමින් සිටිති. ගෘහස්ථ සහ ආර්ථික ප්‍රශ්න පිළිබඳ පැමිණිලි කලින් එල්ටීටීඊ ය වෙත යොමු කරන ලද මුත්, සමහර අවස්ථාවන් හි දී ඒවා ගම් සංවර්ධන කණ්ඩායම් සහ කෘෂිකර්ම කණ්ඩායම් වල අවධානයට ලක් කරනු ලැබේ.

පුද්ගලයින් පවුල් සහ පවුල් අතර ඇතිවන ගැටලු පවුල තුළ විසඳාලීමේ ප්‍රවනතාවයක් පවතී. "තඩකම්" කණ්ඩායම්වල හෝ කමිටුවල පවුලේ සාමාජිකයෙක් සිටීමේ හේතුවෙන් ගෘහස්ථ ගැටලු සාකච්ඡාවට භාජනය කර, ඒ සඳහා විසඳුම් සෙවීමේ හැකියාව ලැබී ඇත. කොරලෙයි පත්තු ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පුද්ගලයින් දෙදෙනකු අතර සිදු වූ ආරවුලක දී එක පුද්ගලයෙකුට අයත් ට්‍රැක්ටරයකට ගිණි තබන ලදී. අයිතිකරු, තම විරුද්ධ වාදියාව සැක කළ මුත් ඒ සඳහා කිසිදු සාක්ෂියෙක් නො වී ය. දෙදෙනා ගේ ම බිරියන් 'තඩකම්' කණ්ඩායමේ සාමාජිකාවන් වූ බැවින් සාකච්ඡා මාර්ගයෙන් ඔවුන්ට අරවුල නිරාකරණය කරගැනීමට හැකිවීම මෙයට කදිම නිදර්ශණයකි. අවසානයේ දී විනාශ වූ ට්‍රැක්ටරයට සරිලන

වන්දියක් වරද සිදු කළ පුද්ගලයා විසින් ගෙවීම නිසා ආරවුල සාමකාමීව විසඳුණි.

## සිද්ධි අධ්‍යයන 13

## නාච්චිවන්කීවන් - වාලච්චිනෙයි

පවුල් 262 කින් යුත් නච්චිවන්කීවන් ග්‍රාමය වාලච්චිනෙයි ප්‍රදේශයට එපිටින් කුඩා දූපතක පිහිටා ඇත. ප්‍රදේශයේ වැසියන් ගේ ප්‍රධානත ම ජීවනෝපාය ධීවර කර්මාන්තය වන අතර වර්ෂා කාලයේ දී ගමනාගමනය හුදෙක් බෝට්ටුවලට පමණක් සීමා වී ඇත. දූපත සහ ගොඩබිම සම්බන්ධ කරනු ලබන මාර්ගය වතුරට යටවීම එයට හේතුවයි. සෞඛ්‍ය හෝ විදුලිය පහසුකම් හෝ නො මැත. යුද්ධය පැවති සමයේ ජනතාව බෙහෙවින් අවතැන් වූ අතර තැන්තැන්වල ජීවත් වූ හ. දැන් ඔවුහු ආපසු පැමිණි සිටිති.

"තඩකම්" සංවිධානය ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරමින් සිටියි. ගොඩබිමින් වෙන් වූ නිසා ජනතාව හුදකලා ජීවිතයක් ගත කරති. "තඩකම්" සංවිධානයේ මැදහත්වීම ජනතාව දැඩි විශ්වාසයකින් යුතු ව තම අවශ්‍යතා සහ මුහුණ පා ඇති දුෂ්කරත්වයන් ගැන සාකච්ඡා කිරීමට පෙළඹී සිටී. දුප්පත්කම පිටුදැකීමේ සමෘද්ධි වැඩසටහන මෙහි ක්‍රියාත්මක වී ඇතත් තවමත් ප්‍රදේශ වාසීහු දුප්පත් කමින් පෙළෙති. ජනතාව ගේ කැමැත්ත පිට මෙහි කෝවිලේ ප්‍රධාන පූජකවරයා දූපතේ අධිපතියා වශයෙන් කටයුතු කරයි. ඔහු සමෘද්ධි ක්‍රියාකාරී කමිටුවේ සභාපතිවරයා ය. "තඩකම්" උප කමිටුවේ ද ප්‍රධානියා ය. දූපත් වාසීන් ගේ ආරවුල් නිරාකරණය කරනු ලබන්නේ ද ඔහු විසිනි. ශාන්තිකර්ම විධි හා සාම්ප්‍රදායික ප්‍රතිකාර ක්‍රම දූපත් වාසීන් අතර ඉතා බහුලව වෙති. ඒවා හරහා තම ගැටලුවලට පිළිසරණ පැතීමට ද ඔවුහු පුරුදු වී සිටිති. ගම්සභා රැස්වීම්වල දී ජනතාව තම දුක්ගැනවිලි ඉදිරිපත් කරයි. පවුල් සේවිකාව සහ පෙර පාසල් ගුරුවරිය යන දෙදෙනා ගම්සභාව නියෝජනය කරන මුත්, එහි වැඩකටයුතු සම්බන්ධයෙන් හඬක් නැගීමට කාන්තාවන්ට ඉඩක් නැත.

දූපත් වාසීන් විසින් ම තම ගැටලුවලට විසඳීම් සොයා ගත යුතු ය යන අවබෝධය මත ය සටන් විරාම ගිවිසුමට හෝ තඩකම් සංවිධානය විසින් ගම්සභාව ආරම්භ කරන ලද්දේ. ග්‍රාම සංවර්ධන කමිටුව, කාන්තා කමිටුව සහ අධ්‍යයන කමිටු යන මේ සියල්ල ද තඩකම් සංවිධානය

විසින් පිහිටුවන ලදී. ග්‍රාම සංවර්ධන කමිටුව සහ කාන්තා කමිටුව ගැටලු නිරාකරණය කිරීමේ ප්‍රධාන ආයතනයෝ ය. පවුලේ ප්‍රශ්න සහ ඉඩම්වල මායිම් පිළිබඳ ආරවුල් මෙම කමිටු විසින් නිරාකරණය කරනු ලැබේ. මුදල් පිළිබඳ ආරවුල්වල දී ණයට ගත් මුදලක් ඇතොත් එය කොටස් වශයෙන් ආපසු ගෙවීමේ පොරොන්දුව මත නිරාකරණය ලැබේ. සුහදශීලීව ගැටලුව නිරාකරණය කළ නො හැකි අවස්ථාවල දී, අඹු සැමි පාර්ශ්වයන් ඔවුනොවුන් වෙන්වීම අපේක්ෂා කළ ද, කමිටුව ඔවුන් එක් වහලක් යට තබා ගැනීම සඳහා සියලු උත්සාහයන් දරයි. පුරුෂයා අතින් සිදු වන වැරදි අමතක කර දමා භාර්යාව තම පුරුෂයා සමඟ පවුල් ජීවිතය ඉදිරියට පවත්වා ගැනීම අපේක්ෂ කරන අතර එය ගමේ ප්‍රධානියා සහ කමිටුව අතරත් පුරුෂයා සහ භාර්යාව අතරත් තියුණු මතභේද වලට හේතු වී තිබේ. ධීවර ප්‍රජාව අතර හටගන්නා ගැටලු ධීවර සමිතිය විසින් ද, කම්කරුවන් සහ මේසන්වරුන් හා එබඳු ශ්‍රේණීන් අතර ඇති වන ආරවුල් ගම්සභාව විසින් ද විභාග කරනු ලැබේ. මුදල් ණයට ගැනීම් සහ ප්‍රේම සම්බන්ධතා වැනි ප්‍රශ්න ද මේවාට ඇතුළත් වේ. මෙම ග්‍රාමයට වෙනම ම ග්‍රාමසේවා නිලධාරියකු නො මැති වීම බලවත් පාඩුවකි. ස්ථිර ග්‍රාමසේවා නිලධාරියකු නො මැති වීමෙන් තම ගැටලු විසඳා ගැනීම සඳහා දූපත් වාසීන්ට ගම් සභාවේ පිහිට පතන්නට සිදු වී තිබේ.

සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වීමෙන් පසු, විසඳාලිය නො හැකි ගැටලු සමත මණ්ඩල වෙත යොමු කිරීම සඳහා ගම්සභාව සහ වාලච්චිනෙයි සමත මණ්ඩලය එකඟත්වයකට පැමිණියා ය. පර්යේෂණය කරගෙන යන අවස්ථාව වන තෙක් සමත මණ්ඩලය වෙත පැමිණිලි කිසිවක් යොමු කර නො තිබුණි.

# අම්පාර දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි සටහනක්

අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් හා දෙමළ ගම් එකිනෙකට යාව පිහිටා තිබේ. එ ලෙස රට අභ්‍යන්තරයේ මායිම් ගම්වල සිංහල ජනතාව අනෙකුත් ජන කොටස්වලට සමීපව ජීවත් වෙයි. ගොවි තැන, ධීවර කටයුතු සහ වෙළඳාම යන ක්ෂේත්‍රවල දී මේ ජන කොටස් තුනේ සාමාජිකයෝ එකිනෙකා මුණ ගැසෙති. එල්ටීටීඊ ය සහ දෙමළ ජාතිකයින් මුස්ලිම් ප්‍රජාවට අයත් ඉඩම්වල බලහත්කාරයෙන් පදිංචි වීම පිළිබඳ සැලකිය යුතු ආරවුල් සංඛ්‍යාවක් වාර්තා වී තිබේ.

සටන් විරාම ගිවිසුම නිසා තමන්ට අහිමි වී ඇති ඉඩකඩම් ආදිය ආපසු ලබාගැනීමට මුස්ලිම් ජනතාව පෙළඹී සිටිති.

ප්‍රදේශයේ විවිධ ජන කොටස් අතර ගැටුම් ඇති වීමට කටකතා සහ වාර්ගික මතභේද බෙහෙවින් හේතු වී තිබේ.

## 1. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ මෙවලම්

- ⋆ ප්‍රදේශ වාසීන් විසින් ස්ථාපනය කරන ලද ගම්සභා
- ⋆ රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කර ඇති සංවර්ධන සහ කාන්තා කමිටු හෝ ගම්සභා
- ⋆ රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කර ඇති සාම කමිටු

* දේශපාලන නායකකාරකාදීන් විසින් පිහිටුවා ඇති සාම මණ්ඩල
* මුස්ලිම් දේවස්ථාන කමිටු සහ මුස්ලිම් දේවස්ථාන කමිටු සම්මේලනය
* එල්ටීටීඊ ය, පොලීසිය, ග්‍රාමසේවා නිලධාරී සහ ජල ඒජන්ත වරුන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රමෝපායයන්

## ප්‍රදේශ වාසීන් විසින් ස්ථාපනය කරන ලද ගම්සභා

අම්පාර දිස්ත්‍රික්කයේ සමහර සිංහල හා දෙමළ ගම්වල වෙසෙන පුද්ගලයින්, පවුල් සහ ගම් අතර හටගන්නා ආරවුල් විසඳීම සඳහා ගම්වල කණ්ඩායම් පිහිටුවා ඇත. මේවායේ තනතුරු පිරිමින් විසින් හෙබවීම ගම්වාසීන් ගේ අභිලාෂය වී තිබේ. සිංහල ගම්වල පන්සලේ අනුග්‍රහය යටතේ ආරම්භ කරනු ලබන මෙම කණ්ඩායම්වල මූලික රාජකාරිය වී ඇත්තේ පුද්ගලයින් සහ පවුල් අතර ඇතිවන ආරවුල් විසඳීම හෝ ඒවාට මැදහත් වීම ය.

දෙමළ ජාතිකයින් සහ මුස්ලිම් ජාතිකයින් ගේ ප්‍රධාන ජීවනෝපාය මසුන් මැරීම හා ඒ හා සම්බන්ධ අනෙක් ආර්ථිකමය ක්‍රියාදාමයන් ය. ඔවුන් අතර හටගන්නා ආරවුල් බේරුම් කරනු ලබන්නේ ධීවර සමිති විසිනි. සමිති වර්ග දෙකකි. එනම් ධීවරයින් ගෙන් සමන්විත ධීවර සමිතිය සහ දෙමළ සහ මුස්ලිම් ජන කොටස්වලට අයත් බෝට්ටු අයිතිකරුවන් සහ වෙළඳුන් ගෙන් යුත් ධීවර සමූපකාර සමිතියයි. සාමාජිකයින් 10 - 12 අතර සංඛ්‍යාවකින් සමන්විත ධීවර සමූපකාර සමිති මුදල් ගනුදෙනු සහ ණය සම්බන්ධයෙන් තීරණ ගනු ලැබේ. ධීවරයින් ගේ ගෙදර දොරේ ප්‍රශ්න, මසුන් ඇල්ලීමේ ප්‍රදේශ මායිම් සහ ධීවර උපකරණ සොරකම් කිරීම් මුල් කර ගත් ආරවුල් විසඳනු ලබන්නේ ද ධීවර සමූපකාර සමිති විසිනි. එම සමිතිවලට විසඳීමට අපහසු ගැටලු කෝවිල් භාරකාර මණ්ඩලයට හෝ පොලීසියට උපදෙස් සහ මැදහත්වීම සඳහා යොමු කරනු ඇත.

## රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කර ඇති සංවර්ධන සහ කාන්තා සමිති හෝ ගම්සභා

ස්වකීය ගම්වල පවත්නා ආරවුල විසඳීමේලා සමහර ගම් වැසියෝ ඉතිරි කිරීම් සහ ණය යෝජනා ක්‍රම, ස්වයං රැකියා, කෘෂිකාර්මික සංවර්ධනය, සාම වැඩසටහන් සහ කාන්තාවන් ගේ දැනුවත් කිරීමේ ව්‍යාපෘති හරහා රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති කණ්ඩායම් කරා පැමිණෙති. රාජ්‍ය නො වන සංවිධානවල උපදෙස් යටතේ සමහර ගැටලුවලට විසඳුම් ලැබෙන අවස්ථා ද ඇත.

## රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති සාම කමිටු

අන්තර් වාර්ගික ගැටලු විසඳා සිංහල, දෙමළ සහ මුස්ලිම් ජන කොටස් අතර සුහදතාව තහවුරු කිරීම සඳහා රාජ්‍ය නො වන සංවිධානවල නියෝජිතයින්, විද්වතුන්, වෘත්තිකයින් සහ ආගමික නායකයින් ගේ සහයෝගය ඇතිව සාම කමිටු පිහිටුවා තිබේ. යුද්ධය පැවති කාලය තුළ ආගමික නායකයින්, පොලීසිය, දේශපාලන පක්ෂ සහ යුද්ධ හමුදාව අතර සම්බන්ධීකරණය පවත්වා ගෙන යෑම සඳහා අක්කරෙයිපත්තු සාම පදනම සහ පොතුවිල් සාම පදනම පිහිටුවන ලදී. ඉහත සඳහන් ආයතන දැන් රාජ්‍ය නො වන සංවිධාන වශයෙන් ලියාපදිංචි කර තිබේ.

## දේශපාලන නායකයින් විසින් පිහිටුවා ඇති සාම මණ්ඩල

2002 ජුනි මාසයේ හටගත් වාලච්චිනෙයි සිද්ධියෙන් පසු ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ මන්ත්‍රී ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා ගේ සහ මුස්ලිම් දේවස්ථාන කමිටුවේ නායකත්වය යටතේ අක්කරපත්තු අන්තර් - වාර්ගික සාම සහයෝගීතා මණ්ඩලය පිහිටුවන ලදී. එහි අරමුණ වී ඇත්තේ කල්මුණේ, අක්කරපත්තුව සහ නින්තාවුර් හි පදිංචි සිංහල, මුස්ලිම් සහ දෙමළ වැසියන් අතර හටගන්නා ආරවුල් විසඳීම ය. පසුව තවත් අන්තර් වාර්ගික සාම සහයෝගිතා මණ්ඩලයක් දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රී චන්ද්‍රනේරු මහතා යටතේ ආලයියාදි වෙම්බු ප්‍රදේශයේ ආරම්භ කරන ලදී. මෙම සභා දෙකේ ම සාමාජික සංඛ්‍යාව 12 කි. ජනවාර්ගික කොටස් අතර මතුවන ගැටලු නිරාකරණය කර සුහදතාව පවත්වා ගෙන යෑම සඳහා මේ මණ්ඩල දෙකේ සාමාජිකයෝ එල්ටීටීඊ ය සහ පොලීසිය සමඟ සාකච්ඡා පැවැත්වූ හ. සාමාජිකයින් අතර උනන්දුවක් නො තිබීම හා අභ්‍යන්තර දේශපාලන ගැටලු හේතුවෙන් මෙම මණ්ඩල දැන් අකර්මන්‍ය වී තිබේ.

## මුස්ලිම් දේවස්ථාන කමිටු හා මුස්ලිම් දේවස්ථාන කමිටු සම්මේලනය

මුස්ලිම් ජනතාව තම ප්‍රජාව සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම සඳහා මුස්ලිම් දේවස්ථාන කමිටුවේ ආධාරය පතති. මෞලවි තුමා ගේ නායකත්වය යටතේ කමිටුව රැස් වී පැමිණිලි පිළිබඳ ව පරීක්ෂණ පැවැත්වීම සඳහා දෙනෙකු ගෙන් යුත් කමිටුවක් පත් කරනු ලැබේ. පරීක්ෂණයෙන් පසු කමිටුව අගමුල විසඳයි. මුස්ලිම් ගම් දෙකක් අතර හටගන්නා ගැටුම් නිරාකරණය කරගැනීම සඳහා මුස්ලිම් දේවස්ථාන සම්මේලනය කරා යන අවස්ථා ඇත.

## පුද්ගලයින් විසින් ක්‍රියාත්මක කරනු ලබන ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රමෝපායන්

සමහර ගැටලු එල්ටීටීඊ යේ දේශපාලන අංශයේ ප්‍රාදේශීය කාර්යාල සහ පොලීසිය වෙත යොමු කරනු ලැබේ. පුද්ගලයින්, ඉඩම්, සහ ගෘහස්ථ කරුණු සම්බන්ධයෙන් ඇතිවන ගැටලු විසඳීම සඳහා ග්‍රාමසේවා නිලධාරී උත්සාහ කරයි. එය අසාර්ථක වන අවස්ථාවන් හි දී එම ආරවුල් සාමාන්‍යයෙන් පොලීසිය වෙත යොමු කරනු ලැබේ. දෙමළ පළාත්වල පොලීසියට යොමු කරනු ලබන්නේ සොරකම් පිළිබඳ සිද්ධීන් ය. එහෙත් පැමිණිලි කරු නිරන්තරයෙන් පොලීසිය වෙත වරින්වර ගොස් තම පැමිණිල්ල පිළිබඳ ව අවධාරණය කරන තෙක් ඒ පිළිබඳ ව කිසිවක් නො කෙරෙනු ඇත.

වාරිමාර්ග හා කුඹුරු සම්බන්ධ ආරවුල් සාමාන්‍යයෙන් වට්ට විදානයර් හෙවත් ජල ඒජන්ත වෙත යොමු කරනු ලැබේ. සාම්ප්‍රදායිකව ජල ප්‍රශ්න සම්බන්ධයෙන් වට්ට විදානයර්ට බලතල හිමි වී ඇති අතර, ඉඩම් පිළිබඳ මායිම් ප්‍රශ්න සම්බන්ධයෙන් ද ඔහු කටයුතු කරනු ඇත. ප්‍රශ්න විසඳීමේ ලා ඔහු අසමත්වන අවස්ථාවන් හි දී එම ප්‍රශ්න සම්බන්ධයෙන් පොලීසියේ සහය පතන ලෙස අදාල පාර්ශ්වයන්ට ඔහු දන්වනු ඇත. 1995 දී මෙම වට්ට විදානයර් ක්‍රමය ප්‍රති සංවිධානය කරන ලදී. කලින් ජල ඒජන්ත වරයකු කුඹුරු ඉඩම් අයිතිකරුවන් 90 දෙනෙක් සම්බන්ධයෙන් වගකීම දරන ලදී. පස් වසරකට වරක් තෝරා ගනු ලබන මෙම ජල ඒජන්ත වරුන් කුඹුරු ඉඩම් හිමියකු වීමේ අවශ්‍යතා සපුරාලිය යුතු අතර වී වගාව පිළිබඳ කරුණු සම්බන්ධයෙන් දැනුවත් විය යුතුවීම අවශ්‍ය ය. 1995 න් පසු සෑම ප්‍රාදේශීය ලේකම් වසමක ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෘෂි කණ්ඩායම් පිහිටුවන ලදී. විසඳීමට නො හැකි පැමිණිලි දැන් කෘෂි කණ්ඩායම් වෙත යොමු කරනු ලැබේ. වට්ට විදානයාර් නම දැනට වෙනස් කර ඇති අතර ඒ වෙනුවට ‘නීර්මුහාවර්’ යන අලුත් නම භාවිතා කරනු ලැබේ.

### *අධිකරණ අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද සමථ මණ්ඩල*

අධිකරණ අමාත්‍යාංශය විසින් කෙළින් ම හෝ ග්‍රාමසේවා නිලධාරීන් ගේ මාර්ගයෙන් පිහිටුවන ලද සමථ මණ්ඩල වෙත ආරවුල් වලට සම්බන්ධ පාර්ශ්වයෝ විසඳුම් අපේක්ෂාවෙන් සමීප වෙති. මෙම සමථ මණ්ඩල වෙත යොමු කරනු ලබන පැමිණිලි සාමාන්‍යයෙන් ඉඩම්, පවුල් සහ මුදල් ගනුදෙනු පිළිබඳ ප්‍රශ්න වන අතර ඒවා බාරගනු ලබන්නේ හුදෙක් සතියට දෙවරක් පමණි. සෑම ඉරු දිනක ම එහි රැස්වීමක් ප්‍රසිද්ධ ස්ථානයක පවත්වනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාමසේවා නිලධාරී මාර්ගයෙන්

අදාල ප්‍රාර්ශ්වයන් වෙත සිතාසි නිකුත් කරනු ඇත. සමථ මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව අධිකරණ අමාත්‍යාංශය විසින් ගැසට් නිවේදනයක් මඟින් නියම කරනු ලැබේ. තෝරා ගන්නා ලද නියෝජිතයින් දෙදෙනා ගෙන් එක් අයෙකු ප්‍රධාන මැදිහත්කරු වශයෙන් ක්‍රියා කරයි. පාර්ශ්ව කරුවෙකු තමන් වෙත නිකුත් කරන ලද සිතාසියක් අනුව නියමිත දිනට පෙනී නො සිටිය හොත්, එය තුන් වරක් යළි නිකුත් කිරීමෙන් පසු දිස්ත්‍රික් උසාවිය වෙත යොමු කරනු ලැබේ.

## 2. අන්තර් වාර්ගික ආරවුල්

ආරවුල් ඇති කිරීමට මෙන් ම උග්‍ර කිරීමට ද කටකතා මූලික වෙයි. අනෙක් දිස්ත්‍රික්කවල ඇති වූ සිද්ධියකට ප්‍රතික්‍රියාවක් වශයෙන් බොහෝ ගැටුම් අම්පාර දිස්ත්‍රික්කය තුළ හට ගනී. ඒවා දේශපාලන කණ්ඩායම් සහ කටකතා නිසා උග්‍ර තත්ත්වයකට පත් වේ.

2002 ජුනි වල දී වාලච්චිනෙයිවල ඇති වූ සිද්ධියේ අතුරුවිපාක දෙමළ හා මුස්ලිම් ජනතාව සමීපව ජීවත්වන අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ සහ අක්කරපත්තු ප්‍රදේශවලට තදින් බලපෑ ය. විවිධ දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් මෙම සිද්ධීන් පිටුපස ක්‍රියාත්මක වෙමින් සිටි බැව් දැනගන්නට ලැබී ඇත. සතුන් සොරකම් කිරීම වැනි දෙමළ හා මුස්ලිම් ජන කොටස් අතර ඇතිවන සිද්ධීන් නිසා ගැටුම් උග්‍ර වීමට මඟපෑදේ.

ගැටුම් ඇතිවන අවස්ථාවල දී ඒවාට සම්බන්ධ සන්නද්ධ කණ්ඩායම් වලින් සිදුවන එකටෙක කිරීම් ගැන වාර්ගික කණ්ඩායම් බියෙන් පසු වූ හ. සටන් විරාම ගිවිසුවෙන් පසුවුව ද බිය සැක පහ වී ගොස් නො මැත. සටන් විරාම ගිවිසුමෙන් පසු හා රජයේ පාලනය යටතේ පවතින ප්‍රදේශවල එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයන් සැරිසැරීම නිසා මුස්ලිම් ජනතාව බියෙන් පසු වේ.

දිස්ත්‍රික්කයෙන් පිටත ඇති වූ සිද්ධීන් පිළිබඳ පැතිරී ගිය කටකතා නිසා ප්‍රදේශය තුළ සැක සංකා හා බිය පවතී. දිස්ත්‍රික්කයේ එක් තැනකට හටගත් සිද්ධියක් අනෙකුත් ප්‍රදේශ කරා පහසුවෙන් පැතිරයාම සාමාන්‍ය දෙයකි. කුකුළු පැටවුන් සහ හරකුන් සොරකම් කිරීම නිසා දෙමළ හා මුස්ලිම් ජන කොටස් අතර හොඳහිත පළුදු වී විරුද්ධවාදී කම් ද ඇති වේ. සටන් විරාම ගිවිසුමෙන් පසු ආරවුල් සංඛ්‍යාව වැඩි වී ඇති බව ගම් වැසියෝ පවසති.

## සිද්ධි අධ්‍යයන 14

## අක්කරපත්තු සහ අලෙයියාදිවෙම්බු ප්‍රදේශවල ඇති වූ සිද්ධීන්ට කටකතා බලපෑ අයුරු

2002 නොවැම්බරයේ දී ත්‍රීවිල් රථයක් සැහෙන වේලාවක් එක ම ස්ථානයේ නවත්වා තිබීමට හේතු වී ඇත්තේ එහි මුස්ලිම් රියදුරා එල්ටීටීඊ ය විසින් පැහැර ගෙන යන ලද නිසාය යන කටකතාව අක්කරපත්තුව නගරය පුරා පැතිර ගියේ ය. තත්ත්වය කෙතරම් උග්‍රවී ද යත්, දෙමළ වැසියන්ට ප්‍රසිද්ධ පාරවල ගමන් කිරීම අපහසු වීම නිසා මුස්ලිම් ප්‍රදේශ හරහා යෑමට සිදුවිය. මුස්ලිම් ජනතාවට ද එම ඉරණමට ම මුහුණ පෑමට සිදුවිණි. තම මිතුරෙකු හමුවීමට ගිය බව පැවසූ ත්‍රීරෝද රියදුරා පසු දින ආපසු පැමිණීම නිසා තත්ත්වය සමහන් විය.

පසු දින තවත් සිද්ධියක් ඇතිවිය. මුස්ලිම් පළාතක් වූ අලෙයියාඩිවෙම්බු ප්‍රදේශයේ ඉගෙනුම ලබන දෙමළ ශිෂ්‍යාවක් සවස පන්ති නිම වී ආපසු ගෙදර නා බවට කටකතාවක් පැතිරිණි. දෙමළ තරුණිය පැහැර ගෙන මුස්ලිම් තරුණයින් විසින් දූෂණය කර ඇති බවට රාත්‍රිය වන විට විවිධාකාරයේ කටකතා දසත පුරා පැතිරෙන්නට විය. ගැටුම්කාරී පරිසරයක් ගොඩනැගෙමින් තිබුණ අතර ඒ හේතුවෙන් නගර දෙක අතර මුස්ලිම් හා දෙමළ ජාතිකයින්ට සැරසැරීම පවා අපහසු විය. පැතිරී ගිය කටකතාව අමූලික බොරුවක් බව පසුව හෙළිවිය. ගැටුම්කාරී පසුබිම සමහන් කිරීමට හෝ කටකතාවල ස්වභාවය පිළිබඳ දැනුවත් කිරීම සඳහා රාජ්‍ය නො වන සංවිධාන හෝ මුස්ලිම් දේවස්ථාන කමිටුව ක්‍රියා කළේ නැත.

එල්ටීටීඊ යේ බදු අය කරගැනීම සහ පැහැර ගැනීමේ ක්‍රියාවන් නිසා අන්තර් වාර්ගික ගැටුම් ගණනාවක් ම හටගැනිණි. අම්පාරේ මුස්ලිම් ජනතාව ගෙන් එල්ටීටීඊ ය බදු අය කරගත් අතර, මුස්ලිම් වරුන් සුළු ප්‍රමාණයක් එයට අවනත වූ හ. බදු ගෙවීම ප්‍රතික්ෂේප කළ හා ප්‍රමාද කළ වෙළඳුන් සහ එල්ටීටීඊ ය අතර ආරවුල් හා ගැටුම් හටගැනුණි. එම වෙළෙන්දෝ පොලීසියට හා සටන් විරාම කමිටුවට මේ සම්බන්ධයෙන් පැමිණිලි කළ හ.

මුස්ලිම් වරුන්ට අයත් විශාල කුඹුරු පිහිටා ඇති අලයාදිවෙම්බු ප්‍රදේශයේ ගැටුම්කාරී පසුබිමක් උදා විය. අසීමිත වශයෙන් අයබදු සඳහා එල්ටීටීඊ ය බලපෑම් කර සිටින බව හා අයබදු ගෙවීමට අපොහොසත් වන පුද්ගලයින් පැහැරගෙන යන බවට ප්‍රදේශයේ විවිධ කටකතා පැතිරෙන්නට විය. පැනනැගී ඇති තත්ත්වය පැහැදිලි කරදීම සඳහා දිස්ත්‍රික්කයේ රාජ්‍ය නො වන සංවිධාන

නියෝජිතයෙකු අක්කරපත්තු සාම කමිටුවේ ලේකම්වරුන් හමු විය. පසුව, ඔවුන් මේ පිළිබඳ ව එල්ටීටීඊ යේ ප්‍රාදේශීය කාර්යාලයේ බලධාරීන් හමු වූ අවස්ථාවේ දෙමළ ජනතාව ගෙන් ද බදු අයකරන බවත්, නො ගෙවන අයට තර්ජන කිසිවක් එල්ල කර නො මැති බවත්, පවසා ඇතැ යි වාර්තා වේ.

## 3:1 සාම ප්‍රයත්නය සහ ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය

වාර්ගික ජන කොටස් අතර හටගන්නා ගැටුම් නිරාකරණය කිරීම සඳහා රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කර ඇති කමිටු කරා ජනතාව ප්‍රවේශ වේ. (සිද්ධි අධ්‍යයන 15 සහ 16 බලන්න.) මෙම සාම ක්‍රියාමාර්ගයන් ගේ අරමුණ වී ඇත්තේ ගැටලු නිරාකරණය කිරීම හරහා විවිධ ජන කොටස් අතර සුහදතාව තහවුරු කිරීම ය. මේ සම්බන්ධයෙන් මහජනතාව පෙරමුණ ගෙන කටයුතු කරයි. කල්මුනේ සාම පදනම සහ අක්කරපත්තු සාම පදනම මෙම සාම ප්‍රයත්නය සාක්ෂාත් කරගැනීමේ ප්‍රධාන සංවිධාන දෙකකි.

### *සිද්ධි අධ්‍යයන 15*

### *කල්මුණේ සාම පදනම*

1990 දී හටගත් ජනවාර්ගික අර්බුදයත් සමඟ ම කල්මුණේ ප්‍රදේශයේ සිංහල, දෙමළ සහ මුස්ලිම් විද්වතුන්, වෘත්තිකයින්, සමාජ සේවකයින් සහ ආගමික ප්‍රභූන් ගෙන් සමන්විත 50 දෙනෙකු ගෙන් යුත් කණ්ඩායමක් පිහිටුවන ලදී.

සන්නිවේදනය, ගැටුම් නිරාකරණය සහ සාමය පිළිබඳ ව දැනුවත්වීම යන විෂයන්හි ක්ෂේත්‍ර නිලධාරීන් සහ නියාමකයින් පුහුණු කරනු ලැබූ හ. ඔවුහු දැනට අම්පාර දිස්ත්‍රික්කයේ ගම් 18 ක සේවය කරති. මායිම් ගම්වල පදිංචිකරුවන් හමු වී සාකච්ඡා පැවැත්වීම සඳහා සියලු ජන කොටස් නියෝජනය වන අයුරින් කල්මුණේ සාම පදනම විසින් පුහුණු කරන ලද නියාමක වරුන් පිටත් කර යවන ලදී. සාමාන්‍යයෙන් වාර්ගික අර්බුද හා හිංසාවාදී ක්‍රියාවන් ආරම්භයේ දී ම වැඩි වශයෙන් විපතට පත්වන්නේ මායිම් ප්‍රදේශවල ජීවත්වන ජනතාවයි. මුල දී මොවුන් සමඟ සම්බන්ධවීම අපහසු වුවත්, පසුව සෑම ගමකම පාහේ ක්‍රීඩා සහ සංස්කෘතික උත්සව පැවැත්වීමටත්, පෙර පාසල් ආරම්භ කිරීමටත් හැකියාව ලැබුණි. ජනවාර්ගික කොටස් අතර සාමය සහ සංහිඳියාව තහවුරු කිරීමේ අභිලාෂයෙන්, විවිධ ජන කොටස් නියෝජනය වන සේ ප්‍රදේශයේ උපදේශන කමිටුවක් පිහිටුවීමට කටයුතු කරන ලදී. කල්මුණේ සාම පදනම්

බල ප්‍රදේශය තුළ සියලු ම ගම්වල මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන ලදී. දැනට උපදේශක කමිටු 09 ක් ක්‍රියාත්මක වේ. මෙම කමිටුවේ සාමාජිකත්වය පිරිමින්ට පමණක් සීමා වී ඇත. කාන්තා කණ්ඩායම් සහ තරුණ කණ්ඩායම් ද ගම් ප්‍රදේශයන් හි පිහිටුවා තිබේ.

කල්මුණේ සාම පදනමට අයත් ප්‍රධාන කමිටුව විසින් සාම වැඩසටහන් සැලසුම් කර සංවිධානය කරනවාත් හැර, ගම් මට්ටමින් තවමත් විසඳී නො මැති ආරවුල් විසඳනු ලබයි. මෙය සාමාජිකයින් 22 කින් සැදුම් ලද්දකි. කමිටු සාමාජිකයින් විසින් සභාපති, භාණ්ඩාගාරික සහ ප්‍රධාන ලේකම් තනතුරුවලට පුද්ගලයින් පත්කරනු ලබයි. ජනවාර්ගික සමබරතාව රැකීම සඳහා අතිරේක සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික තනතුරු ඇති කර තිබේ. ගම් උපදේශන කමිටුව ගම්වල හෝ ගම් කීපයක් අතර හටගන්නා අන්තර් ජනවාර්ගික ගැටලු එක්කෝ විසඳයි; නැතහොත් බේරුම් කිරීම සඳහා වැදගත් වේ. ගැටලු විසඳීමට අපොහොසත් වන අවස්ථාවන් හි දී එම ගැටලු ක්ෂේත්‍ර නිලධාරියා මාර්ගයෙන් මහ කමිටුව වෙත යොමු කරනු ලැබේ. කාන්තා සහ තරුණ උප කණ්ඩායම්වලට සම්බන්ධ ගැටලු සාකච්ඡාවට ගැනෙන රැස්වීම්වලට ක්ෂේත්‍ර නිලධාරීහු සහභාගි වෙති. 2001 වසරේ දී වැටුපක් ලැබෙන තෙක් කල්මුණේ සාම පදනමේ සාමාජිකයෝ තම රාජකාරිය ස්වේච්ඡාවෙන් ඉටුකළ හ.

## සිද්ධි අධ්‍යයන 16

## අක්කරපත්තු සාම පදනම

අක්කරපත්තු සහ අලයාදිවේම්බු ප්‍රදේශවල දෙමළ සහ මුස්ලිම් ජනතාව අතර හටගන්නා ආරවුල් විසඳීමේ අරමුණින් අක්කරපත්තු සාම පදනම පිහිටුවන ලදී. සාමාජිකයින් එකොළොස් දෙනෙකු ගෙන් සමන්විත මෙම සංවිධනය දෙමළ සහ මුස්ලිම් ජන කොටස් නියෝජනය වන අයුරින් සභාපති, සම ලේකම්වරු සහ කමිටු සාමාජිකයින් ගෙන් සැදී තිබේ. මෙය රාජ්‍ය නො වන සංවිධානයක් ලෙස ලියාපදිංචි කර ඇති අතර දැන් අකර්මන්‍යව පවතී.

ගැටුම්වලට තුඩු දුන් හේතු හඳුනා ගැනීමෙන් පසුව මෙම පදනම ආගමික නායකයින්, රාජ්‍ය නො වන සංවිධානවල නියෝජිතයින්, ප්‍රදේශයේ දේශපාලන පක්ෂවල නියෝජිතයින්, පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්, පොලීසිය සහ එල්ටීටීඊ ය සමඟ ආරවුල් නිරාකරණය කිරීම සඳහා විවිධ සාකච්ඡා පවත්වා තිබේ. බොරු කටකතා නිසා හටගන්නා ගැටුම්කාරී

තත්ත්වයන්ට මුල් වූ හේතු පැහැදිලි කිරීම සඳහා ඔවුන් දැනුවත් කිරීමේ රැස්වීම් පවත්වා තිබේ.

## 3:2 රාජ්‍ය නො වන සංවිධාන දැරූ වෙනත් ප්‍රයත්නයන්

සංවර්ධන හෝ ඉතිරි කිරීම් හරහා ණයදීමේ ව්‍යාපෘති, ස්වයං රැකියා. කෘෂි සංවර්ධන සහ කාන්තාවන් දැනුවත් කිරීමේ යෝජනා ක්‍රම වැනි වෙනත් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති ග්‍රාමීය කණ්ඩායම් පුද්ගලයින් පවුල් සහ විවිධ ජන කොටස් අතර හටගැනෙන ආරවුල් නිරාකරණය කිරීමේ ලා උදෙ‍්‍යාගයෙන් ක්‍රියා කරති. මුස්ලිම් ගම්වල දුගී දුප්පත් කාන්තාවන් වෙනුවෙන් ඇප කැප වී කටයුතු කරන අල් කුරිෂ් සමා සංවර්ධන ආයතනය ස්වයං රැකියා සඳහා ඉතිරි කිරීමේ හා ණය දීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගම්වල විශේෂ කණ්ඩායම් පිහිටුවා තිබේ. ජන කොටස් අතර හටගන්නා විවිධ ආරවුල් සමනය කිරීමේ ලා ඔවුන් ක්‍රියා කරන අවස්ථා ද ඇත. එ වැනි අවස්ථාවල දී ආරවුල් නිරාකරණය කිරීමට අපොහොසත් වුවහොත්, ආරවුලට සම්බන්ධ පාර්ශ්ව කරුවන්ට මුස්ලිම් දේවස්ථාන කමිටුවේ හෝ පොලීසියේ සහය පතන ලෙස ද උපදෙස් දෙනු ඇත. වාර්ගික ගැටුම්වල දී ප්‍රධාන වශයෙන් සම්බන්ධ වන තරුණ කොටස් දායක කරගෙන සිංහල, දෙමළ හා මුස්ලිම් ජන කොටස් අතර හටගන්නා ආරවුල් සමනය කිරීම සඳහා ඔවුන් සාම වැඩසටහන් දියත් කර තිබේ. මෙම සංවිධානය විසින් ගම් අතර මායිම් ප්‍රදේශයන් හි පදිංචි තරුණයින් ගෙන් සමන්විත අල්කුරිෂ් තරුණ සාම බලකායක් පිහිටුවා ඇති අතර ඔවුන්ට නායකත්වය, සන්නිවේදනය, සාමය පිළිබඳ දැනුවත් කිරීම, ගැටුම් නිරාකරණය කිරීම යනාදිය සම්බන්ධයෙන් පුහුණුවක් ද ලබා දී තිබේ. ඔවුන්ට රාජ්‍ය නො වන සංවිධානයෙන් උපදෙස් හා සහයෝගය ලැබෙන අතර, ස්වකීය පවුලේ සාමාජිකයින් ගේ ඉරියව් වෙනස් කිරීම සඳහා ඔවුහු පරිශ්‍රම දරමින් සිටිති.

## *සිද්ධි අධ්‍යයන 17*

## *කුකුළු පැටවුන් සොරකම් කිරීම : කල්මුණේ දෙමළ කොට්ඨාසයේ නත්පද්දිමුනෙයි සහ සෙනායිකුදියුරිප්පු ප්‍රදේශ*

පහත සඳහන් සිද්ධිය සාකච්ඡාවට බඳුන් වූ කල්මුණේ සාම පදනමේ කමිටු රැස්වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂණ නිලධාරීහු සහභාගි වූ හ. පසුව අදාල ගම් දෙකට පැමිණි පර්යේෂණ කණ්ඩායම, සිද්ධියට සම්බන්ධ පාර්ශ්වයන් සමඟ සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වී ය.

නත්පද්දිමුනෙයි ග්‍රාමයේ මුස්ලිම් බහුතරයක් (පවුල් 1400) සහ දෙමළ සුළුතරයක් (පවුල් 100) ජීවත් වන අතර, සෙනායිකුදියුරිප්පු ග්‍රාමයේ දෙමළ බහුතරයක් (පවුල් 500) සහ මුස්ලිම් සුළුතරයක් (පවුල් 25) සිටිති. ගම පිහිටා ඇති ආකාරය අනුව දෙමළ හා මුස්ලිම්වරුන්ට නගරයට හෝ ගොවිතැන් කරන කුඹුරු වෙත යෑමට සිදු වී ඇත්තේ ඔවුනොවුන් ගේ ගම්බිම් හරහා ය. එ බැවින් ගැටුම්කාරී තත්ත්වයන් උද්ගතවන අවස්ථාවල දී දෙමළ හා මුස්ලිම් ජාතිකයින්ට හුදෙක් තම ගෙවල් දොරවල් තුළට කොටු වී සිටීමට සිදු වී තිබේ. නත්පද්දිමුනෙයි පිහිටුවා ඇති ප්‍රදේශයේ උපදේශක කමිටුවේ සම සභාපතිවරයා ගේ (එක්ස්) නිවසේ දී 2002 වසරේ නොවැම්බරයේ හටගත් සිද්ධියකින් කල්මුණේ සාම පදනම මුහුණ පෑ ගැටලු සහ එය සතු ශක්තිය පෙන්නුම් කරයි. සම සභාපතිවරයා ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථාන කමිටුවේ සභාපතිවරයා ද වේ.

මධ්‍යම රාත්‍රියේ දී මුස්ලිම් ළමුන් දෙදෙනෙක් හා එක් දෙමළ ළමයෙක්, ‘එක්ස්’ ගේ නිවසින් කුකුළු පැටවකු සොරකම් කිරීමට උත්සාහ දැරූ හ. බල්ලකු බුරන ශබ්දයක් ඇසී ඒ ගැන පරීක්ෂා කර බැලූ ‘එක්ස්’ට, ‘වයි’ දැකගත හැකි වූ අතර මුස්ලිම් ළමුන් දෙදෙනා සැඟවී සිටිය හ. එහෙත් ගමේ සන්නද්ධ කල්ලි සම්බන්ධයෙන් පැතිරී පවත්නා බිය නිසා ‘එක්ස්’, ‘වයි’ අල්ලා ගැනීමට පසුබට විය. මේ අතර ‘එක්ස්’ ගේ බිරිය විදුලි පහනක් දැල්වීම නිසා ආලෝකය පැතිරිණි. තර්ජනාත්මක විලාසයෙන් පිස්තෝලය ගැනීමට සූදානම් වන අයුරින් වයි, තමා එල්ටීටීඊ සාමාජිකයෙකු බවත්, එල්ටීටීඊ යේ ප්‍රාදේශීය නායක කරිකාලන් ගේ උපන් දිනය සැමරීමේ උත්සවය සඳහා කුකුළු පැටවා සොරකම් කළ බවත් පැවසී ය.

සොරකම් නො කර, තමා ගෙන් කුකුළු පැටියකු ඉල්ලුවේ නම්, තම මස්සිනා ගේ නිවෙසින් කුකුළු පැටියකු ලබා දෙන බව එක්ස් ඉතා කරුණාවෙන් පවසා සිටී ය. පසුව සිය මස්සිනා ගේ ආධාරය ඇතිව ‘එක්ස්’, ‘වයිව’ අල්ලා ගසක බැඳ තැබී ය. ‘එක්ස්’ ගේ පැමිණිල්ල විභාග කළ මුස්ලිම් දේවස්ථාන කමිටුව ‘වයි’ පොලීසිය වෙත භාර දෙන ලෙස යෝජනා කළේ ය. එහෙත් ප්‍රදේශයේ උපදේශක කමිටුව පහත සඳහන් හේතු නිසා ‘වයි’ එල්ටීටීඊයට භාර දෙන ලෙස තීරණය කළේ ය.

⋆ තමා එල්ටීටීඊ යේ සාමාජිකයෙකු බවත්, එ බැවින් කරිකාලන් ගේ උපන්දින උත්සවය සඳහා කුකුළු පැටවා සොරකම් කළ බව කියා සිටි නිසාත්, මෙම සිද්ධිය පිළිබඳ සුදුසු පරිදි ක්‍රියාකිරීම සඳහා එල්ටීටීඊ ය වෙත යොමු කිරීම යෝග්‍ය ය.

⋆ ‘වයි’ දෙමළ ජාතිකයෙකු බැවින් ඔහු පොලීසියට බාර දුනහොත් එමගින් වඩ වඩාත් ගැටලු ඇතිවීමට ඉඩකඩ තිබේ.

‘වයි’ එල්ටීටීඊ යට භාරදීමෙන් පසු ඔවුහු ඉතිරි මුස්ලිම් ළමුන් දෙදෙනා ද අත්අඩංගුවට ගතහ. එවට එම ළමුන් දෙදෙනා ගේ දෙමව්පියෝ තම ළමුන් මුස්ලිම් දේවස්ථාන කමිටුව විසින් එල්ටීටීඊ යට භාර දුන් බවට පොලීසියට පැමිණිලි කළ හ. පොලීසිය දේවස්ථාන කමිටුවේ ලේකම් සහ උප සභාපති අත්අඩංගුවට ගත්තේ ය. මේ අවස්ථාවේ දී ඉදිරිපත් වූ කල්මුණේ සාම පදනම සිද්ධිය පොලීසිය සහ එල්ටීටීඊ ය සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව අවසානයේ දී අත්අඩංගුවට ගත් සියලු දෙනා ම නිදහස් කරීම දක්වා ක්‍රියා කළේ ය.

ජන කොටස් දෙක අතර පැනනගින ගැටලු නිරාකරණය කිරීම සඳහා කල්මුණේ සාම පදනම මහජනතාව සමඟ ඉතා සමීපව ක්‍රියා කළේ ය. මෙම සිද්ධිය වැනි විවිධ සොරකම් ප්‍රදේශයේ කලින් ද සිදු වුණ අතර, ඒවාට එල්ටීටීඊ සාමාජිකයින් සම්බන්ධ බව විශ්වාස කළේ යයි ප්‍රදේශවාසී හු පැවසූ හ. මේ සිද්ධියෙන් මැනවින් අනාවරණය වූයේ, ප්‍රදේශයේ කෙරෙන සොරකම් සම්බන්ධයෙන් වගකිවයුත්තේ කවුද යන්නයි. එසේ ම එමඟින් වාර්ගික ගැටුම්වලට තුඩු දෙන තත්ත්වයන් පහ කිරීමට ද ඉඩ සැලසුණි.

## 4. ගැටුම් නිරාකරණය කිරීමේ අවධිමත් යාන්ත්‍රණය සහ වාර්ගික අනන්‍යතාව

සහෝදර සහෝදරියන්, අඹු සැමියන් සහ අනෙකුත් විවිධ පුද්ගලයින් අතර ගෘහස්ථ ආරවුල් ඉතා බහුල වශයෙන් සිදු වේ. ඉඩම් මායිම් පිළිබඳ ගැටලු එතරම් නො මැත. එහෙත් මුදල් ගනුදෙනු, ණය වැනි පවුලේ සාමාජිකයින් අතර ඇති වතු ප්‍රශ්න සහ පවුල් අතර හටගන්නා ආරවුල් වැඩිවෙමින් පවතී.

සත්‍ය මෙන් ම, ගොතන ලද අතුරුදහන් වීම් හෝ පුද්ගල පහරදීම් වැනි සිද්ධි හැරුණු විට සතුන් සොරකම් කිරීම් සම්බන්ධයෙන් ද ආරවුල් පැනනැඟිණි. මේ ආරවුල් වලට ප්‍රතිචාර වශයෙන් ජන කොටස් ස්වකීය වාර්ගික අනන්‍යතාවට අනුකූලව ගැටුම් සමහන් කිරීමේ විවිධ ක්‍රමෝපායන් යොදා ගනිති.

### 4:1 අම්පාර මුස්ලිම් ප්‍රජාව

අම්පාර මුස්ලිම් ප්‍රදේශවල හටගන්නා අරමුදල් සම්බන්ධයෙන් එහි සෑම මුස්ලිම් ගමක ම පිහිටුවා ඇති මුස්ලිම් දේවස්ථාන කමිටු විසින් ක්‍රියාකරනු

ලැබේ. පුද්ගලයින්, පවුල්, ගම්, ජනවාර්ගික කොටස්, එල්ටීටීඊ ය හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමග හෝ වේවා පවතින ආරවුල් නිරාකරණය කරගැනීම සඳහා මුස්ලිම් දේවස්ථාන කමිටු වෙත යොමු කරනු ලැබේ. ඉඩම්, ඉඩම් බෙදීම සහ පවුලේ ඉඩම් උරුමය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් මතුවන පැමිණිලි ද දේවස්ථාන කමිටු වෙත යොමු කෙරේ.

ඉතා විරල අවස්ථාවන් හි දී පමණක් පැමිණිලි කරුවන්, දේවස්ථාන කමිටු හෝ පොලීසිය විසින් ආරවුල් සමථ මණ්ඩල වලට යොමුකරනු ඇත. ඉඩම්වල මායිම් මැන දේවස්ථාන කමිටුවට විසඳිය නො හැකි ආරවුල් සමථ මණ්ඩල වෙත යොමු කෙරේ. සමථ මණ්ඩලවල තීරණවලට සැලකීමක් නො දක්වන ආරවුල්වලට සම්බන්ධ වූ පිරිස් එක්තරා කාලසීමාවක් සඳහා දේවස්ථාන කමිටුව විසින් සමාජයෙන් හුදකලා කර තබනු ලැබේ. එනම් දේවස්ථානයේ යාඥා කටයුතු වලට එම පුද්ගලයින් ගේ සහභාගිත්වය සීමා කරනු ඇත.

ඇතැම් දේවස්ථාන කමිටු ප්‍රධානීහු දේශපාලන වශයෙන් නැඹුරුතාවක් පෙන්වන්නෝ වෙති. විවිධ දේශපාලන පක්ෂයන්ට සම්බන්ධ පවුල් අතර පැනනගින ආරවුල්වල දී දේවස්ථාන කමිටු නායකත්වය නැඹුරු වී සිටින දේශපාලන පක්ෂයේ පුද්ගලයින්ට වාසිදායක වන අන්දමේ තීන්දුවක් ලැබීම අසාමාන්‍ය දෙයක් නො වේ.

## 4:2 අම්පාර දෙමළ ප්‍රජාව

දෙමළ ප්‍රදේශවල හටගන්නා ආරවුල්වල දී ඒවාට සම්බන්ධ පාර්ශ්වකරුවෝ සාමාන්‍යයෙන් ආරම්භයේ දී ම රාජ්‍ය නො වන සංවිධානයන් හෝ කෝවිල් භාරකාර කමිටු වෙත ප්‍රවිශ්ට වෙති. පවුලේ සාමාජිකයින් අතර ඉඩම් බෙදාදීම සහ මායිම් වෙන් කරමින් තනනු ලබන වැටවල් සම්බන්ධයෙන් පැනනගින ආරවුල් කෝවිල් භාරකාර කමිටු හෝ සමථ මණ්ඩල වෙත යොමු කරනු ලැබේ.

ගෘහස්ත කරුණු කේන්ද්‍ර කොටගත් ආරවුල් හා කාන්තාවන් පිළිබඳ ප්‍රශ්න ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන සංවිධාන විසින් ගම් ප්‍රදේශවල පිහිටුවා ඇති විශේෂ කණ්ඩායම් වෙත හෝ ක්ෂේත්‍ර නිලධාරීන් හරහා එම සංවිධාන වෙත ම පවරා ගනු ලැබේ. අඹු සැමියන් අතර හටගන්නා සුළු ආරවුල් රාජ්‍ය නො වන සංවිධාන විසින් පිහිටුවා ඇති ප්‍රදේශයේ විශේෂ කණ්ඩායම්වල රැස්වීම්වල දී සාකච්ඡා කර විසඳීම සඳහා හෝ උපදෙස් ලබාදීම පිණිස කටයුතු කරයි.

ප්‍රමාණවත් ග්‍රාමසේවා නිලධාරීන් සංඛ්‍යාව නො මැති වීම නිසා ඇතැම් දෙමළ ගම්වල වැසියන් තමන් ගේ මූලිකත්වය යටතේ තම ප්‍රජා අවශ්‍යතා සහ

ගැටලු ගැන සොයාබැලීම සඳහා පදිංචි ගම් ප්‍රදේශවල කණ්ඩායම් පිහිටුවා තිබේ. තරුණ පිරිස් සාමාජිකයින් වශයෙන් කටයුතු කරන මෙම කණ්ඩායම්වලට ප්‍රදේශයේ ප්‍රභූවරයෙක් නායකත්වය ගෙන ක්‍රියා කරමින් අවශ්‍ය උපදෙස් ලබාදෙනු ලැබේ. බොහෝ අවස්ථාවල එම ගම් ප්‍රධානියා ගේ බසට අනෙක් පිරිස් කන්දෙනු ඇත. මෙම කණ්ඩායම්වල ඇතැම් සාමාජිකයෝ සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු එල්ටීටීඊ ය අත්හැර ආපසු පැමිණ දැන් තම තමන් ගේ පවුල්වල කටයුතුවලට සම්බන්ධ වී සිටිති. ග්‍රාමසේවා නිලධාරී සහ එල්ටීටීඊ ප්‍රාදේශික නායකයා මෙම කමිටුවල සම්බන්ධීකරණ කටයුතුවලට උපකාරී වේ. එම කණ්ඩායම් තම ජන කොටස්වලට සම්බන්ධ ප්‍රශ්න නිරාකරණය කිරීමට සමත් වී සිටිති. (සිද්ධි අධ්‍යයන 18 බලන්න.)

සමහර කමිටු ඒවා සතු කාර්යයභාරය එල්ටීටීඊ යේ සාමාජිකයෙකුට හෝ එල්ටීටීඊ රණවිරුවෙකුට හෝ සමහර අවස්ථාවල දේශපාලන පක්ෂයකට අයත් ගමේ ප්‍රධානියකු වෙත හෝ පවරනු ඇත. මෙසේ කිරීමට හේතුව වී ඇත්තේ මෙම පුද්ගලයින් දේශපාලන වශයෙන් විවිධ සම්බන්ධතා පවත්වන බැවින් ගමේ ගැටලු සාර්ථක අයුරින් විසඳාගත හැකි ය යන විශ්වාසයයි.

සමහර ගම්වල කෝවිල් භාරකාර මණ්ඩල නිලධාරීහු කණ්ඩායම් නායකයින් වශයෙන් ද කටයුතු කරති. කෝවිල් භාරකාර මණ්ඩල නිලධාරීන් ඉඩම් හිමිකරුවන් වන අතර ඔවුන් මහජනයා විසින් තෝරා පත් කෙරේ. තම සැමියන් සමඟ මතභේද ඇති කරගත් බිරියන්ට, සැමියන් සමඟ ම ජීවත් වන ලෙස උපදෙස් දෙන අතර එයට අවනත නො වන කාන්තාවන්ට තම මව්පියන් වෙත ආපසු යාමට සිදු වේ. සමහර අවස්ථාවල කෝවිල් භාරකාර මණ්ඩල බිරියන්ට පමණක් නො ව ඔවුන් ගේ සැමියන්ට ද අවශ්‍ය උපදෙස් හා අනුශාසනා පවත්වනු ලැබේ. සහනය පතා සංවිධානවල උපදෙස් පතන කාන්තාවන්ට පමණක් දික්කසාද වීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි ය.

රජයේ පාලන පෙදෙස්වල එල්ටීටීඊ දේශපාලන කාර්යාල පිහිටුවීමත් සමඟ ම වැසියන් අතර මතුවන ගැටලු බහුල වශයෙන් එල්ටීටීඊ සාමාජිකයින් වෙත යොමු කරනු ලැබේ. ඉඩම් පිළිබඳ පවුලේ ආරවුල්, හෝ ශාරීරික පීඩා, ගුටි බැට දීම් යනාදිය මේ අතුරින් විශේෂ වේ. විශේෂයෙන් එල්ටීටීඊ සාමාජිකයන් හෝ රණවිරුවන් සම්බන්ධ නඩු පිළිබඳ ව එල්ටීටීඊ ය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. සාමාන්‍ය ජනතාවට තම පැමිණිලි පොලීසිය වෙත යොමු කරන සේ උපදෙස් ලැබේ. පැමිණිල්ලක් කිරීම සඳහා පොලීසියට පැමිණි ඇතැම් පුද්ගලයින්ට එල්ටීටීඊ ය වෙත යන ලෙස උපදෙස් දුන් අවස්ථා ද නැත්තේ නො වේ.

ප්‍රේම සම්බන්ධතා, ලිංගික පීඩා ආදී ආරවුල් වලට සම්බන්ධ එල්ටීටීඊ සාමාජිකයින් පිළිබඳ ව වහාම ක්‍රියා කරන බව පවසා එල්ටීටීඊ ප්‍රාදේශීය කාර්යාල

විසින් පැමිණිලි භාරගනු ලබන මුත් ඒ පිළිබඳ ව ක්‍රියාකරනු ලබන්නේ කලාතුරකිනි. විකල්ප වශයෙන්, පොලීසිය වෙත යන පැමිණිලිකරුවන්ට අත්වන්නේ ද එම ඉරණමයි. එම පැමිණිලි සටන් විරාම කමිටුවේ දෙමළ නියෝජිතයින් වෙත දැන් වූ විට ඒවා යළි රාජ්‍ය ආයතන හෝ එල්ටීටීඊ ය වෙත යොමු කිරීම සඳහා පැමිණිලි කරුවන්ට උපදෙස් ලැබෙයි.

## 4:3 අම්පාර සිංහල ප්‍රජාව

තම ප්‍රජාව තුළ ඇතිවන ආරවුල් සම්බන්ධයෙන් සිංහල ජනතාව ගමේ පන්සලේ නායක ස්ථවීරයන් ගේ හෝ පොලීසිය හා ග්‍රාමසේවා නිලධාරීන් ගේ උපදෙස් පතති.

සමහර රාජ්‍ය නො වන සංවිධාන ඉතිරි කිරීමේ හා ණය දීමේ යෝජනා ක්‍රම, ස්වයං රැකියා සහ කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති ගම් ඇතුළත ආරම්භ කර ඇති අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපකාරී වීම සඳහා එම ගම්වල කණ්ඩායම් සංවිධාන කර තිබේ. ගමේ මට්ටමින් ගැටලු විසඳීම අපහසු වන අවස්ථාවල දී විහාරාධිපතීන් වහන්සේ ගේ මැදහත්වීම සිදු වේ. ගෘහස්ථ ආරවුල් හා පවුලේ සාමාජිකයින් අතර ඉඩම් බෙදාදීමේ ප්‍රශ්න ග්‍රාමසේවා නිලධාරී වෙත යොමුකරනු ලැබේ. ඒවා විසඳීමට ඔහු අසමත්වන අවස්ථාවල දී ගමේ පන්සල හෝ පොලීසිය ඒවාට මැදිහත් වේ. පොලීසිය එම පැමිණිලි යළි ගමේ පන්සල වෙතට යොමු කරයි. ග්‍රාමාරක්ෂකයෝ තමන් වෙත ගෙන එන පැමිණිලි පොලීසියට යොමු කරති. විදුහල්පති වරුන්, ගුරුවරුන් සහ සාම්ප්‍රදායික බලි තොවිල් කරුවන් පවා අඩංගුවන ග්‍රාමසේවා නිලධාරීන් විසින් පිහිටුවා ඇති ග්‍රාම සංවර්ධන සමිති ගැටලු නිරාකරණය කිරීමේ දී සක්‍රියව කටයුතු කරති. බොහෝ ගම්වල ගමේ භික්ෂූන් වහන්සේ ග්‍රාම සංවර්ධන සමිතිවල උපදේශන වශයෙන් ක්‍රියා කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ ආරවුල් විසඳීමේ දී විහාරාධිපතීන් වහන්සේ වැදගත් කාර්යයභාරයක් ඉටුකරති. සිංහල ගම් දෙකක් අතර ඇති වන ආරවුල් වල දී එම ගම් දෙකේ භික්ෂූන් වහන්සේලා තම වැසියන් සමඟ විසඳුමක් පතා අම්පාර මහා විහාරයේ නායක ස්වාමීන් වහන්සේ වෙත පැමිණෙති. උන් වහන්සේ දෙපක්ෂය රැස්වීමකට කැඳවා ගැටුම නිරාකරණය කරති.

## *සිද්ධි අධ්‍යයන 18*

## *අලයාදිවෙම්බු හි මහා ශක්ති ග්‍රාමය*

සන්නද්ධ අරගල නිසා 1998 දී අම්පාර දිස්ත්‍රික්කයේ අවතැන් වූ පවුල් 48 ක් මහාශක්ති නම් සංවිධානයක් මගින් මහ ශක්ති නමැති අලුත් ග්‍රාමයක පදිංචි කරන ලදී. හුදෙක් ඉතිරි කිරීමේ හා ණය දීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මහශක්ති සංවිධානය විසින් කාන්තා සමිතියක් පිහිටුවා තිබේ. පර්යේෂණ කණ්ඩායම මහ ශක්ති සංවිධානයේ සේවක මණ්ඩලය සම්මුඛ පරීක්ෂණයට ලක් කළ අවස්ථාවේ, ගම තුළ ආරවුල් කිසිවක් නො මැති බව ඔවුහු පැවසූ හ. එහෙත් ඉදහිට අභිකුණ්ඨිකයින්ට පොදු ළිං පාවිච්චි කිරීමට ඉඩ නොදීම වැනි ප්‍රශ්න මතුවන බවත් ඔවුහු සඳහන් කළ හ. පවුල් 48 කින් 8 ක් අභිකුණ්ඨික පවුල් වෙති. අභිකුණ්ඨික කාන්තාවන් දෙදෙනෙක් මහ ශක්ති කාන්තා සමිතියේ සාමාජිකයන් වන අතර එක් අභිකුණ්ඨික පිරිමියෙකු ගම් ප්‍රදේශයේ පිහිටුවා ඇති කණ්ඩායමේ සාමාජිකයෙකි.

අභිකුන්ඨිකයින් සම්බන්ධ ගැටලු කිසිවක් නැති බව ගම් වැසියෝ පැවසූ හ. කෙසේ වුව ද, වැඩිදුරටත් කරුණු පරීක්ෂා කිරීමේ දී ඇතැම් ආරවුල් හටගෙන ඇති බව හෙළිදරව් වූ අතර, ඒවා ගමේ කණ්ඩායමක් විසින් විසඳා ඇත. එබඳු ආරවුලක් මෙහි පහත දැක් වේ.

"එක්ස් සහ වයි දෙනැනන් අතර ආරවුලක් හට ගත්තේ ය. 'එක්ස්' වසර හයක් ම මැද පෙරදිග ගෘහ සේවයේ නියුතුව සිටි අතර ඇය ගේ පුත්‍රයා 'වයි' ගේ සෙවනේ ජීවත් විය. තමා සඳහා ඉඩමක් මිල දී ගන්නා ලෙස දන්වමින් 'එක්ස්' පිටරට සිට 'වයි' වෙත මුදල් එවූ අතර 'වයි' තමා ගේ නමින් එම මුදල් යොදවා ඉඩමක් මිල දී ගත්තා ය. 'එක්ස්' ආපසු ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ, මිල දී ගත් ඉඩමේ ලියකියවිලි ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම 'වයි' ප්‍රතික්ෂේප කළා ය. ඒ සඳහා ඇය ගෙනහැර දැක් වූ හේතු මෙසේ යි;

⋆ උකසට තබා මුදල් ලබාගැනීම සඳහා තම පුත්‍රයා සතු රන් මාලයක් 'එක්ස්' වෙත ලබාදුන් මුත්, 'එක්ස්' එම මාලය මෙතෙක් 'වයි' වෙත ලබා දී නැත.

⋆ 'එක්ස්' ගේ පුත්‍රයා බලා කියා ගැනීම වෙනුවෙන් 'වයි' දැන් 'එක්ස්' ගෙන් වියදම් ඉල්ලා සිටී.

දෙපාර්ශ්වය ම තම ආරවුල ගම්සභා වෙතඉදිරිපත් කළ හ. පිරිමි සාමාජිකයින් 15 දෙනෙකු ගෙන් යුත් ගම් ප්‍රදේශයේ සංවිධානයක් 2003

මාර්තුවල දී පිහිටුවන ලද්දේ මෙම ආරවුලට ප්‍රතිචාරයක් වශයෙනි. මෙම සංවිධානය කසිප්පු, පාසල් නොයන ළමුන් සහ පවුල් සම්බන්ධ ප්‍රශ්න වැනි අනෙකුත් ප්‍රජා ගැටලු සම්බන්ධයෙන් ද සිය අවධානය යොමු කරයි. පරීක්ෂණයක් පැවැත් වූ මෙම සංවිධානයට 'එක්ස්' පිටරට සිට තම පුත්‍රයා බලා කියා ගැනීම සඳහා 'වයි' වෙත මුදල් එවා ඇති බැවින් දැන් එම මුදල් සම්බන්ධයෙන් 'වයි' වගකිව යුතු බව අවබෝධ විය. 'එක්ස්' රන් මාලය ආපසු දුන් විට 'වයි' ඉඩමට සම්බන්ධ ලියකියවිලි ආපසු 'එක්ස්' වෙත ලබාදිය යුතු බවට කමිටුව තීරණය කළා ය. ගමේ නායකයින් තම ප්‍රජාව ගේ ගැටලු නිරාකරණය කිරීමේ දී වගවිය යුතු කාර්යයභාරයක් ඉටු කරන අතර එක්ස් හා වයි අතර ආරවුල සාර්ථකව විසඳූ බවක් ද පෙනේ. කමිටුවේ තීරණය හුදෙක් වයිට වැඩි වාසි දායක නො වූවත්, මෙ බඳු ගැටලු පොලීසිය හෝ එල්ටීටීඊ ය වෙත යොමු කරනවාට වඩා ගමේ ම පිරිස් වෙතින් නිරාකරණය වීම සතුටට කරුණක් බව 'වයි' ප්‍රකාශ කළා ය.

# වව්නියා දිස්ත්‍රික්කය පිළිබඳ කෙටි විස්තරයක්

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ මෙවලම්

* රාජ්‍ය නො වන සංවිධාන විසින් ආරම්භ කර ඇති ගම්සභා
* මුස්ලිම් දේවස්ථාන කමිටු
* ගැටුම් නිරාකරණය කිරීමේ නිරත වූ පුද්ගලයින් - කඳවුරු නිලධාරීන්, එල්ටීටීඊ ය සහ ග්‍රාමසේවා නිලධාරීන්

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය වව්නියා දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූයේ සීමිත අයුරිනි. ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන් විසින් ම ස්වකීය ගැටලු නිරාකරණය කරගත් බව, පලාත් පාලන නිලධාරීන්, රාජ්‍ය නො වන සංවිධානවල ප්‍රධානීන් සහ පුවත්පත් කලාවේදීන් යන සියලු දෙනාම පැවසූහ.

ගම්වල වැඩිහිටි - මූලික සංවිධාන ඇදවැටීම, තරුණ පිරිස් සන්නද්ධ වීම සහ යුද්ධය නිසා ඇති වූ බලවත් දුෂ්කරතා සහ අවතැන්වීම් හේතුවෙන් මිනිසුන් අකර්මන්‍ය වීම ප්‍රජා මට්ටමින් ගැටලු නිරාකරණය කිරීමේ ක්‍රමෝපායන් නො මැති වීමට හේතුවක් විය.

අනෙක් අතට විවිධ අවතැන් වීම්, තරුණ පිරිස් සන්නද්ධ වීම සහ අර්බුදය හේතුවෙන් හටගත් බිය නිසා ගම්වල සාම්ප්‍රදායික වැඩිහිටියන් ගේ ක්‍රියාකාරකම් ද දුර්වල මට්ටමකට වැටුණි. ඒ නිසා ගම් ප්‍රදේශවල ඇතිවන ආරවුල් එම ආරවුල්වල පාර්ශ්වකරුවන් විසින් ම හෝ හමුදා සහයක කණ්ඩායම්, එල්ටීටීඊ

ය හෝ සන්නද්ධ හමුදා වෙත යොමු කෙරිණි. ඇතැම් ගම්වල වැඩිහිටි පිරිස් වෙනුවට තරුණ කොටස් ඉදිරිපත් වූ අතර අන්‍ය තැන්හි වැඩිහිටි සංවිධාන කිසිත් ක්‍රියාත්මක නො වී ය. සුහසාධක කඳවුරු මෙයට කදිම නිදර්ශණයකි. වව්නියාවේ පමණක් ප්‍රධාන සුහසාධක කඳවුරු නවයක් ඇත. එමෙන් ම පදිංචිකරුවෝ තම ආරවුල් හෝ ගැටලු කඳවුරු බලධාරීන් වෙත යොමු කරති. කඳවුරු වැසියන් ගේ දුක්ගැනවිලි වලට කන්දීම සඳහා එක් ප්‍රධාන කඳවුරක මානව හිමිකම් කොමිසමේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පිහිටුවා තිබේ. ගෘහස්ථ ගැටලු සම්බන්ධයෙන් අවතැන් වූ පවුල් පදිංචි වී සිටින කුඩාරම් වලට යාබද නිවෙස්වල පදිංචි අසල්වැසි ජනතාව මැදිහත් වේ. කඳවුරු වැසියන් සහ අසල්වාසීන් අතර හට ගැනෙන ආරවුල් වලට පොලීසිය, හමුදාව, ග්‍රාමසේවා නිලධාරී හෝ එල්ටීටීඊ ය මැදිහත් වේ. ගමේ ප්‍රධාන මාවතක රංචු පිටින් ගමන් කිරීමේ තම අයිතිය අවධාරණය කළ පුන්කොට්ටම් සුහසාධක මධ්‍යස්ථානයේ තරුණ පිරිසක් සහ අසල්වැසි ගමක තරුණයකු අතර හබයක් ඇතිවිය. තරුණ පිරිසට සණ්ඩු කිරීමෙන් වලකින ලෙස එල්ටීටීඊ ය අවවාද කළ මුත්, ඔවුහු දඹරයකට ම සූදානම් වූ හ. ටෙලෝ, ප්ලොට් වැනි හමුදා සහයක කණ්ඩායම් ගැටුම් නිරාකරණය කිරීමේ ලා වැදගත් කාර්යයභාරයක් ඉටු කරයි.

ගමේ නායකත්වය ගෙන ප්‍රජා අවශ්‍යතා සපුරාලීමත් රාජ්‍ය නො වන සංවිධාන විසින් සපයන ලද අරමුදල් මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරීම පිණිසත් ගම්වල කමිටු පිහිටුවීම මඟින් ජන කොටස් බලාත්මක කිරීම සඳහාත් රාජ්‍ය නො වන සංවිධාන මුල් තැනක් ගෙන කටයුතු කළ හ. ගමේ ආරවුල් විසඳීම සඳහා මෙම කමිටුවලට ශක්තිය ඇතැයි ද අපේක්ෂා කෙරේ. සිවපුරමෙන් ග්‍රාම සංවර්ධන අරමුදල මඟින් නැවත පදිංචි කරන ලද ගම් දෙකක පිහිටුවන ලද කමිටු ප්‍රජා සහ අන්තර් ප්‍රජා ගැටුම් සමනය කිරීමේ ලා උනන්දුවක් දැක්වූ හ. අන්‍ය අවස්ථාවල දී රාජ්‍ය නො වන සංවිධාන හෝ ඒවායේ ක්ෂේත්‍ර නිලධාරී හු සහභාගි වූ හ. ඒ සඳහා කදිම නිදර්ශනයක් පහත දැක් වේ. අලුතින් පිහිටු වූ ගමක වැසියන්ට ජලය සැපයීම ප්‍රශ්නයක් වීම නිසා ප්‍රදේශයේ ප්‍රජා කටයුතු වල නිරතව සිටි රාජ්‍ය නො වන සංවිධානය අසල්වැසි ගමක වැසියන් හා සාකච්ඡා කර ඔවුන් ගේ ළිං වලින් ජලය පාවිච්චි කිරීමේ ක්‍රමයක් සලසා දුන්නේ ය. ජලය නාස්ති කරන බවට හා ළිඳ අපවිත්‍ර ලෙස පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අයිතිකරුවන් තම විරෝධය පලකිරීමට පටන් ගත් බැවින්, රාජ්‍ය නො වන සංවිධානයේ මැදිහත් වීමෙන් අලුතින් පිහිටු වූ ගමේ වැසියන්ට සවස හයෙන් පසු ජලය ප්‍රයෝජනයට ගැනීමේ සහ ළිඳ අසබඩ රෙදි සේදීමෙන් වැලකී සිටීමේ විකල්ප වැඩපිළිවෙලක් හඳුන්වා දීම මඟින් අර්බුදය සමතයකට පත් කරන ලදී. අවතැන් වූ ජනතාවට අනුන් ගේ සරණ පතා නිරන්තරයෙන් යැමට සිදුවීමේ ප්‍රවනතාව ගැන බොහෝ රාජ්‍ය නො වන සංවිධාන සැලකර සිටිය හ. ජීවිත්වීම සඳහා සලාකය ලැබෙන තෙක් බලාසිටීමට සිදුවීම, සහ හමුදාව විසින් නිකුත් කර ඇති බලපත්‍ර ක්‍රමය යටතේ ගමන් බිමන් යාම අසීරුවීම මෙම තත්ත්වයට හේතු වී තිබේ.

## සිද්ධි අධ්‍යයන 19

කසිප්පු ප්‍රශ්නයට ගමක් මුහුණ දුන් ආකාරය : සිවපුරම් 2 ග්‍රාමය සිවපුරම් 2 වව්නියා - වව්නියා - මන්නාරම් මහමාර්ගය අසබඩ අලුතින් පිහිටුවන ලද ගමකි. එහි වන්නිය, මුලතිව් සහ යාපනයෙන් පැමිණි පවුල් 65 ක් පදිංචිව සිටිති. ටෙලෝ සංවිධානය විසින් 1995 දී ආරම්භ කරන ලද මෙම ගමෙහි සෑම වැසියෙකුට ම අක්කර 1/4ක ඉඩම් කැබැල්ලක් ලැබුණ අතර, ඇතැම් පවුල් ගොවිතැන් කිරීමේ යෙදුණ අතර, බහුතරය එදිනෙදා කුලී වැඩවල නිරත විය. අලුතින් පිහිට වූ ගමක් නිසා මූලික අවශ්‍යතා සියල්ල සැපයිය යුතු වුව ද, පැනනැගි නෛතික ගැටලු කීපයක් නිසා හුදෙක් වැසිකිලි වැනි අත්‍යවශ්‍ය සේවා සැපයීම පවා ග්‍රාම සංවර්ධන අරමුදලට ගැටලුවක් විය. රාත්‍රි කාලයේ හමුදා ඇඳිරි නීතිය උල්ලංඝනය කිරීම් වැනි සිද්ධීන්ට හේතුවන බැවින්, වැසිකිළි තැනීමේ ව්‍යාපෘතියට බාධා ඇතිවිය. කල් යත්යත්, ග්‍රාම සංවර්ධන අරමුදල සිය කාර්යයභාරය පුළුල් කෙළේ ය. ස්වකීය ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම හා පරිපාලනය කිරීම සඳහා විශේෂ කමිටුවක් ද පිහිටුවන ලදී. මෙම කමිටුවට විධායක සභිකයින් හතර දෙනෙක් ද අනෙකුත් සාමාජිකයින් හතක් ද වෙති. කාන්තාවන් දෙදෙනෙක් විධායක සභිකයින් වශයෙන් කටයුතු කරති. ගණිකා වෘත්තිය හා මත් පැනට අබ්බැහිවීම, කමිටුව හඳුනා ගත් ප්‍රශ්න දෙකකි. මෙම ව්‍යසන දෙකෙන් ගම් වාසීන් බේරාගැනීමට කමිටුව කටයුතු කරන මුත්, හිතුවක්කාර අන්දමින් දිගින් දිගට ඒවාට ඇබ්බැහි වන පුද්ගලයින් ප්‍රජා සමාජයෙන් බැහැර කිරීම පවා සිදු වේ. කෙසේ වුව ද එවන් පියවරක් ගැනීමට පෙර ඔවුන් යහපත් පුරවැසියන් කිරීමට කමිටුව සියලු පරිශ්‍රම දරනු ඇත. ඉතා දරුණු ලෙස මත්පැනට ගිජු වූ පුද්ගලයකු සම්බන්ධයෙන් කමිටුව මැදිහත් වී ඔහු බේරාගත් ආකාරය වැදගත් සිද්ධියකි. මෙහි දී අදාල සැමියා සහ බිරිය සමඟ කමිටු සාමාජිකයන් වෙන්වෙන් වශයෙන් කළ සාකච්ඡාවකින් පසු යථා තත්ත්වය හඳුනා ගෙන, ඔවුන් දෙදෙනාට තම වගකීම් අවබෝධ කරන ලදී. පසුව සැමියා හැරදා යන බවට බිරිය කළ තර්ජන හා සැමියාව ප්‍රජා සමාජයෙන් ඉවත් කරන බවට කළ අනතුරු ඇඟවීම නිසා, පවුලක් විනාශයෙන් මුදවා ගැනීමට හැකිවිය. කසිප්පු මුදලාලි සම්බන්ධයෙන් ග්‍රාමසේවා නිලධාරී, පොලීසිය සහ යාබද හමුදා කඳවුරට දන්වා සිටි මුත් ඉන් පලක් නො වී ය. කමිටුව විසින් කසිප්පු මුදලාලිව සිය ව්‍යාපාරය අවසන් කරන ලෙස දැන්වූ මුත් එයින් ද ප්‍රතිඵලයක් සිදු නො වීම නිසා අවසානයේ දී ඔහු ගේ කසිප්පු පෙරීමේ උපකරණ විනාශ කර දැමීමට සිදුවිය. ගැටලුව ඉන් හමාර විය.

## සිද්ධි අධ්‍යයන 20

# සිවපුරම් 2 සහ හිජ්රාක්පුරම් ගම් දෙකට ලබාදුන් ඉඩම් ප්‍රමාණවත් ද?

සිවපුරම් 2 ග්‍රාමය පිහිටා ඇත්තේ අර්බුදයකට තුඩු දුන් ඉඩමක ය. 1990 ට පෙර මුස්ලිම් පවුල් ප්‍රදේශයේ ජීවත් වූ මුත් 1990 දී එල්ටීටීඊ ය විසින් පලවා හරින ලදී. හිජ්රාත්පුරම් මුස්ලිම් ග්‍රාමයේ පවුල් 36 කට අයත් දේපල වර්තමාන සිවපුරම් ග්‍රාමයට ඔබ්බෙන් පිහිටා ඇති අතර, ඉඩම් අටක දැන් ජනයා පදිංචි වී සිටී. රජයේ ඉඩමක පදිංචි වී සිටින බැවින් මුස්ලිම් වැසියන්ට තම ඉඩම් කැබලි සඳහා ඔප්පු කිසිවක් නැත.

තමන් දැනට පදිංචිව සිටින ඉඩම් සම්බන්ධයෙන් ඇතැම් මුස්ලිම් පවුල්වලට හිමිකමක් ඇතත්, එම ඉඩම්වල දැනට ළිං තනා විවිධ භෝග වගා කර ඇති නිසා තමන්ට අයිතියක් ඇතැ යි දෙමළ වැසියෝ ප්‍රකාශ කරති.

මුස්ලිම් වරුන් තමන් සතු ඉඩකඩම් ආපසු ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම ගැන මුස්ලිම් දේවස්ථාන කමිටුව ක්‍රියාත්මක විය. ටෙලෝ සංවිධානය මේ සඳහා කමිටුව වැදගත් කරගත් මුත් මෙතෙක් කිසි ප්‍රතිඵලයක් ලැබී නැත. 2001 වසරේ දී කුඹුරක මායිම් පිළිබඳ ව පුල්තියාරිත සහ හිජ්රාත්පුරම් ගම් දෙක අතර ඇති වූ ගැටුමක් ටෙලෝ සංවිධානය විසින් සමථයකට පත් කරන ලදී. සිවපුරම් - හිජ්රාත්පුරම් අතර හටගත් ගැටුම විසඳීමට දිසාපති වරයාට හෝ උතුරේ මුස්ලිම් මන්ත්‍රීවරයෙකුට හෝ හැකියාවක් නො ලැබුණි. මුස්ලිම් සහ දෙමළ දෙපාර්ශ්වයට ඔවුනොවුන් මුහුණ පා ඇති ගැටලුව මැනවින් අවබෝධ කරගෙන සිටිය හ. සිවපුරම් ග්‍රාමය ඉදිරිපිට පිහිටා ඇති රජය ඉඩමේ පදිංචියට යාමට මුස්ලිම් වැසියන් කැමැත්තෙන් සිටින මුත් ඒ සඳහා නෛතික හෝ දේශපාලන පිළිසරණ අපේක්ෂාවෙන් සිටිති.

# එල්ටීටීඊ පාලනයට නතුව තිබෙන වන්නිය පිළිබඳ කෙටි සටහනක්

කාලය ප්‍රමාණවත් නො වීමත්, නිදහසේ සැරි සැරීමට ඉඩ නො දීමත් නිසා, වන්නි ප්‍රදේශයේ ක්ෂේත්‍ර පර්යේෂණවලට දුෂ්කරතා මතුවිය. එ බැවින් ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාවලිය සම්බන්ධයෙන් රැස් කරගත් දත්ත සීමිත ය. එල්ටීටීඊ යේ අවසරයක් නො මැතිව ප්‍රදේශවාසීන් ගෙන් තොරතුරු ලබාගැනීමට නා හැකිවීම, ප්‍රදේශයේ ක්‍රියාත්මකව තිබෙන රාජ්‍ය නො වන සංවිධානයේ අවසරයක් නො මැතිව කතා කිරීමට නො හැකිවීම, ප්‍රදේශයේ නිදහසේ සැරසැරීමට ඉඩ නො දීම ආදී දහසකුත් එකක් දුෂ්කරතා හේතු කොට ගෙන බාහිර රාජ්‍ය නො වන සංවිධානයකට ගැටුම් නිරාකරණයේ අවිධිමත් ක්‍රමෝපායන් හඳුන්වා දීමට හෝ ප්‍රදේශවාසීන්ට තමන් රුචි පරිදි සංවිධානයක් පිහිටුවා ගැනීමට හෝ කිසිඳු අවකාශයෙක් නො මැත.

තමන් විසින් හඳුන්වා දී ප්‍රමිතීන් ගේ අරමුණ තම ප්‍රදේශ වාසීන් ප්‍රමාණවත් අයුරින් ශක්තිමත් කිරීම සහ බාහිර පුද්ගලයින් ගේ ආධාර මත යැපීම වලක්වාලීම බව එල්ටීටීඊ ය තර්ජන කරයි. බාහිර සංවිධානවලට එල්ටීටීඊ යේ ආධිපත්‍යය යටතේ පවත්නා රාජ්‍ය නො වන සංවිධාන හරහා ක්‍රියාකිරීමට සිදුවීමේ දී ප්‍රදේශයේ වැසියන් ඍජුව සම්බන්ධ කර ගැනීම බලවත් දුෂ්කර කාර්යයක් වී තිබේ. ප්‍රදේශයේ වැසියන් වෙත ඍජුව ම ගොස් ඔවුන්ට සහන සේවා සැපයීමට ඉදිරිපත් වූ පුද්ගලයින් පවා ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙමින් පවතින රාජ්‍ය නො වන සංවිධාන හරහා සිය සේවා සලසන ලෙසට උපදෙස් ලැබී තිබුණි.

ප්‍රදේශ වාසීහු හුදෙක් තමන් ආපසු පැමිණි දින හෝ අස්වැන්න නෙලා ගැනීම වැනි පොදු විෂයයන් ගැන පමණක් ක්ෂේත්‍ර නිලධාරීන්ට අදහස් ප්‍රකාශ කළ හ. ප්‍රදේශයේ රාජ්‍ය නො වන සංවිධානය ගැන වචනයකුදු හෝ දෙඩුවේ ඔවුන් නො වේ. ප්‍රදේශයේ සිට අන්‍ය ගමකට හෝ ස්ථානයක් කරා පිවිසෙන

ප්‍රදේශවාසීන් ඒ සඳහා ප්‍රදේශයේ රාජ්‍ය නො වන සංවිධානයක් හෝ එල්ටීටීඊ යෙන් අවසර ලබාගත යුතු බව ප්‍රදේශ වාසීහු පර්යේෂකයින්ට පැවසූ හ. ගමෙන් පිට වී යාමේ දී එල්ටීටීඊ බලධාරීන්ට දැන්විය යුතු අතර ඔවුන් ඒ පිළිබඳ ව අදාල ගම් ප්‍රදේශයෙන් පිටවීම් කරනු ලැබේ. ගැටලු නිරාකරණය කිරීම සඳහා එල්ටීටීඊ ය විසින් ස්ථාපනය කර ඇති යාන්ත්‍රණය මිස අන්‍ය කිසිවක් ක්‍රියාත්මක වන්නේ නැත. අන්‍ය කිසිදු කමිටුවක් ක්‍රියාත්මක නො වේ. මුලතිව් නගරයෙන් පිට ගමක, කමිටුව විසින් නිරාකරණය කරන ලද අවසාන ආරවුල ගමේ හරකුන් ගලක් වගා කළ ඉඩමකට ඇතුළු වී හානි පැමිණවීම සම්බන්ධයෙන් වූ එකකි. කමිටුව මැදිහත් වී අවුල බේරා ගැනීම සඳහා ශක්තිමත් වැටක් ඉදිකිරීම වැනි ආරක්ෂක පියවර යෝජනා කරන ලදී.

වන්නි ප්‍රදේශයේ පරිපාලනය සහ නීතිය හා සාමය පවත්වා ගෙන යැමේ විධිමත් ව්‍යූහයක් ක්‍රියාත්මක වේ. පෝරුප්පලාර් හෙවත් එල්ටීටීඊ නිලධාරියා ගම් ප්‍රදේශයේ ප්‍රධානියායි. ගම් වැසියන් ගේ ගැටලු ඔහු වෙත යොමු කෙරේ. වඩාත් බරපතළ කරුණු සම්බන්ධයෙන් වූ පැමිණිලි එල්ටීටීඊ පොලීසිය වෙත යොමු කෙරෙනු ඇත.

පර්යේෂකයින් පිවිසි ගමක දී නිරීක්ෂණය වූ ආරවුලක් මෙසේ ය. ගෙයක පවත්වා ගෙන ගිය ප්‍රාථමික පාසලක් 2003 වසර ආරම්භයේ දී වසා දමන ලදී. එහි සිසුන්ට ජ්‍යෙෂ්ඨ පාසලට යන ලෙස උපදෙස් ලැබිණි. එහෙත් කැලෑ ප්‍රදේශයක් හරහා වඳුරන් ගේ තාඩන පීඩන වලට ලක්වීමට සිදුවන හෙයින් දරුවන් එසේ යැවීමට දෙමව්පියෝ විරුද්ධ වූ හ. එහෙත් නව වැඩපිළිවෙලට පොප්පුලාර් ගේ සහ එල්ටීටීඊ යේ අනුග්‍රහය ලැබීම නිසා කිසිවකුටවත් කළ හැකි දෙයක් නො වී ය.

ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් ගම් වැසියෝ පහසුවෙන් ම සුදුස්සා වන එල්ටීටීඊ ය සහ ග්‍රාමසේවා නිලධාරියා ද එල්ටීටීඊ පාලන පෙදෙස්වල තම රාජකාරි ඉටු කරයි. රජයෙන් සැපයෙන සම්පත් හීනවන ඔවුහු ප්‍රකාශ කරති. ජනතාව ගේ ආහාර සලාකය සහ රාජ්‍ය ආයතනවලට අවශ්‍ය යතුරු පැදි ඒ අතරට ගැනේ. ගැටලු නිරාකරණය කිරීමේ දී එල්ටීටීඊ ය මෙම රාජ්‍ය ආයතවලට සහයෝගය පතයි.

මහාවීර සහ මුස්ලිම්වරු යන කණ්ඩායම් දෙකට සීමා වූ ඉඩම් පිළිබඳ ප්‍රශ්න එල්ටීටීඊ පාලන පෙදෙස්වල දක්නට ඇති කැපී පෙනෙන ලක්ෂණයෝ ය. යුද්ධයේ දී මියගිය සාමාජිකයින් ගේ පවුල් සඳහා ඉඩකඩම් ගේ දොර සපයා දීම එල්ටීටීඊ ය බාර ගෙන ඇති සක්‍රීය ව්‍යාපෘතියකි. එක් අවස්ථාවක විපතට පත්ව සිටින මහාවීර වැන්නඹුවකට දී ඇත්තේ වයසක ජෝඩුවක් සතු ඉඩමකි. මතු පිටින් පෙනෙන ආකාරයට මෙම ක්‍රියාව පාර්ශ්වයන් දෙක අතර මතභේද ඇති වීමට හේතු වේ. එල්ටීටීඊ ය ගැටුම් නිරාකරණය කරන ආකාරය

සාධාරණ නො වේ. ඉඩමේ අයිතිකරු අසල්වැසියෙකුට පරිභව කිරීම නිසා හිරගෙට යවා ඇත. එහෙත් චෝදනාව අධිකරණයක් හමුවට ඉදිරිපත් කර නො මැත. නඩුව තවමත් නිම වී නැත. විශේෂයෙන් පිටස්තර පුද්ගලයින් පැමිණීම නිසා වයසක පුද්ගලයා ගුටි බැටිවලට ගොදුරු වේ. වයසක ජෝඩුවට දරුවන් නො මැති අතර, තමන් සතු දේපොළ ආපසු ලබාගැනීම සඳහා ඔවුහු දැඩිව අධිෂ්ඨාන කරගෙන සිටිති.

වන්නි ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව ගේ ඉඩම් ප්‍රශ්න විසඳෙන ආකාරය බොහෝ විට ඉඩමේ පිහිටීම මත රඳාපවතී. මුහුදු කොටින් ගේ අධි ආරක්ෂක ප්‍රදේශයක් වන මුලතිව් හි මුස්ලිම්වරු සතු ඉඩම් කිසිවකට ඔවුන්ට යෑමට අවසර නැත. එය තහනම් කලාපයකි. සමහර අවස්ථාවල මුස්ලිම්වරු තමන් ගේ ඉඩකඩම් කරා ස්ථිර වශයෙන් ආපසු පැමිණීමට අපේක්ෂා නො කරතත්, එය තමන් වෙත ලබාගැනීමට ක්‍රියා කරති. නිදර්ශනයක් වශයෙන්, එල්ටීටීඊ ය විශාල ලෙස පදිංචි වී සිටින කිලිනොච්චි නගරයේ මුස්ලිම්වරු තමන් සතු ගොඩනැගිලි ආපසු ලබාගැනීම සඳහා ඍජුව ම එල්ටීටීඊ ය සමග සාකච්ඡා කරමින් සිටිති. කුලියට දීමේ වැඩපිළිවෙළක් ද සකසා ඇත. ගම්බද පළාත්වල තමන් සතුව පැවැති ඉඩකඩම් වලට ආපසු ඒමට මුස්ලිම් වරුන් අපේක්ෂා කරන මුත්, එය සංකීර්ණ ප්‍රශ්නයක් බවට පත්ව තිබේ.

මන්නාරම - පූනරින් මාර්ගයේ පිහිටි ස්වකීය ඉඩම් සම්බන්ධයෙන් මුස්ලිම්වරු ප්‍රථමයෙන් ප්‍රදේශයේ ග්‍රාමසේවා නිලධාරී හමු වූ හ. සුභසාධක මධ්‍යස්ථානයෙන් තමන්ට ලැබෙන සලාකය අවලංගු කරන තාක් ඔවුන්ට තම ඉඩම් වෙත ආපසු පැමිණීම අසීරු බව ග්‍රාමසේවා නිලධාරී පැවසී ය. (සමහර අවස්ථාවල පවුලේ සාමාජිකයින් කොටසක් සුභ සාධක මධ්‍යස්ථානයට වී දිගින් දිගට ම පහසුකම් බුක්ති විඳිති.) මුස්ලිම්වරුන්ට අයත් ඉඩම්වල 1990 න් පසු පදිංචි වී සිටින දෙමළ වැසියන් තමන් වගා කළ ගහ කොළ සම්බන්ධයෙන් වන්දි මුදල් ඉල්ලා සිටීම තවත් ගැටලුවක් වී තිබේ. අභ්‍යන්තර ජලාශයන්හි ධීවර කටයුතුවල යෙදීම් සහ හරකුන් තණකැවීමේ අයිතිය පිළිබඳ ව මතුවන ගැටලු, මුස්ලිම් වරුන් ගේ බලවත් සැලකිල්ලට යොමු වී තිබේ. ආපසු ගම් බිම් කරා පිවිසෙන මුස්ලිම් ජනතාව මේ පිළිබඳ කණස්සල්ලෙන් සිටී. එම තත්ත්වය වඩාත් උග්‍ර වී ඇත්තේ එල්ටීටීඊ ය විසින් වෙනත් ප්‍රදේශ වල මුස්ලිම් වරුන් වෙත පණවා ඇති ආර්ථික තහංචි නිසා ය. තේ කඩ සහ මස්කඩ පවත්වා ගෙන යෑමට එරෙහිව පණවා ඇති තහනම එයට කදිම නිදර්ශනයකි.

# 1 වෙනි ඇමුණුම

## තවදුරටත් පර්යේෂණ පැවැත්වීමේ යෝජනා

මෙම අධ්‍යයනය හුදෙක් මාස 2 1/2 ක් වැනි සුළු කාලයක් තුළ දී නිම කරන ලද්දකි. වෙනස් ක්‍රමවේද අනුගමනය කරමින් වඩාත් ගැඹුරු අධ්‍යයනයක් කළේ නම් මෙයට වඩා පුළුල් පරාසයක් ආවරණය කිරීමට අවකාශ තිබුණි.

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළකට සාර්ථකත්වය මැනීම සඳහා දිගු කලක් ගත කිරීමට සිදු වේ. එසේ වීනම් පර්යේෂක පිරිසට යළි අදාල ප්‍රදේශ වලට ගොස් නිර්දේශිත ක්‍රමවේද හරහා කොතෙක් දුරට සාර්ථක ප්‍රතිඵල ලබාදීමට හැකිවේ දැයි මැන ගැනීමට ඉඩකඩ තිබුණි.

තවදුරටත් පර්යේෂණයට ලක්විය යුතු ක්ෂේත්‍ර කීපයක් මෙහි පහත දැක්වේ.

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ

ඓතිහාසික සහ තුලනාත්මක වශයෙන් මෙහෙයවනු ලබන අධ්‍යයන මඟින් පහත සඳහන් දෑ පිළිබඳ විමසා බැලිය හැකි ය.

⋆ වාර්ගික අර්බුදය ඇති වීමට පෙර තිබූ ගැටුම් නිරාකරණය කිරීමේ විධිමත් හා අවිධිමත් යාන්ත්‍රණ

⋆ එම යාන්ත්‍රණ සහ දේශීය සමාජ ජාලය කෙරෙහි වාර්ගික අර්බුදයෙන් ඇති වූ බලපෑම්

⋆ දකුණේ ක්‍රියාත්මකව පවත්නා වාර්ගික අර්බුද නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය සහ වෙනත් ක්‍රියාමාර්ග. පුළුල් අධ්‍යයනයක් මඟින් සාම්ප්‍රදායික ප්‍රජා සම්බන්ධතා සහ ආයතන රටේ සාමය පැවති යුගයේ දී හෝ අර්බුදයෙන් හානි නො වූ පෙදෙස්වල පැවැති ආකාරය පෙන්නුම් කිරීමට හැකි විය. එසේ

ම දැනට සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියේ නිරත පුද්ගලයින්ට එම යාන්ත්‍රණ ඵලදායී අයුරින් උපයෝගී කරගත හැක්කේ ද යන්න අවබෝධ කර ගත හැකි ය.

## ⋆ ආරවුල්වලට හේතු වූ කරුණු පිළිබඳ පර්යේෂණ පැවැත්වීම

ගැටුමට මුල් වූ කරුණු අධ්‍යයනය කිරීම මඟින් කෙතරම් දුරට ආරවුල් නිරවුල් කරගත හැකි දැයි මෙම පර්යේෂණය පෙන්වයි. ගැටලුවල මූලය ගවේෂණය කිරීම මඟින් ගැටුම් විසඳීමේ ලා කවර ආකාරයේ උපකාරයක් අවශ්‍ය දැයි තීන්දු කළ හැකි ය. නිදර්ශනයක් වශයෙන්, ඉඩම් හා ධීවර සම්පත් ඌණතාව පිළිබඳ ආරවුල්වල දී පුළුල් අධ්‍යයනයක් මඟින් ස්ථිර ආදායම් ඉපයීමේ විකල්ප මාර්ග පරීක්ෂා කර බැලිය හැකි ය. එමෙන්ම නිතර හටගැනෙන වැට සහ මායිම් පිළිබඳ ආරවුල් ඉඩම් ලියාපදිංචි කිරීමේ ලේඛනයක් මඟින් බොහෝ දුරට අවම කළ හැකි ය. ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය ශක්තිමත් කරනවාට වඩා සංවර්ධනය සහ රජයේ පැවැත්ම සහතික කිරීම කෙරෙහි ආධාර වැඩසටහන් යොමු වේ නම් එමඟින් ආරවුල් හටගැනීම අවම කළ හැකි දැයි පුළුල් අධ්‍යාපනයක් මඟින් පරීක්ෂා කර බැලිය හැකි ය.

## ⋆ කාන්තාව සහ ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය

ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණයට ආවේනික වූ පීතෘ මූලික ව්‍යූහය නිසා කාන්තාවන්ට සිය ආරවුල් නිරාකරණය කරගැනීම ප්‍රශ්නයක් වී ඇත. කමිටුවල කාන්තා නියෝජනය පවතින අවස්ථාවක ප්‍රශ්න නිරාකරණය කිරීම හා තීන්දු ගැනීම සම්බන්ධයෙන් ඔවුන්ට කොපමණ ප්‍රමාණයකට බලපෑම් කළ හැකි ද? ප්‍රජා ගැටලු විසඳීමේ ගම්බඳ කාන්තා සංවිධාන සතු ශක්තිය අවශ්‍යයෙන් ම විමසුමට ලක් කළ යුතු ය.

## ⋆ විවිධ සාම කමිටු පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

විවිධාකාරයේ සාම කමිටු ක්ෂේත්‍රයේ දී දැකගන්නට ලැබිණි. සාමය පිළිබඳ දැනුවත් කිරීමේ කමිටු (හවමාරු වැඩසටහන්, සංස්කෘතික ක්‍රියාකාරකම්, බහුවාර්ගික රැස්වීම් යනාදිය); ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ අනුගමනය කරන සාම කමිටු සහ සංවර්ධනය සහ සාමය ගොඩනැගීමේ කමිටු ඉන් සමහරකි. මෙම කමිටු එක්කෝ පිටින් ලැබෙන ආධාර මත ක්‍රියාත්මක වන හෝ දේශීය ආයතන විය හැකි යි. විවිධ සාම කමිටුවලින් ප්‍රතිඵල මත වාසි සහ අවාසි තුලනාත්මක අධ්‍යයනයක් මඟින් අවබෝධ කරගත හැකි ය.

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළ කෙරෙහි ඇතිවන දේශපාලන බලපෑම්

ආරවුල් ඇති වන්නේ කෙසේ ද? ඒවා වර්ධනය වන්නේ කවර අයුරින් ද හා ගැටුම් නිරාකරණය කිරීමේ ලා ප්‍රජාව දරන පරිශ්‍රමයන් කෙරෙහි ඉන් කිනම් බලපෑමක් ඇතිවේ ද යන කරුණු වලට මෙ රට දේශපාලකයින් පමණක් නො ව දේශපාලනය ද මුල්වන අයුරු මෙම අධ්‍යයනයෙන් අවධාරණය කෙරේ. බලගතු දේශපාලකයින් සහ දේශපාලන අනුග්‍රහය සහ සම්බන්ධතා රජයන දේශපාලන පසුබිමක් තුළ කෙතෙක් දුරට අපක්ෂපාතී ගැටුම් නිරාකරණය හිස ඔසවා සිටිය හැකි දැයි තවදුරටත් පර්යේෂණයක් මඟින් තහවුරු කළ යුතු වේ.

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණ සහ හිංසාවාදී ජනවාර්ගික සම්මත වැලැක්වීම හෝ ඒවායේ වර්ධනය පාලනය කිරීම

හිංසාව පැතිරවීමේ ලා කටකතා සහ දේශපාලකයින් ක්‍රියා කළ ආකාරය සහ ජනවාර්ගික හා කුලවාදී පිපිරීම්වලට ජනතාව දැක් වූ ප්‍රතිචාරය මෙම අධ්‍යයනයෙන් පෙන්නුම් කර තිබේ. සාකච්ඡා සඳහා වේදිකාව සංවිධානය කිරීම, ආරවුල් වලට මැදිහත් වීම සහ ගැටලු නිරාකරණය කිරීමේ දී හිංසාවාදී ක්‍රියාවන් අවම කිරීම සඳහා සාම කමිටු, පුරවැසි කමිටු, ගම් පෙදෙස්හි නායකකාරකාදීන් සහ රාජ්‍ය නො වන සංවිධාන උනන්දුවෙන් ක්‍රියාකරන අයුරු නිරීක්ෂණය විය.

ජාතිවාදී අරගල උත්සන්න වීම සාර්ථක අන්දමින් වැලැක්වීමට උපකාරී වූ සාධක හඳුනා ගැනීම සඳහා තවදුරටත් අධ්‍යයනයක් මෙහෙයවීම අවශ්‍ය වී තිබේ. අර්බුදයෙන් බැට කෑ ඇතැම් ප්‍රදේශ හිංසාවාදී පිපිරීම්වලට පහසුවෙන් ග්‍රහණය වෙද්දී අනෙක් පෙදෙස්වල හටගන්නා අර්බුද උත්සන්න නො වීමට හේතු ගවේෂණය කිරීම කාලෝචිත ය.

## ගැටලු නිරාකරණය කිරීමේ දී යෝග්‍ය යාන්ත්‍රණයක් තෝරාගැනීමට ජනතාව පෙළඹීම පිළිබඳ අධ්‍යයනයක්

අරමුදලක පාර්ශ්වකරුවන් කුමන යාන්ත්‍රණයක් දෙසට නැඹුරු වේ ද යන්න හඳුනා ගැනීම කෙරෙහි මෙම අධ්‍යයනය යොමු වී තිබේ. යම් විශේෂ යාන්ත්‍රණයක් කෙරෙහි පාර්ශ්වකරුවන් මනාපය දැක්වීමට පෙලඹුණ සාධක අධ්‍යයනය කිරීම වටී. එවන් අධ්‍යයනයක් මඟින් යහපත් ප්‍රතිඵල ගෙනදීමට හැකි යාන්ත්‍රණයක් පිළිබඳ අවබෝධයක් ලබා දියහැකි ය. ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් පොළඹවන සාධක අතුරට, ගම් ප්‍රදේශයේ නායකත්වය එම නායකත්වය විසින් සාමාජිකයන් හඳුනා ගැනීම, යාන්ත්‍රණයන් ගේ ස්වභාවය, බිය සහ විකල්ප යාන්ත්‍රණ නො මැති වීම ද ඇතුළත් වේ.

## දේශීය රාජ්‍ය නො වන ආයතන, විවිධ ජන කොටස් සහ ආධාර සපයන ආයතන අතර පවත්නා සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනයක්

ආධාර සපයන ආයතන සහ මෙ රට රාජ්‍ය නො වන සංවිධාන සාමය ගොඩනැගීමේ ක්ෂේත්‍රයේ තමන් අත් කරගන්නා ලදැයි පවසන ජයග්‍රහණ සහ ඒවායේ සැබෑ තත්ත්වය අතර වෙනසක් දකින්නට ලැබේ. ප්‍රජා ඉල්ලීමක් පිට තමන් ව්‍යාපෘතියක් ආරම්භ කළ බව රාජ්‍ය නො වන සංවිධානයක් පවසන විට, එයට පිළිතුරු වශයෙන් ගම් වැසියන් කියා සිටිනුයේ රාජ්‍ය නො වන සංවිධානයක් ඔවුන්ට රිසි ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට උනන්දු වන විට තමන් හුදෙක් ඒ සඳහා ප්‍රතිචාරයක් දැක්වූ බවයි. ආධාර සපයන්නන් ගේ බස හා අභිමතාර්ථයන්ට මැනවින් හුරු වී සිටින මෙ රට ඇතැම් රාජ්‍ය නො වන සංවිධාන සාර්ථකව නිමාවට පත් කළ නො හැකි ව්‍යාපෘති ආරම්භ කිරීමට පුරුදු වී සිටිති.

ජනතාව ගේ අසංවේදීතාව, මෙ රට රාජ්‍ය නො වන සංවිධාන ආධාර සැපයීමේ ආයතන වලට හැකිවීම සහ කෙටිකාලීන ව්‍යාපෘති සැලසුම් හා ඇගැයුම මෙම වෙනසට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

ආධාර සපයන ආයතන, මෙ රට රාජ්‍ය නො වන සංවිධාන සහ ප්‍රජාව අතර පවත්නා සන්නිවේදන හිඩැස පිරවීම සහ ඒවා අතර පවත්නා සම්බන්ධතා අධ්‍යයනය කිරීම සාමය ගොඩනැගීමේ ආයතනවලට ප්‍රයෝජනවත් වනු ඇත. එබඳු අධ්‍යයනයක් පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් වීම වටී.

- ★ සාමය ගොඩනැගීමේ දේශීය රාජ්‍ය නො වන සංවිධාන සතු හැකියාව පිළිබඳ ආධාර සපයන ආයතන තබා ඇති බලාපොරොත්තු සහ එම සංවිධාන සතු සාමය ගොඩනැගීමේ හැකියාව.
- ★ ආධාර සැපයීමේ ආයතන ප්‍රජා අවශ්‍යතා සංජානනය කිරීම.
- ★ ආධාර සපයන ආයතනවල අභිමතාර්ථයන් මෙ රට රාජ්‍ය නො වන සංවිධාන විසින් සංජානනය කිරීම.
- ★ ප්‍රජා අවශ්‍යතා රාජ්‍ය නො වන සංවිධාන විසින් සංජානනය කිරීම.
- ★ රාජ්‍ය නො වන සංවිධාන සහ ආධාර සපයන ආයතන මෙ රට ප්‍රජාව විසින් සංජානනය කිරීම.
- ★ සාමය ගොඩනැගීමේ ආයතන, අන්තර් ජාතික රාජ්‍ය නො වන සංවිධාන. මෙ රට රාජ්‍ය නො වන සංවිධාන සහ අනෙකුත් ආයතන විසින් උපයෝගී කරගත් විවිධ ක්‍රමෝපායන් සහ ආදර්ශයක්

## ★ ග්‍රාමීය නායකත්වය පිළිබඳ විශ්ලේෂණයක්

අවිධිමත් ක්‍රියාමාර්ග හරහා ගැටුම් නිරාකරණය කිරීමේ දී ග්‍රාමීය නායකයින් වෙතින් ඉටු වූ සුවිශේෂ කාර්යයභාරය මෙම අධ්‍යයනය මඟින් මැනවින් විස්තර කර ඇත. එමෙන්ම ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය සතු කාර්යයක්ෂම භාවය සහ සාධාරණත්වය සම්බන්ධයෙන් ග්‍රාමීය නායකත්වයෙන් ලත් බලපෑම් ද, ඒ මඟින් පැහැදිලි කරන ලදී.

පහත සඳහන් කරුණු හඳුනා ගැනීම සඳහා තවදුරටත් පර්යේෂණ කිරීම වැදගත් වේ.

★ ග්‍රාමීය නායකයින් ගම් ප්‍රදේශ තුළ තම බලය තහවුරු කර ඇත්තේ කෙසේ ද? (පෞරුෂය, රැකියාව, සාම්ප්‍රදාය, බාහිර බලවතුන්ට ඇති සම්බන්ධතාව)

★ ප්‍රජාව සමඟ ගමේ නායකයින් පවත්වන සම්බන්ධතා (බලපුළුවන්කාරකම්, ගෞරවය, පිදීමෙන් සහ උපදේශන මට්ටමින්)

★ ග්‍රාමීය නායකයන් ගේ යුක්තිය පසිඳලීමේ අවබෝධය සහ අනෙකුත් සාරධර්ම (ප්‍රජා උන්නතිය කෙරෙහි ඇල්ම, පුද්ගල අයිතිවාසිකම්, පීතෘ මූලිකත්වය, පුද්ගල අයිතිවාසිකම් ආගමික හා පෞද්ගලික ඒකාග්‍රතාව)

★ මෙය සාධාරණ හා කාර්යක්ෂම ග්‍රාමීය යාන්ත්‍රණ සැලසුම් කිරීමේ යාන්ත්‍රණය සැලසුම් කිරීමේ අරගලයක නිරත ආධාර සපයන ආයතන හා රාජ්‍ය නො වන සංවිධානවලට බෙහෙවින් වැදගත් වේ.

## ගැටුම් නිරාකරණය කිරීමේ අවිධිමත් ක්‍රියාපිළිවෙළෙහි අන්තර්ගත ආර්ථික ජාලයන්

ප්‍රජා ආරවුල් විසඳීමේ ග්‍රාම සංවර්ධන සමිති සහ ධීවර සමිති වැනි ප්‍රජා මූලික ආර්ථික ජාලයන් සතු කාර්යයභාරය මෙම අධ්‍යයනය මඟින් විභාග කරන ලදී. වෙළඳ මණ්ඩලය, වෘත්තීය සමිති යනා දී සාර්ව ආර්ථික ජාලයන් සතු කාර්යයභාරය පර්යේෂණයට ලක්කිරීමේ අධ්‍යයනයක් ආරම්භ කිරීම ප්‍රයෝජනවත් වනු ඇත.

ආර්ථික ක්‍රියාකාරකම් වලට සම්බන්ධ ගැටලු මෙම ආර්ථික ජාල මඟින් නිරාකරණය කරනු ලබන්නේ ද, ඒ මඟින් වෙනත් ආරවුල් පවා විසඳනු ලබන්නේ ද, එසේ නම් ඒ කොපමණ ප්‍රමාණයක් ද සහ විකල්ප ක්‍රමෝපායන් ඇතුළු ආරවුල් විසඳීමේ ක්‍රියාවලියෙන් කුමක් උකහා ගත හැක්කේ ද යන මේ කරුණු තවදුරටත් අධ්‍යයනය කළ යුතු ව ඇත.

# 2 වෙනි ඇමුණුම

## පරිශීලනය සඳහා නිර්දේශිත ග්‍රන්ථ

යුද්ධයත්, කඳුළුත් අතර: යුද්ධයෙන් විපතට පත් ශ්‍රී ලංකාවට ආධාර දීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු

- **බාර්ට් ක්ලෙම්**

මෙය නිජ්මෙගන්හී ජාත්‍යන්තර සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයෙකි. ශ්‍රී ලංකාවේ යුද්ධයේ කොටස් කරුවන් මෙන් ම යුද්ධය කෙරෙහි ද ආධාර සැපයීමේ සංවිධාන වලින් සිදුවන බලපෑම විමසා බැලීම මෙහි අරමුණ වේ. යුද්ධයෙන් විනාශයට පත් ප්‍රදේශවල නිරත ආධාර සැපයීමේ සංවිධානවලට මුහුණ පෑමට සිදු වී ඇති ගැටලු මේ පොතට කේන්ද්‍ර වී තිබේ. නිලාවේලි සුහසාධන මධ්‍යස්ථානයේ ක්‍රමවත් කළ වාර්තාකරණය සඳහා සියල්ල ගේ ම කැමැත්ත ප්‍රකාර කාර්යය මණ්ඩලයක් පත්කිරීමේ දී මතු වූ ප්‍රශ්න සාකච්ඡාවට බඳුන් වී තිබේ.

## ගැටුම්කාරී කලාපයක් තුළ ශක්තිමත් ආයතන පිහිටුවීම :

ශ්‍රී ලංකාවේ මානුෂීය ආධාර වැඩසටහන කාන්තාවක ගේ ඇසින්

- **මාලතී ද අල්විස් සහ ජෙනිෆර් හින්ඩ්මන්**

(වාර්ගික අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය) - ජනවාරි 2002 ශ්‍රී ලංකාවට සැපයෙන මානුෂීය ආධාර වැඩිකිරීම කෙරෙහි මෙම වාර්තාවේ අවධානය යොමු වී තිබේ. පුද්ගලයා, වාර්ගික ගැටලුව සහ අවතැන්වීම යනාදිය

අතර පවත්නා සම්බන්ධතා විශ්ලේෂණය කිරීම එහි තවත් අංගයක් වේ. ඒ හැරුණු විට කාන්තා සෞඛ්‍යය කාන්තා හිංසනය සහ ආදායම සුරක්ෂිත කිරීමේ ආයතන ස්ථාපනය කිරීම සඳහා සම්පත් උපයෝගී කරගැනීමේ හැකියාව ද මෙම වාර්තාවට අරමුණු වී තිබේ.

සාමය උදාකිරීම සඳහා කල්මුනේ සාම කමිටුවේ විශිෂ්ට සේවාව අගය ලක්කර තිබේ. මත්පැනට ගොදුරුවූ පිරිස් පිළිබඳ ප්‍රශ්නය ගැන කටයුතු කිරීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන්ට පුහුණුවක් ලබාදීම මෙම වාර්තාව අවසාන වශයෙන් නිර්දේශ කරයි.

## ශ්‍රී ලංකාවේ වාර්ගික අර්බුදයෙන් වැඩියෙන් ම බැට කෑ ප්‍රදේශවල සිවිල් සමාජය ශක්තිමත් කිරීම.

**- කොළඹ නෝර්වේජියානු තානාපති කාර්යාලයේ අනුග්‍රහයෙන්**
**'නෝරුට්' ආයතනය විසින් සම්පාදනය කර තිබේ.**

ශ්‍රී ලංකාවේ වාර්ගික යුද්ධයේ බලපෑමට ලක් වූ සිවිල් සමාජ සංවිධාන සතු ශක්තිය පිළිබඳ 'නෝරුට්' පර්යේෂණ වාර්තාවේ තොරතුරු මෙම වාර්තාවෙන් ඉදිරිපත් කරයි. සාම්ප්‍රදායිකව ගම කේන්ද්‍ර කොටගත් හෝ ප්‍රජාව පදනම් කරගත් ආයතන බාහිර සංවිධාන විසින් හඳුනා ගැනීම, දිරිමත් කිරීම සහ පණගැන්වීම පිළිබඳ අවශ්‍යතාව මෙම වාර්තාව අවධාරණය කරයි. එහෙත් එබඳු ප්‍රවේශයක දක්නට ලැබෙන දුර්වලතා ගැන ද සඳහන් කර තිබේ. යුද්ධයට පෙර පැවති සිවිල් සමාජ සංවිධාන පිළිබඳ ව ආරම්භක අවධියේ සිට කෙරෙන කෙටි විස්තරයක් ද වාර්තාවට ඇතුළත් වේ. වෙට්ඩිකුලම් සහ වව්නියාවේ පිහිටා ඇති පුරවැසි කමිටුවල සාර්ථකත්වය යනු සිවිල් සමාජයේ උන්නතිය ඉලක්ක කරගත් බහුවාර්ගික හා බහු ආගමික සහයෝගීතාවයක් බව වාර්තාව අවධාරණය කරයි. පුත්තලම සාම කමිටුවේ කාර්යයභාරය ගැන ද සඳහන්ව තිබේ. එල්ටීටීඊ පාලන පෙදෙස්වල මත්පැන් මර්දන සංවිධානයක් ගමේ මට්ටමින් පිහිටුවා ඇතිමුත් එය එල්ටීටීඊ යේ සාමාජිකයින් බඳවාගැනීමේ මධ්‍යස්ථානයක් බවට සැක පහළ වී ඇති අතර එමඟින් එල්ටීටීඊ ය එම ගම් ප්‍රදේශය සිය පාලනයට නතුකර ඇතැ යි කතුවරයා විශ්වාසය පළකරයි.

## මායිම් අතර හිර වී : අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් ගෙන් ප්‍රතිචාරයක්

**-මාර්ක් වින්සන්ට් සහ බිර්ජිට් රෙෆ්ස්ලන්ඩ් සොරෙක්සන්**

(7 වෙනි පරිච්ඡේදය) : යුද්ධයේ සෙවනැල්ල යටතේ නව දිවි පෙවෙතක් ආරම්භ කිරීම - අවතැන් වූ සහ යළි පදිංචි කරවූ මුස්ලිම් වැසියන්
**- නෝර්වේජියානු සරණාගතයින් ගේ මණ්ඩලය - 2001**

මෙය විෂයානු බද්ධ අධ්‍යයනයකි. එම අධ්‍යයනයක් මඟින් රැකියාවක් සොයා ගැනීම, සහ අලුතින් පදිංචි වූ ගමක අවතැන් වූ මුස්ලිම් ජාතිකයින් නව ප්‍රජා එකමුතුවක් පිහිටුවීමේ වෑයමක් ගැන මෙහි විස්තර කර ඇත. කම්කරු කොන්ත්‍රාත්කරු ගිවිස ගැනීම, කණ්ඩායම් වශයෙන් වැඩකර මුදල් බෙදා හදා ගැනීම සහ අගහිඟකම් වලට මුහුණපාන සාමාජිකයින්ට උපකාර කිරීම සඳහා සියලු සාමාජිකයින් ගේ දායකත්වය ලබන අරමුදලක් පිහිටුවීම නව ප්‍රජා එකමුතුවේ අංගයන් විය.

## කාන්තා සවිය :

**අයිතිවාසිකම්, නැවත පදිංචි කිරීම සහ අවතැන් වූ කාන්තාවන් (මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය - 2003)**

සටන් විරාම ගිවිසුමෙන් පසු ශාරීරික අනතුරු, ආර්ථික අවහිරකම් සහ යටිතල පහසුකම් නො මැතිවීම, නැවත පදිංචි කිරීම යනාදිය කාන්තාවන් ඉලක්ක කරගත් ප්‍රමුඛත්වයෝ ය. අවතැන් වූ කාන්තාවන් ගේ සුභ සිද්ධිය තකා නව ව්‍යාපෘති සකස් කිරීමේ දී කාන්තාවන් ගැන විශේෂයෙන් සැලකිලිමත් වීම සහ එය අවතැන් වූ කාන්තාවන්ට සේවා සැපයීමේ ආයතනවල ප්‍රමුඛත්වයක් විය යුතු බව වාර්තාව පවසයි. මඩුපල්ලියේ කන්‍යා සහෝදරියන් ආරවුල් නිරවුල් කිරීමේ ලා වැදගත් වුව ද, එය එ තරම් සාර්ථක වූ ක්‍රියාමාර්ගයක් නො වී ය.

සුභ සාධන මධ්‍යස්ථානවල කාන්තා ආරක්ෂාව සහතික නො වන අවස්ථාවල දී ඒ සඳහා අලුතින් පිහිටුවා ඇති 'කාන්තා කමිටු' අභිබවා පොලීසිය, මුස්ලිම් දේවස්ථාන කමිටු හෝ මුස්ලිම් පෞද්ගලික නීතිය පිළිබඳ අධිකරණය දක්වා යෑමට පවා මුස්ලිම් කාන්තාවෝ දිරිමත් වී සිටිති.

ආරවුල් නිරාකරණය කිරීම සඳහා එල්ටීටීඊ ය ද සම්බන්ධ වී සිටින බව වාර්තාව පවසයි. එල්ටීටීඊ දඬුවම් ක්‍රමය සහ වැරදිකරුවන්ට දඬුවම් පමුණුවන ආකාරය සමාජය කෙරෙහි බලපාන අයුරු වාර්තාවේ සඳහන් වේ. අවතැන් වූ සිංහලයින් එල්ටීටීඊ අධිකරණයෙන් යුක්තිය අපේක්ෂා කරන අවස්ථා ගැන ද වාර්තාවේ සඳහන් වේ.

## කෘෂි සංක්‍රමණය සහ වෙනස්වන දේශීය දේශපාලන ආර්ථිකය ශ්‍රී ලංකාවේ වයඹ පළාත පිළිබඳ අධ්‍යයනයක්

**- එන්. ශන්මුගරත්නම්**

නෝරාග්‍රික් කෘෂිකර්ම විශ්ව විද්‍යාලයයේ ජාත්‍යන්තර පාරිසරික හා සංවර්ධන අධ්‍යයන මධ්‍යස්ථානය හා එක්ව ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යා සංගමය මෙහෙය වූ අධ්‍යයනයක් - 2001

## මුස්ලිම් ජනතාව බලහත්කාරයෙන් ශ්‍රී ලංකාවේ

උතුරු පළාතෙන් පලවා හැරීම මෙම අධ්‍යයනයට කේන්ද්‍ර වී තිබේ. මෙම මුස්ලිම් ජාතිකයින් ගෙන් බහුතරයක් පුත්තලම් ප්‍රදේශයට සංක්‍රමණය වී තිබීම නිසා කල්යාමේ දී ඔවුන් ගේ අවතැන්වීම එම දිස්ත්‍රික්කයේ දේශපාලන ආර්ථිකයට බලපාන අයුරු මෙම අධ්‍යයනයෙන් විස්තර කෙරේ. අලකුඩා සරණාගත කඳවුරේ ප්‍රධානියා එහි නිල ප්‍රකාශකයා ද විය. මුස්ලිම් ප්‍රජාව ගේ මධ්‍යස්ථානය වශයෙන් සැලකුණේ ඔවුන් ගේ දේවස්ථානයයි. ආගමික නායකයින් සමාජ සංහිදියාව පවත්වා ගෙන ගිය අතර මුස්ලිම් දේවස්ථාන කමිටුව ආරවුල් නිරාකරණය කිරීමේ කාර්යයේ නිරත විය. අවතැන්වූවන් ස්වර්ණ භූමි ඉඩම් ලාභීන් වීම ගැන මතු වූ විරුද්ධත්වයක් නිල නො වන අයුරින් නිරාකරණය කිරීමට හැකිවීමක් ගැන ද වාර්තාවේ සඳහන් වේ.

## ඉඩම් අයිතිය පිළිබඳ ඉදිරිපත් වන දුශ්ගැනවිලි -ඉඩම් පරිහරණය පිළිබඳ දෙහිවත්ත තොමටික් ප්‍රදේශය අධ්‍යයනය

**- කනගරත්නම් දේවරාජා, බෙනඩික්ට් කෝර්ප්, ක්‍රිස්ටීන් ෂෙන්ක් සහ ඒ.එම්. සමන්තා ඒකනායක, රෝහිනි එම්. සිංගනායර්, එච්.එම්. සුගත් බණ්ඩාර විජේතිලක සහ ආර්. සිවසුදත්**

(ආහාර සුරක්ෂිත භාවය පිළිබඳ ඒකාබද්ධ වැඩසටහන - ත්‍රිකුණාමලය, ඔක්තෝම්බර් 2001)

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් විපතට පත් පෙදෙස්වල සමාජ - ආර්ථික තත්ත්වයන් හසුරුවීමේ උපාය මාර්ග සහ ඉඩම් පරිහරණ රටාවේ වෙනස්වීම ගවේෂණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

මායිම් ගම් දෙකක් අතර ඉඩම් පිළිබඳ අර්බුද, ගම්වැසියන් තම ගැටලු ගමේ වයෝවෘද්ධ නායකයෙකු හෝ පොලීසිය මඟින් විසඳාගැනීම, පැහැර ගත් පුද්ගලයින් සම්බන්ධයෙන් කාන්තාවන් සෘජුව ම එල්ටීටීඊ ය සමඟ සාකච්ඡා කර බේරුම් කරගැනීම සහ වැව් ආශ්‍රිත පෙදෙස්වල නීති විරෝධී අයුරින් ගොඩනැගිලි තැනීමට විරුද්ධව බලධාරීන් වෙත පැමිණිලි කිරීම වැනි අවස්ථා මෙම අධ්‍යයනයේ අන්තර්ගතව ඇත.

## ජීවනෝපායන් අනතුරේ : ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණය සහ යුද්ධයෙන් විපතට පත් ජනතාව ගේ ගැටලු විසඳීමේ උපාය මාර්ග

**- බෙනඩික්ට් කෝර්ෆ්**

ආහාර සුරක්ෂිත භාවය පිළිබඳ ඒකාබද්ධ වැඩසටහන - ත්‍රිකුණාමලය 2001 නොවැම්බර්

නැගෙනහිර පළාතේ යුද්ධයෙන් විපතට පත් ප්‍රදේශවල ජීවනෝපාය මාර්ග සහ හැසිරවීමේ උපාය මාර්ග මත මෙම වැඩසටහන පදනම් වී ඇත. ගමේ ප්‍රජාව හා ආධාර සපයන පිටස්තර ආයතන අතර අතරමැදියකු මෙන් ම ගැටලු නිරාකරණය කරන්නෙකු සේ බෞද්ධ හා මුස්ලිම් ආගමික නායකයින් විසින් ඉටුකර ඇති කාර්යයභාරය ගැන ද වාර්තාවේ සඳහන් වේ.

## සහභාගිත්වය, අනුශාසකවරුන් සහ ගම: පුත්තලම් දිස්ත්‍රික්කයේ වෙරළ කලාපය කළමනාකරණය කිරීම - ශ්‍රී ලංකාව

**- ජෙන්ස් ෆොයෙල්, එලිසබත් හැරසන් සහ රොඩරික් ස්ටිරට්, සසෙක්ස් විශ්වවිද්‍යාලයයේ අප්‍රිකානු සහ ආසියානු අධ්‍යයන ශාස්ත්‍රාලය**

ඉඩම් ආරවුල්, ව්‍යාපාරික මතභේද, මත්පැන් ලෝලී තරුණ පිරිස් අතර සට්ටන, ගම්වාසීන් අතර හටගන්නා ආරවුල් විසඳීමේ දී කතෝලික පූජකවරුන් වෙතින් සුවිශාල සේවයක් ඉටු වේ.

## වද්දම් ධීවර ගම්මානය හිර වේ!

**- තංගවේලි ශක්තිවේලි සහ ජූලියා සිග්ලර්, කනගරත්නම් දේවරාජ්, කේ. ගව්රිවාසම්, කේ. කඩඩිශානි, බෙනඩික්ට් කෝරුෂ් සහ ටී. ගනේෂරාෂා සමඟ**

(ආහාර සුරක්ෂිත භාවය පිළිබඳ ඒකාබද්ධ වැඩසටහන - ත්‍රිකුණාමලය - ඔක්තෝම්බර් 2001)

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ධීවර ගම්මානයක් වූ වද්දම් නාවුක හමුදාවත් එල්ටීටීඊ යත් අතර ඇවිලී ගිය සටන් වලට කොටු වුණ ප්‍රදේශයෙකි. ගම් ප්‍රධානීන් සහ මුස්ලිම් සමාජය අවිධිමත් යාන්ත්‍රණය මගින් ගැටුම් සහ වෙනත් ආරවුල් නිරාකරණය කළ අයුරු මෙම වාර්තාවෙන් විස්තර කෙරේ.

## විමුක්තිය සොයා : අවතැන්වීම සහ අභිමිවීම අතර නො මැරී ජීවත්වන ගැහැනු

**- එෆ්. සකාරියා සහ එන්. ශන්මුගරත්නම්**

(මුස්ලිම් කාන්තා ක්‍රියාකාරී කේන්ද්‍රය)

යුද්ධය නිසා ජනගහනය අවතැන්වීමේ සංසිද්ධිය පුත්තලම සහ කල්පිටිය පෙදෙස්වල නිවැසි කාන්තාවන්ට බලපා ඇති අයුරු ප්‍රධාන වශයෙන් මෙහි මතුකර පෙන්වයි. සාම්ප්‍රදායික පවුල යළි පිහිටුවීම සඳහා කාන්තාවන් පරිශ්‍රම දරන අයුරු මෙහි දී තවදුරටත් පැහැදිලි කරයි. සුභ සාධන කඳවුරේ කළමනාකරණ කමිටුව සහ මුස්ලිම් දේවස්ථාන කමිටුව සැලකිය යුතු කාර්යයභාරයක් ඉටු කරයි. විවිධාකාර ආරවුල් නිරාකරණය කිරීම කඳවුරු කමිටුවේ ප්‍රධාන වගකීම වේ. දේවස්ථාන කමිටුව සහ කඳවුරු කමිටුවට නිරාකරණය කිරීමට නො හැකිවන අර්බුද කාති අධිකරණය වෙත යොමු කෙරේ.

# 3 වෙනි ඇමුණුම

## සම්මුඛ පරීක්ෂණයට ලක් වූ ආයතන ලයිස්තුව

### රාජ්‍ය නො වන සංවිධාන, සිවිල් සමාජය හා එක්සත් ජාතීන් ගේ ආයතන

★ යුද්ධයෙන් හානි පැමිණි කාන්තාවන් ගේ සංවිධානය, අක්කරපත්තුව, අම්පාර.
★ ඒඑච්ඒඑම්, ත්‍රිකුණාමලය.
★ අල් ඉන්සානියා සමාජ සංවර්ධන සංවිධානය, වාලච්චිනෙයි, මඩකලපුව.
★ අල් කුවාරිස් ජනතා සංවර්ධන සංවිධානය, අම්පාර.
★ මඩකලපුව සාම කමිටුව, මඩකලපුව.
★ කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය, යාපනය.
★ මන්නාරම පුරවැසි කමිටුව, පුත්තලම.
★ සාමය සහ හොඳහිත සඳහා වූ පුරවැසි සභාව, යාපනය.
★ ප්‍රජා සංවර්ධන පදනම, වන්තරාරුමූලයි, මඩකලපුව.
★ ප්‍රජා භාරකාර අරමුදල, පුත්තලම.
★ රාජ්‍ය නො වන සංවිධාන සභාව, යාපනය.
★ උතුරේ අවතැන් වූ මුස්ලිම් වැසියන් ගේ සංවිධානය, යාපනය.
★ ඊ.එච්.ඊ.ඩී, මඩකලපුව.
★ එස්කෝ, මඩකලපුව.
★ පවුල් උපදේශන මධ්‍යස්ථානය, මන්නාරම.
★ ෆෝරුට්, යාපනය, කිලිනොච්චිය.
★ හියුඩෙක්, යාපනය.
★ මානව හිමිකම් කොමිසම, යාපනය, මන්නාරම, පුත්තලම, වව්නියාව.
★ ඉනයියච්, මඩකලපුව.
★ ළඳරු අධ්‍යාපන ආයතනය සහ කාන්තා සහ පිරිමි සංවර්ධන ඒකකය.
★ අන්තර් ආගමික සාම කමිටුව, මුතූර්.

- ★ යාපන කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය, යාපනය.
- ★ යාපනයේ මානව හිතවාදී ආයතන කේන්ද්‍රය.
- ★ යාපනයේ සමාජීය ක්‍රියාකාරී මධ්‍යස්ථානය.
- ★ කල්මුණේ සාම පදනම, කල්මුණේ, අම්පාර.
- ★ කින්නියා විෂන්, ත්‍රිකුණාමලය.
- ★ මහශක්ති සංවිධානය, අම්පාර.
- ★ රාජ්‍ය නො වන සංවිධාන හවුල, අම්පාර, මඩකලපුව, මන්නාරම, පුත්තලම, වව්නියාව.
- ★ ‘උෆට්රූ’, යාපනය.
- ★ ඔක්ස්ෆර්ඩ්, වව්නියාව.
- ★ සාම සහ ප්‍රජා ක්‍රියාකාරී සංවිධානය, අම්පාර.
- ★ ජනතා කේන්ද්‍රය, පුත්තලම.
- ★ ආර්.ඒ.ඒ.එෆ්, පුත්තලම.
- ★ ග්‍රාමීය සංවර්ධන අරමුදල, මන්නාරම, පුත්තලම, වව්නියාව.
- ★ සර්වෝදය, මඩකලපුව, මන්නාරම, ත්‍රිකුණාමලය, වව්නියාව.
- ★ ‘සීඩ්’ වව්නියාව.
- ★ සේවාලංකා, අම්පාර, යාපනය, පුත්තලම, වව්නියාව.
- ★ ශාන්තිහම්, යාපනය.
- ★ ශාන්ති, ත්‍රිකුණාමලය.
- ★ සූරිය කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය, මඩකලපුව.
- ★ ග්‍රාම සංවර්ධන සමාජ සුභසාධන සංවිධානය, අම්පාර.
- ★ ත්‍රිකුණාමල දිස්ත්‍රික් සංවර්ධන සංගමය, ත්‍රිකුණාමලය.
- ★ දෙමළ පුනරුත්ථාපන සංවිධානය, මන්නාරම.
- ★ දෙමළ අනාඩයින් ගේ පුනරුත්ථාපන මධ්‍යස්ථානය, යාපනය.
- ★ තියටර් ඇක්ෂන් ගෲප්, යාපනය.
- ★ තඩකම්, මඩකලපුව.
- ★ ත්‍රිකුණාමල ඉස්ලාමීය සංවර්ධන සංගමය, ත්‍රිකුණාමලය.
- ★ අනාථයින් පිළිබඳ එක්සත් ජාතීන් ගේ මහ කොමසාරිස්, යාපනය, වව්නියාව.
- ★ වෝඩෙප්ට්, පුත්තලම.
- ★ ‘සොආ’, මන්නාරම.

**ආගමික ආයතන**

- ★ බෞද්ධාගමික පන්සල: පුබුදුගම, පුත්තලම්, සේරුවිල, ත්‍රිකුණාමලය.
- ★ ක්‍රිස්තියානි දේවස්ථාන: මානිපායි, නවන්තුරෙයි, යාපනය, අඩප්පම්, අරිප්පු, පේසාලෙයි, තලෙයිමන්නාර් ගම, මන්නාරම, මඩකලපුව.
- ★ මුස්ලිම් දේවස්ථාන කමිටු: තත්පිත්තිමුනෙයි, අම්පාර, යෝනකවීදිය, යාපනය, කොටස්පතුරෙයි, මුසාලි, තවපුරම්, මන්නාරම, එරිකුලම්පිට්ටි, පුත්තලම, කුඩාවේලි, මුතූර්, ත්‍රිකුණාමලය
- ★ කෝවිල් භාරකාර මණ්ඩල: සෙනායිකුදියරුප්පු, අම්පාර, පිරම්බදිතිව්, මඩකලපුව, මුතූර්, ත්‍රිකුණාමලය.

**රාජ්‍ය ආයතන**

- දිසාපතිː යාපනය, කිලිනොච්චි, වව්නියාව.
- ග්‍රාමසේවා නිලධාරීː පේදුරුතුඩුව, කෝපායි, යාපනය, පාලකඩිච්චෙනායි, මුතූර්, ත්‍රිකුණාමලය, වට්ට විදානයර්, ආලෙයිය දිවෙම්බු, අම්පාර.
- සමථ මණ්ඩලː අලෙයියදිවෙම්බු, අම්පාර, කුරුනෑගල
- එල්ටීටීඊː යාපනය, වන්නිය
- ඊපීඩීපීː නයිට්ස්, යාපනය.
- ශ්‍රී ලංකා සටන් විරාම කමිටුවː මන්නාරම, යාපනය.

**ගම්වල පිහිටා ඇති සුහසාධන මධ්‍යස්ථාන**

- ආලන්කෙනි, ත්‍රිකුණාමලය.
- අලෙයියදිවෙච්චු, අම්පාර.
- අරිප්පු, මන්නාරම.
- එරිතුලම්පිටි, පුත්තලම
- හිජ්රාපුරම්, පුත්තලම.
- හිජ්රාපුරම්, වව්නියාව.
- කයිතඩි, යාපනය.
- කන්නක්තිපුරි, මඩකලපුව.
- කෝරිකල්ලිමාඩු, මඩකලපුව.
- කරම්බායි, පුත්තලම.
- කවාදාපිට්ටි, අම්පාර.
- කෝපායි, යාපනය.
- කුඩාවේලි, ත්‍රිකුණාමලය.
- මදුරකුලි, මන්නාරම.
- මූසාලි, මන්නාරම.
- නසිවන්තිවු, මඩකලපුව.
- නන්පිත්තිමුනෙයි, අම්පාර.
- පලටඩිවෙනායි, ත්‍රිකුණාමලය.
- පුන්කෝටම් සුහසාධන මධ්‍යස්ථානය, වව්නියාව.
- ප්‍රම්හතිව්, මඩකලපුව.
- පුබුදු ගම, පුත්තලම.
- සන්දිලිපායි, යාපනය.
- සේනායිකුදියුරුප්පු, අම්පාර.
- සිරිමාපුර, පුත්තලම.
- සිවපුර 2, වව්නියාව.
- තරාපුරම්, මන්නාරම.
- තිහලිවත්ත, මඩකලපුව.
- වාලච්චිනෙයි, මඩකලපුව.

## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 1996 ජූන මස පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ යහ පැවැත්ම හා ගැටලු නිරාකරණය පිණිස ශක්තිමත් ආයතනයක් හා ශක්‍යතා වර්ධනයක් සඳහා ප්‍රබල අවශ්‍යතාවයක් ඇතැයි ද මේ ක්‍රියාවලියේ දී පක්ෂ භජනයෙන් තොර සිවිල් සමාජයට අයත් විවිධ කණ්ඩායම් වලට ඉතා වැදගත් හා සුසාධනීය අයුරින් දායක විය හැකි ද යන බලවත් විශ්වාසය ඇතිව ය.

මහජනයා වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීමේ දී අප මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත වනුයේ ප්‍රචණ්ඩකාරී නොවන ආකාරයට ගැටුම් නිරාකරණය කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ද වෙනුවෙන් කටයුතු කරන, පුළුල් ව පැතිරුණු ප්‍රතිපත්තිමය විකල්පයන් කෙරෙහි ඉලක්ක වූ ද ක්‍රියාකාරී හා මැදිහත් වන සුළු වූ ද මූලික කාර්යභාරයකි. ඒ අනුව, ඉතා පුළුල් වූ පර්යේෂණ කටයුතු රැසක් පවරා ගැනීමට මධ්‍යස්ථානයට සිදුවන අතර ක්‍රියාත්මක කළ හැකි විකල්ප ප්‍රතිපත්ති හඳුනා ගැනීම හා සංවර්ධනය කිරීම ඒ ඔස්සේ සිදු කළ යුතුව ඇත.